# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2072/58 - 2018 මැයි මස 25 වැනි සිකුරාදා - 2018.05.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 12(1) වගන්තිය යටතේ සකස් කරන ලද ශ්‍රී ලංකා වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම - 2018**

2018 ශ්‍රී ලංකා වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලස්ම 2018 අප්‍රේල් මස 25 වැනි දින අමාත්‍ය මණ්ඩලය මගින් අනුමත කරන ලද අතර සැලැස්ම *ගැසට් පත්‍රයේ* පළකරන දින සිට ක්‍රියාත්මක වන බව මෙයින් මහජනතාවට දන්වා සිටිමි.

මෛත්‍රීපාල සිරිසේන,
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍ය.

2018 මැයි මස 23 වැනි දින,
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය,
අංක 500, ටී. බී. ජායා මාවත,
කොළඹ 10.


1A - PG 4054 — 507 (2018/05)

මෙම *අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1 පරිච්ඡේදය

## 1. හැඳින්වීම

### 1.1 වෙරළ සම්පත් කළමනාකරණය සහ වෙරළ කලාපයේ විෂය පථය

#### 1.1.1 සන්දර්භය හා පසුබිම

වෙරළබඩ ප්‍රදේශයන්හි ජනගහන වර්ධනය සහ ආර්ථික කටයුතු වේගවත්වීම සමග ශ්‍රී ලංකාවේ සම්පත්වලින් අනූනවූත් ගතිකවූත් වෙරළබඩ ප්‍රදේශයන් සංරක්ෂණය, සංවර්ධනය සහ තිරසාර භාවිතය ඉලක්ක කොටගත් සමෝධානික කළමනාකරණ අවශ්‍යතාව බොහෝකල් සිට හඳුනාගෙන ඇත. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් විධිමත් කළමනාකරණ ප්‍රවේශයක් පළමුව යොදාගන්නා ලද්දේ 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ විධිවිධානවලට අනුකූලව සම්පාදනය කොට ක්‍රියාත්මක කරන ලද 1990 ජාතික වෙරළ කලාප කළමනාකරණ සැලැස්ම මගිනි. එම සැලැස්ම 1997 සහ 2004 වසරවලදී සංශෝධනය කොට යාවත්කාලීන කරන ලදී. ජාතික සංවර්ධන ඉලක්කයන්ට අනුකූලව වෙරළබඩ පරිසරය සහ එහි සම්පත් තිරසාර ලෙස භාවිතා කිරීම දිගුකාලීනව සහතික කිරීම සඳහා 2018 වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමානාකරණ සැලැස්ම සකස්කොට ඇත.

පසුගිය වෙරළ කලාප කළමනාකරණ සැලසුම් මගින් හඳුනාගන්නා ලද ගැටලු සඳහා වූ ප්‍රතිපත්ති අරමුණු, ක්‍රමෝපායන් සහ ක්‍රියාකාරකම්වල බලපෑම සහ ප්‍රතිඵල පිළිබඳව වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් දියත් කරන ලද විමර්ශනයන් සහ ඇගයීම් තුළින් හෙළි වී ඇත්තේ අපේක්ෂිත ඉලක්ක සපුරාගැනීමේදී යම් පසුබෑම් සිදුව ඇති බවයි. මෙම තත්ත්වයට බොහෝ හේතු සාධක ඉවහල් වී ඇති අතර නෛතිකව අර්ථකතනය කරන ලද "වෙරළ කලාපය" ප්‍රමාණවත් නොවීම, විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ආයතනගත කිරීම සඳහා නෛතික විධිවිධාන නොමැතිවීම, නෛතිකව අර්ථකතනය කරන ලද කලාපයෙන් ඔබ්බට ගැටලු පිළිබඳව කටයුතු කළ නොහැකි බව සහ සංරක්ෂණ ප්‍රදේශ සහ පොදු පිවිසුම් ආරක්ෂා කිරීම සඳහා නෛතික බලාධිකාරිය නොමැතිවීම වඩාත් වැදගත් වේ.

මෙයට අමතරව, වෙරළබඩ ධීවර කර්මාන්තය සහ ජලජීවී වගාව ඒකාබද්ධ කිරීම සහ සුවිශේෂ වැදගත්කමින් යුත් ස්ථාන කළමනාකරණය පිළිබඳව හඳුන්වාදෙන ලද කළමනාකරණය ක්‍රමෝපායන්ගේ බලපෑම සහ ප්‍රතිඵල, ආයතනයන්ගේ සහයෝගීතාව හා වගකීම් සහ අධිකාරිය පිළිබඳ ගැටලු හේතුකොට අපේක්ෂිත මට්ටමින් ලඟාකර ගැනීමට නොහැකි විය. මෙම අඩුලුහුඬුකම්වලට අමතරව උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල පැවති ගැටුම්කාරී තත්ත්වය රටතුළ පවත්නා වෙරළබඩ සම්පත් පූර්ණ වශයෙන් කළමනාකරණය කිරීමට බාධා ඇති කරන ලදී.

#### 1.1.2 2004 වෙරළ කලාප සැලැස්මෙන් වන ප්‍රධාන බැහැර වීම

2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ සංශෝධන පනතේ නෛතික විධිවිධානවලට අනුකූලව 2018 වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් පිළියෙල කරල ලදී. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ධාරිතාව සහ ප්‍රායෝගිකත්වය පිළිබඳ අවධානය යොමුකර 2018 වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම වෙරළතීර කළමනාකරණය, වෙරළබඩ දූෂණය, වෙරළබඩ පරිසර පද්ධති කළමනාකරණය, විශේෂ කළමනාකරණ ප්‍රදේශ සහ නියාමක යාන්ත්‍රණය යන ප්‍රධාන ක්ෂේත්‍ර පහකට සීමාකොට ඇත. 2004 වෙරළ කලාප කළමනාකරණ සැලැස්ම මගින් අවධානය යොමුකරන ලද ගැටලු දෙකක් 2018 සැලැස්මෙන් බැහැර කරන ලදී. මේ අනුව විශේෂ වැදගත්කමින් යුත් වෙරළ ප්‍රදේශ, පොදු පිවිසුම් පිළිබඳ ගැටලු හා වෙරළබඩ ධීවර කර්මාන්තය සහ ජලජීවී වගාව ඒකාබද්ධ කිරීම පිළිබඳ ගැටලු 2018 සැලැස්මෙන් බැහැර කරන ලදී. මෙම වෙනස්කම් සඳහා බොහෝවිට පාදක වූයේ සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී අත්විඳි ප්‍රතිඵල, වගකීම් සහ අධිකාරිය පිළිබඳ ගැටලු වේ. කෙසේවුවත් මෙම ගැටලු පිළිබඳව හයවන පරිච්ඡේදයෙහි නියාමන යාන්ත්‍රණය යටතේ අවධානයට ලක්කොට ඇත.

#### 1.1.3 පශ්චාත් යුධ ගැටුම් අවස්ථාවන් සහ වෙරළබඩ ප්‍රදේශයන්හි සංවර්ධන උපනතීන්

වසර 30කට අධික කාලයක් පුරා උතුරු සහ නැගෙනහිර වෙරළබඩ කලාපයන්හි පැවති ගැටුම්කාරී තත්ත්වය එම ප්‍රදේශයන්හි වෙරළබඩ සම්පත් මනා ලෙස කළමනාකරණය කිරීමට බාධා පමුණුවා තිබේ. පැවති ගැටුම්කාරී තත්ත්වය වෙරළබඩ ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වය අඛණ්ඩ පිරිහීමටද හේතු වී ඇත. කෙසේවුවත් පැවති

ත්‍රස්තවාදී උවදුර 2009 වර්ෂයේ දී මුලිනුපුටා දැමීමෙන් පසුව වෙරළබඩ සම්පත් පදනම්කොට ආර්ථික සංවර්ධනය සඳහා සුවිශේෂී අවස්ථාවන් උදා විය. මේ අනුව වෙරළබඩ ප්‍රදේශයන් ආශ්‍රිත නාවික, සංචාරක, බලශක්ති කේන්ද්‍රයන් සංවර්ධනය කිරීම පිළිබඳ රජයේ ප්‍රමුඛතාව ලබාදී තිබේ. වෙරළබඩ ප්‍රදේශයන්හි ස්ථානගත සංචාරක කර්මාන්ත සංවර්ධනය කිරීමේදී සංවර්ධන අවශ්‍යතාවන් අනුව සංරක්ෂණ අවශ්‍යතාවන් තුලනය කිරීමේ අවශ්‍යතාව ඉතා පැහැදිලිව පෙනී ගොස් ඇත. එමෙන්ම හම්බන්තොට වැනි වානිජ වරායන් සංවර්ධනය කිරීම වෙරළ ප්‍රදේශයන්හි සැලසුම් සහගතව සංවර්ධනයන් සඳහා වූ නිදසුන් සපයයි. මෙම සැලැස්ම මගින් හඳුන්වා දෙන ප්‍රතිපත්ති, අරමුණු, කළමනාකරණ ක්‍රමෝපායන්, සංවර්ධන මාර්ගෝපදේශ සහ ප්‍රමිතීන් වෙරළ ප්‍රදේශයන්හි ගුණාත්මකභාවය තවදුරටත් වැඩිදියුණු කිරීමට සහ සංවර්ධන අවශ්‍යතාවන් සපුරාලීමට ඉවහල් වේ.

## 1.2 වෙරළ කලාපයේ ගති ලක්ෂණ

### 1.2.1 ජීව - භෞතික ගති ලක්ෂණ

ඉන්දියන් සාගරයේ උතුරු ප්‍රදේශයේ උතුරු අක්ෂාංශ $05^0$ 54’ සහ $09^0$ 52′ සහ නැගෙනහිර දේශාංශ $79^0$ 39’ සහ $81^0$ 53’ අතර පිහිටීම ශ්‍රී ලංකාවේ වෙරළබඩ පරිසරය කෙරෙහි දැඩි ලෙස බලපා ඇත. දිවයිනේ නිර්මාණයට පදනම් වූ අඩ තැනිතලා තුන අතරින් පහත්ම තැන්නෙහි වෙරළබඩ ප්‍රදේශ ස්ථානගත වී තිබේ. වෙරළබඩ ප්‍රදේශ සාමාන්‍යයෙන් අඩි 100 (මී.30) ට වඩා උසින් අඩු තැනිතලාවලින් සමන්විත වේ. වෙරළබඩ නැතිතලා අයත්වන පහත් වෙරළබඩ තැන්න දිවයිනෙන් පිටතට මහද්වීපික තටකය ලෙස මුහුදට යටින් විහිදෙන අතර බොහෝ තැන්වල එය සැතපුම් 5 -25 (කි. මී. 8-14) පමණ පළලින් යුතුව විහිදේ. මුහුදු මට්ටමින් පහළට ගැඹුර අඩි 216 (මීටර් 65) පමණ වේ. දිවයිනේ දකුණු දිග කොටසේදී මහද්වීපික තටකය පටුවන නමුත් උතුරු දෙසට බොහෝ පළල්වී ඉන්දියාව වටා ඇති තටකය හා සම්බන්ධ වේ. කලපු හැර බොකු සහ මුවදොර සහිතව ශ්‍රී ලංකාවේ වෙරළ තීරය දිගින් කි.මී. 1620ක් පමණ වේ.

නිරිත දිග සහ ඊසාන දිග පිහිටි තිරස් (Transverse Type) වෙරළ තීරයන්, ගල් සහිත තුඩුවලින් සහ දෙපසින්ම ආරක්ෂා වූ දර්ශනීය වැලි සහිත බොකු පෙලකින් සමන්විත වේ. නිරිතදිග වෙරළ තීරයේ වක්‍රාකාර (Sinuous) සංකීර්ණ කලපු සහ ජලාශ පද්ධතියක්ද ඇත. ඊසාන දිග වෙරළ පිහිටි ත්‍රිකුණාමල බොක්ක ඉන්දියන් සාගරයේ ඇති පරිපූර්ණ ස්වභාවික වරාය ලෙස සැලකෙන අතර එය විශේෂ වැදගත්කමින් යුක්තය. වයඹ සහ ගිණිකොණ වෙරළ තීරයන්හි ඇතැම් ස්ථානවල කලපු, වැලි වැටි සහ වැලි තුඩු ද දැකිය හැක. ඇතැම් ස්ථානයන්හි මේවා කිලෝමීටර් ගණනාවක් දක්වා දිගැතිය. දිවයින වටා නොගැඹුරු ජලයෙන් යුත් මහද්වීපික තටකයක් ඇති අතර වෙරළ තීරය දිගේ හොඳින් වැඩුණ වැලිගල්පර සහ ගල්පර අතර හිරිගල්පර නිර්මාණය වී ඇත. අකුරල ප්‍රමුඛව අම්බලන්ගොඩ සහ මාතර අතර ප්‍රදේශයේ ගොඩබිම දෙසට විහිදී ගිය හිරිගල් නිධි පිහිටා තිබේ. නිරිතදිග වෙරළ තීරයේ ගංගාවලින් වැලි ඉවත් කිරීම හා වෙරළට ආරක්ෂාව සපයන හිරිගල්පර විනාශ කිරීම වැනි මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් ඛාදන ක්‍රියා තවත් උග්‍ර වී නිරිත දිග වෙරළ තීරය ඛාදනයට භාජනය වී ඇත. අනෙක් අතට වයඹ සහ ගිණිකොන දිග ප්‍රදේශවල සමහර වෙරළ තීරයන් වැලි තැන්පත් වීම හේතුවෙන් විවර්ධනයට පාත්‍ර වී තිබේ.

මුහුද, ගොඩබිම සහ වායුගෝලය අතර ඉතා ගතික සංක්‍රමණික කලාපයකින් වෙරළ භූදර්ශනය සමන්විත වන අතර, භූමි ප්‍රදේශ සහ අවසාදිත (වැලි) සැපයීම කෙරෙහි මුහුද සහ වායුගෝලීය බලපෑමේ ප්‍රතිඵලයක් ලෙස මෙම ප්‍රදේශ නිර්මාණය වී ඇත. මධ්‍යම කඳුකරයේ සිට ගලා බස්නා ගංගා 103ක් පමණ වෙරළබඩ භූ දර්ශනයන්ගේ ඉතා වැදගත් ලක්ෂණයක් වන මුවදොර නිර්මාණය කරමින් මුහුදට ගලා බසී. වානිජ සහ යැපුම් භාවිතය සඳහා යොදා ගන්නා මත්ස්‍ය වර්ගයන්ට එම ගංගා මගින් වැදගත් පරිසර පද්ධති (වාස භූමි) සැපයේ. මෙම ගංගා මගින් පෝෂණයට ඉතා අවශ්‍ය වන වැලි, මැටි සහ රොන් මඩ විශාල ප්‍රමාණයක් ප්‍රවාහනය කෙරේ. නමුත් වෙරළබඩ ජලයේ සහ පරිසර පද්ධතියේ ගුණාත්මකභාවය ක්ෂය කරනු ලබන දූෂක එමගින් ගෙන එනු ලැබේ. වෙරළ කලාපය පුරා ගොඩබිම් ප්‍රදේශවල ස්ථානගතවූ විවිධ පරිසර පද්ධති පවත්නා අතර ඊට මුහුදු වෙරළ, බාධක වෙරළ, වැලි වැටි වැලි තුඩු, ගල් සහිත වෙරළ, කඩොලාන සහ ලවන වගුරු ඇතුළත් වේ. ඒ හා සමාන වැදගත් පරිසර පද්ධතින් නම් හිරිගල්පර, කලපු, මුවදොර, මුහුදු තෘණතලා යනාදියයි. මෙම පරිසර පද්ධති මගින් වැදගත් භෞතික ක්‍රියාවලීන් නඩත්තු කිරීම, පරිසර පද්ධති සේවාවන් සහ කාර්යයන් සපුරාලීම සහ භූමිය, භාණ්ඩ සහ සේවාවන් යනාදියට උපකාරී වේ. (වෙරළ කලාප කළමනාකරණ සැලැස්ම - 2004)

### 1.2.2 2004 වර්ෂයේ සුනාමි ව්‍යසනයේ බලපෑම්

2004 දෙසැම්බර් මස 24 දින ඇති වූ ආසියානු සුනාමිය, වෙරළබඩ ප්‍රජාවට වූ හානිය, සංකීර්ණත්වය සහ එහි ප්‍රමාණය අනුව ශ්‍රී ලංකා ඉතිහාසයේ වාර්තා වූ දරුණුතම ස්වභාවික ව්‍යසනය ලෙස සැලකිය හැකිය. මෙම ව්‍යසනයේ ප්‍රතිඵලයක් ලෙස වෙරළ කලාපයේ සැලකිය යුතු කොටසක් සහ එහි ජීව - භෞතික සම්පත් විනාශවීම

හෝ හානියට ලක් වීම සිදු විය. මේ නිසා මිනිස් ජීවිත 38,000ක් පමණ අහිමි වූ අතර 7100 දෙනෙකු අතුරුදහන් විය. රජයේ සංඛ්‍යා ලේඛනවලට අනුව පුද්ගලයින් මිලියනයකට පමණ ඉන් බලපෑම් වූ අතර (මුළු ජනගහනයෙන් 5%ක් පමණ) ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් අහිමිවීම, ආබාධයන්ට ලක්වීම, ඔවුන් සතු සියලු වත්කම් අහිමිවීම මෙන්ම ඔවුන්ගේ නිවාස පූර්ණ හෝ අර්ධ වශයෙන් විනාශ වීම සිදුවිය. අනෙකුත් බලපෑම් අතර වෙරළ කලාපයේ පානීය ජල ප්‍රභවයන් දැඩි ලෙස හානියට පත්විය. දළ ඇස්තමේන්තු අනුව ලවන ජලය කාන්දුවීම හේතුකොට ළිං 12,000 පමණ හානියට පත් වූ අතර ළිං 50,000 පමණ අත්හරින ලදී. බලපෑමට ලක්වූ වෙරළබඩ ප්‍රදේශයන්හි අවට ජල ප්‍රවාහයන් අහිමි විය. බොහෝ අවස්ථාවන්හිදී ගෘහස්ථ ජල සැපයුමට (ළිං) ලවන ජලය මුහුවීම, මෘත දේහ සහ අනෙකුත් යටිතල පහසුකම් හානි වීම හෝ රසායනික ද්‍රව්‍ය මිශ්‍ර වීම නිසා ඇති වූ දූෂක මගින් හානියට පත්විය (MIND 2004). වෙරළබඩ සම්පත් කෙරෙහි වූ බලපෑම අනුව හිරිගල්පර බොහොමයක් හානියට පත් වූ බව වාර්තා වූ අතර එය භූගෝලීය වශයෙන් විවිධත්වයක් ගනී. තංගල්ල, කුඩාවැල්ල, කප්පරතොට, වැලිගම, පොල්හේන, උණවටුන සහ හික්කඩුව ප්‍රදේශන්හි සෑම ස්ථානයකම හිරිගල්පර හානි විය. හිරිගල්පරවලට අමතරව තංගල්ල, පානම, වාකරේ, සල්ලිතිව් සහ අක්කරෙපත්තු යන ස්ථානයන්හි සැලකිය යුතු මට්ටමින් කඩොලාන ශාක ප්‍රජාව විනාශ වී ඇත.

**2004 සුනාමි ව්‍යසනයේ ප්‍රධාන බලපෑම්**

| *හානි ප්‍රමාණය* | | *හානි වූ නිවාස ප්‍රමාණය* | | *භූමි හානිය (හෙ.යා)* | | | *ධීවර යාත්‍රා හානිය* |
|---|---|---|---|---|---|---|---|
| මරණ | අතුරුදහන් | පූර්ණ | අර්ධ | කුඹුරු | අනෙකුත් වගා | නිවාස සහිත ඉඩම් | |
| 38195 | 7100 | 79000 | 41000 | 2300 | 1708 | 2500 | 18500 |

*මූලාශ්‍රය* : (TAFREN)

**1.3 වෙරළ කලාප කළමනාකරණය පිළිබඳ වෙරළ සංරක්‍ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ කාර්යභාරය**

රටෙහි සංවර්ධන අවශ්‍යතා සහ සංරක්‍ෂණ අරමුණු අතර තුලනයක් ඇති කිරීමට වෙරළ සංරක්‍ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙරළ කලාප කළමනාකරණ වැඩසටහන්වලින් ආරම්භයේ සිටම වෑයම් කර ඇත. පරිසර සංරක්‍ෂණය සඳහා වගකියනු ලබන අනෙකුත් රාජ්‍ය ආයතනයන් සිදුකරනු ලබන සම්ප්‍රදායික සංරක්ෂණ කාර්යභාරයට වඩා වෙනස් ආකාරයක කාර්යභාරයක් වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව ඉටු කරනු ලබයි. වෙරළ කලාපයේ පවත්නා ගතික ස්වභාවය බහුවිධ පාරිසරික සේවාවන් සහ කර්තව්‍ය මෙන්ම වෙරළ පරිසරයෙන් ලබාගන්නා ප්‍රතිලාභ සැලකිල්ලට ගෙන ලිඛිත ප්‍රතිපත්ති අරමුණුවලට සීමා නොවුන, පාර්ශ්වකරුවන්ගේ පුළුල් උපදේශකත්වය මත වඩාත් සැලසුම්ගත කළමනාකරණයක් සඳහා විශේෂ අවධානයක් යොමු කරන ලදී. වෙරළ සම්පත් කළමනාකරණ ක්‍රියාවලියේදී තරගකාරී භාවිතාවන්ගේ අවහිරතාවන්ගෙන් තොරව වෙරළබඩ ප්‍රජාවගේ මූලික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා ජීවන තත්ත්වයේ ගුණාත්මකබව වැඩි දියුණු කිරීම සහතික කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලදී.

වෙරළ සම්පත් කළමනාකරණයේදී යොදාගන්නා විධාන සහ නෛතික පාලන උපකරණයන්ගේ සමාජීය පිරිවැය සහ වෙරළබඩ පරිසර පද්ධතීන්හි සේවාවන්ගේ හඳුනා නොගත් අංශ පිළිබඳව වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ සැලසුම්කරණ තීරණ සෑමවිටම පරීක්‍ෂාකාරී ලෙස අවධානය යොමුකොට ඇත. තවද වෙරළ සම්පත් කළමනාකරණයේදී පහළ සිට ඉහළට විහිදෙන සහභාගිත්ව ප්‍රවේශය ප්‍රවර්ධනය කරන ලද අතර හැකි සෑම අවස්ථාවකදීම එම ක්‍රමවේද යොදා ගන්නා ලදී.

**වෙරළ සංරක්ෂණය සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව අත්කර ගැනීමට අපේක්ෂිත මෙහෙවර**

වෙරළබඩ සම්පත් තිරසාර ලෙස සංවර්ධනය කිරීමත් වෙරළබඩ ක්‍රියාවලිය කළමනාකරණය කිරීම මගින් ශ්‍රී ලංකාවේ සාමාජීය, ආර්ථික සහ පාරිසරික තත්ත්වයන් ප්‍රශස්ථ මට්ටමක් කරා යොමු කිරීම වේ.

**අපේක්ෂිත අරමුණු**

මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා වෙරළ සංරක්ෂණය සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මෙහෙයවන අරමුණු වනුයේ;

- වෙරළබඩ පාරිසරික තත්ත්වය වැඩි දියුණු කිරීම.
- වෙරළබඩ තීරය සංවර්ධනය කිරීම සහ කළමනාකරණය කිරීම.
- වෙරළබඩ ප්‍රජාවගේ සහ සම්පත් භාවිතාකරුවන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම.
- වෙරළබඩ සම්පත් පදනම් වූ ආර්ථික සංවර්ධනය පහසු කරවීම සහ ප්‍රවර්ධනය කිරීම.

**අත්කර ගත යුතු ප්‍රතිඵල**

- වෙරළබඩ භූමියේ සහ ජලයේ ගුණාත්මක බව වැඩි දියුණු වේ.
- ජෛව විවිධත්වය සංරක්ෂණය සහ තිරසාර භාවිතය සහතික කිරීම කරනු ලැබේ.
- වෙරළබඩ ඉඩම්වල ප්‍රශස්ථ ආර්ථික විභවය සාක්ෂාත් කරනු ලැබේ.

**1.3.1 වෙරළ කලාප කළමනාකරණයේ පසුගිය දශක තුනක සාර්ථකත්වයන්** (achievements)

- ➢ වෙරළ ඛාදනයේ බලපෑම් ප්‍රමාණවත් මට්ටමකට අවම කිරීම.
- ➢ මුහුදු වෙරළින් වැලි ඉවත් කිරීම සැලකිය යුතු මට්ටමකට අවම කිරීම.
- ➢ මුහුදු හිරිගල් ඉවත් කිරීම සම්පූර්ණයෙන් පාලනය කිරීම.
- ➢ වෙරළබඩ සංවර්ධන කටයුතු සඳහා පාරිසරික බලපෑම් ඇගැයීම් ක්‍රියාවලිය (EIA/IEE) යොදා ගැනීම තහවුරු කිරීම.
- ➢ බලපත්‍ර අනුකූලතාව සහතික කිරීම.
- ➢ වෙරළ පිවිසුම් ස්ථාපිත කිරීම.
- ➢ පාසල් විෂයමාලා සංවර්ධනය ඇතුළු වෙරළබඩ ගැටලු පිළිබඳ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම.
- ➢ වෙරළබඩ සම්පත් කළමනාකරණය පිළිබඳ ප්‍රජා අධ්‍යාපනය සහ දැනුවත් කිරීම.
- ➢ වෙරළබඩ සම්පත් කළමනාකරණයේ දී ප්‍රජා සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම.
- ➢ ඒකාබද්ධ වෙරළ කලාප කළමනාකරණය සඳහා වූ අතිරේක සැලසුම් උපකරණයක් ලෙස විශේෂ කළමනාකරණ ප්‍රදේශ සංකල්පය හඳුන්වා දීම.
- ➢ සහයෝගීත්ව වෙරළබඩ සම්පත් කළමනාකරණය සඳහා නෛතික රාමුවක් හඳුන්වා දීම.

**1.3.2 විදේශීය තාක්ෂණික ආධාර**

වෙරළ කලාපයේ දිගුකාලීන ස්ථායිතාව කෙරෙහි තර්ජනයක් වූ වෙරළබඩ ගැටලුවල අහිතකර ප්‍රතිඵල අවම කිරීමට හෝ වැළැක්වීම සඳහා අවශ්‍ය මූල්‍ය සහ තාක්ෂණික ආධාර ලබා ගැනීමට පසුගිය වකවානුවලදී වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව සමත් වී ඇත. මේවා අතරින් ප්‍රධාන වනුයේ ඩැනිඩා ආධාර යටතේ ක්‍රියාත්මක වූ වෙරළ ඛාදන කළමනාකරණ ව්‍යාපෘති දෙක (1987 -1989 සහ 1990- 1992), නොර්විජියානු (NORD) ආධාර යටතේ ක්‍රියාත්මක වූ හම්බන්තොට ඒකාබද්ධ වෙරළ කලාප කළමනාකරණ වැඩසටහන (1999 -2001) ගෝලීය පරිසර පහසුකම් (GEF) යටතේ ක්‍රියාත්මක වූ රැකව, කලමැටිය, උස්සන්ගොඩ ජෛව විවිධත්ව සංරක්ෂණ වැඩසටහන (1994-1998) ජාත්‍යන්තර සංවර්ධන සඳහා වූ ඇමෙරිකානු ආධාර යටතේ ක්‍රියාත්මක වූ (අදියර 1 සහ අදියර 2) වෙරළබඩ සම්පත් කළමනාකරණ වැඩසටහන (1985-1991) සහ (1991 - 1997) ජර්මන් තාක්ෂණික ආධාර යටතේ ක්‍රියාත්මක වූ (GTZ) වෙරළ සංරක්ෂණ ව්‍යාපෘතිය (1988 - 1996), ආසියානු සංවර්ධන බැංකුව සහ නෙදර්ලන්ත රජයේ ආධාර මත ක්‍රියාත්මක වූ වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (2001 - 2007) සහ නැගෙනහිර පළාත් වෙරළ කලාප සහ තිරසාර කළමනාකරණ ව්‍යාපෘතිය (2009 - 2016).

## 1.4 වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම 2018

### 1.4.1 2011 වෙරළ සංරක්‍ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ සංශෝධන පනත මගින් හඳුන්වාදුන් නව නෛතික විධිවිධාන

1981 අංක 57 වෙරළ සංරක්‍ෂණ පනත 1983 ඔක්තෝබර් මස 01 දින සිට ක්‍රියාත්මක වූ පසු, වෙරළ කලාපය සහ එහි සම්පත් මෙන්ම වෙරළ කලාපය තුළ සිදු කරනු ලබන සියලු සංවර්ධන කටයුතු මූලික වශයෙන් කළමනාකරණය කරන ලද්දේ එම පනතේ විධිවිධාන පදනම් කොටගෙනය. කළමනාකරණය සැලසුමක බලපෑම් ඉස්මතු වී ඇති බව පෙනීගොස් ඇත. මේ අනුව 1988 අංක 64 දරන සංශෝධනය මගින් ප්‍රධාන පනත සංශෝධනය කරන ලදී. 1988 සංශෝධන ප්‍රධාන වශයෙන් ඉලක්ක කරනු ලැබුයේ හිරිගල් සහ වැලි ඉවත් කිරීම වෙරළට පිවිසීමට මහජනයාට ඇති අයිතිය සහ වෙරළ කලාපය තුළ පිහිටි හුණු පෝරණු විනාශ කිරීම පිළිබඳ නියාමන බලතල ශක්තිමත් කිරීම කෙරෙහි කාලයත් සමග වෙරළ සම්පත් කළමනාකරණ විෂය පථය පුළුල්වීමත්, ස්වභාවික සහ මානව ක්‍රියාකාරකම් හේතුකොට ගැටලු වර්ධනය වීමත් සමග නව නෛතික ප්‍රතිපාදනයන්ගේ අවශ්‍යතාව දිගුකලක සිට පෙනී ගොස් ඇත. නව නීතිමය ප්‍රතිපාදන අවශ්‍ය ක්ෂේත්‍රයන් අතර විශේෂ කළමනාකරණ ප්‍රදේශ ආයතනගත කිරීම, සහභාගීත්ව කළමනාකරණයේදී ප්‍රජා සහභාගීත්වය නීත්‍යානුකූලව පිළිගැනීම, නෛතික අර්ථකතනය කරන ලද වෙරළ කලාපය පුළුල් කිරීම, වෙරළ කලාපයෙන් පිටත සිදුවන මිනිස් ක්‍රියාකාරකම් පාලනය සහ පොදු පිවිසුම් සහ විවෘත ප්‍රදේශ කළමනාකරණය වැදගත් වේ.

ඉහත කරුණු සැලකිල්ලට ගෙන රජය 2011 අංක 49 දරන සංශෝධන මගින් ප්‍රධාන පනතට දෙවන සංශෝධනය හඳුන්වාදෙන ලදී. මෙම සංශෝධනයන්ගේ වැදගත් ක්ෂේත්‍රයන් වනුයේ:

- වෙරළ කලාපයේ පිහිටි මුහුදට සම්බන්ධ ජල තලයන් දෙපස භූමිය ඇතුළත්වන ලෙස "වෙරළ කලාපය" නැවත අර්ථකතනය කිරීම.
- ''වෙරළ කලාප සහ වෙරළබඩ සම්පත් කළමනාකරණ සැලැස්ම'' සම්පාදනය කිරීම.
- "වෙරළ කලාපයේ හෝ ඉන් පිටත ප්‍රදේශයන් බලපෑමට ලක්වන ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පැමිණවීම සඳහා වූ විධිවිධාන.
- විශේෂ කළමනාකරණ ප්‍රදේශ නම් කිරීම සහ ආයතනගත කිරීමේ විධිවිධාන.
- වෙරළබඩ උද්‍යාන සහ සංරක්‍ෂණ ප්‍රදේශ ප්‍රකාශයට පැමිණවීමේ විධිවිධාන.
- වෙරළබඩ පිවිසුම් මාර්ග සැලැස්ම සම්පාදනය කිරීමේ විධිවිධාන.

**වෙරළ කලාපය**

GRAPHIC ILLUSTRATION OF THE COASTAL ZONE & ITS LIMITS




1.1 රූපය - 2011 අංක 49 දරන පනත මගින් සංශෝධනය කරන ලද 1981 අංක 57 දරන වෙරළ සංරක්‍ෂණ වෙරළ සම්පත් කළමනාකරණ පනතට අනුව වෙරළ කලාපය

1.4.2 ප්‍රාරම්භක ක්‍රියාවලිය

2017 වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම 2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනත මගින් සංශෝධනය කරන ලද 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ විධිවිධානවලට අනුකූලව සම්පාදනය කරන ලදී. තොරතුරුවල විශ්වාසනීයත්වය සහ ප්‍රමාණවත් මට්ටමින් ගැටලු හඳුනාගැනීම සහ විශ්ලේෂණය සහතික කරනු පිණිස 2018 වෙරළ කලාප සහ වෙරළබඩ සම්පත් කළමනාකරණ සැලැස්ම පිළියෙල කරනු ලැබූයේ පුළුල් ක්ෂේත්‍ර විමර්ශන සහ අධ්‍යයන තුළිනි. එක් එක් පරිච්ඡේදය සඳහා තොරතුරු එක්රැස්කොට පිළියෙල කරන ලද්දේ රාජ්‍ය නිලධාරීන්, වෘත්තිකයන් සහ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් සමන්විත තාක්‍ෂණික කමිටු මගිනි. තොරතුරු අවශ්‍යතාව සපුරාලනු පිණිස ගැටලුව පිළිබඳ ප්‍රාථමික හා ද්විතීක තොරතුරු සම්පාදනය කරන ලදී. අධ්‍යයනයන් පහක් මගින් ගැටලු එක්රැස්කරන ලදී. සැලැස්මේ සියලු පරිච්ඡේද සියලු වෙරළබඩ දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි සහභාගීත්ව වැඩමුළු මගින් සමාලෝචනය කරන ලද අතර සැලැස්ම අවසන් වශයෙන් පිළියෙල කිරීමට ප්‍රථම අනෙකුත් ආයතනවල එකඟතාව ලබා ගන්නා ලදී.

1.4.3 සැලැස්මේ ව්‍යුහය සහ අන්තර්ගතය

වෙරළ කලාප සහ වෙරළබඩ සම්පත් කළමනාකරණ සැලැස්ම පරිච්ඡේද හතකට වෙන් කොට ඇත. පරිච්ඡේද 2-6 දක්වා ඒකාබද්ධ වෙරළ කලාපය සහ වෙරළතීර කළමනාකරණය (2 පරිච්ඡේදය) වෙරළබඩ පරිසර පද්ධති සංරක්ෂණය (3 පරිච්ඡේදය) වෙරළබඩ ජල දූෂණය පාලනය (4 පරිච්ඡේදය) විශේෂ කළමනාකරණ ප්‍රදේශ (5 පරිච්ඡේදය) නියාමන යාන්ත්‍රණය (6 පරිච්ඡේදය) යන පරිච්ඡේදයන් සම්පාදනය කරන ලද්දේ ලබා ගන්නා ලද ප්‍රාථමික දත්ත සහ තොරතුරු මෙන්ම පෙර පැවැති වෙරළ කලාප කළමනාකරණ සැලසුම් (1990, 1997, 2004) සහ අනෙකුත් ද්විතීක මූලාශ්‍ර උපයෝගී කරගෙනය. ගැටලු ආශ්‍රිතව සකස් වූ සෑම පරිච්ඡේදයකින්ම ඊට අදාළවන වෙරළබඩ සම්පත් හෝ ඒ සඳහා අවශ්‍ය වන මැදිහත්වීම් පිළිබඳ ගැඹුරින් කරුණු ඉදිරිපත් කරනු ලබන අතර සාකච්ඡා කළයුතු ගැටලු ඒ සම්බන්ධ දැනට පවත්නා සැලසුම්, ප්‍රතිපත්ති, වැඩසටහන්, නීති, ආයතනික යාන්ත්‍රණ සහ කළමනාකරණ මැදිහත්වීම් සඳහා බලපාන නීති ක්‍රියාත්මක කිරීමේ ක්ෂේත්‍රයන් ඇතුළත් වේ. ගැටලු පිළිබඳව සම්පාදනයකර ඇති සෑම පරිච්ඡේදයක්ම කළමනාකරණ අරමුණු, අදාළ ප්‍රතිපත්තීන්, ක්‍රමෝපායන් සහ කළමනාකරණය සඳහා යෝජිත ක්‍රියාකාරකම්වලින් සමන්විත වේ. මෙම සැලැස්ම මගින් ඉදිරිපත් කෙරෙන සෑම අරමුණක්ම ළඟාකරගත යුතු තත්ත්වයන් වශයෙන් කෙටුම්පත් කොට ඇති අතර කළමනාකරණ මැදිහත් වීම අවශ්‍ය ප්‍රශ්නවලට අනුරූපවන පරිදි සකස්කොට ඇත. එක් එක් අරමුණ මුදුන්පත්කර ගැනීම සඳහා අවශ්‍යවන ක්‍රියාවලීන් ප්‍රතිපත්ති මගින් නිරූපනය වේ. කළමනාකරණ ක්‍රමෝපායන් ප්‍රධාන ගැටලු ඉලක්ක කර ඇති අතර විවිධ අන්දමේ ක්‍රියාකාරකම් එමගින් පෙන්වා දෙයි. කිසියම් ක්‍රමෝපායක් අනුගමනය කිරීමට අදාළවන නියත පියවර යෝජිත ක්‍රියාකාරකම් මගින් හඳුනාගෙන ඇත.

## 2 පරිච්ඡේදය

## 2. වෙරළ තීර කළමනාකරණය

2.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ වෙරළ කලාප කළමනාකරණ වැඩසටහන ආරම්භ කිරීම සඳහා ඉවහල් වූ ප්‍රධානතම සාධකය ලෙස වෙරළ ඛාදන ගැටලුව හඳුනාගත හැකිය. ගැටලුවේ ප්‍රමාණය, අදාළ හේතු සාධක, මහජන අදහස්, යොදගන්නා ලද කළමනාකරණ පිළියම් සහ ප්‍රතිපත්තිමය ප්‍රතිචාරයන් අනුව වැඩසටහන සංවර්ධනය වූ මාවත විශේෂිත කාල පරිච්ඡේද තුනක් යටතේ වර්ගීකරණය කිරීමට පුළුවන. මුල් වකවානුවේ වෙරළ ඛාදන ගැටලුව ප්‍රධාන වශයෙන් දිවයිනේ දකුණු වෙරළ තීරයෙන් අත්දකින ලද අතර එය ස්වාභාවික සංසිද්ධියක් ලෙස සලකා තත්කාර්ය පදනමකින් පාලනය කිරීමට උත්සාහ කරන ලදී. වෙරළ ආරක්‍ෂණය සඳහා වගකියනු ලබන කේවල ආයතනයක් නොවූ අතර රජයේ වැඩ දෙපාර්තමේන්තුව, දුම්රිය දෙපාර්තමේන්තුව වැනි රාජ්‍ය ආයතන කිහිපයක් "වෙරළ තීරය රකිමු" ප්‍රවේශය යටතේ පනා බැම් සහ පැති බැම් වැනි දැඩි වෙරළාරක්ෂක නිර්මාණ කෙරෙහි අවධානය යොමු කරන ලදී. කෙසේ වුවත් කාලයත් සමග වෙරළ ඛාදන ගැටලුව තීව්‍ර වූ අතර ප්‍රධාන පාරිසරික සහ සමාජ ආර්ථික ගැටලුවක් ලෙස හඳුනා ගැනිණි. 1970 වර්ෂය වන විට වෙරළබඩ ඉඩම් සහ දේපල හානිවීම, මහාමාර්ග, දුම්රිය මාර්ග වැනි යටිතල පහසුකම්වලට වූ හානියත්, වෙරළබඩ පරිසර පද්ධතිවලට වන්නා වූ හානියත් ඒකාබද්ධ දැඩි බලපෑම් මත මේ පිළිබඳව වූ දැක්ම වෙනස්වීමට හේතු විය. ඒ අනුව මෙම තත්ත්වය සඳහා මනා කළමනාකරණයක් අවශ්‍ය වන බව හඳුනා ගැනිණි. ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යාංශය යටතේ වෙරළ සංරක්ෂණ අංශය 1978 දී ආරම්භ වීමත් සමග අවශ්‍ය ආයතනික රාමුව ස්ථාපිත විය. ඉන් අනතුරුව මධ්‍යම මට්ටමින් කළමනාකරණ වැඩසටහන ආරම්භ කෙරිණි. මෙම කාලපරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කරන ලද ඉංජිනේරුමය වැඩවලට සමගාමීව නෛතික රාමුව ශක්තිමත් කිරීම මගින් ආයතනික ධාරිතාවන් වැඩිදියුණු විය. වෙරළ කලාප කළමනාකරණ වැඩසටහන සංවර්ධනය වූ තෙවන කාල පරිච්ඡේදය 1986 දී වෙරළ ඛාදන

කළමනාකරණ මහා සැලැස්ම සම්පාදනය කිරීමෙන් පසුව එම සැලැස්ම ඩැනිඩා ආධාර පළමු අදියර (1987) සහ ඩැනිඩා ආධාර දෙවන අදියර යටතේ (2001 - 2007) කාලය තුළ ආසියානු සංවර්ධන බැංකු මූල්‍යාධාර යටතේ වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මකවීම මගින් හඳුනාගත හැකිය. මෙම අවදියේදී පවත්නා හොඳම ඉංජිනේරුමය තොරතුරු මත සැලසුම් සහගත වෙරළ ආරක්ෂණය ක්‍රියාත්මක කරන ලදී. මෙයට සමගාමීව හිරිගල් පර ඉවත් කිරීම සහ වැලි ඉවත් කිරීම පාලනය කිරීම, වෙරළබඩ පරිසර පද්ධති සංරක්ෂණය, අවිධිමත් සංවර්ධන කටයුතු පාලනය සහ මහජනයා දැනුවත් කිරීම වැනි අනෙකුත් කළමනාකරණ විකල්පයන් ද ක්‍රියාත්මක කරන ලදී.

වෙරළ ඛාදනය පාලනය කිරීම සඳහා වෙරළ සංරක්ෂණය සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව යොදා ගන්නා ලද ඉහත සඳහන් කළමනාකරණ ප්‍රවේශය ධනාත්මක ප්‍රතිඵල ළඟාකරදීමට සමත් විය. කළමනාකරණ පිළියම් මගින් අත්කර ගන්නා ලද සමස්ත සමාජ ආර්ථික ප්‍රතිලාභ දරන ලද පිරිවැය ඉක්මවා යන ලදී. මෙමගින් අත්කර ගන්නා ලද ප්‍රතිලාභ ඉඩම් සහ දේපල, යටිතල පහසුකම්, සංචාරක ස්ථාන, ධීවර යටිතල පහසුකම් ආරක්ෂාවීම මෙන්ම වෙරළබඩ ප්‍රදේශයන්හි ජනිත වූ ජීවනෝපායන් සහ රැකියාවන් මගින් මනාව පිළිබිඹු වේ.

### 2.1.1. ගැටලුවේ ස්වභාවය

වෙරළ ඛාදනය ශ්‍රී ලංකාවේ සැලකිය යුතු අඛණ්ඩව විවිධ මට්ටමින් පැවත එන ගැටලුවක් වන අතර එමගින් සමාජ ආර්ථික සහ පාරිසරික ප්‍රතිවිපාක ජනිත කරයි. ස්වභාවික හේතු මෙන්ම මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන වෙරළ ඛාදනය පොදු සහ පෞද්ගලික පිරිවැයක් අවශ්‍යයෙන් උපදවයි. වෙරළ තීරයන් අහිමි වීම, සංචාරක සහ විනෝදාත්මක කටයුතු අවහිරවීම, පොදු සහ පෞද්ගලික දේපල යටිතල පහසුකම් හානිවීම මෙයට ඇතුළත් වේ. වෙරළ ඛාදනය සඳහා වාර්ෂිකව කරනු ලබන විශාල පිරිවැය මෙන්ම හදිසි සහ ආපදා සහන සේවාවන් සඳහා දැරිය යුතු පිරිවැයද මීට ඇතුළත් වේ. 1985 - 1999 කාලය තුළ වෙරළ ඛාදන කළමනාකරණය සඳහා රුපියල් මිලියන 1520ක් වැයකොට ඇති අතර 2001 - 2007 කාලය තුළ දී ආසියානු සංවර්ධන බැංකුව සපයන ලද මූල්‍ය ආධාර යටතේ වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය මගින් රුපියල් බිලියන 3ක් වැයකොට ඇත. මීට අමතරව ඇමරිකානු ඩොලර් මිලියන 1.4ක් සුනාමියට බලපාන ලද ප්‍රදේශ පුනරුත්ථාපන (TAARP) වැඩසටහන යටතේ වෙරළ පුනරුත්ථාපනය සඳහා වැය කර ඇත. මෙයට අමතරව දකුණ, බටහිර සහ වයඹ වෙරළ තීරයන් සඳහා වැලි පෝෂණයට සහ අනෙකුත් වෙරළාරක්ෂක කටයුතු සඳහා රුපියල් බිලියන 2ක් මේ දක්වා වැයකර තිබේ. කෙසේ වුවත් පසුගිය දශක තුනෙහි දිවයිනේ උතුරු සහ නැගෙනහිර වෙරළ තීරයන්ගෙන් වාර්තා වී ඇති වෙරළ ඛාදන සිද්ධීන් අවම මට්ටමක පවතී. නැගෙනහිර සහ උතුරු ප්‍රදේශයෙන් වෙරළ තීර සම්බන්ධව වෙරළ ආරක්ෂණය සඳහා වූ ආයෝජනයන් පවතිනුයේ අවම මට්ටමක ය.

වෙරළ ඛාදනය හා සම්බන්ධ ප්‍රධාන ගැටලුවක් ලෙස වෙරළ තීරයන්ට ලැබෙන වැලි ප්‍රමාණයන්ගේ අඩුවීම හඳුනාගෙන ඇත. සුළං සහ කෙටි රළ මගින් හටගන්නා වෙරළාන්ත දිය වැල් මගින් ප්‍රධාන වශයෙන් වැලි වෙරළ තීරයේ එක් ප්‍රදේශයක සිට වෙනත් ප්‍රදේශයකට ප්‍රවාහනය කෙරේ. එය අඛණ්ඩ ක්‍රියාවලියක් වන අතර ප්‍රමාණවත් අඛණ්ඩ වැලි සැපයුමක් සහිත වෙරළ තීරයක් සහිත ප්‍රදේශයන්හි වෙරළ ඛාදනය ගැටලුවක් වී නොමැත. වෙරළබඩ වැලි ප්‍රවාහන ක්‍රියාවලිය සඳහා ප්‍රමාණවත් වැලි සැපයුමක් නොවන්නේ නම් හෝ වෙරළ තීරයන් වෙරළාරක්ෂිත නිර්මාණ මගින් අවහිර වී ඇත්නම් ඊට ආසන්න වෙරළ තීරයේ ඛාදනය ඇතිවීම වැළැක්විය නොහැක.

දැනට පවත්නා තොරතුරු අනුව පසුගිය වසර පහක පමණ කාලයේ දී (2007-2012) ලංසිගමට උතුරින් පිහිටි වෙරළ තීරයේ ඉහළ වෙරළ ඛාදන සීඝ්‍රතාවක් වාර්තා වී ඇත. මෙම තත්ත්වය වසර 2000 - 2005 කාලය තුළ මහඔය - ලංසිගම වෙරළ තීරයේ වාර්තා වූ ඉහළ ඛාදන සීඝ්‍රතාවය වේ. එලෙසම උග්‍ර වෙරළ ඛාදන සීඝ්‍රතාවයක් 2010 වසරේදී ඕලුවිල් වරායට උතුරින් පිහිටි වෙරළ තීරයෙන් ද වාර්තා වී තිබේ. වගුව 2.1 මගින් 2010 - 2013 කාලය තුළ වාර්තා වී ඇති හදිසි වෙරළ ඛාදන අවස්ථාවන් පෙන්වා දී ඇත. වෙරළ විවර්ධනය (වැලි එකතුවීම) ස්ථාන කිහිපයක පමණක් සිදු වී ඇති අතර වාර්තාගත වී ඇති එම සීඝ්‍රතාවය වෙරළ ඛාදන සීඝ්‍රතාවයට වඩා අඩු මට්ටමක පවතී. ව්‍යුහාත්මක හා ව්‍යුහාත්මක නොවන කළමනාකරණ ක්‍රමෝපායන් භාවිතා කළ ද, වෙරළ ඛාදනය දිගින් දිගටම පවත්නා ගැටලුවක් බව වගුව 2.1 පෙන්වා ඇති පරිදි 2010 - 2013 කාලය තුළ වර්තා වී ඇති හදිසි වෙරළ ඛාදන සිද්ධීන්ගෙන් පෙනී යයි.

වගුව 2.1 : වාර්තා වී ඇති හදිසි වෙරළ ඛාදන ස්ථාන 2010 - 2013

| *දිස්ත්‍රික්කය* | *ඛාදන ස්ථානය* |
|---|---|
| පුත්තලම | කුඩාව - කන්දකුලිය<br>මුතුපන්තිය - නගුල්එළිය<br>ආරච්චිකට්ටුව<br>ඉලන්තඩිය - නොරොච්චෝල වෙරළ<br>තල්විල - අඹකන්දවිල වෙරළ<br>මාරවිල වෙරළ<br>මෝදර - බරුදූල්පොල වෙරළ<br>කප්පල්අඩිය |
| ගම්පහ | මහ ඔය<br>උස්වැටකෙයියාව<br>වත්තල - හැඳල<br>පරණ අම්බලම<br>දූන්ගල්පිටිය |
| කොළඹ | වෙඩිකන්ද - රත්මලාන<br>දෙහිවල - ගල්කිස්ස |
| කළුතර | මාගල්කන්ද වෙරළ<br>බේරුවල - මග්ගොන<br>පොතුපිටිය<br>බේරුවල - මරදාන<br>බේරුවල - කොඩ්ඩිමලේ |
| ගාල්ල | අහංගම<br>උණවටුන<br>පලටුගහ<br>ගොයම්බොක්ක වෙරළ<br>ගිංතොට<br>අහංගම<br>ඉඳුරුව<br>බූස්ස<br>දෙඩංදූව |
| මාතර | කොටුවෙගොඩ |
| හම්බන්තොට | වැලිපටන්විල<br>පල්ලිකුඩාව<br>යාරවත්ත<br>තංගල්ල<br>උනාකුරුව |
| අම්පාර | ඔලුවිල්<br>කල්මුනේ |
| ත්‍රිකුණාමලය | වෙරුගල්<br>මුරුගන් කෝවිල් - කුච්චවේලි<br>සල්ලි - මුත්තුඅම්මාන් කෝවිල අසල<br>කින්නියා<br>මුත්තූර් |
| මන්නාරම | අරිප්පු |

(*මූලාශ්‍රය* : වෙරළ තීර තත්ත්ව වාර්තාව 2014)

රළු මුහුද පවතින කාලයන්හි දී රළ මගින් වෙරළ වෙත අවසාදිත ගෙන එනු ලබයි. බොහෝවිට මෙලෙස ප්‍රවාහනය වන අවසාදිතවලින් වැඩි කොටසක් නොගැඹුරු මුහුදේ තැන්පත් වන අතර මුහුද රළු නොවන කාලයේ දී රළ මගින් එම අවසාදිතවලින් කොටසක් වෙරළ වෙත නැවත ගෙන එනු ලබයි. මේ අනුව මුහුද රළු කාලයේ වෙරළ ඛාදනයත් රළු නොවන කාලයේ වෙරළ විවර්ධනයත් ඍතුමය ලෙස සිදුවන අතර එය වෙරළේ ස්වාභාවික හැසිරීම ලෙස සැලකිය හැකිය.

වෙරළේ ස්වභාවික හැසිරීම දරාගැනීම සඳහා ඉතා සීමිත ප්‍රදේශයක් පවතින බැවින් වෙරළ ඛාදනය සහ වෙරළබඩ භූමිය සහ දේපල ආරක්ෂා කිරීම සඳහා වඩාත් ලාභදායී හෝ ක්ෂණික පිළියම වූයේ දෘඪ වෙරළාරක්ෂක නිර්මාණයන් ඉදිකිරීමය. ඇතැම්විට මෙවැනි නිර්මාණ නිසා කලකට පසුව ආසන්න ප්‍රදේශයන්හි වෙරළ ඛාදනය ඉස්මතු විය හැකියි.

### 2.1.2 අතීත කළමනාකරණ ක්‍රියාකාරකම් සහ ඒවායේ බලපෑම්

**මුල් කාලීන මූලාරම්භය**

1970 ගණන්වලට පෙර වකවානුවලදී වෙරළ ඛාදනය අවම කිරීම සඳහා ගන්නා ලද මැදිහත්වීම් ඒවායේ තත්කාර්ය ස්වභාවය නිසාවෙන් තාවකාලික විසඳුම් ලෙස හැඳින්විය හැක. වෙරළ ඛාදනය, එමගින් ඇතිවන ගැටලු සහ විශේෂයෙන් සම්පත් පරිහරණ පුරුදු වැනි මානව ක්‍රියාකාරකම් අතර ඇති සම්බන්ධතාවය ඒ වනවිට හඳුනාගෙන නොතිබුණි. මෙම අවධියේදී යොදාගන්නා ලද සියලු ඉංජිනේරු විසඳුම් "වෙරළ තීරය පමණක් රැකගමු" යන මූලධර්මය මත පදනම් විය. මෙයට හේතු වූයේ නාගරීකරණය හේතු කොට වෙරළ තීරයන්ගේ නම්‍යතාව නැතිවීමයි. එවිට මෙම ක්‍රියාවලියේ දී වෙරළ ඛණ්ඩයේ සම්පූර්ණ තත්ත්වය සහ ගතික ස්වභාවය මෙන්ම එම වෙරළ කණ්ඩයේ සිදුවන මිනිස් ක්‍රියාකාරකම් සැලකිල්ලට ගෙන නොමැත. වෙරළ කලාපයේ යටිතල පහසුකම් සැලසුම් සහගතව සංවර්ධනය නොවීම මත, මෝසම් කාලවලදී ඇති වන වෙරළ ඛාදන සිද්ධීන් හේතුකොට වෙරළබඩ ප්‍රජාවගේ සමාජීය සහ ආර්ථික කටයුතුවලට බලපෑම් ඇති කරයි. මේ නිසා මුල්කාලයේ සිදුකරන ලද වෙරළ ආරක්ෂණ කටයුතුවල සඵලත්ව ඉතා අඩු මට්ටමක පැවති බව නිරීක්ෂණය කළ හැකි අතර වක්‍ර බලපෑම් මධ්‍යම ප්‍රමාණයෙන් පවත්වා ගැනීමට හැකි වූ බව පෙනී යයි.

**1980 ප්‍රථම භාගයේ දී ක්‍රියාවට නංවන ලද මූලාරම්භය**

1978 වසරේ දී ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය යටතේ වෙරළ සංරක්ෂණ අංශය බිහිවීමත් සමග සැලසුම් සහගත වෙරළ ආරක්ෂණ යෝජනා ක්‍රම ආරම්භ විය. ඉන් අනතුරුව ඉටුකිරීමට පැවරී ඇති කාර්යයේ වැදගත්කම හඳුනාගැනීමෙන් පසුව එය 1984 ජනවාරි මාසයේ දී රජයේ දෙපාර්තමේන්තුවක් ලෙසින් ස්ථාපිත කරන ලදී. මෙම කාලය තුළ සිදුකරන ලද සැලසුම්ගත වෙරළ ආරක්ෂණ කටයුතු බොහෝදුරට පැතිබැම්, පනාබැම් සහ ගල්පෙට්ටි යෙදූ බැම් (gabions) යනාදියට සීමා විය. එයට අමතරව වෙරළ කලාපයෙන් වැලි සහ හිරිගල් පර ඉවත් කිරීම වැනි සම්පත් ඉවත් කිරීමේ ක්‍රියාකාරකම් පාලනය කිරීම සඳහා අනෙකුත් කළමනාකරණ පිළියම් ක්‍රියාත්මක කරන ලදී. 1970 ට පෙර ක්‍රියාත්මක කරන ලද වෙරළ ආරක්ෂණ කටයුතුවලට වඩා සැලසුම් සහගතව ක්‍රියාත්මක කරන ලද වෙරළාරක්ෂක පිළියම්වල සඵලත්වය ඉහළ මට්ටමක පැවතිනි. කෙසේ වුවත් වෙරළ ඛාදනය අවම කිරීම සඳහා යොදාගන්නා ලද දෘඪ වෙරළ ආරක්ෂණ පිළියම්වල ප්‍රතිඵලයක් ලෙස මාදැල් ධීවර කටයුතු, විනෝදාත්මක කටයුතු සහ වෙරළ පිවිසුම් පහසුකම් අවහිර වීම සිදුවිය.

**වෙරළ ඛාදන කළමනාකරණ මහා සැලැස්ම යටතේ ක්‍රියාකාරකම් (Master Plan for Coastal Erosion Management)**

1986 අගෝස්තු මස දී ඩැනිඩා තාක්ෂණික ආධාර යටතේ වෙරළ ඛාදන කළමනාකරණ මහා සැලැස්ම සම්පාදනය කිරීමත් සමග වෙරළ ඛාදන කළමනාකරණය සඳහා යොදාගන්නා ලද සමස්ත ප්‍රවේශය වඩාත් ඵලදායී මාවතකට ප්‍රවිෂ්ඨ විය. මෙමගින් දිගුකාලීන ප්‍රශස්ථ පිළියම් ප්‍රවර්ධනය කෙරිනි. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ ඩෙන්මාර්ක් ජල හසුරු ආයතනයේ (DHI) විශේෂඥයින්ගෙන් සමන්විත කණ්ඩායමක් මගින් කරනු ලැබූ පුළුල් සමාජ ආර්ථික, පාරිසරික සහ තාක්ෂණික විශ්ලේෂණයන් හේතුකොට ශ්‍රී ලංකාවේ වෙරළ ඛාදන ගැටලුව සීමිත දත්ත සහ තොරතුරු ප්‍රමාණයක් මත අර්ථකථනය කරන ලද අතර එක් එක් වෙරළ තීරවල සිදුවිය හැකි ඛාදන අවම කිරීම සඳහා යොදගත හැකි හොඳම තාක්ෂණික ප්‍රවේශය නිර්දේශ කරන ලදී. එම කටයුතු සඳහා අවශ්‍යවන ප්‍රාග්ධන ආයෝජන ප්‍රමාණයන් ද අර්ථකතනය කරන ලදී. 1986 සිට වෙරළ ඛාදන කළමනාකරණ පිළියම් ඩැනිඩා අදියර 1 (1987 - 1989), ඩැනිඩා අදියර 2 (1990 - 1992) ජර්මන් තාක්ෂණික ආධාර (1988 - 1996) ආසියානු සංවර්ධන බැංකු ආධාර සහ ශ්‍රී ලංකා රජයේ අරමුදල් මත වූ වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (2000 - 2007) මත වෙරළ ඛාදන කළමනාකරණ මහා සැලැස්ම

(MPCEM) අනුකූලව සිදු කරන ලදී. වෙරළ ආරක්‍ෂණ පිළියම්, මහා සැලැස්මට අනුව භූගෝලීය වශයෙන් සම්පාදනය කරන ලද අතර එක් එක් වෙරළ ඛණ්ඩ අනුව ගැඹුරු මුහුදේ දිය කඩන සමග කෘතිම වැලි පෝෂණය, පැතිබැම් සහ පනා බැම් ඇතුළු ව්‍යුහාත්මක පිළියම් සහිතව ප්‍රධාන ප්‍රදේශ (Key Area) සහ කේවල ස්ථාන (Singular Cases) ලෙස වර්ගීකරණය කරන ලදී.

මෙයට අමතරව සංවර්ධන කටයුතු සඳහා වූ වෙරළාරක්‍ෂිතයන් (Singular Cases), වැලි සහ හිරිගල් පර ඉවත් කිරීම අවම කිරීම සඳහා රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සහ මහජන අධ්‍යාපනය සහ දැනුවත් කිරීම් ප්‍රවර්ධන කිරීම වැනි අනෙකුත් කළමනාකරණ පිළියම් ද ක්‍රියාත්මක කරන ලදී. වෙරළ ඛාදන කළමනාකරණය පිළිබඳ වූ මහා සැලැස්ම යටතේ ක්‍රියාත්මක කරන ලද සැලසුම්ගත වෙරළාරක්‍ෂණ කටයුතුවල සඵලත්වය සහ ප්‍රතිඵල මගින් වඩාත් ඉහළ මට්ටමක සාර්ථකත්වයක් පෙන්නුම් කරන අතර මධ්‍යම ප්‍රමාණයෙන් වක්‍ර බලපෑම් පෙන්නුම් කරයි.

මෙතෙක් ගණනය කරනු නොලැබුවත්, මෙම පිළියම් මගින් සැලකිය යුතු සමාජීය, ආර්ථික සහ පාරිසරික ප්‍රතිලාභ ළඟාකරගෙන ඇතිබව පෙනී යයි. අතීත වෙරළ ආරක්‍ෂක පිළියම් මගින් ලබාගත් ප්‍රතිලාභ ප්‍රධාන වශයෙන් දැකිය හැක්කේ මහා මාර්ග, දුම්රිය මාර්ග, පෞද්ගලික සහ පොදු නිවාස, ධීවර යටිතල පහසුකම් සහ සංවර්ධන සහ විනෝදාත්මක පහසුකම් ආරක්‍ෂා කිරීම මගිනි. මෙයට අමතරව මහා සැලැස්ම ක්‍රියාත්මක වීමෙන් පසු වෙරළ ආරක්‍ෂණය සඳහා අවශ්‍ය වූ පෞද්ගලික ආයෝජන සඳහා අවශ්‍යතාව සැලකිය යුතු ලෙස අඩු විය.

### 2.2 ගැටලු, තර්ජන සහ අභියෝග

#### 2.2.1. වෙරළ ඛාදනයට දයකවන ස්වාභාවික ක්‍රියාවලි සහ සිද්ධීන්

ශ්‍රී ලංකාවේ බොහෝ වෙරළ තීරයන් අඛණ්ඩ ඛාදනයට සහ විවර්ධනයට භාජනය වේ. ඇතැම් වෙනස්වීම් ඍතුමය වන අතර තවත් සමහර ස්ථානවල වඩා ස්ථාවරව සිදු වේ. වෙරළ ඛාදනයට දයකවන ස්වභාවික ක්‍රියාවලිය පහත දැක්වේ.

- ඇතැම් ගංගාවලින් වෙරළට සැපයෙන වැලි ප්‍රමාණයේ ස්වභාවික වෙනස් වීම්.
- කුඩා වැලි වැටි (sand berm) සේදී යාම හේතුකොට ගෙන රට අභ්‍යන්තරයේ පවත්නා වැලි නැති වී යාම
- දැඩි රළ සහ උදම් තත්ත්වයන් යටතේ ගැඹුරු මුහුදේ වැලි නැති වී යාම
- ආගාධයන් වෙත ඇදීයාම නිසා වැලි නැති වී යාම.
- වැලි තුඩු සහ වැලි වැටිවල වෙරළේ ඇති වැලි තැන්පත් වීම
- වෙරළබඩ ගහකොළ විනාශ වීම
- සුනාමි, සුළි සුළං වැනි අනෙකුත් ස්වභාවික ආපදාවන්
- සංකේන්ද්‍රීය ප්‍රදේශයන් (Nodal Area) වෙතින් ද්‍රව්‍ය නැතිවී යාම
- මුහුදු මට්ටම ඉහළ යාම

ශ්‍රී ලංකාවේ වෙරළ ඛාදනයට දායකවන සාධක අතර ඉතා වැදගත් සාධකය වනුයේ වෙරළබඩ ප්‍රවාහය මගින් වෙරළට ලැබෙන සහ වෙරළෙන් පිටවන අවසාදිත ප්‍රමාණයේ අසමබරතාවයි. වෙරළබඩ ප්‍රවාහය ප්‍රධාන වශයෙන් ඇති වනුයේ මෝසම් මගින් ඇති කරනු ලබන කෙටි සුළං රළ සහ දිගු රළ මගින් ආසන්න වෙරළ තීරයේ අවසාදිතවලට සිදුවන බලපෑමයි. වෙරළට සපයන වැලි ප්‍රමාණයේ සහ වෙරළබඩ ප්‍රවාහයේ ඇති ධාරිතාවය හේතුවෙන් වෙරළෙන් ඉවත්වන වැලි ප්‍රමාණයේ සැලකිය යුතු විචල්‍යතාවක් පවතී. නිරිත දිග වෙරළ තීරයේ ඛාදනය සිදුවනුයේ ගංගා මගින් එම වෙරළට ලැබෙන වැලි ප්‍රමාණයට වඩා වැඩි වැලි ප්‍රමාණයක් රැගෙන යා හැකි වෙරළබඩ ප්‍රවාහ ධාරිතාවයක් ඇති බැවිනි.

මහ ඔයෙන් අධික ලෙස වැලි ඉවත් කිරීම නිසා වෙරළේ ඇති වී තිබෙන විශාල වැලි හිඟය හේතු කොට මීගමුවෙන් උතුරු දෙසට ඇති වෙරළ තීරයෙන් ඉතා උග්‍ර වෙරළ ඛාදනයන් වාර්තා වී ඇති අතර මෙම ප්‍රදේශයේ සෘජුව පිහිටි වෙරළ තීරයක් තිබීම ද ඛාදනය උග්‍රවීමට හේතු වී ඇත. දැනට තිබෙන තොරතුරු අනුව දකුණු වෙරළ තීරයට සැපයෙන වැලි ප්‍රමාණය ද පහත් මට්ටමක පවතී. නමුත් වැඩි වශයෙන් බොකු සහ තුඩු සහිත වෙරළ භූරූපනයක් මෙහි පවතින බැවින් වෙරළ තීරය සාපේක්ෂ වශයෙන් ස්ථායි වේ.

දේශගුණික විපර්යාස පිළිබඳ ජාත්‍යන්තර කමිටුවේ (IPCC) ඇස්තමේන්තු අනුව අහිතකර වායු (හරිතාගාර වායු) මුදාහැරීම ඉහළ යාම මගින් ග්‍රීන්ලන්තයේ සහ ඇන්ටාර්ක්ටිකාවේ අයිස් තට්ටු දියවීම පාදක කොටගෙන 21 වන සියවසේ දී ගෝලීය සාගර මට්ටම සෙ.මී. 30 - 40 ප්‍රමාණයෙන් ඉහළ යා හැකි බවට අනුමාන කෙරේ. මේ අනුව මුහුදු මට්ටම ඉහළ යාම හේතුවෙන් වෙරළ ඛාදනය ඉහළයාමට ඇති අවස්ථාව නොසලකා හැරිය නොහැක. කෙසේ වුවත් ගංගා මුවදොර, කලපු වැනි සාගරයට ජලය ඇතුළුවන ස්ථානයන්හි වෙරළ තීරයන් ගත්කළ එහි ඇතිවිය හැකි වෙරළ ඛාදනය ගණනය කිරීම වඩා සංකීර්ණ වේ. අධික වර්ෂාව නිසා ජලයෙන් යට වීම, ද්‍රෝණි පිරීමේ බලපෑම සහ කරදිය මිශ්‍රවීම ආදී වෙනත් සාධක මෙම ස්ථානවලට බලපානු ලබයි. ජලතල ආශ්‍රිත මෙම අහිතකර බලපෑම් සහ ලවන ජලය කාන්දුවීම මුහුදු මට්ටම ඉහළ යාම සමග අධික ලෙස වේගවත් වනු ඇත.

ස්වාභාවික වෙරළ ඛාදනයට බලපාන එක් සාධකයක් වනුයේ ශුද්ධ ප්‍රවාහන දිශාව වෙත ප්‍රවාහන සීඝ්‍රතාවේ අනුක්‍රමණය වැඩිවීමය. මෙම තත්ත්වය යම් යම් ස්ථානයන්හි දී රළ තත්ත්වයේ වෙනස් වීම, කවාකාර වෙරළ තීරයන් පැවතීම හෝ විශේෂ අගාධමිතික තත්ත්වයන් හේතුකොට සිදුවිය හැකි මුහුදු රළ ප්‍රබලත්වය මත විවර වීම මගින් ගොඩබිම වෙතින් වැලි සේදීයාම, බාධක දූපත් ප්‍රමාණය ඉක්මවා සේදී යාම, සුළං මගින් වන වැලි ප්‍රවාහනය, දැඩි රළ සහ උදම් තත්ත්වයන් හේතුකොට ගැඹුරු මුහුද වෙත වැලි ඇදී යාම ද මෙයට හේතු වේ. එමෙන්ම උස් රළ මගින් වැලි වැටි මුහුද දෙසට තල්ලුවීමත් දැඩි උදම් තත්ත්වයන් හේතුකොට ගැඹුරු මුහුද වෙත වැලි ඇදී යාමත් නිසා පැතිකඩෙහි අසමතුලිතතාවයක් ද ඇති විය හැකිය.

වැලි තුඩුවල කෙළවරින් බැහැරවන වැලි වෙරළ තීරයන්හි තැන්පත්වන අතර වෙරළාශ්‍රිත සක්‍රීය ප්‍රදේශයන්හි (Litoral cells) හැරවුම් ස්ථානයන්හි පිහිටි වැලිතුඩුවල සුළං මුවාව පැත්තෙන් බැහැරවන වැලි ගැඹුරු මුහුද දිශාවට ඇදී යයි. මෙලෙස බැහැර වන වැලි මගින් වැලි එක්රැස්වන වෙරළ තීරයන් ඇතිවීමත්, වැලි තැන්පත් වන ප්‍රදේශයන්හි දිය යට වැලිපර ඇති වීමක් සිදුවන නමුත් වෙරළ තීරයන්හි ඉහළ ප්‍රදේශයන්ට වැලි අහිමි වේ. මුහුද වෙත නෙරා ඇති වෙරළ ප්‍රදේශයන්ගෙන් එක් පැත්තකින් හෝ දෙපැත්තෙන්ම ද්‍රව්‍ය බැහැරවීම වෙරළ ඛාදනයට හේතුවන ස්වභාවික සාධකයකි. වැලිගල්පර වැනි අර්ධ වශයෙන් දැඩි (semi-hard) ඉදිරියට නෙරා ඇති තුඩු දෙකක් අතර ඇති අවසාදිත මගින් නිර්මාණය වී ඇති වෙරළ තීරයක වෙරළ ඛාදනය ඇතිවිය හැකිය. අවසාදිතවලින් සමන්විත වෙරළ තීරයන් නිර්මාණය වීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ස්වභාවිකව මෙම දැඩි කොටස් මගින් සපයා ඇත. මෙම වෙරළ තීරයන්හි හැඩය බොහෝවිට රඳාපවතින්නේ අර්ධ වශයෙන් දැඩි කොටස් පැවැත්ම සහ මුහුදු රළෙහි ස්වභාවය මතයි. මෙම වෙරළ තීරයන් මූලික වශයෙන් ද්‍රව්‍ය තැන්පත් වන ස්වරූපයක් ගත්තද, අර්ධ දැඩි කොටස් දිගින් දිගටම ඛාදනය වන බැවින් මෙම අවසාදිත වෙරළ තීරයන් ද ඛාදනයට භාජනයට වේ.

ස්වභාවික වෙරළ ඛාදනයට බලපාන තවත් හේතුවක් වනුයේ මුහුදු රළ විශාල ආනතියකින් වෙරළට ළඟා වීමයි. මෙවැනි වෙරළ තීරයන්හි වෙරළ තීරයට සමාන්තරව වැලි තුඩු නිර්මාණය වීමට නැඹියාවක් පවතී. මෙවැනි ස්ථානයන්හි වැලි එක්රැස් වූ විට වෙරළ තීරයට ඇති වැලි සැපයුම ගැඹුරු මුහුද වෙත ගලායාමක් සිදුවන අතර එවිට එම වෙරළ තීරයේ පහළ කොටසට වැලි හිඟ වීමෙන් ඛාදනය සිදු වේ.

### 2.2.2 වෙරළ ඛාදනය සහ වෙරළ ආරක්ෂණ කටයුතු කෙරෙහි 2004 වර්ෂයේ සුනාමි ව්‍යසනයේ බලපෑම

2004 වසරේ දෙසැම්බර් මස 26 වන දින ඉන්දුනීසියාවේ සිදු වූ භූ කම්පනයෙන් පැය දෙකකට පසුව උස් රළින් යුත් ආසියානු සුනාමිය ශ්‍රී ලංකා වෙරළ තීරය මතට පතිත විය. මීටර් 1 සිට මීටර් 15 උසින් යුත් රළ පහර එකේ සිට තුන දක්වා ප්‍රමාණයෙන් ඒ ඒ ස්ථාන අනුව වාර්තා වී ඇත. අම්පාර දිස්ත්‍රික්කයේ කොඩ්ඩියාර් වෙරළේ වැඩිම උසින් වූ මීටර් 15 රළ වාර්තාවූ අතර කුරුකාලමඩම් සහ හම්බන්තොට නගරයෙන් උසින් මීටර් 12ක් වූ සුනාමි රළ වාර්තා විය. මීටර් 10 ක උසින් යුත් සුනාමි රළ මාන්කනි, පොතුවිල්, පුන්නෙයිකුඩා, කිරින්ද සහ හම්බන්තොට නගරයේ රතුපස් ගොඩනැගිල්ලෙන් ද මීටර් 8 උසින් වූ රළ පැරලියෙන් සහ කහදමෝදරින් වාර්තා වී ඇත. නැගෙනහිර වෙරළ තීරයට සුනාමි රළ ප්‍රථමයෙන් අවතීර්ණ වී ඉන් අනතුරුව වෙරළබඩ පරිපාලන දිස්ත්‍රික්ක 14 න් 12 ක් ආක්‍රමනය කරමින් ශ්‍රී ලංකාවේ දකුණු දිග තුඩුව හා උතුර දක්වා ව්‍යාප්ත විය. භූරූපනය සහ වෙරළබඩ ආරක්ෂිත ව්‍යුහයන් අනුව දිවයිනේ දකුණු දිග වෙරළ ප්‍රදේශය විවිධ මට්ටමින් මුහුදු ජලයෙන් යටවිය. මීටර් කිහිපයක සිට කි.මී. 3.5 දක්වා රට අභ්‍යන්තරයට ලවන ජලය ගලායාම සිදු විය. ඉතා ඉහළ මට්ටමෙන් ජලයෙන් යටවීම වාර්තා වී ඇත්තේ මඩකලපුව සහ කුච්චවේලි ප්‍රදේශයන්හි කි.මී. 2ක් වශයෙනි. පැරලියේ මෙලෙස ජලයෙන් යටවූ ප්‍රදේශය ද, කි.මී. 2 රට අභ්‍යන්තරයට වාර්තා වී ඇත. දකුණු දිග වෙරළ තීරයේ කලපුවල මෙලෙස ජලයෙන් යට වූ සීමාව කි.මී. 3.5 දක්වා විහිදිනි. (ශ්‍රී ලංකාවේ දෙසැම්බර් 26 ඉන්දියන් සාගර සුනාමිය පිළිබඳ සමීක්ෂණය, ජේම්ස් ගොන්, ජාත්‍යන්තර සුනාමි සමීක්ෂණ කණ්ඩායම - TST).

මානව ක්‍රියාකාරකම් හේතුකොට හිරිගල්පර, වැලිකඳු සහ වෙරළබඩ තුරුලතා වැනි පාරිසරික සම්පත්වලට වී ඇති හානි සිදු වී ඇති ස්ථානයන්හි වෙරළ කලාපයේ සුනාමි බලපෑම ඉතා උග්‍ර වී ඇත. සුනාමි උවදුරින් පසුව වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය මගින් කරන ලද ඇස්තමේන්තු අනුව වෙරළ ආරක්ෂක නිර්මාණ බොහොමයක් නිරිත දිග වෙරළ තීරයේ හානි වී ඇති අතර ඇතැම් වෙරළ තීරයන් සහ වැලිතුඩු දැඩි ලෙස ඛාදනය වී ඇත.

### 2.2.3 වෙරළ ඛාදනය වේගවත් කරන මානව ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකාවේ දියත් කරන ලද වෙරළ ඉංජිනේරු සමීක්ෂණ මගින් පෙනී ගොස් ඇත්තේ වෙරළ කලාපයේ සහ ඉන් පිටත සිදුවන මානව ක්‍රියාකාරකම් සහ වර්ධනය වන වෙරළ ඛාදනය අතර සහසම්බන්ධතාවක් පවතින බවයි. වෙරළින් සහ ගංගාවලින් වැලි ඉවත් කිරීම සහ හිරිගල්පර ඉවත් කිරීම පිළිබඳව කරන ලද සමාජ ආර්ථික සමීක්ෂණයන් සහ අධ්‍යයනයන්, ගංගා හරහා වේලි ඉදිකිරීම් සහ වෙරළාරක්ෂක ඉදිකිරීම් පිළිබඳව කරන ලද අධ්‍යයනයන් මගින් මෙය තවදුරටත් තහවුරු කොට ඇත. වගුව 2.2 මගින් වෙරළ ඛාදනයට ඉවහල්වන මිනිස් කටයුතු සහ ඒවායේ බලපෑම පිළිබඳව සාරාංශයක් ඉදිරිපත් කර තිබේ.

වගුව 2.2 ශ්‍රී ලංකාවේ වෙරළ ස්ථායිතාව කෙරෙහි බලපාන මානව ක්‍රියාකාරකම්

| ක්‍රියාකාරකම | වර්තමාන තත්ත්වය | ප්‍රතිඵල | වෙරළට වන බලපෑම් | බලපෑම් ඇති ස්ථාන පිළිබඳ නිදසුන් |
|---|---|---|---|---|
| වෙරළින් වැලි ගොඩ දැමීම | මධ්‍යස්ථ | වෙරළබඩ ප්‍රවාහයේ ක්‍රියාවලිය සඳහා පවත්නා වැලි පරිමාව අඩුවීම | වෙරළ හා වෙරළ ඛාදනයට තුඩු දීම | පානදුර, ලුනාව |
| ගංගාවලින් වැලි ගොඩ දැමීම | ඉහළ | ගංගා මගින් වෙරළට සැපයෙන වැලි ප්‍රමාණය අඩුවීම, කරදිය ඇතුලුවීම | වෙරළ සහ ගංගා ඉවුරු ඛාදනයට ලක්වීම | කැලණි, නිල්වලා, මහඔය, කළුගඟ |
| වෙරළින් සහ වෙරළ ඉමෙන් හිරිගල් කැබලි එක්රැස් කිරීම | පහළ | ස්වභාවික හිරිගල්පර නිර්මාණය පහළ යාම | වෙරළ ඛාදනය ඉහළ යාම | රැකව, අහංගම |
| හිරිගල්පර කැණීම | පහළ | ස්වභාවික බාධකයන් විනාශවීම හිරිගල්පර අතර හිඩැස් ඇතිවීම | වෙරළ වෙත එන රළෙහි ශක්තිය වැඩිවීම. වෙරළ ඛාදනය උග්‍රවීම | සීනිගම, රැකව |
| වෙරළට ආසන්නව ගොඩනැගිලි සහ යටිතල පහසුකම් ස්ථාපිත කිරීම | ඉහළ | වෙරළ ස්ථායිතාව අඩුවීම | වෙරළ හා සමුද්‍රීය පරිසරය දූෂණය වීම | උණවටුන, හික්කඩුව |
| වරායට ඇතුළු වන මාර්ග සහ පිවිසුම් ඇළ මාර්ග සඳහා වූ නඩත්තු කැණීම් | මධ්‍යස්ථ | වෙරළබඩ ප්‍රවාහයෙන් වැලි ඉවතට ගැනීම | වෙරළබඩ ගොඩනැගිලි විනාශවීම වෙරළ ඛාදනය උග්‍රවීම | කොළඹ වරාය |
| වෙරළබඩ තුරුලතා ඉවත් කිරීම | මධ්‍යස්ථ | වෙරළ ස්ථායිතාව අඩුවීම, ඛාදනයට සහ සුළඟට නිරාවරණය කිරීම | වෙරළ ඛාදනය උග්‍රවීම | රොන්මඩ තැන්පත් වූ වෙරළ තීරයන්හි ඛාදනය අපේක්ෂා කළ හැක. |
| සැලසුම් රහිතව වෙරළාරක්ෂක නිර්මාණ ඉදි කිරීම | මධ්‍යස්ථ | ආසන්න වෙරළ තීරයන්හි ස්ථාවර බව අඩුවීම | වෙරළ ඛාදනය උග්‍රවීම හෝ ආසන්න වෙරළ තීරයන් විවර්ධනය | ඔලුවිල් වරාය |

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් ඉටුකර ඇති කළමනාකරණ පිළියම්වල සඵලතාව මත පරායත්තව නමුත් විවිධ මට්ටමින් ඉහත ලැයිස්තුගත කරන ලද මානව ක්‍රියාකාරකම්වල බලපෑම වෙරළ ඛාදනය කෙරෙහි සැලකිය යුතු ලෙස දායක වේ.

**වෙරළබඩ ව්‍යුහයන් මගින් වන බාධා**

බොහෝ විට පනාබැම්, වෙන් වූ දියකඩන, මුහුදු බැම්, ගංගා මුවදොරවල ඉදිකරනු ලබන දියකඩන සහ ජැටි වැනි දෘඪ වෙරළාරක්ෂක නිර්මාණ මගින් වෙරළබඩ ද්‍රව්‍ය ප්‍රවාහයට බාධා පමුණුවන අතර ඒවා වෙරළ ඛාදනය උග්‍රවීමට ද දායක වේ. මෙවැනි නිර්මාණ මගින් බලපෑම් රාශියක් ඇති කරනු ලබයි.

- ❖ වෙරළබඩ ප්‍රවාහයෙන් සපයන වැලි වෙරළාරක්ෂක නිර්මාණයන් මගින් රඳවාගනු ලබන බැවින් දියකඩන වැනි ඉදිකිරීම් කළ පසු පහළ ප්‍රදේශයන්හි වෙරළ ඛාදනයට ලක් වේ.
- ❖ රළ පරාවර්තනය වන රටාවේ වන වෙනස් වීමත් ඒ සමග රළවල ශක්තිය ගැඹුරු මුහුද දෙසට, වෙරළ දෙසට සහ වෙරළ දිගේ ව්‍යාප්තවීම.
- ❖ දැනට පවත්නා වෙරළබඩ දියවැල් ස්වරූපය සහ උදම්වල ස්වභාවය වෙනස් විය හැකිය.
- ❖ අක් වෙරළින් වැලි ඇදීයාම
- ❖ වරායවල පිටත සහ ඇතුළුවන ප්‍රවේශ මාර්ගයන්හි වැලි තැන්පත් වීම.

**වෙරළබඩ ස්ථායිතාවට අහිතකර බලපෑම් ඇති කරන සංවර්ධන කටයුතු**

දෘඪ සමුද්‍රික ඉදිකිරීම්වලට අමතරව සංචාරක, වානිජ සහ නේවාසික කටයුතුවලට අදාළ ගොඩනැගිලි සහ අනෙකුත් සංවර්ධන කටයුතු වෙරළට ඉතා ආසන්නව ස්ථානගත කිරීමෙන් වෙරළබඩ ක්‍රියාවලියට සීමාවන් ඇතිවන අතර වෙරළ කලාපයේ වෙරළ ඛාදනය කඩිනම් කිරීමට හේතු විය හැකිය. මෙයට අමතරව වෙරළ කලාපය ඔබ්බෙන් රට අභ්‍යන්තරයේ ඉදි කරනු ලබන වාරිමාර්ග යෝජනාක්‍රම, වැව් සහ වේලි මගින් වැලි සැපයුම සීමා කරමින් වෙරළ ස්ථායිතාවට අහිතකර බලපෑම් ඇති කරයි. අතීතයේ දී පාරිසරික ඇගයීම් වාර්තා ක්‍රියාපටිපාටිය මගින් සංවර්ධන කටයුතු පාලනය කිරීමේ යාන්ත්‍රණයක් නොමැති විට මේ තත්ත්වය හොඳින් විද්‍යමාන විය. ජාතික පාරිසරික පනත සහ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණය පනත ක්‍රියාත්මක කිරීමට පෙර වෙරළේ ස්ථායිතාව කෙරෙහි අහිතකර බලපෑම් ඇතිවීම මඟහැරවීමට ආයතනික හෝ නෛතික යාන්ත්‍රණයක් නොවීය.

**ගංගාවලින් වැලි ගොඩ දැමීම**

ගංගා පද්ධතීන්ගේ වැලි ඉවත් කිරීමෙන් වෙරළට සැපයෙන අවසාදිත ප්‍රමාණය ඍජුවම අඩුවන බැවින් එය ශ්‍රී ලංකාවේ වෙරළ ඛාදනයට තුඩු දෙන ප්‍රධාන හේතුව වශයෙන් හඳුනාගෙන ඇත. 1970 දශකයේ අග භාගයේ සිට ඉදිකිරීම් කර්මාන්තයේ වර්ධනයට සමගාමීව ජාතික වැලි අවශ්‍යතාව ද අඛණ්ඩව ඉහළ ගොස් ඇති අතර රටෙහි උතුරු නැගෙනහිර පැවති ගැටුම්කාරී තත්ත්වය 2009 වසරේ දී අවසන් වීමෙන් පසු ඇති වූ සංවර්ධනය හේතු කොට ගෙන ද මෙම අවශ්‍යතාවය සැලකිය යුතු මට්ටමකින් ඉහළ යන ලදී. වර්තමානයේ මුළු රටටම අවශ්‍ය වැලි ප්‍රමාණය දළ වශයෙන් කියුබික් මීටර් මිලියන 21 පමණ ලෙස ඇස්තමේන්තු කොට ඇති අතර මින් බහුතර ප්‍රමාණයක් සැපයනුයේ ගංගා මගිනි.

පාලනය සඳහා බොහෝ ක්‍රියාමාර්ග ගෙන තිබුණ ද, වයඹ, බස්නාහිර සහ දකුණු පළාත්වල ගංගා වලින් වැලි ඉවත් කිරීම ඉතා ඉහළ මට්ටමක පවතින අතර මෙම පළාත්වල බොහෝ ඉදිකිරීම් කටයුතු මෙන්ම වෙරළ ඛාදනයද සංකේන්ද්‍රනය වී ඇත. කෙසේ වුවත් ඉතා ඉහළ මට්ටමක පැවති වැලි ඉල්ලුමත්, ගංගා මගින් ලබා ගන්නා වැලි සඳහා යොදන ලද නෛතික සීමාවන් ද හේතුකොට ගංගා වැලි සඳහා වූ වෙළෙඳපල මිල ඉතා ඉහළ මට්ටමකින් වැඩි වූ බැවින් ගැඹුරු මුහුදින් ලබා ගන්නා වැලි මෙන්ම වැලි නිධිවලින් ලබාගන්නා වැලි යන විකල්ප ප්‍රභවයන් කෙරෙහි අවධානය වැඩි විය. කැළණි ගඟ, කළු ගඟ, දැදුරු ඔය, මහ ඔය සහ නිල්වලා ගඟ යන ගංගා පද්ධතීන් සමූහය මහා පරිමාණයෙන් වැලි ලබාගන්නා ගංගා ලෙස ලැයිස්තුගත වූ අතර වර්තමානයේ මීට මහවැලි ගඟ ද ඇතුළත් වී ඇත.

ඉදි කිරීම් කර්මාන්තයේ වත්මන් අවශ්‍යතාව සපුරාලීම පිණිස ගංගාවලින් පෙර නොවූ විරූ වේගයකින් වැලි ගොඩ දැමීම හානියට පත්වන ගංගා පත්ලේ තිරසාර නොමැති බව සහ නොවැලැක්විය හැකි බව මෙන්ම අවශ්‍ය වැලි ප්‍රමාණය සැපයීම ද අඩු වීම මනාව නිරූපනය කරයි. මේ නිසා ගංගා පත්ල දැඩි ලෙස හායනයට ලක්වීමත් වෙරළ වෙත අවශ්‍ය වැලි ප්‍රමාණය සැපයීම ද අඩු වේ. මහවැලි ගඟේ වැලි මූලාශ්‍ර පදනම් කොට වර්තමානයේ මනම්පිටිය සහ මහියංගන ප්‍රදේශයන්හි ලබා ගන්නා වැලි ප්‍රමාණය සහ සීඝ්‍රතාව එලෙසම ඉදිරියේ දී පැවතිය හොත් දැඩි පාරිසරික ගැටලු ඇති විය හැකි බවට පුරෝකථනය කළ හැකි වේ. වගුව 2.3 මගින් පතල් සහ කැණීම් කාර්යාංශයේ බලපත්‍ර යටතේ නීත්‍යානුකූලව අනුමත කරන ලද වැලි ඉවත් කිරීමේ ප්‍රමාණය දක්වා ඇත.

ගංගාවලින් වැලි ඉවත් කිරීම තිරසාර නොවන අතර එය සමාජ ආර්ථික ගැටලු හා බැඳුන දිගු කාලීන ගැටලුවක් බව ද සඳහන් කළ යුතු ය. ගංගාවලින් වැලි ඉවත් කිරීමෙන් වන බලපෑම කෙටිකාලීන හෝ මධ්‍යම කාලීනව යථාතත්ත්වයට පත්කළ නොහැකි වේ. මේ නිසා ප්‍රතික්‍රියාත්මක ප්‍රතිපත්ති මගින් වෙරළට වැලි සැපයුම කෙටිකාලීනව හෝ මධ්‍යකාලීනව නැවත ස්ථාපිත කළ නොහැක. දැනට පවත්නා තත්ත්වය යටතේ ප්‍රතිපත්තිමය

ප්‍රතික්‍රියාවන් බහුවිධ කළමනාකරණ ප්‍රවේශයක් යොදා ගැනීම පිළිබඳ ඉලක්ක කළයුතු අතර මෙම ප්‍රවේශය පහත දැක්වෙන පරිදි විය යුතු ය.

(අ) දැනට පවත්නා තත්ත්වය තවදුරටත් පිරිහීම වැළැක්වීමට ගංගාවලින් වැලි ඉවත් කිරීම වඩාත් ඵලදායි ලෙස විධිමත් කිරීම මගින් අතීතයේ දී වැඩි වශයෙන් වැලි ඉවත් කරන ස්ථානයන්හි නැවත වැලි තැන්පත් වීමට ඉඩ හැරීම.

(ආ) සියලු ගංගා පද්ධතිවලින් ප්‍රමාණය ඉක්මවා වැලි ඉවත් කිරීම සීමා කිරීම.

(ඇ) වැලි ඉවත් කිරීමේ තිරසාර මට්ටම තීරණය කිරීම සඳහාත් වැලිවලට වඩාත් යෝග්‍ය විකල්ප සොයා ගැනීම හා ප්‍රවර්ධන කිරීම සඳහාත් වැලි පිළිබඳ ජාතික අධ්‍යයනයක් දියත් කිරීම.

රටෙහි වැලි සඳහා වූ ඉල්ලුම ඉදිකිරීම් කර්මාන්තයේ වර්ධනයත් සමග දිනෙන් දින ඉහළ යමින් පවතින අතර රටතුළ ගැටුම්කාරී තත්ත්වය නිමාවීමෙන් පසු වඩාත් හොඳින් මෙම අවශ්‍යතාවය පිළිබිඹු වේ.

වාර්ෂිකව රටතුළ භාවිතා කරන සිමෙන්ති ප්‍රමාණය අනුව ඇස්තමේන්තු කරන ලද වැලි භාවිතය

වගුව 2.3 - වාර්ෂික වැලි භාවිතය 2003 - 2012*

| වැලි ($m^3$) (000') | 2003 | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| වැලි භාවිත කිරීම | 8082 | 6339.6 | 8986.2 | 12214.8 | 13514.4 | 12873.6 | 11358 | 13507.2 | 17247.6 | 21110.4 |

- වාර්ෂික සිමෙන්ති භාවිතය මත පදනම් වී ඇත.
- සමීකරණය - වැලි මීටර් කියුබ් 3.6 = සිමෙන්ති ටොන් එකක් සඳහා (මූලාශ්‍රය : Byrne G.et.al.2002, Alternative for river sand, Unpublished report CRMP, 2002)

2.4 වගුව: - පතල් හා කැණීම් කාර්යාංශයේ නිකුත් කරන ලද බලපත්‍ර මත වාර්ෂිකව ගංගාවලින් ලබා ගන්නා වැලි ප්‍රමාණය

| *වර්ෂය* | *ඉවත් කරන ලද වැලි ප්‍රමාණය (මිලියන ($m^3$))* |
|---|---|
| 2005 | 2.6 |
| 2006 | 5.35 |
| 2007 | 0.367 |
| 2008 | 0.266 |
| 2009 | 4.7 |
| 2010 | 4.83 |
| 2011 | 8.97 |
| 2012 | 8.97 |

2.5 වගුව : ඉදිකිරීම් කර්මාන්තය සඳහා ගැඹුරු මුහුදින් ලබා ගන්නා වැලි ප්‍රමාණය 2004 - 2013

| |
|---|
| 2004 - 2014 - 2.8 කියුබික් මීටර් |
| 2011 - 2013 - 3.7 මිලියන (කියුබික් මීටර්) |

*මූලාශ්‍රය* : ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධන සංස්ථාව වාර්තා

**වැලි වැටිවලින් සහ වෙරළින් වැලි ඉවත් කිරීම**

වැලි සඳහා වූ ඉල්ලුම සහ අධික මිල ගණන්වලට අනුරූපව මෑත කාලයේ දී වෙරළින් සහ වැලි වැටිවලින් වැලි ඉවත් කිරීම ද යෝග්‍යතාව හෝ ඉදිකිරීම් කටයුතුවල ගුණාත්මක ප්‍රමිතීන් පිළිබඳව නොසලකා ඉහළ ගොස් ඇත. ගංගාවලින් ඉවත් කරනු ලබන වැලි ප්‍රමාණය හා සැසඳීමේදී, මුහුදු වෙරළින් වැලි ඉවත් කිරීම එතරම් ඉහළ මට්ටමක නොපවතී. වාර්ෂිකව වෙරළින් සහ වැටිවලින් ඉවත් කරන වැලි ප්‍රමාණය කුඩා වුවත් ගංගවලින් වැලි ඉවත් කිරීමෙන් වන බලපෑමට වඩා විශාල හානියක් වෙරළින් සහ වැටිවලින් වැලි ඉවත් කිරීම මගින් සිදු වේ. වෙරළබඩ ප්‍රවාහය (Litoral drift) සඳහා පද්ධතියේ ඇති වැලි ප්‍රමාණයේ අඩුවීම වෙරළේ ස්ථායිතාවට වඩාත් හානිකර වේ.

කෙසේවුවත් වෙරළ සංරක්‍ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් නීතිරීති ක්‍රියාත්මක කිරීම, ප්‍රජාව දැනුවත් කිරීම සහ අනෙකුත් ආයතන අතර සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම වැනි කළමනාකරණ පිළියම් යොදා ගැනීම නිසා වෙරළින් වැලි ඉවත් කිරීම සැලකිය යුතු මට්ටමකින් අඩු කිරීමට හැකිවිය. ආගමික සහ වෙනත් අවශ්‍යතා සඳහා වෙරළබඩ ප්‍රජාවට ඉතා සුළු ප්‍රමාණයන්ගෙන් හඳුනාගත් ස්ථානවලින් වැලි කියුබ් දෙකකට නොවැඩි ප්‍රමාණයක් ඉවත් කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමට අවශ්‍ය බලතල වෙරළ සංරක්‍ෂණ පනතේ විධිවිධාන අනුව ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ලබා දුන් නමුත් පසුව එම වැඩපිළිවෙළ ද නවතා දමන ලදී.

වෙරළ සංරක්‍ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ඉතා ඵලදායී ලෙස කළමනාකරණ පිළියම් ක්‍රියාත්මක කළ ද, වැලි වැටිවලින් වැලි ඉවත් කිරීම වයඹ, බස්නාහිර සහ උතුරු පළාත්වල වැලිවැටිවලින් වැලි ඉවත් කිරීම මෑත කාලයේ දී සැලකිය යුතු මට්ටමකින් ඉහළ ගොස් ඇත. උතුරු සහ නැගෙනහිර පළාත්වල පැවති ගැටුම්කාරී තත්ත්වය නිසා එකල වැලි වැටිවලින් අනවසරයෙන් වැලි ඉවත් කිරීම නියාමනය කිරීමට නොහැකි විය. මේ නිසා ඉතා වැදගත් වැලි වැටි පද්ධති කිහිපයක්ම සැලකිය යුතු ලෙස හානියට ලක්ව තිබේ.

**කොරල්පර ඉවත් කිරීම (හිරිගල් ඉවත් කිරීම)**

මෑතක් වන තුරු ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තය සඳහා අවශ්‍ය හුණු ලබාදෙන ප්‍රධාන මූලාශ්‍රය වනුයේ හිරිගල් වන අතර එම කර්මාන්තය සඳහා අවශ්‍ය හුණුවලින් 90%ක් පමණ එමගින් සැපයින. ආසන්න මුහුදු වෙරළතීරයන්ගෙන් හිරිගල්පර ඉවත් කිරීම බටහිර සහ දකුණ වෙරළතීරවලින් සහ නැගෙනහිර වෙරළ තීරයේ ඇතැම් කොටස්වල විශාල වශයෙන් සිදු වූ අතර එමගින් සැලකිය යුතු මට්ටමේ වෙරළ ඛාදනයක් සිදු වූ බව ද වාර්තා වේ. වෙරළ තීරයේ ඇතැම් කොටස්වල හිරිගල්පර ඉවත් කිරීම වසර 400ක් පමණ ඈත සිට සිදු වුව ද එය ඉතා සීමිත මට්ටමින් ආගමික කටයුතු සඳහා ආසන්න හිරිගල්පර කැණීම්වලට සීමා විය. 1970 සිට ඉදිකිරීම් කර්මාන්තයේ සිදු වූ වර්ධනයත් සමග මුහුදු හිරිගල් ඉවත් කිරීම ද වර්ධනය වූ අතර එමගින් වෙරළ ඛාදනය වැළැක්වීම සඳහා බාධකයක් ලෙස ක්‍රියාකරන ජීවී හිරිගල්පර ද විනාශ කිරීම සිදු විය. පවත්නා වාර්තා අනුව බටහිර සහ දකුණු වෙරළ තීරයේ මුහුදින් සහ ගොඩබිම ප්‍රදේශයන්ගෙන් ඉවත් කරනු ලබන හිරිගල් ප්‍රමාණය 1984 දී ටොන් 18,000 සිට 1998 වනවිට ටොන් 30,500 දක්වා වර්ධනය විය. 1988 අංක 84 දරන වෙරළ සංරක්‍ෂණ සංශෝධන පනතේ දැඩි විධිවිධාන ක්‍රියාත්මක කිරීම සමග වෙරළ කලාපය තුළ හුණු පෝරණු ක්‍රියාත්මක කිරීම, හිරිගල් පිරිසැකසුම් කිරීම, ළඟ තබාගැනීම සහ ප්‍රවාහනය තහනම් කරන ලදී. මේ අනුව 1984 දී ටොන් 7660 ක් වූ මුහුදු හිරිගල් කැණීම 1994 දී ටොන් 2200 ක් දක්වා පහත වැටිණි. මෙම තත්ත්වය තුළ හිරිගල්පර කැණීම හා සම්බන්ධ සමාජ ආර්ථික සහ පාරිසරික බලපෑම නිරන්තරව ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ වෙරළ සම්පත් කළමනාකරණ විෂයට සම්බන්ධ සාකච්ඡාවට බඳුන් වූ තේමාවක් විය. මේ අනුව 1998 වසරේ සිට වෙරළ සංරක්‍ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව පුළුල් කළමනාකරණ ක්‍රමෝපායන් ක්‍රියාත්මක කරන ලද අතර එය නීති ක්‍රියාත්මක කිරීම, හිරිගල් සඳහා ආදේශක භාවිතය හඳුන්වා දීම සහ ප්‍රවර්ධනය, මහජනතාව අතර අධ්‍යාපනය සහ දැනුවත්භාවය ඉහළ නැංවීම සහ හිරිගල් කර්මාන්තයේ නියැලි අයට විකල්ප ආදායම් හඳුන්වාදීම යන අංගයන්ගෙන් සමන්විත විය. මෙම කළමනාකරණ පිළියම්වල ප්‍රතිඵලයක් ලෙස 2004 දක්වා හිරිගල් කැණීම පහළ මට්ටමකින් පවත්වා ගෙන යාමට සමත් විය. කෙසේ වුවත් 2004 වසරේ ඇති වූ සුනාමි ව්‍යසනය සමග පාරිසරික වශයෙන් හිරිගල්පරවල වැදගත්කම අවබෝධ වීමෙන් විශේෂයෙන් දකුණු පළාතේ වෙරළබඩ ප්‍රජාව අතර හිරිගල් කැඩීම සැලකිය යුතු මට්ටමින් අඩුවීම හෝ සම්පූර්ණයෙන් නැවතීම සිදු වී ඇත.

**වගුව 2.6 : ශ්‍රී ලංකාවේ නිරිත දිග සහ දකුණු වෙරළ කලාපයේ හිරිගල්පර ඉවත් කිරීම**

| *හිරිගල්පර වර්ගය* | *ප්‍රමාණය 1984 (ටොන්)* | *මුළු ප්‍රමාණයේ ප්‍රතිශතය* | *ප්‍රමාණය 1992 (ටොන්)* | *මුළු ප්‍රමාණයේ ප්‍රතිශතය* | *ප්‍රමාණය 1998 (ටොන්)* | *මුළු ප්‍රමාණයේ ප්‍රතිශතය* | *ප්‍රමාණය 2013 (ටොන්)* |
|---|---|---|---|---|---|---|---|
| ගොඩබිම හිරිගල්පර | 10,400 | 58 | 15,800 | 80 | 28,300 | 93 | වාර්තා වී නැත |
| මුහුදු හිරිගල්පර | 7,660 | 42 | 4,020 | 20 | 2,200 | 7 | වාර්තා වී නැත |
| මුළු ප්‍රමාණය | 18,060 | 100 | 19,820 | 100 | 30,500 | 100 | |

(*මූලාශ්‍රය* : වෙරළ කලාප කළමනාකරණ සැලැස්ම 2004)

### 2.2.4 දේශගුණික විපර්යාසවල අනාගත බලපෑම්

ගෝලීය උණුසුම හේතුකොට ඇතිවිය හැකි මුහුදු උෂ්ණත්වය ඉහළ යාම, මුහුදු මට්ටම ඉහළ යාම, නිවර්තන සුලි කුණාටු සිද්ධීන් හා වාර ගණන වැඩිවීම සහ අන්තගාමී සිද්ධීන් යන දේශගුණික විපර්යාසයන්ගේ බලපෑම් වෙරළබඩ ක්‍රියාවලිය, වෙරළබඩ පරිසර පද්ධති සහ මානව ජීවන රටාව කෙරෙහි අහිතකර බලපෑම් ඇති කරනු ඇත. ගෝලීය මධ්‍ය මුහුදු මට්ටමේ ඉහළ යාම වැදගත් සාධකයක් වුවද, වෙරළට ඇති වන බලපෑම් තීරණය කරන ප්‍රධාන සාධකය වනුයේ සාපේක්ෂ මුහුදු මට්ටමේ ඉහළ යාමයි. දේශගුණික විපර්යාස පිළිබඳ ජාත්‍යන්තර කමිටුව (IPCC) විසින් පුරෝකථනය කරන ලද මධ්‍ය ඇස්තමේන්තු අනුව ගෝලීය මුහුදු මට්ටම සෙ.මී. 0.2 සහ සෙ.මී. 0.5 වසර 2010 ත් 2050 ත් අතර පිළිවෙළින් ඉහළ යනු ඇත. ඉහළ යා හැකි සාපේක්ෂ මුහුදු මට්ටම සහ උෂ්ණත්වය අනුව වෙරළ තීරය ඛාදනයට ලක්වීම පහත්බිම් සහ අන්තරායට ලක්විය හැකි ප්‍රදේශ ජලයෙන් යටවීම, ලවන ජලය අභ්‍යන්තර ජලාශ වෙත ගලා ඒම, ද්‍රව්‍ය ප්‍රවාහනයේ භූ විද්‍යාත්මක වෙනස්වීම් සහ හිරිගල්පර වැනි වෙරළබඩ පරිසර පද්ධති විනාශවීම අපේක්ෂා කෙරේ. ඊට අමතරව මුහුදු මට්ටම ඉහළ යාම ධීවර කටයුතු, සංචාරක කටයුතු සහ එවැනි බලපෑම් සඳහා ඔරොත්තු දීමට සැලසුම් නොකරන ලද වෙරළාරක්ෂක නිර්මාණයන්ට අහිතකර බලපෑම් ඇති කරනු ඇත.

2011 දී පරිසර සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් පවත්වන ලද දේශගුණික විපර්යාසයන්ගේ අන්තරායන් (vulnerability) පිළිබඳ තක්සේරුව අනුව මුහුදු මට්ටම ඉහළ යාමට නිරාවරණය වන වැදගත් අංශයන් වන නාගරික සංවර්ධන, ආර්ථික යටිතල පහසුකම් සහ ජනාවාස, ජලය, කෘෂිකර්ම සහ වන සම්පත්, ජෛව විවිධත්ව සහ පාරිසරික සේවාවන් සහ පශු සම්පත් පිළිබඳව අධ්‍යයනය කොට වඩාත් අන්තරායට ලක්විය හැකි ක්ෂේත්‍ර හඳුනාගෙන ඇත. රූප සටහන 2.1 මගින් මුහුදු මට්ටම ඉහළ යාමට නිරාවරණය වන ප්‍රදේශ සිතියම දක්වා තිබේ. දේශගුණික විපර්යාස පිළිබඳ ජාත්‍යන්තර කමිටුවේ අනාවැකි අනුව පුරෝකථන මුහුදු මට්ටමේ ඉහළ යාම හේතුවෙන් වර්ෂ 25, 50, 75 සහ 100 අවසානයේ ජලයෙන් යටවිය හැකි ප්‍රදේශ (දැනට ජලයෙන් ආවරණය වූ ප්‍රදේශ ද ඇතුළත්ව) වගුව 2.6 මගින් පෙන්වා දී ඇත.

බෲන් (Brunn) නියමය අනුව මුහුදු මට්ටම ඉහළ යාමට අනුකූලව ඇස්තමේන්තු කරන ලද වෙරළ ඛාදන ප්‍රමාණයන් පහතින් දැක්වේ. (1:100 අනුපාතය Burns නියමය අනුව).

අවුරුදු 25 කට පසු වෙරළ ඛාදනය ප්‍රමාණය මී. 50

අවුරුදු 50 කට පසු වෙරළ ඛාදනය ප්‍රමාණය මී. 65

අවුරුදු 75 කට පසු වෙරළ ඛාදනය ප්‍රමාණය මී. 80

අවුරුදු 100 කට පසු වෙරළ ඛාදනය ප්‍රමාණය මී. 95

වගුව 2.7: එක් එක් දිස්ත්‍රික්ක සඳහා ප්‍රතික්ෂේපනය කරන ලද ප්‍රදේශවල ජලයෙන් යට විය හැකි භූමි ප්‍රමාණය - ජල තලයන් ඇතුළත්ව/ඇතුළත් නොවන පරිදි

| දිස්ත්‍රික්කය | ජලතලයන් ඇතුළත්ව ජලයෙන් යටවන මුළු භූමි ප්‍රමාණය | | | | ජල තලයෙන් ඇතුළත් නොවන ජලයෙන් යටවන ප්‍රදේශ | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | *අවුරුදු 25* | *අවුරුදු 50* | *අවුරුදු 75* | *අවුරුදු 100* | *අවුරුදු 25* | *අවුරුදු 50* | *අවුරුදු 75* | *අවුරුදු 100* |
| කොළඹ | 959 | 1133 | 1327 | 1534 | 201 | 375 | 569 | 776 |
| ගම්පහ | 3638 | 4154 | 4631 | 5073 | 459 | 976 | 1452 | 1894 |
| පුත්තලම | 11334 | 12583 | 13716 | 14809 | 1113 | 2362 | 3494 | 4587 |
| මන්නාරම | 8024 | 8262 | 8518 | 8758 | 248 | 486 | 741 | 981 |
| යාපනය | 10321 | 11164 | 12014 | 12891 | 864 | 1706 | 2557 | 3434 |
| මුලතිව් | 912 | 1004 | 1092 | 1180 | 88 | 180 | 268 | 355 |
| ත්‍රිකුණාමලය | 2315 | 2529 | 2791 | 3033 | 252 | 467 | 729 | 971 |
| මඩකලපුව | 2325 | 2443 | 2568 | 2702 | 130 | 247 | 372 | 507 |
| අම්පාර | 1880 | 2175 | 2479 | 2762 | 293 | 588 | 892 | 1175 |
| හම්බන්තොට | 4265 | 5553 | 6516 | 7322 | 885 | 2173 | 3136 | 3942 |
| මාතර | 1277 | 1634 | 1994 | 2401 | 384 | 741 | 1101 | 1508 |
| ගාල්ල | 5622 | 6462 | 7249 | 8014 | 776 | 1617 | 2403 | 3169 |
| කළුතර | 1956 | 2370 | 2790 | 3203 | 417 | 830 | 1251 | 1664 |

(*මූලාශ්‍රය* : වෙරළ තත්ත්ව වාර්තාව 2014)




**2.1 : ශ්‍රී ලංකාවේ මුහුදු මට්ටම ඉහළ යාමට නිරාවරණය වූ ප්‍රදේශ දක්වන සිතියම**

- පහළ මට්ටමින් නිරාවරණය වන ප්‍රදේශ
- මධ්‍යස්ථ මට්ටමින් නිරාවරණය වන ප්‍රදේශ
- ඉහළ මට්ටමින් නිරාවරණය වන ප්‍රදේශ
- නිරාවරණය නොවන ප්‍රදේශ

(*මූලාශ්‍රය* : දේශගුණික විපර්යාස පිළිබඳ දත්ත ග්‍රන්ථය 2011)

මුහුදු මට්ටම ඉහළයාම හා සම්බන්ධිත ගැටලුවල ප්‍රමාණය අනුව, සමස්ත වශයෙන් පිළිගත හැකි ප්‍රතික්‍රියාව වනුයේ ඒ සඳහා නිසි පරිදි අනුවර්තනය වීමයි. මේ නිසා පහත දැක්වෙන අනුවර්තනය වීමේ තාක්‍ෂණයන් පිළිබඳව පරීක්‍ෂාකාරී ලෙස අවධානය යොමු කිරීම වැදගත්ය. (මුලාශ්‍රය : දේශගුණික විපර්යාස පිළිබඳ දත්ත ග්‍රන්ථය 2011)

1. වෙරළාශ්‍රිත සංවර්ධන කටයුතු සඳහා ප්‍රමාණවත් ස්වාරක්ෂිත ප්‍රදේශ ඇති කිරීම.
2. සාපේක්ෂ මුහුදු මට්ටමේ ඉහළයාම සැලකිල්ලට ගෙන වෙරළ ආරක්‍ෂණ නිර්මාණ සඳහා සැලසුම් නිර්ණායකයන් සැකසීම
3. මෘදු ආරක්‍ෂණ පිළිවෙතක් ලෙස වැලි වැටි ස්ථායිකරණය/පුනරුත්තාපනය.
4. මෘදු ආරක්‍ෂණ පිළිවෙතක් ලෙස හිරිගල්පර ප්‍රතිෂ්ඨාපනය කිරීම.
5. වෙරළ පෝෂණය කිරීම.

මුහුදු මට්ටමේ ඉහළ යාමට අමතරව, වෙරළ ඛාදන කළමනාකරණය සඳහා වැදගත් වන්නාවූ දේශගුණික විපර්යාස ප්‍රතිවිපාක ආශ්‍රිත අනෙක් ස්වාභාවික සංසිද්ධිය වනුයේ ඔක්තෝබර් සහ නොවැම්බර් කාලවලදී අන්තර් නිවර්තන අභිසාරිතා කලාපය සමකය වෙත දකුණු දෙසට තල්ලුවීම නිසා බෙංගාල බොක්කේ නිරන්තරව ඇතිවන සුලිසුළං සහ ප්‍රබල කුණාටුය.

### 2.2.5 උතුරු - නැගෙනහිර වෙරළ තීරයන්හි වෙරළ ඛාදනය පිළිබඳ වත්මන් තත්ත්වය

2014 වෙරළ තීර තත්ත්ව වාර්තා අනුව, උතුරු සහ නැගෙනහිර වෙරළ තීරයන්හි වෙරළ ඛාදන පිළිබඳ වර්තමාන තත්ත්වය සාකච්ඡා මගින් ලබා ගන්නා අතර එය පහතින් සාරාංශගත කර ඇත. යාපනය දිස්ත්‍රික්කයේ අඛණ්ඩ වෙරළ ඛාදන සිද්ධීන් කිසිවක් වාර්තා වී නොමැත. කෙසේවුවත් සෘතුමය වෙරළ ඛාදන සිද්ධීන් පේදුරුතුඩුව වෙරළ තීරයෙන් වාර්තා වී තිබේ.

මන්නාරම දිස්ත්‍රික්කයේ වෙරළ ඛාදනය වාර්තා වී ඇත්තේ මුසලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සිලාවතුර සහ අරිප්පු ප්‍රදේශයේත්, නාන්ටාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වන්කාල ප්‍රදේශයේත්, මන්නාරම නගර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තලෙයිමන්නාරමට දකුණින් ප්‍රදේශයෙනි. වන්කාල ප්‍රදේශයේ ඇති වූ වෙරළ ඛාදනයේ ප්‍රබලත්වය පිළිබඳ සැලකිලිමත් වීමෙන් පසුව වෙරළ සංරක්‍ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් පනා බැම් ශ්‍රේණියක් ඉදි කර ඇත. දැනට පවත්නා තොරතුරු අනුව වෙරළ ඛාදනයන් ඊසාන දිග මෝසම් සමයේදී දකුණු වැලිපරය (South Bar) සහ කාල්මඩු ප්‍රදේශයෙන් වාර්තා වී තිබේ. මෙයට අමතරව වෙරළ ඛාදන තත්ත්වයන් ඩොරික් බංගලාව ආශ්‍රිතවත් අරිප්පු ප්‍රදේශයෙන් වාර්තා වී ඇත. මඩකලපුව දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති වෙරළ ඛාදන සිද්ධීන් බොහොමයක් ස්වභාවයෙන් සෘතුමය වන නමුත් නාවල්අඩි සහ නාසිවන්තීව් දූපත් වැනි ස්ථානවල අඛණ්ඩව වාර්තා වී තිබේ. තව ද මන්මුනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, පාලමුනේ ග්‍රාම සේවා කොට්ඨාසයේ පුතුකුඩිරුප්පු, කිරාන්කුලම්, පාසිකුඩා සහ කල්කුඩා ප්‍රදේශවලින් සෘතුමය වෙරළ ඛාදන සිද්ධීන් වාර්තා වී ඇත.

ත්‍රිකුණාමල නගර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වීරනගර්, මුරුගපුරි, ජමාලියා, සිරිමාපුර සහ සල්ලි ප්‍රදේශයෙන් වෙරළ ඛාදන තත්ත්ව වාර්තා වී තිබේ. මෙයට අමතරව වෙරළ ඛාදන සිද්ධීන් කිහිපයක් ඉක්බාල් නගර් (බයිබල් විද්‍යාලය ආසන්නයේ) වෙල්ලූර් මුරුගන් කෝවිල අසල සහ කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නිලාවේලි ප්‍රදේශයෙන් වාර්තා වී ඇත.

අම්පාර දිස්ත්‍රික්කයේ ඔලුවිල් වරායේ සිට පෙරියකල්ලාර් දක්වා ප්‍රදේශයෙන් සැලකිය යුතු මට්ටමේ වෙරළ ඛාදන සිද්ධීන් වාර්තා වී ඇත. මෙම වෙරළ තීරයේ නින්දවුර්, ඔලුවිල්, අටපලම්, නෝච්චිආඩි සහ මුටුපුලෙයි යන ස්ථාන උග්‍ර ලෙස ඛාදනයට භාජනය වේ. මෙම ප්‍රදේශයන්හි ආසන්න වශයෙන් ඉඩම් අක්කර 250 - 300 අතර ප්‍රමාණයක් වෙරළ ඛාදනය නිසා අහිමි වී ඇති බවට ඇස්තමේන්තුගතකර තිබේ.

අවශ්‍ය වුවහොත් දිගු කාලීන ඉංජිනේරුමය විසඳුම් ලබා දීම සඳහා ඇති ප්‍රධානතම අභියෝගය වන්නේ උතුරු සහ නැගෙනහිර වෙරළ ප්‍රදේශවල වෙරළබඩ ක්‍රියාවලීන් සම්බන්ධයෙන් ප්‍රමාණවත් දත්ත සහ තොරතුරු නොමැති වීමයි.

**2.2.6 උතුරු සහ නැගෙනහිර වෙරළ ප්‍රදේශයන්හි වෙරළබඩ ක්‍රියාවලිය සහ ගති ලක්‍ෂණ පිළිබඳව ප්‍රමාණවත් දත්ත සහ තොරතුරු නොමැති වීම**

වෙරළ බාදන කළමනාකරණය සඳහා ඉතා වැදගත් අවශ්‍යතාවය වනුයේ වෙරළබඩ ක්‍රියාවලි මෙන්ම වෙරළ බාදන ආශ්‍රිත සමාජ ආර්ථික ජීව විද්‍යාත්මක සහ පාරිසරික සාධක පිළිබඳව නිරවද්‍යවූත් යාවත්කාලීන කරන ලද දත්ත සහ තොරතුරු තිබීමයි. පසුගිය දශක කිහිපය මුළුල්ලේ දකුණු, නිරිතදිග, බටහිර සහ වයඹ වෙරළ ඛණ්ඩවල බාදන කළමනාකරණය සඳහා අවශ්‍ය දත්ත සහ තොරතුරු වෙරළබඩ අධ්‍යයනයන් සහ අධ්‍යයන සහ අනෙකුත් පර්යේෂණ මගින් එක්රැස් කළ නමුත් දශක තුනක් මුළුල්ලේ උතුරු සහ නැගෙනහිර පළාත්වල පැවති ගැටුම්කාරී තත්ත්වය නිසා එම ප්‍රදේශ හා සම්බන්ධව දත්ත සහ තොරතුරු පවතින්නේ අවම වශයෙනි. උතුරු සහ නැගෙනහිර වෙරළ තීර දේශගුණික විපර්යාස මත ඇතිවිය හැකි ගැටලුවලට මෙන්ම සුනාමි, සුළි සුළං වැනි ස්වාභාවික උපද්‍රවයන්ට නිරාවරණය වී ඇති බැවින් වෙරළ බාදන කළමනාකරණය සඳහා නිරවද්‍ය දත්ත සහ තොරතුරු තිබීම වැදගත් අවශ්‍යතාවයකි. මෙයට අමතරව මහවැලි වැනි ප්‍රධාන ගංගාවලින් විශාල ලෙස වැලි ඉවත් කිරීම වැනි මිනිස් ක්‍රියාකාරකම් නිසා නැගෙනහිර පළාතේ වෙරළ වෙත වන බලපෑම් මේ වනතෙක් තක්සේරු කොට නොමැත. තව ද උතුරු සහ නැගෙනහිර ප්‍රදේශයන්හි දවැන්ත සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා රජය ප්‍රයත්න දරන බැවින් එම සංවර්ධන ව්‍යාපෘතිවල පාරිසරික බලපෑම් ඇගයීමේ දී වෙරළබඩ ක්‍රියාවලිය, මෙන්ම රළ, දියවැල්, උදම් සහ අවසාදිත ද්‍රව්‍ය ප්‍රවාහන රටාව පිළිබඳ දත්ත සහ තොරතුරු තිබීමද අත්‍යාවශ්‍ය වේ.

ඒ අනුව උතුරු සහ නැගෙනහිර ප්‍රදේශ සඳහා මනා වෙරළ බාදන කළමනාකරණ වැඩසටහනක් සකස් කිරීම වෙනුවෙන් අවශ්‍ය දත්ත සහ තොරතුරු එක්රැස් කිරීම වැදගත් වේ.

**2.2.7 වෙරළ ප්‍රදේශයන්හි දිගුකාලීන පදනමක් මත හිඳ නව සංවර්ධන කටයුතු සඳහා ඉඩ සැලසීම**

දශක තුනකට වඩා පැවති ත්‍රස්තවාදය සහ ගැටුම්කාරී තත්ත්වය මුලිනුපුටා දැමීමෙන් පසු ශ්‍රී ලංකාව 2009 වසරේ සිට විශාල පරිවර්තනයකට ලක්වෙමින් පවතී. ඒ අනුව වාර්ෂික ඒක පුද්ගල ආදායම ඇමරිකානු ඩොලර් 4000 සීමාව ළඟාකර ගනිමින් සමස්ථ ආර්ථික වර්ධනය මගින් අඩු ආදායම් උපයන තත්ත්වයේ සිට මධ්‍යම ආදායම් උපයන රටක තත්ත්වයට ළඟා වී ඇත. වර්තමානයේදී මධ්‍යම ආදායම් උත්පාදක පාෂයෙන් (Trap) ගැලවී ඉහළ ආදායම් උපයන තත්ත්වයට ළඟාවීම සඳහා ප්‍රධාන ආර්ථික කේන්ද්‍රයන් (Hubs) හයක් සංවර්ධනය කිරීමට උත්සාහ කරන අතර මෙම සංවර්ධන කේන්ද්‍රයන් අතරින් නාවික, බලශක්ති සහ සංචාරක යන කේන්ද්‍රයන් සංකේන්ද්‍රනය වී ඇත්තේ වෙරළබඩ පරිසරය ඉලක්ක කරගෙනය. මෙයට අමතර මහා පරිමාණ ව්‍යාපෘති වන කොළඹ වරාය පුළුල් කිරීම සහ වරාය නගර ව්‍යාපෘතියද ස්ථානගත වී ඇත්තේ නාගරික වෙරළබඩ පරිසර පද්ධතිය කේන්ද්‍ර කරගෙනය. එබැවින් හදිසි සහ නිදන්ගත වෙරළබඩ උපද්‍රවයන්ගෙන් වියහැකි අන්තරායන් අවම වන ලෙස මෙම නව සංවර්ධන ව්‍යාපෘති අනුගත කිරීම අවශ්‍ය වී ඇති අතර වෙරළබඩ සම්පත්වල තිරසාරත්වය ද සහතික කළ යුතුය. වෙරළබඩ ප්‍රදේශයේ ආර්ථික සංවර්ධනය මගින් අපේක්ෂිත අරමුණු ළඟාකර ගැනීම සඳහා යොමු වීමේ දී එම ප්‍රදේශයන්හි වෙරළ සම්පත් ජීවායේ හැසිරීම් සහ ක්‍රියාවලි පිළිබඳව වෙරළබඩ ඉංජිනේරුමය හා විද්‍යාත්මක දැනුම ද ප්‍රදේශයන්හි සාමාජීය කරුණු තීරණ ගැනීමේදී සැලකිල්ලට ගත යුතුය.

## 2.3 ප්‍රතිපත්ති, සැලසුම්, නීති සහ ආයතනික රාමුව

### 2.3.1 සැලසුම් සහ ප්‍රතිපත්ති

වෙරළ බාදන කළමනාකරණය පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රධාන වශයෙන් පාලනය කරනු ලබන්නේ 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත සහ එහි සංශෝධන පනත වන 1988 අංක 64 දරන පනත මගින් වන අතර එමගින් වෙරළ කලාපයේ කටයුතු පාලනය කිරීම සඳහා අවශ්‍ය නෛතික විධිවිධාන සපයයි. වෙරළ කලාපයෙන් පිටත පවා සිදුවන ඇතැම් බලපෑම් සහිත කටයුතු පාලනය කිරීමේ අවශ්‍යතාව අනුව නෛතික අවකාශය 2011 අංක 49 දරන සංශෝධන පනත මගින් ශක්තිමත් කරන ලදී. මෙයට අමතරව 1990 ප්‍රථම ජාතික වෙරළ කලාප කළමනාකරණ සැලැස්ම, 1997 සහ 2004 සංශෝධිත වෙරළ කලාප කළමනාකරණ සැලසුම් සහ "වෙරළ 2000" ශ්‍රී ලංකාවේ වෙරළ ප්‍රදේශ සඳහා වූ සම්පත් කළමනාකරණ ක්‍රමෝපාය මගින්ද වෙරළ බාදන ගැටලුව සම්බන්ධයෙන් සාකච්ඡාකොට ඇත. 1986 පිළියෙල කරන ලද වෙරළ බාදන කළමනාකරණ මහා සැලැස්මට අනුකූලව වෙරළ කලාප කළමනාකරණ සැලසුම්, "වෙරළ 2000" මගින් ඉදිරිපත් කරන ලද ප්‍රතිපත්ති මාර්ගෝපදේශ මත පාදකව සමස්ත වෙරළ බාදන කළමනාකරණ ක්‍රමෝපාය ක්‍රියාත්මක කරන ලදී.

නෛතික සහ ආයතනික ප්‍රකාරව සහ අභිමතය අනුව වෙරළ ඛාදනය පාලනය කිරීමේ වගකීම සහ අභිමතය වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත පැවරී ඇත. මේ නිසා වෙරළ කලාපය තුළ වෙරළ ස්ථාවර කිරීමේ වැඩ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේදී පාරිසරික ඇගයීම් වාර්තා පිළිබඳ අවශ්‍යතාවයෙන් නිදහස්කොට ඇත. ප්‍රතිපත්තිමය වශයෙන් මේ දක්වා වෙරළ සංරක්ෂණ කටයුතු ක්‍රියාත්මක කිරීමේදී, ප්‍රමුඛතාවය දෙනු ලබන්නේ පොදු යටිතල පහසුකම් ආරක්ෂා කිරීමට (මහාමාර්ග/දුම්රිය මාර්ග සහ පාලම් වැනි දෑ) වේ. ඉන්පසුව පිළිවෙලින් පොදු යටිතල පහසුකම් සහ ගොඩනැගිලිද, නිවාස, රජයේ ඉඩම් සහ පෞද්ගලික සහ වානිජ ගොඩනැගිලි ආරක්ෂා කරනු ඇත. වෙරළ ඛාදන කළමනාකරණ මහා සැලැස්මේ (MPCEM) මාර්ගෝපදේශ සහ නිර්ණායකයන්ට අනුකූල වේ නම් පෞද්ගලික සහ රජයේ ආයතනයන්ට වෙරළාරක්ෂණ පිළියම් ක්‍රියාත්මක කිරීමට වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව අවසර දෙන ලදී. වෙරළ ඛාදනය හා සම්බන්ධ කළමනාකරණ ක්‍රියාකාරකම් සහ නෛතික යාන්ත්‍රණය ජාතික මට්ටමින් ක්‍රියාත්මක වේ. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත අනුව, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අභිමතය පරිදි, පෞද්ගලික සහ රජයේ වෙනත් ආයතන මගින් වෙරළාරක්ෂක කටයුතු ඇතුළු අනෙකුත් සංවර්ධන කටයුතු කිරීමේදී පාරිසරික ඇගයීම් වාර්තා අවශ්‍ය විය හැකිය. වෙරළ කලාපයෙන් ඔබ්බට දිවෙන සංවර්ධන කටයුතු 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ 1988 අංක 56 දරන එහි සංශෝධන සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයන්ද සැලකිල්ලට ගත යුතුය. වෙරළ තීරයේ ස්ථායිතාවයට ඍජුව හෝ වක්‍රව බලපාන කැණීම්, පිරවීම් සහ ජලපහරවල් හැරවීම වැනි කටයුතු පාලනයට බොහෝ ආයතන සහ නෛතික යාන්ත්‍රණ ඇත.

තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික මණ්ඩලය මගින් සම්පාදනය කරන ලද ''2009 හරිත ලංකා වැඩසටහන'' සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ද වෙරළ ඛාදන ගැටලුව ''වෙරළ තීරය සහ මුහුද අවට ප්‍රශස්ථ භාවිතය'' (හතරවන මෙහෙවර) පිළිබඳ ක්ෂේත්‍රය යටතේ හඳුනාගෙන තිබේ. මේ සඳහා උපරිම මට්ටමින් වෙරළබඩ සම්පත් සහ වෙරළබඩ පරිසර පද්ධති පුනරුත්ථාපනය කිරීම සඳහා ඛාදනයට ලක්ව ඇති වෙරළතීර මෘදු විසඳුම් මගින් ස්ථායි කිරීම සඳහා උපාය මාර්ග යොදා ගැනීමට මෙමගින් අවධාරණය කර ඇත.

**2.3.2 වෙරළ ඛාදන කළමනාකරණ පරිචයන්හි අනාගත ප්‍රවේශ සහ උපනතීන්**

වෙරළ ඛාදනය සහ විවර්ධනය ස්වාභාවික ක්‍රියාවලීන්ය. කෙසේ වුවත් මෙම ස්වභාවික සංසිද්ධිය මානව ක්‍රියාකාරකම් සහ ස්වාභාවික ආපදාවන් හේතුකොට උග්‍ර ගැටලුවක් බවට පත්විය හැකිය. මෙයට අමතරව වෙරළබඩ ප්‍රදේශයන්හි ජනගහනය වැඩිවීමට සාපේක්ෂව දුගීබව ව්‍යාප්ත වීම සහ ආර්ථික වර්ධනය මගින් වෙරළ ඛාදනය කළමනාකරණය කිරීමේ ප්‍රබල අභියෝගයන් ජනිත කරනු ඇත.

මේ නිසා වෙරළ ඛාදනය කළමනාකරණය කිරීමේ දී පහත දැක්වෙන කරුණු පිළිබඳව පරීක්ෂාකාරීව අවධානය යොමුකළ යුතුය.

(1) දැනට පවත්නා වෙරළ ආරක්ෂණ නිර්මාණ මගින් සුවිශේෂී ආරක්ෂණයක් ලබා දෙන බව පවත්නා තොරතුරු මගින් පෙනී යයි.

(2) වෙරළබඩ ප්‍රදේශයන්හි වෙරළබඩ පැළෑටි පැවතීමෙන් බෑවුම් ස්ථායිතාව වැඩිදියුණු වන අතර, අවසාදිත ඒකරාශී වීමත්, වෙරළ වෙත එන රළෙහි ශක්තිය හීන වීමත් ඛාදනයෙන් වෙරළ තීරය ආරක්ෂා වන බවත් විද්‍යාත්මක සොයාගැනීම් මගින් හෙළිදරව් වී තිබේ.

(3) වෙරළබඩ ක්‍රියාවලිය පිළිබඳව දනට පවත්නා දැනුම අනුව වෙරළ ආරක්ෂණ සඳහා මෘදු පිළියම් පිළිබඳ අවධානය වැඩි වී තිබේ.

(4) පාරිසරික සහ ආර්ථික වශයෙන් පිළිගත හැකි වෙරළ ආරක්ෂණ පිළියම් ලබාදීම සඳහා සහ විකල්පයන්ගේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා දෘඪ සහ මෘදු විසඳුම් යුගලයම යොදගැනීම ඇතැම් විට අවශ්‍ය වනු ඇත.

(5) වෙරළ කලාපය තුළ ස්ථානගත වන ධීවර, සංචාරක සහ අනෙකුත් ආර්ථික කටයුතු සඳහා දේශගුණික විපර්යාසයන්ට අනුරූප තාක්ෂණයන්, සැලසුම් යොද ගැනීම අවශ්‍ය වේ.

(6) 2011 අංක 49 දරන සංශෝධිත වෙරළ සංරක්ෂණ පනත මගින් හඳුන්වා දෙන ලද නෛතික විධිවිධාන අනුව වෙරළ ඛාදනය පාලනය කිරීම සඳහා සංරක්ෂණ සහ බලපෑම් ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම කාලීන අවශ්‍යතාවයන් පදනම් කරගෙන සිදු කළ යුතුය.

**2.4 කළමනාකරණ අරමුණු, ප්‍රතිපත්ති, ක්‍රමෝපායන් සහ ක්‍රියාකාරකම්**

**අරමුණ 1**

මෘදු සහ දෘඪ පිළියම් සුසංයෝගයකින් සමන්විත ප්‍රශස්ථ වෙරළ තීර කළමනාකරණ කටයුතු/ක්‍රියාමාර්ග යොද ගැනීම, මගින් වෙරළ ඛාදනයට පිළියම් යොදනු ලැබේ.

**ප්‍රතිපත්ති 1.1**

වෙරළ ඛාදනය පිළිබඳ ප්‍රවණතාවන් හඳුනාගෙන වෙරළ ස්ථායිකරණය සැලසුම් සහගත ආකාරයට සිදු කරනු ඇත.

**ක්‍රමෝපාය 1.1.1**

වෙරළ ඛාදන ප්‍රවණතාවන් හඳුනා ගැනීම, අධික ඛාදන සීඝ්‍රතාව සහ පොදු යටිතල පහසුකම්, පෞද්ගලික සහ පොදු දේපල සහ ආර්ථික කටයුතු මෙන්ම පාරිසරික පද්ධති කෙරෙහි වන තර්ජනය පදනම් කොට ආරක්‍ෂණය කළයුතු ප්‍රදේශ ප්‍රමුඛතාව මත වර්ගීකරණය කිරීම ක්‍රමවත් සුපරීක්ෂණ ක්‍රියා පිළිවෙත් ක්‍රියාත්මක කිරීම සහ ස්ථාන පදනම් කොටගත් කළමනාකරණ ක්‍රමෝපායන් ගොඩනැංවීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. උතුරු සහ නැගෙනහිර ප්‍රදේශයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් වෙරළ ඛාදන ප්‍රවණතාවන් සහ අධික ලෙස ඛාදනයට ලක්විය හැකි ප්‍රදේශ හඳුනා ගැනීම සහ අධ්‍යයනය කිරීම.
2. වෙරළබඩ තත්ත්වයන් පිළිබඳ තත්ත්ව වාර්තාවක් පිළියෙළ කිරීම හා කලින් කලට යාවත්කාලීන කළ හැකි ලෙස හැකිවන ලෙස ප්‍රමුඛතා ප්‍රදේශ මත පදනම් වූ සුපරීක්‍ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
3. සුදුසු ස්ථාන සඳහා වෙරළතීර කළමනාකරණ සැලසුම් කිරීම සඳහා වැඩසටහනක් ආරම්භ කිරීම.
4. ප්‍රමුඛ ස්ථාන සඳහා වෙරළ තීර කළමනාකරණ ක්‍රියාවලිය නියාමක පදනම මත ආරම්භ කිරීම.
5. වෙරළ තීර කළමනාකාරණ සැලසුම්වලට අනුකූලවන ලෙස පොදු සහ පෞද්ගලික වෙරළ ආරක්ෂණ කටයුතු සඳහා අවසර දීම.
6. සකස් කරන ලද සැලැස්මක් මත පදනම් වූ යම් ආකාරයක පාලන ක්‍රියා මාර්ග හඳුන්වා දී ඇති ප්‍රදේශවල දැනට පවතින වෙරළ ආරක්‍ෂණ නිර්මාණයන්ගේ ක්‍රියාකාරිත්වය සහ වෙරළ ස්ථායිතාව සුපරීක්‍ෂණය හා එම වැඩ පවත්වාගෙන යාමට ක්‍රියාමාර්ග ගැනීම.
7. වෙරළ කලාපය තුළ ව්‍යාපෘති අනුමත කිරීමේදී සුදුසු ස්ථාන සඳහා වෙරළ තීර කළමනාකරණයේ මූලික මූලධර්මයන් යොද ගැනීම පිළිබඳ අවධානය යොමු කිරීම.

**ප්‍රතිපත්ති 1.2**

වෙරළ කළමනාකරණය/වෙරළ ඛාදනය පාලනය කිරීම වඩාත් පූර්ණ විද්‍යාත්මක/ඉංජිනේරුමය ඇගැයීම් මත පදනම් වීම.

**ක්‍රමෝපාය 1.2.1**

ජාතික හා ජාත්‍යන්තර පර්යේෂණ ආයතන හා විශ්වවිද්‍යාලවල සහභාගිත්වයෙන් වෙරළ ඛාදනය කළමනාකරණය සහ පාලනය සඳහා අදාළ සියලු විද්‍යාත්මක සහ සමාජ ආර්ථික තොරතුරු එක් රැස් කිරීම, ගබඩා කිරීම සහ භාවිතා කිරීම හා වෙරළ තීර කළමනාකරණ ක්‍රියාවලියට එවැනි තොරතුරු පහසුවෙන් ලබා ගැනීම සඳහා දත්ත පදනමක් ඇති කිරීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. වෙරළ ඛාදනය පිළිබඳව නිරන්තරව සුපරීක්ෂණය සඳහා ජාතික වැඩ සටහනක් ස්ථාපිත කිරීම (විශ්වවිද්‍යාල සහ අනෙකුත් පර්යේෂණ ආයතනවල සහභාගිත්වයෙන්) සහ වෙරළ කලාපයේ අවසාදිත ශේෂ පිළිබඳ විද්‍යාත්මක පර්යේෂණ සහ අවසාදිත මූලාශ්‍ර: වෙරළ ඛාදන ප්‍රවීණතා සහ තත්ත්වය සමාජ ආර්ථික ගති ලක්ෂණ, ජල විද්‍යාත්මක තත්ත්වයන්, සංවේදී පරිසර පද්ධති, හා ඉඩම් පරිහරණය ආශ්‍රිත දත්ත/තොරතුරු පරිතුලනය කිරීම සහ එක්රැස් කිරීම.

2. වෙරළ ඛාදන කළමනාකරණයට අදාළවන අන්තර් ආයතනික පදනම මත දත්ත පදනමක් පිළියෙල කිරීම සහ වෙරළ ඛාදන සහ ආරක්ෂණයේ තත්ත්වය පිළිබඳව සමීක්ෂණයක් කිරීම.

3. වෙරළ කලාපයේ සමාජ ආර්ථික ගති ලක්ෂණ, සංවේදී පරිසර පද්ධති, ඉඩම් පරිහරණය, ජල විද්‍යාත්මක තත්ත්වයන් පිළිබඳ ආයතනික සුපරීක්ෂණය මගින් පූර්ණ දත්ත පදනමක් ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම.

4. පෞද්ගලික සහ පොදු ආයතනවලට මෙන්ම පර්යේෂකයන්ට ඉහත දත්ත පදනම්වලට පිවිසීමට ඉඩ සැලසෙන ලෙස යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.

**ප්‍රතිපත්ති 1.3**

ආර්ථික සංවර්ධන කටයුතුවලට ඉඩප්‍රස්ථා විවරවන ලෙසත්, වෙරළ ආරක්ෂණය ස්ථාපිත වන ලෙසත් සංවර්ධන අවස්ථාවන් ඇතිවන ලෙසටත් තෝරාගන්නා ලද වඩාත් සුදුසු දූනට වෙරළ තීරයන් සඳහා පාරිසරිකව පිළිගත හැකි ගොඩකිරීමේ වැඩ යෝජනා ක්‍රම මගින් පුළුල් කිරීම ප්‍රවර්ධනය කිරීම.

**ක්‍රමෝපාය 1.3.1**

සංවර්ධන අවස්ථාවන්, වෙරළ ආරක්ෂණය සහ ආර්ථික සංවර්ධන අවස්ථා ඇති කිරීම සඳහා පවත්නා වෙරළ තීරයන් පුළුල් කිරීම සඳහා තෝරාගන්නා ලද වඩාත් සුදුසු ස්ථාන සහ පාරිසරික වශයෙන් පිළිගත හැකි ගොඩකිරීමේ වැඩ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම ප්‍රවර්ධනය කිරීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. අතිරේක ආරක්ෂණ ප්‍රදේශ ලබාදීමටත්, සංවර්ධන අවස්ථාවන් උදකරලීම සඳහාත් වෙරළබඩ තීරයන් ගොඩ කිරීම සඳහා යොමු රීති මාලාවක් සම්පාදනය කිරීම.

2. සංවර්ධන ක්‍රියාවලි මගින් ආරක්ෂණ පිරිවැය අත්කර ගැනීමට හැකි ස්ථාන සඳහා ගොඩකිරීමේ සැලසුම් සකස් කිරීමට මාර්ග උපදේශ ලබා දීම.

**ප්‍රතිපත්ති 1.4**

වෙරළ ඛාදනය අවම කිරීම සඳහා වැලි වැටි මත පරිසරයට සරිලන/ආවේණික තුරුලතා වගාකිරීම, ප්‍රවර්ධනය කිරීම මගින් වැලි වැටිවල ස්ථායිතාව වැඩි දියුණු කිරීම.

**ක්‍රමෝපාය 1.4.1**

වැලි වැටි ආශ්‍රිත තුරුලතාවන්ට හානි පමුණුවන අහිතකර කටයුතු පාලනය කිරීම සහ ආවේණික පැළෑටි විනාශ වී ඇති වැලි වැටිවල පරිසරයට සරිලන/ආවේණික ස්වාභාවික පැළෑටි නැවත වගා කිරීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. වැලි වැටිවල ඇති තුරුලතාවන්ට හානි පමුණුවන කටයුතු පාලනය කිරීම.

2. වැලි වැටිවල පරිසරයට සරිලන/ආවේණික ස්වාභාවික පැළෑටි නැවත වගා කිරීම.

**ප්‍රතිපත්ති 1.5**

වෙරළ තීර කළමනාකරණ ක්‍රියාවලියේදී වෙරළබඩ ස්වභාවික භූරූපනයන්ගේ ස්ථායිතාව වැඩි දියුණු කරනු ඇත.

**ක්‍රමෝපාය 1.5.1**

වෙරළබඩ භූරූපනයන්හි (Coastal features) ගේ ස්ථායිතාව වැඩි දියුණුවන ලෙස වෙරළ ඛාදනයේ බලපෑම අවම කිරීම සඳහා වෙරළ තීර කළමනාකරණ සැලසුම්/වෙරළාරක්ෂක වැඩ යෝජනා ක්‍රම සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. වෙරළබඩ ස්වාභාවික භූරූපන සංරක්ෂණය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් වෙරළ තීර කළමනාකරණ සැලසුම් සකස් කිරීම සඳහා ප්‍රමුඛතා ප්‍රදේශ හඳුනා ගැනීම.

**අරමුණ 2**

ස්වභාවික වෙරළ තීරය සහ වෙරළබඩ ලක්‍ෂණ සංරක්‍ෂණයට අනුකූල වන ලෙස වෙරළ කලාපය තුළ සහ ඉන් පිටත වූ සංවර්ධන කාර්යයන් තීරණය කිරීම සහ ස්ථානගත කිරීම.

**ප්‍රතිපත්ති 2.1**

ස්වභාවික වෙරළබඩ ක්‍රියාවලිය අවහිර නොවීම සහතික කිරීම සඳහා වෙරළ කලාපය තුළ සහ ඉන් පිටත සිදුවන සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සහ නියාමනය කරනු ඇත.

**ක්‍රමෝපාය 2.1.1**

වෙරළ කලාපය තුළ නව සංවර්ධන කටයුතු පාලනය කිරීමේ දී වෙරළාරක්‍ෂක යොමු රීතීන්ට අනුකූලව අවසර දිය යුතු අතර එම ප්‍රදේශ වෙරළ ඛාදනයට හෝ ගංවතුරට යටත් නොවන ප්‍රදේශ විය යුතුය.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. අනුකූලතා සුපරීක්‍ෂණ සැලැස්මක් සකස් කොට අවශ්‍ය පරිදි බලපත්‍ර අනුකූලතා සුපරීක්‍ෂණ සමීක්‍ෂණ පැවැත්වීම හා සංවර්ධන කටයුතු වෙරළාරක්ෂිත මගින් වෙරළබඩ ස්වාරක්ෂිත කලාප ප්‍රමිතීන් පිළිපැදීම බලාරක්ෂිත කිරීම.

2. වෙරළ ඛාදනය සහ ජල ගැලීම්වලට නතුවන ප්‍රදේශයන් හඳුනාගැනීම සහ එම ස්ථානවලට අදාළව නව යොමු රීති සකස් කිරීම.

3. අනුකූල නොවන සංවර්ධන කටයුතුවලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ගවලට එළඹීම.

4. ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් මට්ටමින් වෙරළාරක්‍ෂක යොමු රීතී පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

5. නව වෙරළාරක්ෂිතයන්, රෙගුලාසි සහ අදාළ ප්‍රමිතීන් ඇතුළත් කොට සංවර්ධනයන් සඳහා වූ මාර්ග උපදේශයන් සකස් කිරීම.

**ප්‍රතිපත්ති 2.2**

වෙරළබඩ සහ මුහුදු නිර්මාණ ඉදිකිරීමෙන් වෙරළ කලාපය තුළ සිදුවන කටයුතුවලට වන අහිතකර බලපෑම් අවම කරනු ඇත.

**ක්‍රමෝපාය 2.2.1**

වෙරළබඩ සහ මුහුදු නිර්මාණ මගින් වන අහිතකර බලපෑම් අවම කිරීම සඳහා මූලික පාරිසරික වාර්තා/පාරිසරික අගැයීම් වාර්තා මගින් නිර්දේශිත බලපෑම් අවම කිරීමේ පිළිවෙත් ක්‍රියාත්මක කිරීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

වෙරළ ආරක්ෂිත නිර්මාණ සහ අනිකුත් වැඩ යෝජනා ක්‍රම මගින් වෙරළ කලාපයට වන අහිතකර බලපෑම් අවම කිරීම සඳහා නිර්දේශිත පිළිවෙත් ක්‍රියාත්මක කිරීම.

**ප්‍රතිපත්ති 2.3**

වෙරළ කලාපයෙන් පිටත සිදුවන සංවර්ධන කාර්යයන්ගේ බලපෑම් අධ්‍යයනය කොට "බලපෑමට යටත්වන ප්‍රදේශ" (Affected Areas) ලෙස ප්‍රකාශයට පැමිණ වීමට සුදුසු ප්‍රදේශ අවස්ථානුකූලව නිර්ණය කිරීම.

**ක්‍රමෝපාය 2.3.1**

සවිස්තරාත්මක ක්ෂේත්‍ර අධ්‍යයනයක් සහ පාර්ශ්වකරුවන්ගේ අදහස් ලබා ගැනීමෙන් අනතුරුව "බලපෑමට යටත්වන ප්‍රදේශ" හඳුනාගැනීම සඳහා සුදුසු නිර්ණායකයන් සැකසීම සහ අවශ්‍යතාවන් අනුව අදාළ ප්‍රදේශ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පැමිණ වීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. "බලපෑමට ලක්වන ප්‍රදේශ" ලෙස ප්‍රකාශයට පැමිණ වීමට අපේක්ෂිත ප්‍රදේශ තීරණය කිරීම සඳහා නිර්ණායකයන් සැකසීම සහ අදාළ ලැයිස්තුවක් පිළියෙල කිරීම.

2. "බලපෑමට ලක්වන ප්‍රදේශ" කළමනාකරණය සහ පරිපාලනය සඳහා නෛතික විධිවිධානවලට අනුකූලව රෙගුලාසි සකස් කිරීම.

**ප්‍රතිපත්ති 2.4**

වෙරළ කලාපය තුළ සංවර්ධන පීඩනය අවම කිරීම සඳහා වෙරළ ඛාදනය මැඩපැවැත්වීම යාන්ත්‍රණ සඳහා අමතර ආරක්ෂණ ප්‍රදේශ සහ කෘතිම දූපත් නිර්මාණය පිළිගනු ලබනු ඇත.

**ක්‍රමෝපාය 2.4.1**

අමතර වෙරළාරක්ෂිතයන් (Additional Buffers) හා දූපත් නිර්මාණය සහ ගොඩකිරීම සඳහා සුදුසු ප්‍රදේශ තෝරා ගැනීමට තාක්ෂණික, පාරිසරික, සමාජ ආර්ථික සහ දේශපාලන සාධක පදනම් කොටගත් නිර්ණායකයන් සම්පාදනය කිරීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. අමතර වෙරළාරක්ෂිතයන්, දූපත් නිර්මාණය සහ ගොඩ කිරීමට සුදුසු ප්‍රදේශ ඇතුළත් අපේක්ෂිත ප්‍රදේශ ලැයිස්තුවක් සකස් කරන ලද නිර්ණායකයන් පදනම් කොට පිළියෙල කිරීම.

2. විය හැකි පාරිසරික, සමාජ ආර්ථික බලපෑම් හඳුනාගැනීම සඳහා පරිසර ඇගයීම් වාර්තා පිළියෙල කිරීම.

3. දූපත් නිර්මාණය සහ අතිරේක වෙරළ රක්ෂිතයන් නිර්මාණය සඳහා තාක්ෂණික යොමුරීති පිළියෙල කිරීම.

**අරමුණ 3**

වෙරළ කලාපයෙන් සහ ගංගාවලින් වැලි ඉවත් කිරීම පාලනය කිරීමෙන් සහ හිරිගල් කැණීම මුලිනුපුටා දැමීමෙන් වෙරළ ස්ථායිතාව වැඩිදියුණු කිරීම.

**ප්‍රතිපත්ති 3.1**

මුහුදු වෙරළින් සහ ගංගාවලින් වැලි ඉවත් කිරීම පාලනය කිරීමෙන් වෙරළ ස්ථායිතාව වැඩි දියුණු කරනු ඇත.

**ක්‍රමෝපාය 3.1.1**

සුපරීක්ෂණ වැඩසටහන් බලාත්මක කිරීම, කාල නියමයන් සහ ඉවත් කර ගන්නා ප්‍රමාණයන් පිළිබඳ සීමාවන් මාර්ගෝපදේශ මගින් හඳුන්වා දීමෙන් වෙරළින් සහ ගංගාවලින් වැලි ඉවත් කිරීම පාලනය කිරීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. වෙරළ කලාපයෙන් සහ ඉන් ගොඩබිම දෙසිනුත්, මුහුද දෙසිනුත් වැලි ඉවත් කිරීම සඳහා පිළියෙල කරනු ලබන මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ ආයතන සමග ක්‍රමෝපාය සකස් කිරීම.

2. ඉහත ක්‍රමෝපාය අනුව භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහභාගීත්වයෙන් වෙරළ කලාපයෙන් සහ ගංගාවලින් වැලි ඉවත් කිරීම පිළිබඳ කලින් කලට පරීක්ෂා කිරීම හෝ ඒ සඳහා සහය වීම.

3. බලපත්‍ර මගින් කරනු ලබන වැලි ඉවත් කිරීම යොමුරීති වලට අනුකූලව සිදු කරනු ලබන්නේ ද යන්න සහතික කිරීම.

4. භූ විද්‍යා සහ පතල් කැණීම කාර්යාංශය වැනි අදාළ ආයතන සමග වෙරළ කලාපය සහ ඉන් පිටත කරනු ලබන වැලි ඉවත් කිරීම හා සම්බන්ධ ගැටලුවල සංකීර්ණත්වය හඳුනා ගැනීම සඳහා සමීක්ෂණයක් පැවැත්වීම සහ දත්ත එක්රැස් කිරීම.

5. රාජ්‍ය ආයතන, විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතනවල සහයෝගය මත වැලි ඉවත් කිරීමේ තිරසාර මට්ටම තීරණය කිරීම, සහ ස්ථානීය වැලි ලැබීම සහ ක්ෂයවීම පිළිබඳ තත්ත්වයන් අර්ථකථනය කිරීම.

**ප්‍රතිපත්ති 3.2**

ඉදිකිරීම් සඳහා වැලි වෙනුවට විකල්ප ද්‍රව්‍ය හඳුන්වා දීමෙන් ගංගාවලින් වැලි ඉවත් කිරීම පාලනය කරනු ඇත.

**ක්‍රමෝපාය 3.2.1**

ගොඩනැගිලි ඉදිකිරිමේදී ගංගා වලින් ලබාගන්නා වැලි වෙනුවට සුදුසු විකල්පයක් හඳුනා ගැනීම සඳහා වූ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. අදාළ පාරිපාලන ඒකකයන් සහ ආයතන සමග එක් වී වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව පහත සඳහන් ඉලක්කයන් සපුරා ගැනීම සඳහා පර්යේෂණ ප්‍රවර්ධනය කරනු ඇත.

   - ඉදිකිරීම් කර්මාන්තය සඳහා යොදා ගන්නා වැලි ප්‍රමාණය අවම කිරීම සඳහා වූ නව තාක්‍ෂණයන් හඳුනා ගැනීම.

   - ඉදිකිරීම් කර්මාන්තය සඳහා වැලි අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා විකල්ප ද්‍රව්‍ය භාවිතය වැඩි දියුණු කිරීම.

**ක්‍රමෝපාය 3.2.2**

ගංගාවලින් ලබා ගන්නා වැලි වෙනුවට විකල්ප වශයෙන් ගැඹුරු මුහුදින් ලබා ගන්නා වැලි භාවිතය වැඩි දියුණු කිරීම.

**යෝජිත ක්‍රියාකාරම්**

1. අධ්‍යයනයන් මගින් උචිත අක් වෙරළ වැනි නිධි ප්‍රභවයන් හඳුනාගැනීම.

2. ඉදිකිරීම් කර්මාන්තය සඳහා මුහුදු වැලි භාවිතය පිළිබඳ ශ්‍රී ලංකාවේ සහ අනෙක් රටවල පවත්නා දත්ත සහ තොරතුරු ඒකාරාශි කිරීම, පර්යේෂණ ආයතන විශ්වවිද්‍යාල සහ රාජ්‍ය ආයතනයන්ගේ සහභාගිත්වයෙන් කෙරෙන පර්යේෂණ සඳහා අරමුදල් සැපයීම සහ මධ්‍යම දත්ත සමුදායක් ගොඩනැගීම.

3. ඉදිකිරීම් කර්මාන්තය සඳහා මුහුදු වැලි භාවිතය පිළිබඳ පිරිවැය වාසි අධ්‍යයනයක් දියත් කිරීම.

4. ඉදිකිරීම් කර්මාන්තය සහ වෙරළ පෝෂණය සඳහා ගැඹුරු මුහුදින් ලබා ගන්නා වැලි භාවිතා කිරීමේ ප්‍රතිලාභ පිළිබඳව පවත්නා දත්ත සහ බලපෑම් පිළිබඳ ඇගයීම් ප්‍රතිඵල පදනම් කොටගෙන ජාතික සහ ප්‍රාදේශීය මට්ටමේ සංවිධාන, ජනමාධ්‍යයන් හා රාජ්‍ය නොවන සංවිධාන දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

5. ගංගාවල වැලි ඉවත් කිරීමේ නියැළුණු අවතැන් වූ පිරිස් සඳහා විකල්ප රැකියාවක් ලබා දීමට වැඩ පිළිවෙලක් වෙනත් ආයතනවල සහයෝගයෙන් සම්බන්ධීකරණය කිරීම.

6. රාජ්‍ය අංශයේ ඉදිකිරීම් සඳහා අක් වෙරළේ වැලි භාවිතය සඳහා රාජ්‍ය අංශයේ ආයතන දිරිමත් කිරීම.

**ප්‍රතිපත්තිය 3.3**

හිරිගල්පර කැණීම තුරන් කිරීමෙන් වෙරළ ස්ථායීතාව වැඩිදියුණු කරනු ඇත.

**ක්‍රමෝපාය 3.3.1**

මුහුදින් සහ වෙරළින් ලබාගන්නා හිරිගල් ප්‍රමාණයෙන් අඩුවීම සැලකිල්ලට ගන්නා අතර මුහුදු හිරිගල් ඉවත් කිරීම පිළිබඳ පවත්නා තහනම දැඩිව ක්‍රියාත්මක කිරීමෙන් එම කැණීම් සම්පූර්ණයෙන් නැවැත්වීම තහවුරු කිරීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. පළාත් පාලන ආයතන සහ පොලීසියේ සහයෝගයෙන් හිරිගල් කැණීම පිළිබඳ තහනම තවදුරටත් ක්‍රියාත්මක කිරීම.

2. හිරිගල් වලින් සකස් කරනු ලබන හුණු වෙනුවට විකල්පයන් හඳුනාගෙන එම විකල්පයන් භාවිතය ප්‍රවර්ධනය කිරීම.

3. හිරිගල්වලින් සකස් කරනු ලබන හුණු වෙනුවට විකල්පයන් භාවිතය ප්‍රවර්ධනය සඳහා අදාළ ආයතන සමග සහභාගිත්ව යාන්ත්‍රණයක් සැකසීම.

**ප්‍රතිපත්තිය 3.4**

අනාගත වැලි ඉල්ලුමට අනුකූලව ඉදිකිරීම් කර්මාන්තය සහ අනෙකුත් අවශ්‍යතාවන් සඳහා මුහුදේ වැලි නිධි ඇතුළුව පවත්නා වැලි ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා වැලි පිළිබඳ අධ්‍යයනයක් ජාතික මට්ටමින් දියත් කිරීම ප්‍රවර්ධනය කිරීම.

**ක්‍රමෝපාය 3.4.1**

ඉදිරි දශකයේ දී අත්කර ගැනීමට බලාපොරොත්තු වන ආර්ථික ඉලක්කයන් සහ රට තුළ දැනට ක්‍රියාත්මක කොට ඇති දැවැන්ත සංවර්ධන කාර්යයන් සැලකිල්ලට ගෙන ජාතික මට්ටමේ වැලි පිළිබඳ වැඩසටහනක් දියත් කිරීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. ජාතික මට්ටමේ අධ්‍යයනයක් (National Sand Study) වැලි පිළිබඳව දියත් කිරීමේ වැදගත්කම හුවාදක්වන සංකල්ප පත්‍රිකාවක් පිළියෙල කිරීම.

2. අරමුදල් සහ රජයේ එකඟතාව ලබාගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීම.

3. ජාතික මට්ටමේ වැලි පිළිබඳ අධ්‍යයනය දියත් කිරීම සහ එහි ප්‍රතිඵල ඉදිරි ප්‍රතිපත්ති සම්පාදනය සඳහා යොමු කිරීම.

**අරමුණ 4**

වෙරළබඩ භූ රූපන, යටිතල පහසුකම් සහ දේශගුණික බලපෑම් වෙනස්වීම හේතුකොට ප්‍රජාව කෙරෙහි වන බලපෑම් අවම කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග සහ සැලසුම් සකස් කිරීම සහ ඒවා කාලීනව ක්‍රියාත්මක කිරීම.

**ප්‍රතිපත්තිය 4.1**

වෙරළබඩ භූ රූපන, යටිතල පහසුකම්, ජීවනෝපායන් සහ වෙරළබඩ ප්‍රජාව වෙත දේශගුණික වෙනස්වීම් හේතුකොට වන බලපෑම් අවම කිරීම සඳහා අනිශ්චිත අවස්ථා ක්‍රියාමාර්ග තිබීම සහ එම අනිශ්චිත අවස්ථා ක්‍රියාමාර්ග සහ සැලසුම් කාලීනව ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රමවේද සකස් කරනු ලබන බව සහතික කිරීම.

**ක්‍රමෝපාය 4.1.1**

මුහුදු මට්ටම ඉහළ යාම, වෙරළ ඛාදනය, ජල ගැලීම් සහ වෙරළ ආරක්ෂණය ව්‍යුහයන්ට සහ අනෙකුත් වෙරළබඩ සංවර්ධනයන්ට දේශගුණික විපර්යාස මගින් වන බලපෑම ගණනය කිරීම සහ සුපරීක්ෂණය කිරීමේ අවිනිශ්චිතතා (Contingency) පිළියම් සකස් කිරීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. මුහුදු මට්ටම ඉහළ යාමෙන් වන බලපෑම් පුරෝකථනය සඳහා සුළං රටාව, වර්ෂාපතනය, උෂ්ණත්වය, මුහුදු මට්ටම ඉහළයාම ආදිය පිළිබඳ සියලු දත්තයන් අදාළ ආයතන වෙතින් රැස්කිරීම.

2. අදාළ රාජ්‍ය ආයතනයන්ගේ සහභාගීත්වයෙන් වෙරළ කලාප කළමනාකරණයට අදාල දේශගුණික වෙනස්වීම පිළිබඳ ලක්ෂණයන් පිළිබඳ දත්ත පදනමක් සකස් කිරීම.

3. දේශගුණික වෙනස්වීම සම්බන්ධිත ලක්ෂණ අවම කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ දත්ත, තොරතුරු ලබා ගැනීමට ජාත්‍යන්තර ආයතන සහ ගෝලීය වැඩසටහන් සමග සබඳතා ස්ථාපිත කිරීම.

4. දේශගුණික වෙනස්වීම් පිළිබඳ බලපෑම් විශ්ලේෂණය කිරීම සහ කාලානුරූපීව ගැලපිය හැකි අනුවර්තන ක්‍රමෝපායක් (Adaptation Strategy) සඳහා පද්ධතියක් සකස් කිරීම.

5. ස්වභාවික ආපදාවන් හා සම්බන්ධිත සමාජ සහ විද්‍යාත්මක කරුණු පිළිබඳව කටයුතු කරනු ලබන ආයතන සමග බලපෑම් අවම කිරීම සහ කාර්යක්ෂමව පිළියම් යෙදීම සඳහා වූ ඵලදායි යාන්ත්‍රණයක් සකස් කිරීම.

6. වෙරළ කලාපයෙහි සිදුවන්නා වූ ස්වභාවික ආපදාවන්ගේ බලපෑම් අවම කිරීම හා අවම කිරීමේ වෙනත් ක්‍රියාමාර්ග සඳහා වූ අන්තර් ආයතන ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම.

7. වෙරළ ඛාදන කළමනාකරණය සහ වෙරළ කලාපයේ සංවර්ධනයන් සඳහා මුහුදු මට්ටම ඉහළ යාමේ යථාර්තවාදී ඇස්තමේන්තු සහ අනෙකුත් දේශගුණික වෙනස්වීම් වල බලපෑම් නිරන්තරයෙන් සැලකිල්ලට ගන්නා වූ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.

**ප්‍රතිපත්තිය 4.2**

මුහුදු මට්ටම ඉහළ යාම හා බැඳුනු ගැටලු අවම කිරීම සඳහා දේශගුණික අනුවර්තන පිළියම් (Adaptation Measures) ප්‍රවර්ධනය කිරීම.

**ක්‍රමෝපාය 4.2.1**

සිදුවිය හැකි මුහුදු මට්ටමේ ඉහළ යාම් සැලකිල්ලට ගෙන දේශගුණික වෙනස්වීම් අනුවර්තන ක්‍රමෝපායන් සම්පාදනය කිරීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. මුහුදු මට්ටමේ ඉහළ යාම නිර්ණය කිරීම සඳහා වඩාත් යථාර්ථවාදීව ප්‍රයත්න දැරීම.

2. අදාළ ආයතන සමඟ එක්ව වෙරළබඩ ධීවර කර්මාන්තය සහ ජල ජීවී වගාව ඇතුලු වෙරළබඩ සංවර්ධන කටයුතු සඳහා දේශගුණික වෙනස්වීම්වලට අනුරූපව යොමුරීති සකස් කිරීම.

**අරමුණ 5**

වෙරළබඩ උපද්‍රවයන් හේතු කොට ඉහළ යා හැකි වෙරළ ඛාදන තත්ත්වය මත සිදුවන බලපෑම් සහ අස්ථායීතාවන් අවම කිරීම සඳහා වෙරළබඩ ප්‍රජාවගේ ඔරොත්තු දීමේ හැකියාවන් වර්ධනය කිරීම දිගුකාලීන පිළියමක් ලෙස යොදා ගැනේ.

**ප්‍රතිපත්ති 5.1**

සමාජ සහ ආර්ථික බලපෑම් නැවත හරවා යැවීම සහ අස්ථායීතාවන් අවම කිරීම සඳහා වෙරළබඩ උපද්‍රවයන්ට ලක්විය හැකි ප්‍රදේශ හඳුනාගැනීම ප්‍රවර්ධනය කිරීම.

**ක්‍රමෝපාය 5.1.1**

වෙරළබඩ උපද්‍රවයන්ට නිරන්තරව ලක්විය හැකි ප්‍රදේශ හඳුනා ගැනීම සඳහා පසුකාලීන අත්දැකීම් සහ වෙරළබඩ අන්තරාය දර්ශකය (Coastal Vulnerability Index) පදනම් කොට නිර්ණායකයන් සකස් කිරීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. සකස් කරන ලද නිර්ණායකයන් උපයෝගී කොට වෙරළබඩ උපද්‍රවයන්ට ලක්විය හැකි ප්‍රදේශ නම් කිරීම සඳහා එම ප්‍රදේශ හඳුනා ගැනීම.

2. හඳුනා ගන්නා ලද උපද්‍රවයන්ට ලක්විය හැකි ප්‍රදේශයන්හි වෙරළබඩ ප්‍රජාවගේ මුහුණදීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා වැඩසටහන් දියත් කිරීම.

## REFERENCES


1. Byrne G. et al. 2002, Alternative for river sand, Unpublished report CRMP, 2002

2. Byrne, G and Nanayakkara, A. 2002, Alternative for River Sands, Final Report, unpublished , Coastal Resources Management Project.

3. Coast Conservation and Coastal Resources Management Department , 1986, Master Plan for Coastal Erosion Management

4. Coast Conservation and Coastal Resources Management Department, 2004, Revised Coastal Zone Management Plan 2004

5. Coast Conservation and Coastal Resources Management Department, 2014, Preparation of a Shoreline Status Report Covering Effectiveness of Structural and Non - Structural Solutions Adopted by Coast Conservation Department since 2004

6. Ministry of Environment Sri Lanka, 2011, Climate Change Vulnerability Data Book

7. Sri Lanka Land Reclamation & Development Corporation , 2013, Quantity of offshore sand pumping for the requirement of construction industry of Sri Lanka from 2004 - 2013 (Internal Records)

8. Olsen et. al, 1992 "Coastal 2000" ; A Resources Management Strategy for Sri Lanka's Coastal Region


# 3 පරිච්ඡේදය

## 3. වෙරළබඩ පරිසර පද්ධති සංරක්ෂණය

### 3.1 හැඳින්වීම

#### 3.1.1 වෙරළ පරිසර පද්ධතිවල පාරිසරික, සමාජීය හා ආර්ථිකමය වැදගත්කම

ශ්‍රී ලංකාවේ විවිධත්වයෙන් යුත් වෙරළ පරිසර පද්ධති රාශියක් ඇති අතර එම පද්ධතින්ට කලපු සහ මෝය (හෙක්. 2,14,522) කඩොලාන (හෙක්. 11,656) මුහුදු තෘණ තලා (හෙක්. 37,137) ලවන වගුරු (හෙක්. 27,520) හිරිගල්පර (අධ්‍යයනය කර නැත) සහ බාධක වෙරළ ඇතුළත් විශාල වෙරළ තීර ප්‍රමාණයක්, වැලි තුඩු (හෙක්. 5,731) සහ වැලි වැටි (හෙක්. 10,363) අයත් වේ. (වගුව 3.1 මඟින් මෙම පද්ධතීන්ගේ ප්‍රමාණය දිස්ත්‍රික් මට්ටමින් භූගෝලීය දත්ත තොරතුරු විශ්ලේෂණයන් උපයෝගී කොට දක්වා ඇත.) මෙම එක් එක් වෙරළබඩ පරිසර පද්ධතීන් සැලකිය යුතු ප්‍රභේද සංඛ්‍යාවකින් සමන්විත වන අතර මිනිසාට ප්‍රයෝජනවත් පරිසර පද්ධති සේවාවන් රාශියක් සපයනු ලබයි. පාරිසරික සේවාවන්ට අතිරේකව, වෙරළබඩ ප්‍රජාවගේ ජීවනෝපායන් සඳහා සැලකිය යුතු මට්ටමින් මෙම පරිසර පද්ධති උපකාරවන අතර ඔවුන්ගේ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීමෙන් සමාජීය ඒකාග්‍රතාව නඩත්තු කිරීමටත් සහාය වේ. බොහෝ වෙරළබඩ හා අක්වෙරල සම්පත් ආශ්‍රිත වෙරළබඩ පරිසර පද්ධති වෙරළබඩ අපනයන කර්මාන්තයේ දියුණුවට උපකාරී වන අතර එය ඉස්සන්, කකුළුවන්, පොකිරිස්සන්, මුහුදු අට්ටයන්, (මුහුදු කූඩැල්ලන්), හක්බෙල්ලන්, බෙලිකටු සහ වෙනත් ධීවර නිෂ්පාදන පදනම් වේ. 2015 වසරේදී මේ මගින් රුපියල් මිලියන 24,716 වැඩි ප්‍රමාණයක් උපයා ඇත. (ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය 2016)

දිවයිනේ වෙරළබඩ පරිසර පද්ධතීන්, ජෛව විවිධත්වයෙන් පොහොසත් සාගර හා වෙරළබඩ සම්පත් වලින් සමන්විත වේ. දැනට පවත්නා තොරතුරු අනුව, වෙරළබඩ සහ මුහුදු ජලයේ හඳුනාගත් ජීවී විශේෂ 1800 ට වැඩි සංඛ්‍යාවක් උප නිතල මත්ස්‍ය විශේෂ ද, වෙරළ වෙත බිජු ලෑම සඳහා එන කැස්බෑ විශේෂ පහක් ද, තර්ජනයට ලක් වී ඇති සහ දුර්ලභ මුහුදු ඌරා ඇතුළු ක්ෂීරපායී ඝනයට අයත් වෙනත් ජීවී විශේෂ 38 ක් සහ අපෘෂ්ඨවංශික විශේෂ 37 ක් ද එම සමුද්‍රජීවීන් අතර වේ. මුහුදු නයි විශේෂ කිහිපයක් සහ විවිධ වර්ගවලට අයත් හිරිගල්පර ආශ්‍රිත ජීවීන් ද මෙම ප්‍රදේශවලින් හමුවේ. වෙරළබඩ පරිසර පද්ධතීන්ගේ ප්‍රවේනි (genetic) විවිධත්වය ද ඉහළ අගයක් ගන්නා බව විශ්වාස කරන අතර ඒවායේ ආර්ථික වටිනාකමක් ද අන්තර්ගත විය හැක. මෙයට අමතරව කලපු සහ මෝය, හිරිගල්පර, කඩොලාන, මුහුදු තෘණ සහ ලවන වගුරු, විවිධ මත්ස්‍ය විශේෂ සහ අපෘෂ්ඨවංශිකයින් සහ

මොලස්කාවුන් බිජුලන හෝ වැඩෙන ස්ථාන වශයෙන් වැදගත් කාර්යභාරයක් ඉටු කරති. මේවායින් බොහෝමයක් වාණිජ අගයකින් යුත් ඒවා වෙයි.

හිරිගල්පර, කඩොලාන, කලපු, මෝය සහ වෙරළ තීරයන්ගේ උකහාගත නොහැකි වටිනාකම (Non extractive value) ඉතා විශාල අගයක් ගන්නා අතර සැලකිය යුතු ආර්ථික සහ සෞන්දර්යාත්මක අගයක් ද ගනී, මෝය සහ කලපු වැනි ජල තලයන් රක්ෂිතයන් (Buffer Zone) ලෙස ක්‍රියාත්මක වන අතර සුළි සුළං, ගං වතුර, සුළි කුණාටු වැනි කාලගුණික සම්බන්ධිත සිද්ධීන් මගින් වන රළ ක්‍රියාකාරීත්වයේ පූර්ණ බලපෑම අඩපන කිරීමෙන් ගංගා මගින් ගලා එන ජලය විසුරුවා හැරීමෙන් සහ තාවකාලික ජලය ගබඩාකර ගැනීමෙන් වෙරළබඩ ප්‍රජාව ආරක්ෂා කරනු ලබයි. කඩොලාන, මුහුදු තෘණ සහ ලවන වගුරු වැනි වෙරළබඩ පරිසර පද්ධතීන් විශාල පෙරහන් ලෙස ක්‍රියාත්මක වෙමින් නාගරික සහ කර්මාන්ත වලින් බැහැර කරන අපජලය සහ ගොඩබිමින් ගලා එන වර්ෂා ජලය මගින් ගෙන එනු ලබන දූෂක වැඩිපුර පෝෂක කොටස් හා රොන් මඩ රඳවා ගනී. (මිත්තපාල ශ්‍රියානි 2013) කඩොලාන කුඩා ධීවර යාත්‍රා නැංගුරම් ලෑමටත් වෙනත් ධීවර කර්මාන්තය ආශ්‍රිත කටයුතු සඳහා භාවිතා කරයි. රටවටා ඇති වෙරළ තීරයේ ආගමික, පුරාවිද්‍යාත්මක සහ ඓතිහාසික වටිනාකමින් යුත් ස්ථාන රාශියක් ස්ථානගත වී ඇති අතර වෙරළබඩ ජනගහනයෙන් සැලකිය යුතු කොටසක් විශේෂයෙන් ධීවර ප්‍රජාවගේ ගෙවතු සහ නිවාස සඳහා වෙරළාශ්‍රිත ප්‍රදේශය තුළ ඉඩ ප්‍රස්ථා සැපයේ.

ආහාරපාන, නිවාස ඉදිකිරීම් සහ බෝට්ටු නිෂ්පාදනය සඳහා දුව, දර, ධීවර ආම්පන්න සකස් කිරීම ආදී කටයුතු සඳහා වෙරළබඩ ප්‍රජාව විසින් කඩොලාන වැනි වෙරළබඩ තුරුලතා සම්ප්‍රදායිකව භාවිතා කෙරේ. බොහෝ වෙරළබඩ පරිසර පද්ධති විශේෂයෙන් හිරිගල්පර සහ වැලි වැටි වෙරළ තීරය ස්ථායි කිරීමට උපකාරී වේ. විශේෂයෙන් හිරිගල්පර ස්වභාවික පවුරක් ලෙස ක්‍රියා කරමින් මෝසම් කාලවලදී ඇතිවන ප්‍රබල රළෙහි ශක්තිය විසුරුවමින් වෙරළ ඛාදනය වලක්වයි.

වගුව 3.1 : **දිස්ත්‍රික් මට්ටමින් වෙරළබඩ පරිසර පද්ධතිවල ව්‍යාප්තිය (හෙක්ටයාර්)***

| දිස්ත්‍රික්කය | කඩොලාන | ලවන වගුරු | වැලි වැටි | බාධක වෙරළ වැලි තුඩු | කලපු සහ මෝය | අනෙකුත් ජල තලයන් | මුහුදු තෘණ තලා |
|---|---|---|---|---|---|---|---|
| කොළඹ | - | - | - | - | - | 400 | - |
| කළුතර | 130 | - | - | 45 | 172 | 105 | - |
| ගාල්ල | 495 | 224 | - | 112 | 1,259 | 486 | - |
| මාතර | 45 | - | - | 338 | - | 101 | - |
| හම්බන්තොට | 156 | 1,270 | 1,623 | 325 | 1,346 | 2,213 | - |
| අම්පාර | 301 | 294 | 607 | 816 | - | - | - |
| මඩකලපුව | 1,921 | 2,646 | - | 1,093 | 44,132 | 2,273 | - |
| ත්‍රිකුණාමලය | 1,707 | 1,365 | - | 337 | 18,100 | 1,192 | - |
| මුලතිව් | 208 | 722 | - | 717 | 5,377 | 352 | 2,054 |
| යාපනය | 2,427 | 4,970 | 4,590 | 800 | 43,872 | 2,100 | 21,225 |
| කිලිනොච්චි | 507 | 5,943 | - | 872 | 8,123 | 76 | 509 |
| මන්නාරම | 1,502 | 5,602 | 899 | 215.5 | 5,144 | 1,661 | 13,349 |
| පුත්තලම | 2,114 | 1,557 | 2,644 | 328.6 | 83,581 | 3,003 | - |
| ගම්පහ | 143 | 1,274 | - | 36.7 | 3,416 | - | - |
| **මුළු ප්‍රමාණය** | **11,656** | **27,520** | **10363** | **5731.6** | **214,522** | **13,062** | **37,137** |

Source : Synthesis report on coastal habitats (2014)

*පරිසර පද්ධති ප්‍රමාණය භූගෝලීය දත්ත පද්ධති (GIS) මඟින් ගණනය කොට ඇත.

3.1.2 වෙරළබඩ පරිසර පද්ධතිවල වර්තමාන තත්ත්වය

හිරිගල්පර

වෙරළ තීරයට සමාන්තරව සාගරය පතුලේ සිට ඉහළට විහිදී ඇති හිරිගල්පර නොගැඹුරු නිර්වතන ජලයේ පිහිටි දැඩි වේදිකාවන් වැනි ව්‍යුහයක් වේ. ඒවා සෑදී ඇත්තේ ජෛවී සංඝටක වන ඇල්ගාවන් ශ්‍රාවය කරනු ලබන කැල්සියම් කාබනේට් මගිනි. බොහෝ පර නිර්මානය වී ඇත්තේ හිරිගල් ජනපද හා කොරලයින ඇල්ගේ මගිනි.

ශ්‍රී ලංකාවේ හිරිගල්පර ස්වභාවය අනුව පද්ධති තුනක් යටතේ වර්ගකොට ඇත. ඒවා නම් :

(අ) ජීවී කොරල් සහ හුණු මිශ්‍රිත ද්‍රව්‍ය අඩංගු සත්‍ය කොරල්පර (calcareous substancese)

(ආ) වැලිගල් පර

(ආ) ගල් සහිත පර

මෙම වැලිගල් පර සහ ගල් සහිත පර සමහර අවස්ථාවලදී යම්යම් ප්‍රමාණයන්ගේ හිරිගල්පර වලින් වැසී ඇත. මෙම පද්ධති තුනම එකිනෙකට වෙනස් නමුත් ඒවා මිශ්‍රව එකට හමුවන අවස්ථා ඇත. (රාජසූරිය සහ වයිට් 1995).

හිරිගල්පරවල තත්ත්වය ප්‍රධාන වශයෙන් යටිවැස්ම, විවිධත්වය සහ හිරිගල්පර ජීවීන්ගේ බහුලත්වය සමග බද්ධවන අතර වඩාත් හොඳම තත්ත්වයේ හිරිගල්පර අක් වෙරළේ බාධක පර සමග සම්බන්ධව ඇත. ශ්‍රී ලංකාවේ වැඩි වශයෙන් ව්‍යාප්ත වී ඇත්තේ කඩින් කඩ පවත්නා කොරල්පර (patchy coral) වන අතර, එය වයඹ වෙරළබඩ හා ගැඹුරු මුහුදේ මන්නාරම් බොක්ක සහ කල්පිටිය අර්ධද්වීපය අතර දක්නට ලැබේ. මෙම කඩින් කඩ පවත්නා කොරල්පර බටහිර හා නැගෙනහිර වෙරළබඩ ජලයේ වෙරළ සිට කි. මී. 15-20 අතර දුරකින් සාමාන්‍ය ගැඹුර මී. 20ක් වනසේ පැතිර පවතී. නිරිතදිග, නැගෙනහිර සහ උතුරු වෙරළ තීරයන් හිදී වෙරළට ආසන්නව ගැට් හිරිගල්පර (Fringing Reef) දක්නට ලැබේ. සාමාන්‍යයෙන් මෙම හිරිගල්පර ගල්පරයක් පාදක කොට මුහුදු පත්ලේ සිට වැඩේ. වෙරළ තීරයෙන් 2% පමණ ගැට් හිරිගල්පරවලින් යුක්ත බවට ඇස්තමේන්තු කර ඇත. හික්කඩුව, නිරිතදිග වෙරළ තීරයේ උණවටුන හා රුමස්සල ගැට් හිරිගල්පර ප්‍රධාන වශයෙන් පවත්නා ස්ථානයන්ගෙන් කිහිපයක් වන අතර පාසිකුඩා නැගෙනහිර වෙරළ තීරයේ ගැටිහිරිගල්පර පවතින ස්ථානයන්ගෙන් ප්‍රසිද්ධ එකකි. යාපනය අර්ධද්වීපයේ ද හිරිගල්පර ප්‍රධාන වශයෙන් කුඩා දූපත් අවට පිහිටා ඇති නමුත් ඒවා ව්‍යාප්තව වැඩී නොමැත. වෙරළට තරමක් දුරින් වැඩි වශයෙන් පිහිටි හිරිගල්පර වලින් බාධක හිරිගල්පර සමන්විත වේ. වෙරළට සමාන්තර දිවෙන එම වැටි මගින් "පරකලපුව" (Reef lagoon) නිර්මාණය වී ඇති අතර, මේවා ශ්‍රී ලංකාවේ දුර්ලභ වන නමුත් වන්කාල සහ සිලාවතුර ප්‍රදේශවල එවැනි වැටි සමහරක් හමුවේ. වැලිගල්පර වෙරළ තීරයේ බොහෝ තැන්වල ව්‍යාප්තව ඇති අතර මේවායින් බොහෝමයක් මහාද්වීපික තටකයේ මුහුදු පත්ලේ සමෝච්ච රේඛා (bathymetric contours) දිගේ පිහිටා ඇත. ගල් සහිත පර බටහිර වෙරළ තීරයේ කොළඹට දකුණේ සිට ගිණිකොන දිගින් ත්‍රිකුණාමලයට දකුණින් වූ ප්‍රදේශය දක්වා දිවේ.

බාහිර බලපෑම් හේතුකොට දකුණු කොටසේ පවත්නා කොරල් පරවල ඇති කොරල් ආවරණය උතුරු සහ නැගෙනහිර පිහිටි කොරල් වැස්ම සමග සැසඳීමේ දී ඉතා අඩු මට්ටමක පවතී. දකුණු වෙරළ තීරයේ හිරිගල්පර හායන තත්ත්වය ප්‍රධාන වශයෙන් සිදුව ඇත්තේ පතුලේ එලන දැල් භාවිතය, කොරල් මත පය තැබීම, ඩයිනමයිට් දැමීම, කොහු කර්මාන්තය වීදුරු පතුල් සහිත බෝට්ටු සංචාරය, අහිතකර ධීවර කටයුතු සහ මිරිදිය වැඩි වශයෙන් ගලා ඒම සහ අවසාදිත තැන්පත්වීම මගිනි. (Synthesis Report on Coastal Habitats 2014 ) කෙසේ වුවත් වර්තමාන තොරතුරු අනුව හික්කඩුව සමුද්‍ර උද්‍යානයේ ජීවී හිරිගල්පර වැස්ම 2005 - 12% සිට 2007 වන විට 26% දක්වා වැඩි වී ඇත. මෙය බොහෝවිට සිදුව ඇත්තේ අඛණ්ඩ වර්ධනය වූ පොසිලිපෝරා ඩැමිකනිස් ( Pocilliporadamicornis) හේතුවෙනි. මෙය 2004 වසරේ 6% ක් පමණ වූ ජීවී කොරල් ආවරණය 2007 වසර වන විට 35% දක්වා වර්ධනය <u>විය.</u> අධික ලෙස අවසාදිත තැන්පත් වීම නිසා දැනට පවත්නා ඇක්රොපෝරා (Acropora) ප්‍රමාණය 0.6% දක්වා පහත බැස ඇති බව වාර්තා වී ඇත. (රාජසූරිය 2008) කප්පරතොට ප්‍රදේශයේ ජීවී හිරිගල්පර වැස්ම 2004 වර්ෂයේ දී 52% සිට 2006 වන විට 22 % දක්වා අඩු වී ඇත. වර්තමාන තොරතුරු අනුව පොල්හේන ප්‍රදේශයේ ජීවී කොරල් පර වැස්ම 21.2% වන අතර මඩිහ ප්‍රදේශයේ එය 6.45% ලෙසට වාර්තා වී ඇත. මෙය බොහෝ විට මනුෂ්‍ය ක්‍රියාකාරකම් වන කොහු කර්මාන්තය, විසිතුරු මසුන් එක්රැස් කිරීම සහ සංචාරක කටයුතු හේතුකොට සිදු වී ඇත. (Synthesis Report on Coastal Habitats 2014).

2014 වෙරළබඩ පරිසර පද්ධති පිළිබඳ සංක්ෂිප්ත වාර්තාව අනුව දිවයිනේ උතුරු සහ නැගෙනහිර වෙරළ තීරයේ හිරිගල්පරවල තත්ත්වය දකුණු දිග වෙරළ තීරයේ හිරිගල්පරවලට වඩා ඉහළ මට්ටමක පවතී. යාපනය අර්ධද්වීපයේ පුන්කුඩතිව් සහ මන්ඩතිව් දූපත් අවට හුනුගල් ආවරණය සහිත කොරල් වැස්ම 45% සහ 29% ලෙස වාර්තා වී ඇත. ත්‍රිකුණාමලයේ ඕලන්ද බොක්ක ප්‍රදේශය (Dutch Bay) හිරිගල්පර සාපේක්ෂ වශයෙන් ගුණාත්මක තත්ත්වයේ පවතින බවට වාර්තා වී ඇති අතර එය ඇක්රොපෝරා විශේෂ (Acropora spp.), ෆොලියෝස් මොන්ටිපෝරා (Foliose montipora) සහ එචින්පෝරා ලැමිලෝස් (Echinporalamellose) වලින් සමන්විත වේ. පෙර කරන ලද පසුවිපරම් වාර්තා අනුව මෙම හිරිගල්පරවල ජීවී පර ප්‍රමාණය 52% සහ කොරල් කැබලි 20% සමන්විත විය. 2004 සුනාමි ව්‍යසනය හේතුවෙන් මෙම හිරිගල්පරය හානි වූ අතර වර්තමානයේ ජීවී හිරිගල්පර 38.8% ප්‍රමාණයකින් සහ කොරල් කැබලි 40.23% සමන්විත වේ. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පරෙවි දූපත ආසන්න නොගැඹුරු මුහුදේ හිරිගල්පර අතු විහිදුන පර (Branching corals) සහ ඇක්රොපෝරා (Acropora spp.) විශේෂයන්ගෙන් සමන්විත වන අතර 2004 සුනාමියෙන් කිසිදු හානියක් සිදු වී නොමැත. මේ නිසා 2003 වර්ෂයේ දී 54.38% ක් වූ ජීවී හිරිගල්පර වැස්ම 2005 වනවිට 74.25% දක්වා වැඩි විය . ජාතික ජලජ සංවර්ධන පර්යේෂණ නියෝජ්‍ය ආයතනය (NARA) කරන ලද පසුවිපරම අධ්‍යනයන් අනුව කල්පිටිය සමුද්‍ර උද්‍යානයේ ජීවී කොරල් පර වැස්ම 2004 දී 40% පමණ වූ අතර එය 70% දක්වා 2007 වන විට වැඩි වී ඇත. මෙම වැඩිවීම බොහෝ දුරට ජීවී හිරිගල්පර වලින් 75% නියෝජනය කරනු ලබන ඇක්රොපෝරා සයිතීරා (Acropora Cytherea) සීඝ්‍ර වර්ධනය නිසා සිදුවිය.

**මුහුදු තෘණ**

මුහුදු තෘණතලා නොගැඹුරු මෝය සහ සාගර ප්‍රදේශවල හොඳින් වැඩෙන මල්ඵල දරන ශාක විශේෂයක් වන අතර ගොඩබිම සිට වසර මිලියන 65ත් 100ත් අතර කාලයකදී නැවත සාගරය වෙත සංක්‍රමණය වී ඇත. මෙම ශාක පත්‍ර, භූගත කඳ සහ මුල් සහිත වේ. මුහුදු තෘණ ආවරණය වූ ජල තලයන් තුළ හිරිගල්පර හෝ කලපු හා තඩාග මෝය ආශ්‍රිතව බොහෝ විට දැකිය හැක.

ශ්‍රී ලංකාවේ වෙරළබඩ ජලයෙහි මුහුදු තෘණ තලා බහුලව ඇති අතර ඒවා සාමාන්‍යයෙන් හිරිගල් පර පරිසර පද්ධති හෝ මෝය සහ කලපු ආශ්‍රිතව ව්‍යාප්තව ඇත. ගණයන් (Genera) 10 කට අයත් මුහුදු තෘණ විශේෂ 16ක් පුත්තලම, මුන්දලම, මීගමුව, මාවැල්ල, රැකව, කොග්ගල, කෝකිලායි, යාපනය සහ මඩකලපුව වැනි කලපු සහ තඩාග මෝයවලින් වාර්තා වී ඇත. ඉතා විස්තෘත වූ මුහුදු තෘණ තලා ඕලන්ද බොක්කේ (කල්පිටිය) සිට යාපනය අර්ධද්වීපයේ බටහිර කෙලවරට සහ මන්නාරමේ සිට පෝක් සමුද්‍ර සංධිය හරහා වයඹ දෙසට ද ඉන්දියානු වෙරළේ රාමේස්වරම් දූපත් දක්වා ද විහිදෙන බව වාර්තා වී ඇත. (සමරකෝන් සහ පින්තු 1988).

කෙසේ වුවත් ඊසාන දිග සිට ගිණිකොන වෙරළ තීරය දක්වා මුහුදු තෘණතලා ව්‍යාප්තිය සීමා සහිත වන අතර ඒ පිළිබඳ වාර්තාවන් ද නොමැත. මේ නිසා ශ්‍රී ලංකාවේ වෙරළ කලාපයේ මුහුදු තෘණතලා සංයුතිය සහ ව්‍යාප්තිය පිළිබඳ පැහැදිලි චිත්‍රයක් ලබා ගැනීම දුෂ්කරය. කෙසේ වුවත් 2008 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ මුහුදු තෘණතලා ප්‍රමාණය හෙක්ටයාර 23,819 ලෙස ඇස්තමේන්තු කොට ඇත. (ගුණතිලක සහ පිරිස 2008).

විවෘත බීජක (ශාකයක් වන මුහුදු තෘණ තලා වඩාත් ඵලදායිතාවයක් ඇති ජලයෙන් යට වූ පරිසර පද්ධතියකි. මේවා සංකීර්ණ ආහාර දාමයට ශක්තිය (energy) සපයන මූලාශ්‍රයක් වන අතර තර්ජනයට ලක් වී ඇති මුහුදු ඌරන්ට සහ අනෙකුත් ජලජ ජීවීන්ට වාසභූමි සපයයි. අනෙකුත් අපිශාක විසින් අවසාදිත එක්රැස් කර ගැනීමත්, රොන් මඩ නිෂ්පාදනය කිරීමත්, ද්‍රාවිත සහ අංශුමය කේන්ද්‍රීය කාබන්, ජලජ ආහාර දාමයට සැපයීමත් සිදු කරයි. මෙයට අමතරව මුහුදු තෘණතලා විශාල මත්ස්‍ය සංඛ්‍යාවකට, අපෘෂ්ඨවංශිකයන්ට සහ මට්ටින්ට (දෙපියලි) තම වර්ගයා බෝවන ස්ථාන ලෙස ක්‍රියාකරන අතර එය බොහෝවිට ඔවුන්ගේ ජීවන චක්‍රයේ කුඩා අවදියේ දී විශේෂයෙන් ක්ෂණික පාරිසරික වෙනස්වීම්වලට සහ පරපෝෂිතයන්ගෙන් අන්තරායට ලක්විය හැකි අවදිය වේ. (Silva E.I.L et al 2013) ශ්‍රී ලංකාවේ පොලිකීත්ස් (Polychatea) පනුවන් මුහුදු තෘණතලා වෙතින් ලබා ගන්නා අතර එම පනුවන් ජලජීවී වගාවේ මව් සතුනට ආහාර වශයෙන් ලබාදෙයි. උෂ්ණත්වයට අමතරව ආලෝකය, පෝෂක, වැලි, මඩ සහ කොරල් කැබලිවලින් සමන්විත පතුලක් සහිත ආරක්ෂිත කලාපයන් ඉතා හොඳින් මුහුදු තෘණතලා වැඩීමට උපකාරීවන අතර ඒවා විශේෂයන්ගේ විවිධත්වයෙන් සරුවෙයි. මෙම මුහුදු තෘණතලා මුහුදු ජලය පිරිසිදු කිරීමේ මාධ්‍යයක් ලෙස ද ක්‍රියාකරන අතර මුහුදු පතුලේ ස්ථායිකරණයට ලක් වේ. මෙයට අමතරව සාගරයෙන් කාබන්ඩයොක්සයිඩ් උරා ගැනීම, ඒවා ප්‍රභාසංස්ලේෂණය අවස්ථාවලදී කරනු ලැබේ. (මිත්තපාල එස්. 2008)

මුහුදු තෘණතලා මානව ක්‍රියාකාරකම් හේතුකොට විවිධ තර්ජනයට ලක් වී ඇත. මේවා අතර අහිතකර ධීවර පන්න ක්‍රම භාවිතය, බෙල්ලන් සහ කවඩින් එක්රැස් කිරීම, භෞතික නිර්මාණ ඉදිකිරීම, වඩදිය බාදිය ඇතුළුවන ස්ථාන (මෝය) වෙනස් වීම, කෘෂි රසායන ඇතුළුවීම, ඇල්ගී ඉස්මතුවීම, ජලය ඇතුළුවීම පාලනය කිරීම, ඉස්සන් ගොවිපල වලින් අපජලය සහ අපද්‍රව්‍ය මුදා හැරීම වැදගත් වේ. ශ්‍රී ලංකාවේ විවිධ වෙරළබඩ ප්‍රදේශවල දක්නට ලැබෙන මුහුදු තෘණ තලා 3.2 වගුව මගින් දක්වේ.

වගුව 3.2: ශ්‍රී ලංකාවේ විවිධ වෙරළ තීරයන්හි වාර්තාවී ඇති මුහුදු තෘණ විශේෂ

| විශේෂයන් | උතුර | දකුණ | බටහිර | වයඹ |
|---|---|---|---|---|
| *Cymodocea rotundata* | x | | | x |
| *Cymodocea serrulata* | x | | | x |
| *Enhalus acoroides* | x | | | x |
| *Halodule pinifolia* | x | | | |
| *Halodule uninervis* | x | | | x |
| *Halophila beccarii* | | | x | |
| *Halophila decipien* | | x | | x |
| *Halophila minor* | | | x | |
| *Halophila ovalis* | | x | x | x |
| *Halophila ovate* | x | x | | |
| *Potamogeton pectinatus* | | x | x | |
| *Naja marina* | | x | | |
| *Ruppia maritime* | x | x | x | |
| Siringodium isoetifolium | x | | x | x |
| *Thalassia hemprichii* | | | x | x |
| *Sostrea sp* | x | | | |
| එකතුව | 8 | 7 | 7 | 8 |

(*මූලාශ්‍රය* : (Silva E.I.L. et al 2013)

**කලපු සහ මෝය**

වෙරළබඩ කලපුවක් යනු බාධකයක් මගින් සාගරයෙන් වෙන්වූ නොගැඹුරු වෙරළබඩ ජල තලයකි. මෙම බාධකය හිරිගල්පරයක්, බාධක දූපතක් , වැලි වැටියක් හෝ වැලි තුඩක් හෝ තීරයක් ආකාරයට හෝ තැනින් තැන පිහිටි ගල්පර මගින් නිර්මාණය විය හැක. මෝය වනුයේ මුහුද සහ ගංගා එක්වන ස්ථානයයි. උදම් මඟින් ගෙන එනු ලබන මුහුදු ජලය ගංගා සහ ඇළ මාර්ග මගින් ගලා එන මිරිදිය සමග මිශ්‍ර වීම නිසා බොහෝ විට මෝය සහ කලපු ගතික පරිසර පද්ධති වේ.

ශ්‍රී ලංකාවේ වෙරළතීරය මෝය සහ කලපු රාශියක් සමන්විත වන අතර මේවා විවිධ නිවර්තන තත්ත්වයන් සහිත සංක්‍රාන්තික පරිසර පද්ධති, දර්ශනීය ස්ථාන, ආවේනික, දුර්ලභ සහ විශේෂයන් ගෙන් පොහොසත්, ජලජ ජෛව විවිධත්වය සහ පරිසර පද්ධති ඵලදායිතාව සහිත ඒවා වෙයි. මේවා සංකීර්ණ සමාජීය පාරිසරික පද්ධතීන් වන අතර කඩොලාන, ලවන වගුරු, මුහුදු තෘණතලා සහ මඩ සහිත තැනිතලා වලින් සමන්විත වේ. විෂමජාතිය ස්වභාවයෙන් සහ සංකීර්ණත්වයෙන් යුත් කලපු සහ මෝය මූලික වශයෙන් තීරණය කරනු ලබන්නේ භූරූපනය, දේශගුණික සහ කාලගුණය, වඩදිය බාදිය ඇතුළුවීම, ගංගා මගින් ගෙන එන අවසාදිත සහ ගොඩබිම ක්‍රියාකාරකම් සමග ඇති ඒකාග්‍ර අන්නෝන්‍ය ක්‍රියාවන්ය. (Silva E.I.L. et al 2013). සාමාන්‍යයෙන් කලපු සහ මෝය මගින් සිදු කරනු ලබන පරිසර පද්ධති සේවාවන් ඌණ තක්සේරු කොට ඇති අතර ඒවායේ බහුවිධ භාවිතයන් සහ ප්‍රතිලාභ ප්‍රමාණවත් ලෙස ප්‍රතිපත්ති සම්පාදනයේදී හෝ තීරණගැනීමේදී සැලකිල්ලට ගෙන නොමැත. ප්‍රාථමික ලක්ෂණයන් හැර කලපු සහ මෝය වල පාරිසරික වැදගත්කම පිළිබඳ දැනුමත් ඉතා අල්පය. වෙරළ ප්‍රදේශයන් තුළ කලපු 82 පිහිටා ඇති අතර ඒවායේ කලපු ඉවුරු තීරය (පරිමිතිය) කි. මී. 2791 වේ. මෙම කලපු ඉතා ඵලදායි ලෙස සලකනු ලබන අතර ජලජ සහ අර්ධ ජලජ පරිසර පද්ධති සහ කඩොලාන වැනිදෑ වල ජෛව නිෂ්පාදනයන්හි වටිනාකම් ද අන්තර්ගතය. කලපු සහ මෝය අර්ථවත් ප්‍රවේශයකින් කළමනාකරණය කිරීම සඳහා ජීව - භෞතික, සමාජ - ආර්ථික සහ දේශපාලනික කරුණු සැලකිල්ලට ගෙන ඒකාබද්ධ කල යුතුය. මේ නිසා කලපු සහ මෝය සමාජ - පාරිසරික පද්ධතීන් ලෙස හඳුන්වනු ලබයි. (සමරකෝන් ජේ 2012).

වගුව 3.3 මගින් වෙරළ කාණ්ඩයන්හි පිහිටි කලපු සංඛ්‍යාව සහ ඒවායේ පරිමිතය පෙන්වනු ලබයි.

**වගුව 3.3 : එක් එක් වෙරළ කාණ්ඩයන්හි පිහිටි කලපු සංඛ්‍යාව**

| *වෙරළ කාණ්ඩය* | *කලපු ප්‍රදේශයේ ප්‍රමාණය* (වර්ග කි. මී.) | *කලපු පරිමිතිය* කි. මී. | *කලපු සංඛ්‍යාව* |
|---|---|---|---|
| උතුර | 804 | 1221 | 17 |
| උතුරු නැගෙනහිර | 182 | 411 | 04 |
| නැගෙනහිර | 44 | 174 | 14 |
| ගිණිකොන | 29 | 149 | 16 |
| දකුණ | 23 | 109 | 10 |
| නිරිත | 20 | 166 | 09 |
| බටහිර | 46 | 157 | 03 |
| වයඹ | 372 | 410 | 09 |
| **මුළු ගණන** | **1,520** | **2,791** | **82** |

*මූලාශ්‍රය* : (සිල්වා E.I.L. et al 2013)

වර්ග දෙකකින් යුත් මෝය ඇත : ගංගා මෝය එනම් ගංගා එනම් ගංගා මෝයන්හි ජලය සාපේක්ෂ වශයෙන් පටු ඇල මාර්ග යක් ඔස්සේ ගංගා හෝ ඇල මාර්ග ජලය සෘජුවම මුහුදට මුදාහරිනු ලබයි. (උදා. කැළණි ගඟ, මහ ඔය, කළු ගඟ, නිල්වලා ගඟ, මෝයන්).

තඩාග මෝයන්හි ගංගා හෝ ඇල මාර්ග මගින් ජලය මුහුදට මුදාහැරීමට පෙර සාපේක්ෂව නොගැඹුරු ද්‍රෝනියනට (Basin) මුදා හැරේ. (උදා. පුත්තලම, මීගමුව, යාපනය, මඩකලපුව මෝයන් ) සමහර ස්ථානයන්හි මුහුදට විවෘත වූ බොක්කට ගංගා මෝය විවෘතව පවතී). (උදාහරණ : කලා ඔය මෝය ඕලන්ද බොක්කට විවෘතව පවතී, මහවැලි මෝය කොඩ්ඩියාර් සහ තඹලගමුව බොක්කට විවෘතව පවතී. පොල්අතු මෝදර, මෝදර මෝය, වැලිගම බොක්කට විවෘතව පවතී. සමස්ථයක් ලෙස ගත්කල මෝය 45ක් තිබෙන අතර ඉන් 28ක් ගංගා මෝය වර්ගයට අයත් වේ. අනෙකුත් 17 තඩාග මෝය වර්ගයට අයත් වේ. තඩාග මෝයන්හි ද්‍රෝනිය පමණක් හෙක්ටයාර 90,965 වන අතර ගංගා මෝය මඟින් හෙක්ටයාර 2110 ප්‍රදේශයක් ආවරණය වේ. වර්ග ප්‍රමාණය, හෙක්ටයාර 3 සිට හෙක්ටයාර 7589 දක්වා වූ කලපු 82 ක් පවත්නා අතර ඉන් කලපු 8 ක් හෙක්ටයාර 1000 ට වැඩි වර්ග ප්‍රමාණයක් ආවරණය කරයි. සමස්ථ කලපු වල වර්ග ප්‍රමාණය හෙක්ටයාර 36,000 පමණ වන අතර කලපු බොහෝවිට වැඩි වශයෙන් උතුරු, දකුණ, ගිණිකොන, නැගෙනහිර ප්‍රදේශයන්හි ඇති අතර මෙහි ගංගා මෝයන්හි වෙරළබඩ ප්‍රවාහය වෙරළබඩ ප්‍රවාහය මගින් බාධක සහ වැලි වැටි නිර්මාණය කෙරේ. මේ නිසා මිරිදිය මුදා හැරීම ඉතා මන්දගාමී ස්වරූපයක් උසුලයි.

**ලවන වගුරු**

ලවන වගුරු බොහෝවිට අන්තර් උදම් කලාපයේ ගොඩබිම සීමාවට ආසන්නව හමුවෙන අතර එහි එක්රැස්වන ලවන සෝදා හැරීමට ප්‍රමාණවත් ලෙස මිරිදිය නොලැබීම නිසා පසෙහි ලවන ගතිය සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක පවතී. මෙම ලවන වගුරු ලවනතාවයට ඔරොත්තු දෙන වැලි හෝ මඩ සහිත පොලවෙහි පැලවෙන ශාකයන්ගෙන් සමන්විත වේ.

පවත්නා තොරතුරු අනුව රටතුළ ලවන වගුරු හෙක්ටයාර 27,520 ක් තිබේ. (Synthesis Report on Coastal Habitats 2014) ඒ ඒ තත්ත්වයන් යටතේ ලවන වගුරුවල පැවැත්ම විවිධත්වයක් උසුලයි. පැතිරුනු ලවන වගුරු මන්නාරමේ මාන්තායි ප්‍රදේශයේ සිට වන්කාල දක්වා වූ වෙරළ ප්‍රදේශයේ පැතිර ඇත. (ප්‍රධාන වශයෙන් උදම් තැනිතලාවල පිහිටා ඇති වගුරු පැලෑටි විශේෂ 56 කින් සමන්විත වේ.) ප්‍රධාන වශයෙන් කඩින් කඩ විසිරුනු ලවන වගුරු පුත්තලම, කල්පිටිය, හම්බන්තොට, මුන්දලම ප්‍රදේශවල රොන්මඩ තැන්පත් වූ කලපු/මෝය ආශ්‍රිතව දක්නට ඇත.

කඩොලාන

> කඩොලාන එල හටගන්නා විශේෂිත වූ ශාකයන් වන අතර එය පඳුරු සිට ඉතා උස ශාකයන් වශයෙන් පවතී. ලෝකයේ නිවර්තන සහ උපනිවර්තන කලාපයන්හි කලපු මෝය සහ ආවරණය වූ බොකුවල අන්තර් උදම් කලාපයේ වර්ධනය වීමට මෙම ශාක සහ පඳුරු අනුවර්තනය වී ඇත. කඩොලාන පරිසර පද්ධති සමන්විත වනුයේ බොකුවල, කලපු සහ මෝයවල අන්තර් උදම් කලාපයේ අධික ලෙස අනුවර්තනය වූ ලවන ශාක හා නිරන්තර ජලය ගලා එන අනෙකුත් ශාක සහ ජීවීන්ද සමගය.

කඩොලාන, කලපු අන්තර් උදම් කලාපයට සීමාවූ ඉතා ඉහළ ඵලදායීතාවක් ඇති නමුත් තර්ජනයට ලක්විය හැකි පරිසර පද්ධතියකි. 2013 වසරේදී ශ්‍රී ලංකාවේ කඩොලාන භූමි ප්‍රමාණය හෙක්ටයාර 15,669 විය. (වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව 2013). භූගෝලීය තොරතුරු පද්ධති විශ්ලේෂණ මගින් 2014 වසරේදී සිදු කරන ලද ඇස්තමේන්තු අනුව කඩොලාන බිම් ප්‍රමාණය හෙක්ටයාර 11,656 ක් වේ. ශ්‍රී ලංකාවේ උදම්වල වෙනස්වීම ඉතා අඩු මට්ටමක ඇති අතර එය සෙ.මී. 75 ඉක්මවා යන්නේ කලාතුරකිනි. මේ නිසා කලපු, මෝය හෝ ආශ්‍රිත දූපත් වල අන්තර් උදම් කලාපයේ ඉතා පටු තීරයක් ලෙස කඩොලාන සාමාන්‍යයෙන් පවතී.

කෙසේ වුවත් මෙම පද්ධති සියලු අන්තර් උදම් කලාපයන්හි නොතිබෙන අතර ඉතා අඩු රළ ක්‍රියාකාරිත්වයක් ඇති ස්ථානයන්ට සීමා වේ. කඩොලාන මධ්‍ය බාදිය මට්ටමින් කි.මී. 1 ක් පමණ ගොඩබිම දෙසට ව්‍යාප්ත වන්නේ කලාතුරකිනි. නමුත් එවැනි ගංගාවන්හි ඉහළ ප්‍රදේශවල කිවුල්දිය ගලා යන ඉහළ සීමාව දක්වාත්, ඇතැම් ගංගා මෝයන්හි කි. මී. 20 ක් පමණ වූ දුරකට පවා ව්‍යාප්ත විය හැක. (උදා. ජලතර, කළුතර දිස්ත්‍රික්කයේ) කඩොලාන මගින් සපයන අප්‍රකාශිත වටිනාකම් සහ පාරිසරික සේවාවන්ට අමතරව එමගින් යැපෙන ප්‍රජාවට, ධීවර සම්පත්, දර, ගොඩනැගිලි ද්‍රව්‍ය, මාළු දැල් සැකසීම සඳහා සායම් ලබා ගැනීමට උපකාරී වේ. (සිල්වා et al 2013).

රට අභ්‍යන්තරයේ සිට රැගෙන එන දූෂණ සහ රොන්මඩ රඳවා ගැන්මට කඩොලාන පෙරහනක් ලෙස ක්‍රියාකරන අතර ගංවතුරින් වන බලපෑම් ද අඩු කරනු ලබයි. එය කාබන් රඳවා ගැනීම සම්බන්ධයෙන් ද ඉතා වැදගත් වේ.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන කඩොලාන ප්‍රදේශ පිහිටා ඇත්තේ උතුරු වෙරළෙහි යාපනය අවට, වඩමාරච්චි, කලපුව (තොන්ඩමනර්), නන්දිකඩාල් කලපුව, නැගෙනහිර වෙරළෙහි කෝකිලායි, නයාරු, ත්‍රිකුණාමලය කදිරවේලි, උප්පාරු කලපුව, වාලච්චේන, මඩකලපුව, පොතුවිල් දකුණු වෙරළෙහි වැලිගම, ගිංතොට, බලපිටිය, බෙන්තොට, බටහිර සහ වයඹ වෙරළවල පානදුර මෝය, මීගමුව සහ හලාවත කලපුව, මුන්දලම, පුත්තලම කලපුව ඕලන්ද බොක්ක, මන්නාරම සහ පෘතුගාල බොක්ක ආදිය වේ. අමරසිංහ (1986) අනුව කඩොලාන විශේෂ 29 ශ්‍රී ලංකාවෙන් හමු වී ඇත.

බාධක වෙරළ, වැලි තුඩු සහ වැලි වැටි

> බාධක වෙරළක් යනු රළ මගින් වෙරළත කරා ප්‍රවාහනය වන ඒකාබද්ධ නොවුන අවසාදිත රුසාර වේ. එය ජලතලය හරහා වැටී ඇති ස්වරූපයක් ගන්නා අතර එමගින් ජලතලය මුහුදින් වෙන් කරනු ලබයි.
>
> වැලි තුඩු යනු මූලික අවස්ථාවේ වූ වැල්ලක වෙරළක සිට ප්‍රමුඛ ප්ලාවිතය දෙසට විහිදී එක් කෙලවරක් නිදහස්ව පවතින්නා වූ බාධක වැල්ලකි.
>
> වැලි වැටි යනු සුළඟට ගසාගෙනවිත් තැන්පත් වූ වැලි රුසාරය වේ. මේවා වැල්ල සහ උදම් තලා වැනි යාබඩ භූමි වලින් ප්‍රධානව වෙනස් වන්නේ වැලි වැටි වලට උදම් මගින් බලපෑමක් නොවන නිසාය.

ශ්‍රී ලංකාවේ කි. මී. 1,620 ක් පමණ දිගින් වූ වැඩි වශයෙන් වැලි වලින් සමන්විත දර්ශනීය පුළුල් වෙරළ තීරයන් ඉතා ප්‍රසිද්ධ අතර එය ශාක සහ සත්ත්ව ප්‍රජාවේ පැවැත්මට උපකාරී වේ. වෙරළ නිර්මාණය වන්නේ අවසාදිත වෙරළේ තැන්පත් වීමෙනි. මේවා අතරින් බාධක වෙරළ, වැලි තුඩු සහ වැලි වැටි ඒවායේ වෙනස්වන සුළු බව හේතුකොට ඉතා අන්තරාකාරී තත්ත්වයට පත්ව ඇත.

බාධක වෙරළ

දිවයිනේ වෙරළබඩ ප්‍රදේශය කලපු සහ වගුරුබිම් මුහුදින් වෙන්කරනු ලබන බාධක වෙරළවල් වලින් සමන්විත වේ. (උදා. රැකව, කොස්ගොඩ, පානම) බාධක වෙරළවල් නිරිතදිග වෙරළ තීරයේ බෙන්තොට සහ බලපිටිය අතර වැඩි වශයෙන් හමුවේ. දකුණු

වෙරළ තීරයේ වැලිගම බොක්ක අසල බාධක වෙරළක් පවතින අතර දෙවුන්දර සහ අම්බලන්තොට අතර ද බාධක වෙරළවල් කිහිපයක් ඇත. කොඩ්ඩියාර් බොක්කෙන් බටහිර දෙසට වන කොටසේ තඹලගමුව බොක්ක සම්පූර්ණයෙන් බාධක වෙරළක් ලෙස වෙන් වී ඇති අතර ඊසාන දිග මෝසම් සමයේ අඩ වශයෙන් බිඳී යයි. ඇතැම් බාධක වෙරළ දෙකෙලවරම නිදහස්ව පවතින අතර එමගින් දූපත් නිර්මාණය වේ. (උදා. කාරතිව්).

### වැලි තුඩු

දිවයිනේ බටහිර සහ නැගෙනහිර වෙරළ තීරයන් දිගේ වැලි තුඩු බොහෝවිට හමුවන අතර ඒවා මෝය හා සම්බන්ධව පවතී. මීගමු මෝයේ කලින් කළ ගොඩනැගෙන ජලයෙන් යට වූ වැලි කණ්ඩි සහ කළුගඟ මෝයේ පවත්නා වැලි තුඩුව මීට නිදසුන් වේ. කල්පිටියේ දක්නට ඇති ආකාරයට බාධක වෙරළ සහ වැලි තුඩු ආශ්‍රිතව විස්තීරණ වූ වැලි වැටි පිහිටා ඇත. බොහෝ විට මෝය දෙසට නෙරා ඇති වැලි තුඩු අස්ථායි වෙයි. (උදා. කළු ගඟ වැලි තුඩුව) එලෙසම ඒවායේ පිහිටීම කලින් කළට වෙනස්වන අතර එමගින් මුවදොරෙහි නියත ස්ථානය සහ රටාව වෙනස් කරනු ලබයි. උදාහරණ වශයෙන් මඩකලපු මෝයෙහි මුවදොර එය වර්තමානයේ තිබෙන ස්ථානයේ ස්ථානගතවී ඇත්තේ ඊට කි.මී. 5 ක් පමණ දකුණින් පෙර පිහිටි ස්ථානයක සිටය. මෝයකටවල ඇතැම් වැලි තුඩු කාලීනව නිර්මාණය වන අතර ජලය ගලායාමේ රටාවන්ට බාධා පමුණුවන බැවින් පහත් බිම් ජලයෙන් යටවීමට හේතු වේ. (උදා. කළු ගඟ සහ මහ ඔය මෝයවල)

### වැලි වැටි

වැලි වැටි මහාද්වීපය සහ සාගරය අතර අන්තර් කලාපයේ පිහිටි සුවිශේෂී වූ ගොඩබිම පරිසර පද්ධතියකි. මෙම පරිසර පද්ධතිය ස්වභාවයෙන්ම ගතික වේ. මේ නිසා මානව ක්‍රියාකාරකම්වලින් පැනගෙන බලපෑම් වලට ලක්වීමෙන් පහසුවෙන් අන්තරායට භාජනය වේ.

රටතුළ වර්ග තුනක වැලි වැටි හඳුනාගෙන ඇත. ඒවා නම් :

- ❖ මීටර් 1 ට වඩා උසින් අඩු පහත් සමතලා ස්වරූපයේ සිට සුළු වශයෙන් රැලි සහිත හුදකලා වූ වැලි වලින් සෑදුන වේදිකාවක්. (උදාහරණ : කොග්ගල, මාතර, අකුරල සහ උස්වැටකෙයියාව ප්‍රදේශවල පවත්නා මූලික අවස්ථාවේ (Incipient) වැලි වැටි)
- ❖ උසින් මීටර් 5 ට වැඩි වූ ස්ථායි වෙරළතීර ආශ්‍රිත රැලි සහිත වැලි සංචිතවලින් යුත් ඒකල වශයෙන් පවත්නා පෙර වැලි වැටියකින් යුක්ත හරහට දිවෙන ප්‍රාථමික වැලි වැටි (උදා.- මන්නාරම, පුනරින් , කල්පිටිය සහ ගිණිකොන දිග වෙරළ තීරයේ පවත්නා වැලි වැටි)
- ❖ සාමාන්‍යයෙන් උසින් මීටර් 3 ඉක්මවන ඛණ්ඩනය වූ ද්විතික වැලි වැටි මන්නාරම පුනරින් කල්පිටිය සහ යාපනයේ දක්නට ලැබේ. මේවායින් බොහොමයක් දික් අතට පවත්නා අතර ඒවා පාරාවලික (parabolic) හැඩය ගන්නා අතර සුළු සංඛ්‍යාවක් හැඩයෙන් සංකීර්ණ වේ.

ශ්‍රී ලංකාවේ වඩාත් කැපී පෙනෙන වැලි කඳු පිහිටා ඇත්තේ ඊසාන දිග, වයඹ සහ ගිණිකොන දිග වෙරළ තීරයේය. මේවා මුලතිව් සහ පේදුරු තුඩුව දක්වා ද අලිමංකඩ සහ චාවකච්චේරි හරහා මන්නාරම් දූපතේ සිට කල්පිටිය සහ අඹකඳවිල දක්වා ද විහිදේ. ගිණිකොන දිග වෙරළ තීරයේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ අම්බලන්තොට (ගොඩවාය) සිට අම්පාර දිස්ත්‍රික්කයේ සංගමන්කන්ද තුඩුව දක්වා විහිදේ. අවසානයේ සඳහන් කරන ලද වෙරළ තීරයේ පිහිටි වැලි කඳු සමකයට ආසන්නව ලොව පිහිටි දිගම වැලි වැටි තීරය ලෙස හඳුනාගෙන ඇත.

ශ්‍රී ලංකාවේ වැලිවැටි ජෛව විවිධත්වයේ සහ වෙරළබඩ භූරූපනයේ අත්‍යවශ්‍ය අංගයන් වේ. මෙම වැලි වැටි මගින් මුහුදු මට්ටම ඉහළයාම සහ වෙරළ ඛාදනයෙන් ගොඩබිම සේදී යාම ආරක්ෂා කරනු ලබයි. වැලි වැටිවල පවත්නා ශාක ප්‍රජාව මගින් වැලි සුළඟෙන් රට අභ්‍යන්තරයට ගසා ගෙන යාම වලකයි. උදම් රළ සහ කුණාටු අවස්ථාවන්හීදී එට අභ්‍යන්තර ප්‍රදේශ ජලයෙන් යටවීම වැලි වැටි මගින් වලකනු ලබයි. දැනට පවත්නා තොරතුරු අනුව 2004 වසරේ ශ්‍රී ලංකාවේ ඇති වූ සුනාමි බලපෑමට එරෙහිව වඩාත් ඵලදායි බාධකයක් ලෙස ක්‍රියාකර ඇත්තේ තර්ජනයට ලක් නොවූ වැලි කඳුය.
(බඹරදෙනිය et al 2006).

### 3.2 ගැටලුවේ ස්වභාවය

රාජ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන සහ වෙනත් සිවිල් සංවිධාන විසින් විවිධාකාර කළමණාකරණ පිලියම් යෙදුව ද, ශ්‍රී ලංකාවේ වෙරළබඩ පරිසර පද්ධති බොහොමයක් විවිධ මට්ටමින් විවිධ ස්ථානයන්හි හායනයට ලක්ව ඇති අතර මේ නිසා ඒවායේ ප්‍රමාණය සහ සම්පත් වේගවත්ව ක්ෂයවී ගොස් ඇත. වෙරළබඩ පරිසර පද්ධති මෙලෙස හායනයට ලක්වීමට

බලපා ඇති සාධක වනුයේ ගොඩබිම සහ සාගරයේ ස්වභාවික හේතුමත සිදුවන ගතික ක්‍රියාවලීන් සහ මිනිස් ක්‍රියාකාරකම් වේ. මෙම සාධක කොටස් තුනකට වර්ග කල හැක. පළමුව වෙරළ ප්‍රදේශයන්හි ජනගහන වර්ධනයට සමගාමීව ආර්ථික ප්‍රතිලාභ - උදෙසා ප්‍රමාණය ඉක්මවා සම්පත් භාවිතය හේතුකොට පරිසර පද්ධතිවල ප්‍රමාණය සහ ගුණාත්මකභාවය ක්ෂය වීමයි. දෙවනුව කාලයක් මුළුල්ලේ සහ ක්ෂණිකව ඇති වන වෙරළබඩ ව්‍යසනයන් සෘජුවම වෙරළ ප්‍රදේශවල ඇති වෙරළබඩ පරිසර පද්ධතීන්ට අහිතකර බලපෑමක් කරන ලදී. (උදාහරණ වෙරළ ඛාදනය, සුළි සුළං (1978) සුනාමි (2004) "එල්නිනො" (1998) තෙවනුව 2009 වනතෙක් රටතුළ පැවති ගැටුම්කාරි තත්ත්වය විශේෂයෙන් උතුරු සහ නැගෙනහිර පිහිටි යම් යම් වෙරළබඩ පරිසර පද්ධති විනාශ වීමට බලපාන ලදී.

### 3.2.1 තර්ජන සහ ගැටලු

#### හිරිගල්පර විනාශ කිරීම සහ හානි පැමිණවීම

සමාජයට ප්‍රතිලාභ ගෙනදෙන හිරිගල්පර මගින් සපයන පාරිසරික සේවාවන් ඉතා වැදගත් වන අතර ශ්‍රී ලංකාවේ නොගැඹුරු මුහුදේ පවත්නා වටිනාම සාගර පරිසර පද්ධතිය ලෙස හිරිගල්පර හඳුනාගෙන ඇත. කෙසේවුවත් මෙම හිරිගල්පර බොහෝ ස්ථානයන්හි මානව සහ ස්වභාවික බලපෑම මත හායනයට ලක්ව ඇත. මෙලෙස හායනයට ලක්වූ හිරිගල්පර බටහිර සහ දකුණු වෙරළ තීරයන්හි විශේෂයෙන් නොගැඹුරු ප්‍රදේශවල දැකිය හැක. 2004 වසරේ සුනාමි ව්‍යසනයට පෙර හිරිගල්පර විනාශ වීමට බලපෑ මූලික හේතුව වූයේ හුණු කර්මාන්තය සඳහා මහා පරිමානයෙන් හිරිගල්පර ඉවත් කිරීමයි. හිරිගල්පර කැනීම පිළිබඳ 1988 පනවන ලද තහනම තිබියදීත් ප්‍රවාහනය, ලගතබා ගැනීම, පිලිසකර කිරීම්, එක්රැස්කිරීම් සහ කැනීම් සිදුවිය. දැනට පවත්නා තොරතුරු අනුව මුහුදින් කොරල් පර ඉවත් කිරීමේ සැලකිය යුතු අඩුවීමත් 1984 - 1998 කාලය තුළ සිදු විය. එසේ නමුත් සුනාමි ව්‍යසනයෙන් පසුව දකුණු සහ නිරිත දිග වෙරළ තීරයේ හුණු සඳහා හිරිගල්පර ඉවත් කිරීම විශාල ලෙස අඩුවූ අතර එය වර්තමානයේ අවම මට්ටමට ලඟා වී ඇත. මෙම තත්ත්වය ලඟාකර ගැන්මට වෙරළබඩ ප්‍රජාව තුළ හිරිගල්පරවල වැදගත්කම පිළිබඳ ස්වයං අවබෝධයක් ලැබීම හා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමණාකරණ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද නීති රීති රෙගුලාසි, මහජනතාව දැනුවත් කිරීම සහ පසුවිපරම් කටයුතු ද බොහෝ දුරට ඉවහල් විය.

හිරිගල්පර වලට හානි පැමිණෙන අනෙක් සාධකය නම් ඩයිනමයිට් දැමීම වැනි අහිතකර ධීවර පන්න ක්‍රමයන්, මොක්සි (Moxy) දැල් භාවිතය මගින් විසිතුරු මසුන් ඇල්ලීම, පතුල් දැල භාවිතයෙන් පොකිරිස්සන් ඇල්ලීම වැනි කටයුතු ද "සුරුක්කු" "ලයිලා" වැනි තහනම් පන්න භාවිතයද හේතුවන අතර මේවා හිරිගල්පරවල වාසය කරන දුර්ලභ මත්ස්‍යයන් අඩු වීමට හේතු වේ.

දකුණ, වයඹ සහ නැගෙනහිර වෙරළ තීරයන්හි සිදුවන වෙරළබඩ සංචාරක කර්මාන්තයේ වර්ධනයද සෘජුව හෝ වක්‍රව හිරිගල්පර හානිවීමට බලපා ඇත. හිරිගල්පර මත පා තැබීම, නැංගුරම් ලෑම, වීදුරු පතුල් සහිත බෝට්ටු ගමනා ගමනය සහ හිරිගල්පර කැබලි සිහිවටන ලෙස එක්රැස් කිරීම වැනි දෑ සෘජුවම මෙම පරිසර පද්ධති විනාශයට බලපා ඇත. මෙයට අමතරව සංචාරක මධ්‍යස්ථාන වල මල ද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධති වැරදි අයුරින් ස්ථානගත කිරීම මෙන්ම අක්‍රමවත්ව සැලසුම් කරන ලද යටිතල පහසුකම් හේතුකොට හිරිගල්පර මත වක්‍ර බලපෑම් ඇති කරනු ලබන බව මෙම ප්‍රදේශවලින් සාක්ෂි දරයි.

මානව ක්‍රියාකරකම් වලට අමතරව, "එල්නිනො" බලපෑම හේතුකොට ඇති වූ සාගර ජලයේ අධික උෂ්ණත්වය නිසා විශාල පරිමානයෙන් විරංජනයක් 1998 දී ඇති වූ අතර මෙම තත්ත්වය මත නොගැඹුරු මුහුදේ බොහෝ ස්ථානවල හිරිගල්පර විනාශ වීමට හේතු විය. මෑත කාලයේදී "එල්නිනො" බලපෑම නිතර ඇති වන්නක් බවට පත්විය. මෙම සිදුවීම් පරාසය වසර 12 සිට වසර 7 දක්වා අඩු වී ඇත.

කෙසේවුවත් මෙම උපනතීන් ස්ථිර කිරීම සඳහා වූ කාල රාමුව ප්‍රමාණවත් නැත. දැනට පවත්නා තොරතුරු අනුව දිවයිනේ විවිධ පලාත්වල විරංජන සිද්ධීන් 2000, 2002 සහ 2005 වර්ෂවල වාර්තා වී ඇති නමුත් 1992 තරම් විනාශකාරී සිද්ධීන් නොවේ. කෙසේවුවත් 2002 වසරේ දිවයිනේ දකුණ වෙරළ තීරයේ සිදු වූ විරංජන සිද්ධියේ ප්‍රමාණය 1998 විරංජන සිද්ධියට සමාන ලෙස සැලකේ. (Synthesis Report 2014).

මෙයට අමතරව පසැගිල්ලා (Star fish) වැනි විලෝපියන් පැතිරීයාම මගින් හිරිගල්පර විශාල වශයෙන් විනාශ විය. මෙවැනි වසංගත තත්ත්වයන් බොහෝවිට වැඩිවශයෙන් වාර්තා වන්නේ විශාල ජනගහනයක් සිටින, ප්‍රමාණය ඉක්මවා ධීවර කටයුතු කරන හෝ ගොඩබිම ප්‍රදේශවලින් පෝෂක ගලායාම ඉහළ යන ස්ථානවලිනි. හිරිගල්පරවලට හානිකරන ගැස්ට්‍රොපොඩ් මොලොස්කා (gastropod mollusk) විලෝපිතයන් මගින් වන හානි පිළිබඳ වාර්තා ද ඇත. විලෝපිතයන්ට අමතරව ඇතැම් ප්‍රධාන හිරිගල්පර, විශාල ඇල්ගී ප්‍රමාණයන්ගෙන් වැසී ගොස් ඇතිබව නිරීක්ෂණය කොට ඇත. මෙම තත්ත්වය විශේෂයෙන් නිලාවැලි පරෙවි දූපත සහ පොල්හේන හිරිගල්පර ආශ්‍රිතව

නිරීක්ෂණය කලහැක. හිරිගල්පරවල පාරිසරික තුළනයට ආක්‍රමණශීලී විශේෂයන් පැතිරීම ප්‍රධාන තර්ජනයක් බවට දැන් හඳුනාගෙන ඇත. දිවයිනේ බටහිර ප්‍රදේශවල හිරිගල්පරවලට හානිකර ආක්‍රමණශීලී විශේෂ හඳුන්වා දෙන ලද්දේ තෙල් නැව් මගින් මුදා හරින ජලයෙන් හෝ ජලජ (ill informed release of aquarium specimen) නිදර්ශකයන් මගින් බවට සැක කෙරේ. (Synthesis Report on Coastal Habitat 2014) සුනාමි ව්‍යවසනය (2004) නිසා හිරිගල්පරවලට වූ බලපෑම් පිළිබඳ 2005 වසරේදී නාරා ආයතනය මගින් කරන ලද සමීක්ෂණයට අනුව ඇතැම් ප්‍රදේශවල හිරිගල්පරවලට සාපේක්ෂව ඉහළ මට්ටමකින් හානි වීමත් ඇතැම් ස්ථානවල හිරිගල්පරවලට තැනින් තැන හානිවීමත් වාර්තා කොට ඇත. මෙම ඇස්තමේන්තුව අනුව දකුණු ප්‍රදේශයේ ඇතැම් ස්ථාන වල කිසිදු බලපෑමක් සිදු වී නොමැති බවට වාර්තාකොට ඇති අතර අනෙකුත් බොහෝ ස්ථානවල බලපෑම් මධ්‍යස්ථ හෝ ඉහළ මට්ටමක පවතින බව වාර්තාකොට ඇත. වැඩිම බලපෑම වාර්තා වී ඇති ඕලන්ද බොක්කෙ හිරිගල්පර විනාශය ඉතා ඉහළ වන අතර මත්ස්‍ය ගහනය ඉතා විශාල වශයෙන් පහත වැටී ඇත. (http:/www/fao.org/docrep/010/aioooe/A1000E07) (FAO-2007).

මෙයට අමතර දකුණු වෙරළ තීරයේ තංගල්ල, කුඩාවැල්ල, හික්කඩුව, කප්පරතොට, වැලිගම, පොල්හේන සහ උණවටුනේ හිරිගල්පරද සැලකිය යුතු මට්ටමින් හානි වී ඇත. සිදුව ඇති හානි තැනින් තැන වන අතර, 1998 විරංජනය හේතුකොට විනාශ වූ හිරිගල්පර සුන්බුන් එහා මෙහා යාමෙන්ද හානි සිදුව ඇත. (Synthesis Report on Coastal Habitat 2014)

**වගුව 3.4 : 1999 - 2000 ජීවී හිරිගල්පර සහ විරංජනයෙන් පසු හිරිගල්පරවල තත්ත්වය**
(රාජසූරිය 2003)

| ස්ථානය | ගැඹුර | විරංජනයට පෙර ජීවී කොරල් වැඩීම | 1999 - 2000 කොරල් වැඩීම | 2004 - 2013 කොරල් වැඩීම |
|---|---|---|---|---|
| බාර්පර සමුද්‍ර අභය භූමිය | 0-3 | 78.5 | 100% | කොරල් වැඩීම පෙන්නුම් කරයි |
| බාර්පර සමුද්‍ර අභය භූමිය | 7-8 | | 100% | 14% |
| කන්දකුලිය | 0-5 | 22% | කොරල් වර්ධනය (විරංජනයෙන් පසුව) | වැලිමඩ හේතුවෙන් කොරල් වැඩීම නැවතී ඇත. |
| හික්කඩුව | 0-4 | 47% | 7% | 12% |
| වැලිගම | 0-2 | 92% | 30% | 54% |
| රුමස්සල | 1-5 | 45% | 19.6% | 23% |

**කලපු සහ මෝය පරිසර පද්ධති හායනය**

ශ්‍රී ලංකාවේ කලපු සහ මෝය ඉතා වටිනා පරිසර පද්ධති වන අතර ධීවර ප්‍රජාවට ආදායම් උත්පාදනය කරදෙනු ලබන මූලාශ්‍රයක් ලෙසත්, ජෛව විවිධත්වය බහුලවූත්, ධීවර යාත්‍රා නවතා තැබීමට නැංගුරම් පහසුකම් සපයමින් ආර්ථික උපකාරක සාධකයක් ලෙසත් ක්‍රියාත්මක වේ. උදාහරණයක් ලෙස මීගමුව, පුත්තලම සහ මඩකලපුව යන වඩාත් ඵලදායී තඩාග මෝයන්ගේ ධීවර කටයුතුවලින් උත්පාදනය කරනු ලබන වාර්ෂික ආදායම රුපියල් බිලියන දෙකක් ඉක්මවයි. (සමරකෝන් ජේ, et al 2012). කෙසේ වෙතත් කලපු මෝය සහ ඒවායේ ජෛව විවිධත්වය දැඩි පීඩාවට ලක්ව ඇති අතර වෙරළබඩ ජනගහනය ඉහලයාම, වෙරළබඩ ප්‍රදේශවල දූෂණය ඉහළ යාම, මල ද්‍රව්‍ය ගලා ඒමෙන් වන දූෂණය, පිරිපහදු නොකරන ලද කාර්මික අපද්‍රව්‍ය, නාගරික අපද්‍රව්‍ය සහ දැවිතෙල්, ආක්‍රමණශීලී ශාක පැතිරීම සහ දේශගුණික විපර්යාසයන්ගේ ගැටලු නිසා ද සැලකියයුතු වෙනස්වීම්වලට භාජනය වී ඇත. වයඹ දිග ප්‍රදේශයේ පවත්නා කලපු සහ මෝය ප්‍රදේශ ඉස්සන් ගොවිපළවලින් බැහැර කරන අපද්‍රව්‍ය හේතුකොට දූෂණය වී ඇත. ඇතැම් කලපු සහ මෝය දූෂණය වී ඇත්තේ කොහු කර්මාන්තය සඳහා පොල් ලෙලි පල් කිරීම, වැලි හැරීම හා යාත්‍රා නැංගුරම් ලෑම මගිනි. (උද. මාදුගඟ මෝය, බොල්ගොඩ මෝය, මීගමුව මෝය) මෝය සහ කලපුවලට අත් විඳීමට සිදුව ඇති සෙසු බලපෑම් වනුයේ වාරිමාර්ග යෝජනා ක්‍රම වැනි රට අභ්‍යන්තරයේ සිදුවන සංවර්ධන කටයුතු හේතුකොට රොන්මඩ තැන්පත්වීම ඉහළයාම, කෘෂිකාර්මික කටයුතුවලින් පසට වන අවහිරතා, කැලෑ එළිපෙහෙලි කිරීම්, කැණීම් සහ ඉදිකිරීම් ආදියයි. වාරිමාර්ග යෝජනා ක්‍රම හේතුකොට ස්වභාවික ජල ගලායාම වෙනස්වීම මගින් ඇති කරන ලද බලපෑමෙන් මෝය සහ කලපු කිහිපයක ලවනතාවන් (කරදිය මට්ටම) වෙනස් වී ඇත. මෙමගින් ඇතැම් විට සැල්විනියා, කටුපෙඳ (*Najasmarina*) වැනි ආක්‍රමණශීලී ශාඛ වර්ධනයට ඉවහල් වී ඇත. වානිජ වශයෙන් වැදගත් මත්ස්‍ය ජීවී විශේෂ ප්‍රමාණය ඉක්මවා නෙලා ගැනීමෙන්ද මෙම පද්ධති කෙරෙහි අහිතකර බලපෑම් ජනිතකර ඇත.

මෙම පරිසර පද්ධතීන් හා බැඳුන අනෙක් ගැටලු වනුයේ අනවසර අත්පත්කර ගැනීම් සහ ඉඩම් ගොඩකිරීම් හේතුකොට කලපු සහ මෝයන්හි සක්‍රිය ජල ප්‍රදේශ අඩු වී යාමයි. (උදා. බොල්ගොඩ, මීගමුව, මාවැල්ල සහ ලුනාව කලපුව) ඇතැම් මෝය සහ කලපුවල පාරිසරික ගුණය සහ දර්ශනීය අගයන්ද ක්ෂය වී ඇත. (උදා. බෙන්තොට, මාදුගඟ, බොල්ගොඩ කලපුව) මේ හේතු නිසා ධීවර කටයුතු, සංචාරක කර්මාන්තය, විද්‍යාත්මක පර්යේෂණ සහ අධ්‍යාපන කටයුතු සඳහා කලපු සහ මෝය ප්‍රදේශ යොදා ගැනීම අඩාල වී ඇත. ශ්‍රී ලංකාවේ කලපු සහ මෝය ප්‍රදේශයන්හි පූර්ණ සහ අර්ධකාලීන ධීවරයන් 30,000 පමණ නියැලී සිටින බැවින් මෙය සැලකියයුතු ගැටලුවක් වී ඇත

සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවේ බොහෝ කලපුවල සම්පත් තවමත් ඉතා හොඳ, තරමක් හොඳ හෝ සෑහීමට පත්විය හැකි මට්ටමේ පවතී. මන්නාරම ප්‍රදේශයේ ස්ථානගත කලපු අන් දිස්ත්‍රික්කවල කලපුවලට වඩා හොඳ මට්ටමින් පවතින බව වාර්තා වී ඇත. කෙසේ වුවත් හම්බන්තොට, කොළඹ සහ ගාල්ල දිස්ත්‍රික්කයන්හි කලපු "අසතුටුදායක" හා ඉතා "අසතුටුදායක" ලෙස වර්ගකර ඇත. (සිල්වා EIL, et al 2013)

**මුහුදු තෘණතලා විනාශ වීම**

මෑත කාලයේ ශ්‍රී ලංකාවේ මුහුදු තෘණතලාවල තත්ත්වය පිළිබඳ යාවත්කාලීන කිරීමක් සිදුකොට නොමැත. කෙසේ වෙතත් පවත්නා තොරතුරු අනුව කලපු සහ හිරිගල්පර ආශ්‍රිතව පවත්නා මුහුදු තෘණතලා බොහොමයක් අහිතකර ධීවර පන්න ක්‍රම භාවිතයෙන්ද ධීවර දැල් කලපු පතුලේ ඇදගෙන යාම මගින්ද හානියට පත්වෙයි. වෙරළබඩ තෙත් බිම්වල පවත්නා මුහුදු තෘණ තල්ලු දැල සහ අදින දැල භාවිතය හේතුකොට විශාල ලෙස හානිවන බව දක්වා ඇත. (මිත්‍රපාල එස්, 2008) යාපනය සහ පුත්තලම අතර මුහුදු තීරයේ මුහුදු තෘණ මත වාණිජ මට්ටමින් යොදගන්නා ට්‍රොල් දැල සහ පාවෙන දැල්ද ඇතැම් ස්ථානවල සිදුකරන මාදැල් ද විශාල වශයෙන් මුහුදු තෘණවලට හානි පමුණුවයි. ඉන්දියානු ධීවරයින් විසින් මහා පරිමානයෙන් උතුරු මුහුදේ අනවසරයෙන් කරනු ලබන වාර්තාගත වී ඇති ට්‍රොල් හේතුකොට දැඩි ලෙස මුහුදු තෘණවලට හානි සිදුව ඇත. ඉස්සන් ඇති කරන ස්ථානවල එම සතුන්ට ආහාරදීම සඳහා පොලිකීට් (Polychete) පනුවන් වාණිජ මට්ටමින් නෙලා ගැනීමෙන් මුහුදු තෘණවලට විශාල හානියක් සිදුවී ඇත (මීගමුව සහ හලාවත මෝය). අනෙක් අහිතකර බලපෑම්වනුයේ ගැඹුරු මුහුදේ වැලි ඉවත් කිරීමෙන් එන රොන්මඩ තැන්පත් වීම, වාරිමාර්ග කටයුතු මගින් රට අභ්‍යන්තරයේ කෙරෙන ජල පෝෂකයන්ගේ වෙනස්කම් මගින්ද, වැලි තුඩු නිර්මාණය වීමෙන් සහ අනෙකුත් ස්වභාවික හේතු සහ මානව ක්‍රියාවලින්ද මුහුදු තෘණතලා හායනය විය හැක. 2004 සුනාමිය මගින් ශ්‍රී ලංකාවේ සිදුවූ මුහුදු තෘණවලට වූ හානිය ඉතා අල්ප සිද්ධියක් ලෙස වාර්තා කොට ඇත. (FAO 2007). මෙයට අමතරව දේශගුණික විපර්යාස හේතුකොට මුහුදු ජලයේ උෂ්ණත්වය වැඩිවීම, හේතුවෙන්ද මුහුදු තෘණතලාවල වර්ධනය, නැවත නිෂ්පාදන සහ සාමාන්‍ය පරිවෘතිය (metabolism) මගින් ද සෘජු බලපෑමක් ඇති විය හැක. (මිත්තපාල එස්, 2008)

**කඩොලාන ප්‍රදේශ හායනය සහ විනාශ වීම**

ඉස්සන් වගාව සහ ලුණු නිෂ්පාදනය සඳහා විශාල වශයෙන් කඩොලාන බිම් පරිවර්තනය කිරීම නිසා විශේෂයෙන් උතුරු සහ නැගෙනහිර පිහිටි කඩොලාන වගුරුබිම්වලට විශාල හානියක් සිදුවිය. මෙයට අමතරව කඩොලාන බිම් විනාශ වීම සඳහා පහත් බිම්වල කෘෂි කාර්මික කටයුතු, නිවාස ඉදිකිරීම, ජනාවාස පුළුල් කිරීම විශාල වශයෙන් බලපා ඇත. මීගමුව කලපු පරිසරය ආශ්‍රිතව තිබූ කඩොලාන බිම් ප්‍රමාණය හෙක්ටයාර 253 දක්වා වර්ෂ 2010 වනවිට අඩුවූ අතර මේ අනුව පසු ගිය වසර 20 තුළ දළවශයෙන් හෙක්ටයාර 100 ක කඩොලාන බිම් මානව කටයුතු නිසා විනාශ වී ඇත. (Kasigeet al 2012) වයඹ පළාතේ කඩොලාන බිම් විනාශ වී ඇත්තේ මූලික වශයෙන් ඉස්සන් වගාව ව්‍යාප්තවීම නිසාය. සුළු ප්‍රමාණයක් ජනාවාස හා කර්මාන්ත ව්‍යාප්තිය නිසා විනාශ වී ඇත. තවද 1986 සිට 2009 දක්වා සැලකිය යුතු ප්‍රමාණයකින් කඩොලාන වැස්ම මානව කටයුතු නිසා අඩු වී ඇත. කඩොලාන සම්පත් වැඩිපුර භාවිතයන්ද දක්නට ඇත. උදහරණ වශයෙන් ගෘහස්ථ කටයුතු සඳහා දැව සහ දර වශයෙන්ද, මස් අතු (Brush pile) සඳහාද තිරසාර මට්ටම් ඉක්මවා භාවිතා කොට ඇත. රොන්මඩ තැන්පත් වීම සහ දූෂණය හේතුකොට ද කඩොලාන පද්ධති විනාශ වේ. මානව ක්‍රියාකාරකම්වලට අතිරේකව ස්වභාවික හේතුද කඩොලාන විනාශ වීමට බලපා ඇත. 2004 සුනාමි ව්‍යසනය හේතුකොට විශාල කඩොලාන බිම් ප්‍රමාණයක් වාලච්චේන, අක්කරේපත්තු, වාකරේ, සල්ලිතිව් සහ පානම වෙරළබඩ තීරයන්ගේ විනාශ වී ඇත. සැල්වීනියා , කටුපෙඳ, වෙල් අනෝද වැනි ආක්‍රමණශීලී ශාකද කඩොලාන පරිසර පද්ධති කෙරෙහි අහිතකර බලපෑම් ඇති කරන ලදී. (Synthesis Report on coastal Habitats, 2014)

**ලවන වගුරු විනාශ කිරීම**

දිවයිනේ වියලි දේශගුණය වැඩි කලක් පවත්නා උතුර, වයඹ, ඊසානදිග සහ ගිනිකොන දිග ප්‍රදේශවල ලවන වගුරු වැඩි වශයෙන් පිහිටා ඇත. දේශීය සහ සංක්‍රමණික පක්ෂීන් විවේක ගන්නා ස්ථාන සහ ආහාර සපයන ස්ථාන ඇතුළු වැදගත් පාරිසරික ක්‍රියාවලීන් ලවන වගුරු මගින් සපයයි. (Syntheis Report on Coastal Habitat 2014) පුත්තලම දිස්ත්‍රික්කයේ ලවන වගුරු ඉස්සන් කර්මාන්තයටත් ලුණු නිෂ්පාදනය සඳහාත් යොදා ගැනීම හේතුකොට විශාල ලෙස අඩු වී ඇත. 1986 - 2002 කාලය තුළ එලෙස පරිවර්තනය කරන ලද ලවන වගුරු බිම් ප්‍රමාණය හෙක්ටයාර 2960 පමණ වේ. (Dayarathna P, 1997) වාර්තා කරන ආකාරයට වසර 10 ක් තුළ (1981 - 1992) පුත්තලම කලපුව අවට පැවති ලවන වගුරුවලින් 50% ඉස්සන් වගා

කිරීම හේතුවෙන් අහිමි වී ඇත. නැගෙනහිර පළාතේ පවත්නා ලවන වගුරු අපජලය නිසා දූෂණය වීම හා කෘෂිකාර්මික සහ කර්මාන්ත කටයුතු මගින් එන රසායන ද්‍රව්‍ය සහ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන් දූෂණය වී ඇත. පැවති ගැටුම්කාරී තත්ත්වයන් හේතුකොට උතුරු පළාතේ පිහිටි ලවන වගුරු විශේෂයෙන් මන්නාරම දිස්ත්‍රික්කයේ පසුගිය දශක තුන මුළුල්ලේ බලපෑම්වලට භාජනය නොවී තිබිණ. අනෙකුත් වෙරළබඩ පරිසර පද්ධති මෙන් නොව ලවන වගුරු පිළිබඳ නිසි පාරිසරික ඇගයීමක් සිදුකොට නොමැති බැවින් ඒවායේ භාවිතය පිළිබඳ අපැහැදිලි තත්ත්වයක් මතු වී ඇත.

**බාධක වෙරළ, වැලි තුඩු සහ වැලි වැටි හායනය**

ශ්‍රී ලංකාවේ වැලි තුඩු, වැලි වැටි සහ බාධක වෙරළ හායනයට ලක්වීමට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ නේවාසික ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අනවසරයෙන් අත්පත් කර ගැනීම, සංචාරක හෝටල් සහ අදාළ යටිතල පහසුකම් ස්ථානගත කිරීම, ජනාවාස පුළුල් කිරීම සහ පොල්, මිරිස්, ලූනු සහ අනෙකුත් කෘෂි කාර්මික කටයුතු සඳහා ඉඩම් පරිවර්තනය කිරීමත්ය.

සාමාන්‍යයෙන් ඝනව වැඩුනු කෙටි පඳුරු සහිත උසින් අඩු ගස්වලින් සමන්විත "වෙරලාශ්‍රිත ලඳු කැලෑ කලාපය" බොහෝ ප්‍රදේශයන්හි අඩු වී ඇත. දකුණු සහ නැගෙනහිර වෙරළ තීරයන්හි ඇතැම් ප්‍රදේශවල වෙරළ සහ වැලි වැටි මෙන්ම කඩොලාන පරිසරද වෙරළ ඛාදනය, සුළි සුළං, ගං වතුර සහ සුනාමි (2004) හේතුකොට විනාශ වී ඇත.

මෙම ගැටලුව හිරිගල්පර ඉවත්කිරීම, වෙරළබඩ නිර්මාණ සැලසුම් රහිතව ස්ථානගත කිරීම, ගංගා සහ වෙරළින් වැලි ලබා ගැනීම මගින් තවදුරටත් තීව්‍ර කොට ඇත. මුහුදු වෙරළ, අපද්‍රව්‍ය මුදා හැරීමේ ස්ථාන ලෙස භාවිතා කිරීම නිසා විශේෂයෙන් නාගරික ප්‍රදේශයන්හි ගැටලු මතුවී ඇත. දකුණු වෙරළ තීරයන්හි වාද්දුව සිට මිරිස්ස දක්වා වාර්තා වී ඇති අන්දමට නැව් මගින් මුදාහරින තෙල් සහිත අප ජලය, වෙරළ වෙත ළඟාවීමේදී එම තෙල් තාර කැටි මගින් වෙරළ තීරය දූෂණයට ලක් වී ඇත. මෙම තත්ත්වය හිරිගල්පර සහ මුහුදු තෘණතලා වැනි පරිසර පද්ධතීන්ටද අහිතකර ලෙස බලපා ඇත. හම්බන්තොට සහ මඩකලපුව වැනි ඇතැම් ප්‍රදේශවල වෙරළ සහ වැලි වැටි ස්ථායීකරණය සඳහා ආවේණික නොවන (Exotic) පැළෑටි හඳුන්වා දීමෙන් එයින් ඇතිවන අහිතකර ප්‍රතිඵල පිළිබඳ අවධානයට ලක්ව ඇත. දකුණුදිග වෙරළ තීරයේ කොස්ගොඩ හා පලටුපාන අතරත්, උතුරු වෙරළ තීරයේ පාලතිව් දූපත් සහ නැගෙනහිර වෙරළ තීරයේ අරුගම්බොක්ක, කැස්බෑවන් විශේෂ පහක් බිජු ලෑම සඳහා පැමිණෙන ස්ථාන වෙයි. මෙම පරිසර පද්ධති හෝටල් සඳහා ඉඩම් වෙන් කිරීමත්, පැල්පත් ජනාවාස බිහිවීමත්, සැලසුම් රහිතව සංචාරක මධ්‍යස්ථාන ස්ථානගත කිරීමත් හා වෙරළ කලාපයේ රේඛීය සංවර්ධනයත් නිසා හායනයට/ තර්ජනයට ලක්වී ඇත.

**3.2.2. වෙරළබඩ පරිසර පද්ධති කෙරෙහි ගැටුම්කාරී තත්ත්වයේ බලපෑම**

ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශයන්හි වෙරළබඩ පරිසරයේ ගති ලක්ෂණ ගැටුම්කාරී අවදියේ සහ පශ්චාත් ගැටුම්කාරී අවදියේ පුනරුත්ථාපනය ක්‍රියාවලිය හේතුකොට වෙනස්වීම්වලට වේගවත්ව භාජනය විය. වසර තිහක් පමණ දීර්ඝ කාලයක් මුළුල්ලේ උතුරු සහ නැගෙනහිර පැවති ගැටුම්කාරී තත්ත්වයේ බලපෑම මගින් එම ප්‍රදේශයන්හි පවත්නා කඩොලාන, කොරල්පර, වැලි වැටි සහ මුහුදු තෘණතලා සංරක්ෂණය අවධානයට ලක් නොවීය. වෙරළබඩ පරිසර පද්ධතිවල ප්‍රමාණය සහ ගුණාත්මක බව කෙරෙහි ගැටුම්කාරී තත්ත්වයේ බලපෑම මේ වනතෙක් තක්සේරු කොට නොමැත. කෙසේ වුවත් උතුරු ප්‍රදේශයන්හි මනල්කාඩු සහ පුනරීන් ප්‍රදේශවල පවත්නා වැලි වැටි පද්ධති කෙරෙහි මේ තත්ත්වය ඍජුව බලපා ඇති බව පෙනී යයි. මෙයට අමතරව ඇතැම් ප්‍රදේශවල කඩොලාන ඉවත් කර ඇති බව පෙනී යයි. ආරක්ෂක හේතු සඳහා කඩොලාන ප්‍රදේශ ඉවත් කිරීම, ආරක්ෂක පිළියම් සඳහා වැලි ඉවත් කිරීම මෙන්ම රජයේ හමුද සහ ත්‍රස්තවාදීන් බර අවි සහ පුපුරන ද්‍රව්‍ය භාවිතා කිරීම මගින් මෙම බලපෑම් ඉස්මතු වී ඇත. කෙසේ වෙතත් හානියට පත්වී ඇති වෙරළබඩ පරිසර පද්ධති වල ප්‍රමාණය සහ එම හානිවල පිරිවැය මෙතෙක් ආර්ථිකමය වශයෙන් තක්සේරු කොට නොමැත.

**3.2.3. වෙරළබඩ පරිසර පද්ධති කෙරෙහි 2004 සුනාමි බලපෑම**

ශ්‍රී ලංකා ඉතිහාසයේ ඉතා දරුණුතම ස්වභාවික ව්‍යසනය ලෙස 2004 දෙසැම්බර් 26 වැනි දින ඇති වූ ආසියානු සුනාමිය සැලකිය හැකිය. එසේ සලකනු ලබන්නේ එමගින් සිදු වූ බලපෑමේ ප්‍රමාණය, බලපෑමට ලක්වූ පුද්ගල සංඛ්‍යාව සහ එහි සංකීර්ණත්වය අනුවය. නැවත ගොඩනැගීමේ ක්‍රියාවලියේදී එමගින් වෙරළබඩ පරිසර පද්ධතීන්ට සිදුවූ බලපෑම පිළිබඳ බොහෝ දේ ලේඛනගත වී ඇත. 2004 සුනාමිය බලපාන ලද වෙරළබඩ පරිසර පද්ධති අතරින් කඩොලාන ප්‍රමුඛතාවක් ගනී. පශ්චාත් සුනාමි ඇගයීම් අනුව නැගෙනහිර පළාතේ මඩකලපුව සහ අම්පාර දිස්ත්‍රික්කයන්හි වාලච්චේන, අක්කරේපත්තු, සල්ලිතිව්, වාකරේ, පානම යන ප්‍රදේශවල සහ දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ රැකව, කහඳමෝදර තංගල්ල යන ස්ථානවල කඩොලාන ප්‍රදේශ විශාල වශයෙන් හානියට ලක් වී ඇති බව වාර්තා වී ඇත. ප්‍රධාන වශයෙන් සෝදාපාලු වීම හේතුවෙන් කඩොලාන හායනය සිදු වී ඇති බව නිරීක්ෂණය වී ඇත. (සංස්ලේෂණ වාර්තාව 2014).

හිරිගල්පරවලට සුනාමි මගින් වූ බලපෑම ඉහළ විචල්‍යයක් ගන්නා අතර එය කිසිදු හානියක් වාර්තා වී නොමැති මට්ටමේ සිට දැඩි හානියට ලක් වූ අවස්ථාවන් දක්වා වාර්තා වී ඇත. නැගෙනහිර සහ ඊසාන දිග වෙරළතීර වල

හිරිගල්පර දැඩි ලෙස හානි වී ඇති අතර වයඹ පිහිටි හිරිගල්පරවලට කිසිදු බලපෑමක් සිදු වී නොමැත. නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමලයට නුදුරින් පිහිටි ඔිලන්ද බොක්කේ පිහිටි හිරිගල්පර සම්පූර්ණයෙන් හානි වී ඇති බව වාර්තා වී ඇත. වාර්තා වී ඇති බොහෝ හානි යාන්ත්‍රික ආකාරයට එනම් කැඩුන විශාල කොලනි Acropora සහ Montipora කඩොලාන පසුව අනෙක් හිරිගල්පරවල ගැටීමෙන් සහ ඒවා මත පතිතවීමෙන් හානියට පත්ව ඇත. දකුණු වෙරළ තීරය හා සම්බන්ධව සලකා බැලූ විට සියලුම ස්ථානවල ඇති හිරිගල්පරවලට යම් ආකාරයක හානි සිදු වී ඇත. තංගල්ල, කුඩාවැල්ල, පොල්හේන, කප්පරතොට, වැලිගම, උණවටුන සහ හික්කඩුව මෙයට ඇතුළත් වේ. (Syntheis Report on coastal habitats 2014)

හිරිගල්පර හානිය සමග මත්ස්‍ය ගහනයට වූ බලපෑමේ සහසම්බන්ධතාවක් පවතී. හිරිගල්පර හා සම්බන්ධිත විශාල මත්ස්‍ය විශේෂ වන groupers (කොස්සන්) snappers, sweetlips, emperors සඳහා වූ බලපෑම ඉතා සුළු වන අතර හිරිගල්පර වාසී කුඩා මත්ස්‍ය විශේෂ වන damselfish, Butterfly fish, gobies සහ wrasses බලපෑම, විනාශ වූ ප්‍රදේශයන්හි ඉහළ මට්ටමක විය. හිරිගල්පර කැනීම් කරන ලද ස්ථානයන්හි සුනාමි බලපෑම අධික බවට වාර්තා වී ඇත. 2005 වර්ෂයේදී ඇමෙරිකා එක්සත් ජනපදයේ නොටර්ඩැම් විශ්වවිද්‍යාලය මගින් කරන ලද පර්යේෂණයකට අනුව දකුණු දිග වෙරළ තීරයේ සුනාමියෙන් සිදුවූ හානියේ ප්‍රබලත්වය සහ කොරල් කැනීම අතර ඍජු සබඳතාවක් තිබෙන බව සොයාගෙන ඇත. (Rodrigo Malaka 2005)

ලවන වගුරු කෙරෙහි සුනාමි බලපෑම ප්‍රධාන වශයෙන් වාර්තා වී ඇත්තේ වැලි සහ අබලි ද්‍රව්‍ය තැන්පත් වීමෙන් පමණි. ලවන වගුරුවල ඇති පැළෑටි මත කළු රොන් මඩ තැන්පත් වීමෙන් ඒවායේ පැවැත්මට දරුණු බලපෑම් එල්ල වී ඇත. කුඩා ජලාශයන්හි ජලජ ජීවීන් ද හානියට පත්ව ඇත. (Munasinghe 2005) අනෙකුත් වෙරළබඩ පරිසර පද්ධති අතර හානියට ලක් නොවූ වැලි වැටි සුනාමියට එරෙහි බාධකයක් ලෙස ක්‍රියා කොට ඇත. නැගෙනහිර පළාතේ පානම සහ පොතුවිල් ද හම්බන්තොට දිස්ත්‍රික්කයේ මිරිජ්ජවිල ස්ථානයන්හි ද වැලි වැටිවලින් ගොඩබිම ප්‍රදේශය සුනාමි නිසා වූ හානිය ඉතා අල්ප බව පෙනී ගොස් ඇත. මෙයට ප්‍රතිවිරුද්ධව, වැලි වැටි ඉවත් කොට ඇති ස්ථානයන්හි සුනාමි හානිය අතිමහත්ය. (අරුගම් බොක්ක, හම්බන්තොට බෝඹු ඇළ ප්‍රදේශය) මුහුදු තෘණ තලාවලට සුනාමියෙන් වූ හානිය ඉතා අල්ප බවට වාර්තා වී ඇති අතර සුළු වශයෙන් හානි වී ඇත්තේ ගැලවී ගිය කොරල් පර හා අබිලි ද්‍රව්‍ය තැන්පත් වීමෙනි. එම පැළෑටි ගැලවී යාමක් වාර්තා වී නොමැත. (Syntheis Report on coastal Habitats 2014) කලපු හා සම්බන්ධයෙන් ජාත්‍යන්තර සුනාමි සමීක්ෂණ කණ්ඩායම වාර්තා කරන අන්දමට වෙරළතින් සහ මුහුදු වෙරළින් බාදනය වූ වැලි කලපු ඇතුළු ආසන්න ප්‍රදේශවල තට්ටුවක් ලෙස තැන්පත් වී ඇත. (සිල්වා et al 2013)

### 3.2.4 දේශගුණික විපර්යාස ප්‍රතිවිපාක හා වෙරළබඩ පරිසර පද්ධති තත්ත්වය

දේශගුණික විපර්යාස සම්බන්ධිත ගැටලු මානව ක්‍රියාකාරකම් සහ ස්වාභාවික හේතු නිසා වෙරළ බඩ පරිසර පද්ධති ඉතා සීඝ්‍රවත් පුළුල් ලෙසත් වෙන කවරදටත් වඩා වෙනස් වෙමින් පවතින බව පෙනී යයි. වෙරළබඩ පරිසර පද්ධතිවල සංයුතිය, ජෛව විවිධත්වය සහ ගුණාත්මකභාවයේ වෙනස්වීම්වලට බලපාන ප්‍රධාන සාධකය ලෙස දේශගුණික විපර්යාස හඳුනාගෙන ඇත. හිරිගල්පර සහ මුහුදු තෘණතලා වැනි සංවේදී පරිසර පද්ධති ඔස්සේ දේශගුණික විපර්යාස සම්බන්ධ ගැටලු හොඳින් නිරූපනය වේ.

### 3.2.5 වෙරළබඩ පරිසර පද්ධති වටිනාකම අවතක්සේරු වීම තුළින් තිරසාර නොවූ භාවිතයට යොමු වීම

මේ වනතෙක් වෙරළබඩ පරිසර පද්ධතිවල සැබෑ ආර්ථික වටිනාකම නිසි ලෙස ඇස්තමේන්තු කොට නොමැත. මේ නිසා වෙරළ කලාපයේ සංවර්ධන කටයුතු ස්ථානගත කිරීමේදී වෙරළබඩ පරිසර පද්ධතිවල සමස්ත ආර්ථික වටිනාකම ඌන තක්සේරු කිරීමේ නැඹියාවක් පවතී. වෙරළ ප්‍රදේශවල දැනට සිදුවෙමින් පවතින මහාමාර්ග සංවර්ධනය, වාණිජ සහ ධීවර වරාය සංවර්ධනය, පිරවීම්, දූපත් සංවර්ධනය සහ සංචාරක ව්‍යාපාරය සැලකිල්ලට ගැනීමේදී තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා පාරිසරික තක්සේරුව අන්තර්ගත කිරීම වැදගත්වේ.

### 3.2.6 සංරක්ෂණය සහ සංවර්ධන තුළනය කිරීම

වසර 30 ක් පුරා පැවති ගැටුම්කාරී තත්ත්වය, 2004 වසරේදී මුහුණදුන් සුනාමි ව්‍යසනයේ බලපෑම් හමුවේ වේගවත් ආර්ථික සංවර්ධන අවශ්‍යතාවන් සහ ඒකපුද්ගල ආදායම ඉහළ දැමීම වඩාත් ප්‍රමුඛ තත්ත්වයන් ලෙස සලකනු ලැබිය. ප්‍රධාන ආර්ථික සංවර්ධන උපායමාර්ග වෙරළ ප්‍රදේශයන් වෙත යොමු වී තිබීම හේතුකොට වෙරළබඩ පරිසර පද්ධතිවලට වෙන බලපෑම අනිවාර්ය වේ. මේ නිසා සංවර්ධන අවශ්‍යතා සහ සංරක්ෂණ අවශ්‍යතා අතර තුළනයක් ඇති කිරීම වෙරළබඩ පරිසර පද්ධතීන්ගේ ආර්ථක වටිනාකම සැලකිල්ලට ගනිමින් වඩාත් තාත්වික අයුරින් සිදුකළ යුතුය. දැනට ශ්‍රී ලංකා මධ්‍ය ආදයම් පාෂයෙන් බැහැර වීමට ශ්‍රී ලංකා රජය ගන්නා උත්සාහයේදී වෙරළබඩ ප්‍රදේශ සංවර්ධනය සඳහා යොදා ගැනීමේදී, සංරක්ෂණය අවශ්‍යතා සහ අවම කිරීමේ පිළියම් පිළිබඳව වඩාත් සැලකිලිමත් විය යුතුය.

### 3.3 වෙරළබඩ පරිසර පද්ධති සංරක්ෂණය සම්බන්ධයෙන් කටයුතු කිරීම

#### 3.3.1 ප්‍රතිපත්ති, සැලසුම්, නීති සහ ආයතනික සැකැස්ම

වර්තමානයේ වෙරළබඩ පරිසර පද්ධතිවල හායනය සහ හීනවීමේ සීඝ්‍රතාව නිසා සංරක්ෂණ සහ අනුවර්තී කළමනාකරණයක අවශ්‍යතාව පැනනැඟී ඇත. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් පුළුල් ලෙස වෙරළබඩ පරිසර පද්ධති කළමනාකරණය කිරීම 1990, 1997 සහ 2004 වෙරළ කලාප කළමනාකරණ සැලසුම් ක්‍රියාත්මක කිරීමත් සමග සිදු කෙරිනි. 1992 සම්පාදනය කරන ලද "වෙරළ 2000" ශ්‍රී ලංකාවේ වෙරළබඩ ප්‍රදේශ කළමනාකරණය සඳහා වූ ක්‍රමෝපායන්ගේ නිර්දේශ මගින් වෙරළබඩ පරිසර පද්ධති කළමනාකරණ ප්‍රතිපත්ති තවදුරටත් ශක්තිමත් කරන ලදී. රෙගුලාසි පැනවීම, අධ්‍යාපනය සහ දැනුවත් කිරීම, සැලසුම් සහ ප්‍රතිපත්ති, සුපරීක්ෂණ සහ සම්බන්ධීකරණය ඇතුළු කළමනාකරණ ක්‍රමෝපායන් සම්පාදනය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට ඉහත ප්‍රයත්නයන් උපකාරී විය. පරිසර අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන්නා වූ ජාතික ජෛව විවිධත්ව සංරක්ෂණ ක්‍රියාකාරී සැලැස්ම මගින්ද වෙරළබඩ සහ සමුද්‍රීය පරිසර පද්ධති සංරක්ෂණ පිළිබඳ අවධානය යොමුකොට ඇත. 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත සහ 1988 අංක 64 දරන (සංශෝධන) පනත මගින් හඳුන්වා දෙන ලද නියෝගාත්මක පිළියම් මගින් වෙරළබඩ පරිසර පද්ධති සංරක්ෂණය ප්‍රවර්ධනය කෙරේ. 2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ සංශෝධන පනත අනුව වෙරළ කලාපයේ සීමාවන් ජලතලයන්හි දෙපස භූමියද ඇතුළත් කිරීම මගින් වෙරළබඩ පරිසර පද්ධති සංරක්ෂණය සඳහා වඩාත් අවධානය යොමුකොට ඇත.

ලෝක පරිසර සංරක්ෂණ සංගමය (IUCN) ශ්‍රී ලංකා කාර්යාලය මගින් "අනාගතය සඳහා කඩොලාන පිළිබඳ අනාගතය" සඳහා වූ වැඩ සටහනේ ජාතික මෙහෙයුම් කමිටුව සඳහා ප්‍රකාශයට පත්කරන ලදී. "ජාතික ක්‍රමෝපාය සහ ක්‍රියාකාරී සැලැස්ම" මගින් ශ්‍රී ලංකාවේ සමෝධානික වෙරළ කලාප කළමනාකරණය මත පදනම් වූ පරිසර පද්ධතියක් යෝජනා කොට ඇත. මෙය ශ්‍රී ලංකාවේ වසර 30ක වෙරළබඩ කළමනාකරණ වාර්තා ඇගයීමෙන් පසු ඉදිරිපත් කරන ලද අතර "විධිමත් ප්‍රවේශයන් යොදා ගැනීම අත්‍යවශ්‍ය බව" දන්වා ඇත. මේ අනුව වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නෛතික බල අධිකාරියට අනුකූල ඇතැම් නිර්දේශයන් මෙම සැලැස්මට ඇතුළත් කොට ඇත. "පරිසර පද්ධති පදනම් වූ" ප්‍රවේශයන් පූර්ණ වශයෙන් ඒකාබද්ධ වෙරළබඩ කළමනාකරණ සඳහා යොදා ගැනීමට වෙරළ සංරක්ෂණ සහ වෙරළබඩ සම්පත් කළමනාකරණ පනතට ප්‍රධාන වෙනස්කම් කළ යුතුව ඇති අතර යෝජිත "ක්‍රමෝපාය සහ ක්‍රියාකාරී සැලැස්ම" නිලවශයෙන් ඉහළට ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් පිළිගැනීම මත රඳා පවතී.

එලෙස පිළිගතහොත්, පනතේ විධිවිධාන මඟින් බලය පවරා ඇති පරිදි මෙම සැලැස්ම ඉදිරි වසර පහ තුළ ප්‍රතිශෝධනය කිරීමේදී මෙම අංශයට නිසි අවධානය යොමු කළ යුතුය.

**වගුව 3.5 : වෙරළබඩ පරිසර පද්ධති සංරක්ෂණය සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව යෙදූ ප්‍රධාන කළමනාකරණ ක්‍රමෝපායන්**

| | |
|---|---|
| නියාමන | • මුහුදු හිරිගල් කැනීම හා සම්බන්ධිත සියලු කටයුතු තහනම් කිරීම.<br>• වෙරළ කලාපය තුළ සිදුකරනු ලබන සියලු සංවර්ධන කටයුතු සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අවසර පත්‍ර ලබා ගැනීම අනිවාර්ය කිරීම.<br>• වෙරළබඩ ජලතලයන්හි දෙපස භූමිය ඇතුළත්වන ලෙස "වෙරළ කලාපය" පුළුල් කිරීම.<br>• "සංරක්ෂණ ප්‍රදේශ" සහ බලපෑමට ලක් වූ ප්‍රදේශ" ප්‍රකාශයට පැමිණවීමට නෛතික විධිවිධාන හඳුන්වා දීම. |
| අධ්‍යාපනය සහ දැනුවත් කිරීම | • වෙරළබඩ පරිසර පද්ධතීන්ගේ වටිනාකම හා ඒ හා සම්බන්ධ ගැටලු පිළිබඳව මුද්‍රිත මාධ්‍යයෙන් සන්නිවේදනය කිරීම.<br>• වෙරළබඩ පරිසර පද්ධති කෙරෙහි බලපාන ගැටලු පිළිබඳව ද්විතීක පාසල් විෂය නිර්දේශයන්ට ඇතුළත් කිරීම.<br>• පාසල් ළමුන් ගුරුභවතුන් සහ ප්‍රධාන පාර්ශ්වකරුවන් සඳහා වෙරළබඩ පරිසර පද්ධති කළමනාකරණය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. |

| | |
|---|---|
| සැලසුම් සහ ප්‍රතිපත්ති සංවර්ධනය | • විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් මගින් තෝරාගත් ප්‍රදේශයන්හි වෙරළබඩ පරිසර පද්ධති සංරක්ෂණය<br>• විශේෂ කළමනාකරණ ප්‍රදේශ ආයතනගත කිරීම. |
| සුපරීක්ෂණය | • වැලි ඉවත් කිරීම, හිරිගල් කැනීම හා අවසර පත්‍ර අනුකූලතා පිළිබඳ සුපරීක්ෂණ වැඩසටහන් පැවැත්වීම. |
| පර්යේෂණ | • හිරිගල්, කඩොලාන සහ ජලයේ ගුණාත්මකභාවය පිළිබඳ පර්යේෂණ සඳහා සහායවීම. |
| සම්බන්ධීකරණය | • ජාතික මට්ටමින් වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ උපදේශක සභාව |
| | • ප්‍රාදේශීය මට්ටමින් වෙරළ සංරක්ෂණ සම්බන්ධීකරණ කමිටු සහ ප්‍රජා සම්බන්ධීකරණ කමිටු සහ මෙහෙයුම් කමිටු |
| | • ලෝක සංරක්ෂණ සංගමයේ අනාගතය උදෙසා කඩොලාන වැඩසටහන්වලට සහාය වීම. |

### 3.3.2 ආයතනික යාන්ත්‍රණ සහ වැදගත් මූලාරම්භ

වෙරළබඩ පරිසර පද්ධති සංරක්ෂණය සහ කළමනාකරණය පිළිබඳ වගකීම් දරන අමාත්‍යාංශ, රජයේ දෙපාර්තමේන්තු සහ වෙනත් ආයතන ගණනාවක් ඇත. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය, වනජීවී සංරක්ෂණය දෙපාර්තමේන්තුව, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිත ආයතනය, මධ්‍යම පරිසර අධිකාරිය, සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වැනි එක් එක් ආයතනවලට, විවිධ වෙරළබඩ පරිසර පද්ධති සංරක්ෂණය සහ කළමනාකරණය කිරීමේ සුවිශේෂ කාර්යභාරයන් ඇත. මෙයට අමතරව වෙරළබඩ පළාත් සභා ද වෙරළබඩ පරිසර පද්ධති සංරක්ෂණය සඳහා දයක විය යුතුය. වාරිමාර්ග සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවල කටයුතුද වෙරළබඩ පරිසර පද්ධති කෙරෙහි විශේෂ බලපෑමක් කරනු ලබන අතර අදාළ පළාත් සභා, ප්‍රාදේශීය සභා සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්ගේ කටයුතුද වෙරළබඩ පරිසර පද්ධතීන් කෙරෙහි තවදුරටත් බලපායි.

### 3.3.3 කළමනාකරණය පිළිවෙත්වල අනාගත උපනෙතීන්

වෙරළබඩ පරිසර පද්ධති කළමනාකරණය සඳහා අතීතයේදී සමෝධානික ප්‍රවේශයන් ඇති කර ගැනීම සඳහා දරන ලද ප්‍රයත්නයන් පෙන්නුම් කරනුයේ විවිධ වෙරළබඩ සම්පත් කළමනාකරණය සඳහා බලඅධිකාරිය පවත්නා ආයතන අතර සමීප සම්බන්ධීකරණයක අවශ්‍යතාවයි. තවද වෙරළබඩ පරිසර පද්ධති කළමනාකරණය සහ සංරක්ෂණය සඳහා වූ ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීමේදී අතීතයේ මුහුණපාන ලද බාධකයන් පිළිබඳව සැලකිලිමත් විය යුතුය. වෙරළබඩ පරිසර පද්ධති කළමනාකරණය සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව යොදගන්නා ලද කළමනාකරණ පිළියම් බොහෝදුරට රෙගුලාසි මත පදනම් විය. වෙරළ කලාප කළමනාකරණ සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී ආයතන අතර පවත්නා දුර්ලභ සම්බන්ධීකරණය සඳහා විමසීමේදී ආයතන අතර සම්බන්ධීකරණය සහ ප්‍රජාසහභාගීත්වය ශක්තිමත් කිරීම සඳහා ප්‍රජාසහභාගිත්වය ඉතා වැදගත්ය. විවිධ විශේෂිත වෙරළබඩ පරිසර පද්ධතීන් සහ ඒ ආශ්‍රිත ගැටලු පිළිබඳව කටයුතු කිරීමේදී විශේෂ කළමනාකරණ ප්‍රදේශ ප්‍රවේශය හැකි අවස්ථාවන්හිදී යොද ගැනීමෙන් ප්‍රජා සහභාගිත්වය ප්‍රවර්ධනය කළ යුතුය. වෙරළබඩ පරිසර පද්ධති සම්බන්ධයෙන් පිළියෙල කරන ලද අනෙකුත් ක්‍රියාකාරී සැලසුම් සහ කළමනාකරණ සැලසුම් මගින් ඉදිරිපත් කරන ලද නිර්දේශයන් සහ නීති ක්‍රියාත්මක කිරීමේදී ඒකාබද්ධ ප්‍රවේශයක් යොද ගත යුතුය. (උද. පරිසර අමාත්‍යාංශය විසින් සකස් කරන ලද ජෛව විවිධත්ව ක්‍රියාකාරී සැලැස්ම) සියලුම වෙරළබඩ සම්පත් කළමනාකරණ සැලසුම් පිළියෙල කිරීමේදී ප්‍රමාණවත් ආයතනික සම්බන්ධීකරණයක් සහ සහයෝගිතාවක් තිබිය යුතුය. උදහරණයක් ලෙස ඒකාබද්ධ පරිසර පද්ධති කළමනාකරණය, දිය බෙත්ම (Wateshed) කළමනාකරණය සමග සමීප සබඳතාවයක් පවතී. මේ නිසා කළමනාකරණ ක්‍රියාවලියේදී සියලුම අදාළ පාර්ශ්වයන් සම්බන්ධ විය යුතුය. වෙරළබඩ දූෂණය පිළිබඳ ගැටලුව හා සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී ද සංවර්ධන කටයුතු නිවැරදි පටිපාටීන්ට අනුව පාලනය කිරීම සහතික කිරීමද ඉතා වැදගත් වේ. වෙරළබඩ පරිසර පද්ධති සංරක්ෂණය සඳහා ප්‍රජාව දැනුවත් කිරීම ද ඉතා සුදුසු කළමනාකරණ පිළිවෙතකි. එබැවින් ඉදිරි කළමනාකරණ භාවිතාවන්වලදී මේ පිළිබඳ ප්‍රමාණවත් අවධානය යොමු කළ යුතුවේ.

වෙරළබඩ පරිසර පද්ධති කළමනාකරණය සඳහා වූ අනාගත ප්‍රවේශයන් භූගෝලීය වශයෙන් නිශ්චිත සහ මානව කටයුතු සහ ස්වාභාවික පද්ධතීන්ගේ වෙනස්වීම් මනාව අර්ථකතනය කිරීම මත පදනම් විය යුතුය. අනාගත වෙරළබඩ පද්ධති පිළිබඳ සමස්ත කළමනාකරණ අරමුණ තිරසාර කළමනාකරණය, සංරක්ෂණය සහ ඒවායේ ගති ලක්ෂණ වැඩි දියුණු කිරීම පිළිබඳව සහතික කළ යුතුය. මෙම තත්ත්වය ළඟාකර ගැනීම සඳහා එක් එක් පරිසර පද්ධති පිළිබඳව, ඒවායේ ගති ලක්ෂණ සහ අවශ්‍යතා කෙරෙහි අවධානය යොමුකොට කටයුතු කල යුතුය. වෙරළබඩ පරිසර පද්ධති සංරක්ෂණය සඳහා වූ ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම් ජාතික භෞතික සැලැස්ම, ජාතික පාරිසරික සැලැස්ම සහ අනෙකුත් ජාතික සැලසුම්වලට අනුකූලවන බවටද සැලකිලිමත් වියයුතුය. ඇතැම් පරිසර පද්ධති දැඩි තර්ජනයට ලක්ව ඇති බැවින් සහ ක්ෂණික පිළියම් අවශ්‍ය බැවින් වෙරළබඩ පරිසර පද්ධති සංරක්ණය ප්‍රමුඛතාව මත ක්‍රියාත්මක කිරීම වැදගත් වේ. මෙම සැලැස්මේ පරිසර පද්ධති හා සම්බන්ධ කළමනාකරණ ක්‍රියාකාරකම් ප්‍රමුඛතා ගතකොට නැති නමුත් සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී මේ පිළිබඳ අවධානය යොමුකිරීම වැදගත් වේ. විශේෂ කළමනාකරණ ප්‍රදේශ සඳහා සැලසුම් පිළියෙල කිරීමේදී එක් එක් පරිසර පද්ධතීන් සහ ඒවා ව්‍යාප්තව ඇති සමස්ත පද්ධතිය අතර සබඳතාවන් පිළිබඳ සැලකිලිමත් විය යුතුය.

වෙරළබඩ පරිසර පද්ධති කළමනාකරණය සඳහා වූ අනාගත අවශ්‍යතාවන් පිළිබඳ සාකච්ඡා කිරීමේදී මෙම පරිච්ඡේදය මගින් වර්තමාන සහ පසුගිය ක්‍රියාකාරකම් විශ්ලේෂණයේදී හිඩැස් (gaps) මාලාවක් හඳුනාගත හැකිවිය. එක් එක් පරිසර පද්ධතිය සඳහා අදාළ විශේෂිත සංරක්ෂණ ගැටලුද හඳුනාගෙන ඇති අතර මෙම ගැටලු අවම කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති, ක්‍රමෝපායන් සහ ක්‍රියාකාරකම් ද ඒවායේ වර්තමාන තත්ත්වය සහ සම්බන්ධිත භාවිතයන් සැලකිල්ලට ගෙන ඉදිරිපත් කොට ඇත.

### 3.4 කළමනාකරණ අරමුණු, ප්‍රතිපත්ති, ක්‍රමෝපාය සහ ක්‍රියා මාර්ග

**අරමුණු 1**

ජෛව විවිධත්වය ඉහළ නැංවීම, සුනාමි, රළ කුණාටු සහ ඛාදනය වැනි වෙරළබඩ උපද්‍රව්‍යයන්ට එරෙහි බාධාවක් ලෙස ක්‍රියා කිරීම, ජෛව සම්පත් තිරසාර භාවිතයට ඉඩ ප්‍රස්ථා සැලසීම සහ ධීවර සහ අනෙකුත් ආර්ථික කටයුතු සඳහා හිරිගල් පර සංරක්ෂණය කරනු ලැබේ.

**ප්‍රතිපත්ති 1.1**

වෙරළ කලාපය තුළ සහ ඉන් පිටත මිනිස් කටයුතු හේතුකොට ප්‍රමාණාත්මකව සහ ගුණාත්මකව හිරිගල්පර හායනය වීම සහ හීනවීම අවම කරනු ඇත.

**ක්‍රමෝපාය 1.1.1**

මිනිස් ක්‍රියාකාරකම් හේතු කොට සිදුවන හිරිගල්පර විනාශ වීම සහ හානිවීම අවම කිරීම තුරන් කිරීම සඳහා පවත්නා නීති රෙගුලාසි සඵලව ක්‍රියාත්මක කිරීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. හිරිගල් පරිසර පද්ධති විනාශ වීම/ හානිවීම වැළැක්වීම සඳහා පවත්නා නීති රෙගුලාසි තවදුරටත් ක්‍රියාත්මක කිරීම.

2. දැනට පවත්නා තත්ත්වය වඩාත් ඵලදායී ලෙස වැඩිදියුණු කිරීම සඳහා මුහුදු හිරිගල් කැනීමට එරෙහිව වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්මේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම අඛණ්ඩව සිදුකිරීම.

3. ගොඩතර හිරිගල් කැනීමෙන් වන අහිතකර බලපෑම් අවම කිරීම සඳහා එම කැනීම් පාලනයට අදාළ බලධාරීන්ට සහය වීම.

4. හිරිගල්පරවලට වන හානි වැළැක්වීම සඳහා කොරල් පදනම් හුණු භාවිතකරුවන්, වෙරළබඩ ප්‍රජාව, සංචාරක මග පෙන්වන්නන්, විසිතුරු මසුන් එක්රැස් කරන්නන් සහ වීදුරු පතුල් සහිත බෝට්ටු ක්‍රියාකරුවන් වැනි ඉලක්ක කණ්ඩායම් සඳහා නිති රෙගුලාසි පිළිබඳව දැනුවත් කිරීම.

**ක්‍රමෝපාය 1.1.2**

කෘෂිකර්මාන්තය සහ ඉදිකිරීම් කර්මාන්තයේ අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය හුණු වෙනුවට විකල්ප ද්‍රව්‍ය භාවිතය ප්‍රවර්ධනය කිරීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. හිරිගල් මත පදනම් වූ හුණු සඳහා වන විකල්ප ආදේශ පිළිබඳව ප්‍රමාණවත් ප්‍රචාරයක් ලබාදීම මගින් හිරිගල්පර සංරක්ෂණය කිරීම.

2. විවිධ භාවිත කණ්ඩායම් අතර හිරිගල් මත පදනම් හුණු සඳහා වන ආදේශක ප්‍රවර්ධනය කිරීම සඳහා වෙළෙඳපොල ආශ්‍රිත පෙළඹවීම් ප්‍රවර්ධනය කිරීම.

3. රජයේ ඉදිකිරීම් වැඩ සඳහා හිරිගල් මත පදනම් හුණු භාවිතය සීමා කිරීම පිළිබඳ ප්‍රතිපත්තිය තවදුරටත් ක්‍රියාත්මක කිරීම.

**ප්‍රතිපත්තිය 1.2**

හිරිගල්පර පරිසර පද්ධති කළමනාකරණය කිරීමේදී හැකි සෑම අවස්ථාවන්හිදීම දේශගුණික විපර්යාස සහ අනෙකුත් ස්වාභාවික සිදුවීම් සම්බන්ධයෙන් සැලකිල්ලට යොමු වූ කරුණු මූලධාරා ගත කළ යුතුය.

**ක්‍රමෝපාය 1.2.1**

හිරිගල්පර සඳහා දේශගුණික විපර්යාසයන්ට අනුගතවීමේ නිර්දේශිත ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. හිරිගල්පරවල ගුණාත්මක බව පිළිබඳ තත්ත්වයන් සහ ප්‍රවණතාවන් සම්බන්ධයෙන් නාරා ආයතනය මගින් කරනු ලබන අධීක්ෂණ කටයුතු සඳහා සහය වීම.

2. දේශගුණික අනුවර්තන ප්‍රතිපත්තිවලට අඛණ්ඩව අනුකූල වීම සහතික කිරීම.

3. හිරිගල්පර පරිසර පද්ධතීන් ඉක්මනින් ප්‍රතිෂ්ඨාපනය වීම පහසු කරලීම සඳහා පශ්චාත් වෙරළබඩ පරිසරය වැඩිදියුණු කිරීම සඳහා උචිත ක්‍රියාමාර්ග ගැනීම.

**ප්‍රතිපත්තිය 1.3**

හිරිගල්පර සංරක්ෂණය, ප්‍රතිෂ්ඨාපනය සහ පුනරුත්ථාපනය සඳහා අදාළවන්නා වූ විද්‍යාත්මක පර්යේෂණ ප්‍රවර්ධනය කරනු ඇත.

**ක්‍රමෝපාය 1.3.1**

සහභාගීත්ව පර්යේෂණයක් සහිතව හිරිගල්පර පරිසර පද්ධතීන් සහ ඒවායේ සම්පත් පිළිබඳ සමීක්ෂණ කිරීම, හිරිගල්පර ප්‍රතිෂ්ඨාපනය සහ ඵලදායී ලෙස තොරතුරු සන්නිවේදනය කිරීම, ප්‍රවර්ධනය හා සහය ලබා දීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. ශ්‍රී ලංකා ජල තීරය ආශ්‍රිතව පවත්නා කොරල්පර ව්‍යාප්තියේ සතළු ප්‍රමාණයන්, තත්ත්වය සහ අගයන් පිළිබඳව නිර්ණය කිරීම සඳහා සමීක්ෂණයක් පැවැත්වීම.

2. හිරිගල්පර ප්‍රතිෂ්ඨාපනය ප්‍රමුඛව කළ යුතු ස්ථාන, ප්‍රතිෂ්ඨාපනය ක්‍රමවේදයන් සහ තාක්ෂණය පිළිබඳ තොරතුරු හඳුනාගැනීම සහ බෙද හැරීම.

3. හිරිගල්පර දැඩි ලෙස හානි වී ඇති ස්ථානයන්හි හිරිගල්පර නැවත වගා කිරීම සඳහා ප්‍රජා සහභාගිත්වය සහිතව දේශීය සහ විදේශීය අරමුදල් ආයතනවල සහ පර්යේෂණ ආයතන/විශ්ව විද්‍යාල සහයෝගයෙන් වැඩසටහනක් ආරම්භ කිරීම.

4. ජීවන තත්ත්වයේ ගුණාත්මක බව උසස් කිරීමට ඉවහල් වන්නා වූ හිරිගල්පර ජීවීන් පිළිබඳ සහයෝගාත්මක පර්යේෂණ සහ හැකියාවන් ප්‍රවර්ධනය ඉවහල් වන්නා වූ යාන්ත්‍රනයක් ආරම්භ කිරීම. (උදාහරණ වශයෙන් ජීවීන්ගේ සෞඛ්‍යමය වටිනාකම)

5. පසැඟිල්ලන් (තාරකා මසුන්) (Crown of Thorn) ගහනය වර්ධනය පිළිබඳ භූගෝලීය පදනමකින් විමර්ශන ප්‍රවර්ධනය කිරීම සහ පසඟිල්ලන් මර්දනය කිරීමේ වැඩසටහනක් ආරම්භ කිරීම.

6. හිරිගල්පර පිළිබඳ නාරා ආයතනය මගින් පිළියෙල කරන ලද දත්ත පදනම නිරන්තරව යාවත්කාලීන කිරීමට සහය වීම සහ අන්තර් ආයතන දත්ත සමුදයක් ස්ථාපිත කිරීම සහ මෙම තොරතුරු සඳහා පිවිසීමට යාන්ත්‍රණයක් සැපයීම.

7. කොරල්පර සම්පත් භාවිතයන් පිළිබඳව සමාජ ආර්ථික දත්ත එකතු කිරීම වැඩි දියුණු කිරීම මගින් කොරල් පර භාවිතය හා ඒ ආශ්‍රිත වෙනත් භාවිතයන් කළමනාකරණය කිරීම.

**ප්‍රතිපත්තිය 1.4**

හිරිගල්පර හා සම්බන්ධිත සංචාරක කර්මාන්තය විනෝදාත්මක කටයුතු සහ අනෙකුත් සංවර්ධන කටයුතු කළමනාකරණය මගින් හිරිගල්පරවල ගුණාත්මකබව තහවුරු කිරීම.

**ක්‍රමෝපාය 1.4.1**

සහයෝගිතා ක්‍රියාමාර්ග මගින් හිරිගල්පරවල සහ ඒවායේ අඩංගු සම්පත් කෙරෙහි වන අහිතකර බලපෑම් අවම කිරීම සඳහා සංචාරක සහ අනෙකුත් සංවර්ධන කටයුතු කළමනාකරණය කිරීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. ප්‍රජා සහභාගිත්වය සහිතව, සංචාරක කර්මාන්තය සංවර්ධනය වන ප්‍රදේශයන්හි පිහිටා ඇති හිරිගල්පර කළමනාකරණය සඳහා පෞද්ගලික ආයතනවල සහභාගිත්ව ප්‍රවර්ධනය කිරීම.

2. අදාළ ආයතනවල සහයෝගය මත සංවර්ධන කටයුතු මගින් අපද්‍රව්‍ය සහ රොන්මඩ බැහැර කිරීම පාලනය කිරීම.

3. පෞද්ගලික අංශයේ සහභාගිත්වය මත හිරිගල්පර නිස්සාරන නොවන භාවිතයන් (Non extractive uses) මත පදනම් කොට වෙරළබඩ ප්‍රජාවගේ ජීවනෝපායන් වැඩි දියුණු කිරීම.

4. සංචාරක, ධීවර සහ විනෝදාත්මක කටයුතු මගින් හිරිගල්පර කෙරෙහි වන බලපෑම අවම කිරීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමග ප්‍රජා මූලික සෝදිසි මෙහෙයුම් වැඩසටහනක් ආරම්භ කිරීම.

5. සංරක්ෂණය සහ නැරඹීමේ විනෝදස්වාදය ඉහළ නැංවීම සඳහා හිරිගල්පර නැරඹීම හැකි ප්‍රදේශ අදාලව සංචාරක හෝටල් ආශ්‍රිතව සංචාරක මණ්ඩලයේ සහභාගිත්වයෙන් පරිවර්තන පහසුකම් ඇති කිරීම.

6. ලංකා සංචාරක මණ්ඩලය, හෝටල්, සංචාරක මඟපෙන්වන්නන්, රේගුව, ගුවන්තොටුපල අධිකාරින් සමග සහභාගිත්ව වැඩසටහන් ඔස්සේ හිරිගල්පර සහ හිරිගල්පර ආශ්‍රිත ජීවීන්ගේ සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීම ප්‍රවර්ධනය කිරීම.

7. ආනයනය තහනම් කරන ලද හිරිගල්පර ආශ්‍රිත ජීවීන් හඳුන්වාගැනීමට උපකාරී වීම සඳහා අදාළ රාජ්‍ය නිලධාරීන්ට පරිශීලන ද්‍රව්‍ය සහ පුහුණු කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණය සහ සහය වීම.

8. නාරා ආයතනය, විශ්වවිද්‍යාල සහ ආශ්‍රිත ප්‍රජාවන්ගේ සහාය ඇතිව හිරිගල්පර හායනය වූ ප්‍රදේශවල හිරිගල්පර ප්‍රතිරෝපන වැඩසටහන් ප්‍රමාණවත් කර පැවැත්වීම.

අරමුණු 2

සම්පත්වල තිරසාරභාවය පවත්වා ගනිමින් සමාජ - ආර්ථික කටයුතු ප්‍රවර්ධනය කිරීමත් පාරිසරික ක්‍රියාවලිය පවත්වා ගැනීමට කලපු සහ මෝය සංරක්ෂණය කරනු ඇත.

ප්‍රතිපත්ති 2.1

වෙරළ කලාපය තුළ මෙන්ම ඉන් පිටත මානව ක්‍රියාකාරකම් සහ සංවර්ධන කටයුතු හේතුකොට මෝය සහ කලපුවලට සිදුවන හායනය අවම කරනු ඇත.

ක්‍රමෝපාය 2.1.1

දැනට පවත්නා රෙගුලාසි සහ මාර්ගෝපදේශවලට අනුකූලතාව අධීක්ෂණය කිරීම සහ බලාත්මක කිරීම මගින් කලපු සහ මෝයවලට මුදා හරිනු ලබන පිරිපහදු නොකරන ලද අපද්‍රව්‍ය සහ මල ද්‍රව්‍ය බැහැර කිරීම අවම කිරීම.

යෝජිත ක්‍රියාකාරකම්

1. වෙරළ සංරක්ෂණය සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් දැනට දියත් කොට ඇති මුහුදු ජලයේ ගුණාත්මක බව සුපරීක්ෂණ අධ්‍යයනය කලපු සහ මෝය වලට කරනු ලබන අපද්‍රව්‍ය සහ මල ද්‍රව්‍ය බැහැර කිරීමේ බලපෑම් නිර්ණය කිරීම හැකිවන ලෙස මෝය සහ කලපු ඇතුළත් වන පරිදි පුළුල් කිරීම.

2. මෝය සහ කලපු වෙත නේවාසික වාසස්ථාන මගින් ඍජුව බැහැර කරනු ලබන මලද්‍රව්‍ය අවම කිරීම හා කර්මාන්තශාලා මගින් බැහැර කරන අප ද්‍රව්‍ය අවම කිරීම සඳහා පළාත් පාලන ආයතනවල හා වෙනත් අදාළ ආයතන සහයෝග යෙන් නව වැඩසටහනක් ආරම්භ කිරීම සහ පවත්නා වැඩසටහන්වලට සහය වීම.

3. සංවර්ධන බලපත්‍රයන්, පාරිසරික ඇගයීම් වාර්තාවන් සහ පරිසර ආරක්ෂණ බලපත් මගින් පනවා ඇති කොන්දේසි සහ යොමු රීතිවලට අනුකූලව වෙරළ කලාපයේ පිහිටි සියලු කර්මාන්තශාලා කටයුතු කිරීම පිළිබඳව තහවුරු කිරීම සඳහා අධීක්ෂණ වැඩසටහන් පැවැත්වීම.

4. මෝය සහ කලපුවලට කරනු ලබන දූෂණකාරක බැහැර කිරීම් නවතාලීම සඳහා අදාළ නීතිවල විධිවිධානයන් ක්‍රියාත්මක කිරීම.

ප්‍රතිපත්ති 2.2

මෝය සහ කලපු මුවදෙර සහ ආසන්න ඉවුරු වඩාත් ප්‍රබල විද්‍යාත්මක තොරතුරු මත කළමනාකරණය කිරීම.

ක්‍රමෝපාය 2.2.1

අනවසර අල්ලා ගැනීම, ගොඩකිරීම්, තුරුලතා ඉවත් කිරීම සහ වෙනත් සංවර්ධන කටයුතු මගින් කලපු සහ මෝයවල ක්‍රියාකාරී ජල ප්‍රදේශ අඩු වීම අවම කිරීම.

යෝජිත ක්‍රියාකාරකම්

1. අදාළ ආයතනවල සහයෝගයෙන් කලපු සහ මෝය මායිම් මිනුම් කටයුතු කොට එම මායිම් නිර්ණය කිරීම.

2. වෙරළ කලාපයට අයත් ජල තලයන්හි සහ ගංගා මෝය සහ කලපු ඉවුරු දෙපස භූමිය තුළ සංවර්ධන කාර්යයන් පාලනය කිරීම සඳහා සංවර්ධන බලපත්‍ර ක්‍රියාපරිපාටිය ක්‍රියාත්මක කිරීම.

3. කලපු සහ මෝය ආශ්‍රිත සිදුවන සංවර්ධන කටයුතු පාලනය සඳහා විශේෂ කළමනාකරණ ප්‍රදේශ සඳහා වූ නෛතික විධිවිධාන භාවිතා කිරීම.

4. අනවසර අල්ලා ගැනීම් සහ පිරවීම් පිළිබඳව පවත්නා නව රෙගුලාසි ක්‍රියාත්මක කිරීම.

**ප්‍රතිපත්තිය 2.3**

කලපු සහ මෝය හා සම්බන්ධිත පාරිසරික, ආර්ථික සහ සමාජීය අගයන් හඳුනාගැනීමත් වැඩි දියුණු කිරීමත් සිදු කරනු ඇත.

**ක්‍රමෝපාය 2.3.1**

පරිසර පද්ධති සේවාවන් තක්සේරු කිරීම සහ කලපු සහ ප්‍රජා සහභාගිත්වය මගින් කලපු සහ මෝය ආශ්‍රිත සම්පත්වල තිරසාර කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. දේශපාලනික හා ආර්ථික වැදගත්කමක් ඇති බාධක වෙරල සහිත මෝයන් හි පරිසර පද්ධතියේ වටිනාකම තක්සේරු කිරීමේ ආදර්ශකයක් සැකසීම. (උදා. මීගමුව හා පුත්තලම කලපුව)

2. ධීවර පන්න ක්‍රම සහ කටයුතු පාලනය කිරීමෙන් මෝය හා කලපුවල ධීවර කටයුතු තිරසාර මට්ටමක පවත්නා නියාමන ක්‍රියාමාර්ග බලාත්මක කිරීම.

3. සම්පත්වල තිරසාරභාවය පවත්වා ගනිමින් අදාළ පාර්ශ්වකරුවන් සමඟ කලපු සහ මෝයවල පාරිසාරික සහ විනෝදාත්මක අගය සහ ස්වභාවික පරිසරය ප්‍රවර්ධනය සඳහා වැඩ සටහන් සම්පාදනය.

4. පරිසර අමාත්‍යාංශය විසින් සකස් කොට ඇති ජාතික ජෛව විවිධත්ව සංරක්ෂණ ක්‍රියාකාරී සැලැස්මේ අදාළ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සඳහා සහය දැක්වීම හා උනන්දු වීම.

5. තෝරා ගන්නා ලද කලපු සහ මෝයන්හි වැලිවැටි නිර්මාණය සහ ඉවත් කිරීමේ බලපෑම් අධ්‍යයනය කොට අහිතකර ප්‍රතිඵල අවම කිරීමේ පිළියම් හඳුනාගැනීම.

**ක්‍රමෝපාය 2.3.2**

ජල පාලන සහ වාරිමාර්ග වැඩ යෝජනා හේතුකොට මෝය සහ කලපුවල සිදුවන වෙනස්කම් අවම කිරීම සඳහා සහභාගීත්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

**ක්‍රමෝපාය**

1. වාරිමාර්ග වැඩ ඇතුළු ඉහල ප්‍රදේශයන්හි සිදුවන සංවර්ධන කටයුතු මගින් වන දූෂණය වැලි තැන්පත් වීම/ලවනතාව වෙනස්වීම් අවම කිරීම සඳහා මෝය සහ කලපු කළමනාකරණය ජලපෝෂක ප්‍රදේශ කළමනාකරණය සමඟ ඒකාබද්ධ කිරීම.

2. තෝරා ගන්නා ලද මෝය සහ කලපුවලට වාර්මාර්ග කටයුතු/ ජලය හැරවීම නිසා සිදුවන බලපෑම අධ්‍යයනය කිරීම සහ බලපෑම් අවම කිරීමේ පිළියම් හඳුනාගැනීම.

**අරමුණු 3**

පාරිසරික කාර්යයන් සහ ආර්ථික සහ සමාජ අගය පවත්වා ගෙන යාහැකි පරිදි මුහුදු තෘණ කලාප සංරක්ෂණය කිරීම.

**ප්‍රතිපත්තිය 3.1**

මුහුදු තෘණ කලාපවලට ඍජුව සහ වක්‍රව හානි සිදුවන ක්‍රියාවන් අවම කරනු ඇත.

**ක්‍රමෝපාය 3.1.1**

අදාළ ආයතන සමඟ පවත්නා රෙගුලාසි යොදා ගනිමින් මුහුදු තෘණ කලාපවලට සිදුවන අහිතකර බලපෑම් සහ හානි අවම කිරීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. මුහුදු තෘණතලා වලට හානි කරනු ලබන හානිකර ධීවර පන්න ක්‍රම, වැලි ඉවත් කිරීම සහ දූෂණය වැලැක්වීමට පවත්නා නීති ක්‍රියාත්මක කිරීම.

2. වෙරළබඩ ප්‍රදේශයන්හි කැණීම් මගින් වියහැකි අහිතකර බලපෑම් වැළැක්වීමට පාරිසරික ඇගැයීම් සහ මූලික පාරිසරික ඇගයීම් ක්‍රියාත්මක කිරීම.

**ප්‍රතිපත්ති 3.2**

ශ්‍රී ලංකාවේ මුහුදු තෘණ කලාප පිළිබඳ පර්යේෂණ සහ ප්‍රජාව දැනුවත් කිරීම් ප්‍රවර්ධනය කරනු ඇත.

**ක්‍රමෝපාය 3.2.1**

මුහුදු තෘණ කලාප කළමනාකරණය වැඩි දියුණු කිරීමට ඉවහල් වන අන්තර් සහයෝගාත්මක පර්යේෂණ, අධීක්ෂණ සහ දැනුවත් කිරීමේ වැඩසටහන් දියත් කරනු ලැබේ.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. ශ්‍රී ලංකාවේ අනන්‍ය මුහුදු කලාපයේ දැඩි ලෙස අවදානමට ලක්ව ඇති මුහුදු තෘණ තලා ප්‍රදේශ ක්‍රමාණුකූලව සිතියම් ගත කිරීම පිණිස වැඩසටහන් ආරම්භ කළ යුතුය.

2. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ විධිවිධාන අනුව අවධානමට ලක්ව ඇති තෝරාගත් මුහුදු තෘණ ප්‍රදේශ "සංරක්ෂණ ප්‍රදේශ" ලෙස ප්‍රකාශයට පත් කළ යුතුය.

3. ජලවහන ද්‍රෝණි සහ මුහුදු තෘණ පත්ල මත වැලිපර නිර්මාණය වීමේ අයහපත් ප්‍රතිඵල අධ්‍යයනය සඳහා වැඩසටහන් ආරම්භ කිරීම සහ කලමනාකරණ පියවර යෝජනා කිරීම.

4. තෝරාගත් ඉලක්ක කණ්ඩායම් අතර මුහුදු තෘණ තලා ආශ්‍රිත පරිසර පද්ධති සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්විය යුතුය.

5. විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය තුළින් කලපු ආශ්‍රිත මුහුදු තෘණ තලාවන් සංරක්ෂණය කෙරෙහි අවධානය යොමුකළ යුතුය.

**අරමුණ 4**

පාරිසරික වශයෙන් ඉටුවිය යුතු සේවා සහ ජෛව විවිධත්වය පවත්වාගෙන යාම සහ සමාජ ආර්ථික කටයුතු පවත්වාගෙන යාම සඳහා කඩොලාන පරිසර පද්ධති සංරක්ෂණය කොට කළමනාකරණය කිරීම.

**ප්‍රතිපත්ති 4.1**

නිසි ලෙස සැලසුම් නොකරන ලද සංවර්ධන කටයුතු වලින් කඩොලාන පද්ධතීන්ට වන හානිය සහ ක්ෂය වීම වැළැක්වීම අවම කිරීම.

**ක්‍රමෝපාය 4.1.1**

කඩොලානවලට වන හානි අවම කිරීම සඳහා වැඩසටහන් සකස් කොට ක්‍රියාත්මක කිරීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. කළමනාකරණය කඩිනමින් අවශ්‍ය අවදානම් පාත්‍ර කඩොලාන ප්‍රදේශ හඳුනාගෙන එම ස්ථාන සංරක්ෂණය සඳහා ප්‍රමුඛතාගත කළ යුතුය.

2. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහයෝගයෙන් ප්‍රමුඛතා ලැයිස්තුවට අනුකූලව "සංරක්ෂණ ප්‍රදේශ" ප්‍රකාශයට පත්කළ යුතුය.

3. හඳුනාගත් කඩොලාන හායනය වූ ප්‍රදේශයන් පුනරුත්තාපනය පිණිස නැවත වගාකිරීමේ යෝජනාව සඳහා මාර්ගෝපදේශ සම්පාදනය කළ යුතුය.

4. පාරිසරික ඇගැයීම් වාර්තා සහ මූලික පාරිසරික වාර්තා ක්‍රියාපටිපාටිය මඟින් කඩොලාන ප්‍රදේශයන්හි නව සංවර්ධන ක්‍රියාකාරකම් නියාමනය කළ යුතුය.

5. කඩොලාන පද්ධතීන් ආශ්‍රිතව දැනටමත් කෙරෙන හෝ අනාගතයේ දී සිදු කිරීමට අපේක්ෂිත සංවර්ධන කටයුතුවල අහිතකර බලපෑම් හඳුනාගෙන ඒවා අවම කිරීමට උපකාරීවන සුපරීක්ෂණ යාන්ත්‍රණයක් හඳුන්වා දිය යුතුය.

6. තිරසාර ලෙස කඩොලාන සම්පත් නිස්සාරනය සඳහා අවසර ලබාදිය හැකි ස්ථාන හඳුනාගෙන එම භාවිතයන් සඳහා මාර්ගෝපදේශ සකස් කොට ක්‍රියාත්මක කළ යුතුය.

**ප්‍රතිපත්ති 4.2**

ආර්ථික කටයුතු හා සම්බන්ධ කඩොලාන සම්පත් තිරසාර ලෙස භාවිතා කිරීමට සහාය ලබා දෙනු ඇත.

**ක්‍රමෝපාය 4.2.1**

ආයතනික සහයෝගිතාව සහ ප්‍රජා සහභාගීත්වය මඟින් ආර්ථික කටයුතු සඳහා කඩොලාන තිරසරව කළමනාකරණයට සහය වීමත් ප්‍රවර්ධනය කිරීමත් සිදු කළ යුතුය.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. උචිත ස්ථානවල ප්‍රජා සහභාගීත්වය ඇතිව පරිසර හිතකාමී සංචාරක කටයුතු ඇරඹීමට පුද්ගලික අංශය දිරිමත් කළ යුතුය.

2. ප්‍රජා මට්ටමෙන් යොදා ගත හැකි හානිකර නොවෙන කඩොලාන භාවිතයන් හඳුනාගෙන ඒ පිළිබඳ තොරතුරු පාර්ශවකරුවන් අතර ප්‍රචාරණය කළ යුතුය.

3. තිරසාර ලෙස කඩොලාන භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා සුදුසු අන්තර් ආයතනික සම්බන්ධීකරණ යන්ත්‍රනයක් ඇති කළ යුතුය.

4. තිරසාර ලෙස කඩොලාන භාවිතය සහතික කිරීම සඳහා විශේෂ ප්‍රදේශ කළමනාකරණ ක්‍රියාවලිය ඔස්සේ වැඩසටහන් සකස් කොට සහ ක්‍රියාත්මක කළ යුතුය.

**ප්‍රතිපත්ති 4.3**

දැනට පවත්නා නීති විධිවිධානවලට අනුකූලව වෙරළ කලාපය තුළ පවත්නා කඩොලාන පරිසර පද්ධති ආරක්ෂා කළ යුතුය.

**ක්‍රමෝපාය 4.3.1**

වෙරළ කලාපය තුළ පිහිටි කඩොලාන ආරක්ෂා කිරීම සඳහා නෛතික විධිවිධාන ක්‍රියාත්මක කිරීම දිරිමත් කර ප්‍රවර්ධනය කළ යුතුය.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. පාර්ශව කණ්ඩායම් අතර දැනට පවත්නා නෛතික විධිවිධාන පිළිබඳව අධ්‍යාපන සහ දැනුවත් කිරීමේ වැඩසටහන් සම්පාදනය කොට ක්‍රියාත්මක කළ යුතුය.

2. නීති කඩකිරීම් පිළිබඳව තොරතුරු ලබාගැනීම සඳහා ප්‍රජා සහභාගීත්වය දිරිමත් කළ යුතුය.

**අරමුණ 5**

පාරිසරික කාර්යයන්, ආර්ථික සහ සමාජීය අගයන් සහ සෞන්දර්යාත්මක වැදගත්කම පවත්වාගෙන යා හැකි පරිදි බාධක වෙරළවල්, තුඩු, සහ වැලි වැටි සංරක්ෂණය කිරීම.

**ප්‍රතිපත්තිය 5.1**

බාධක වෙරළ, වැලි තුඩු සහ වැලි වැටි හායනය කරන්නා වූ වෙරළබඩ සංවර්ධන කටයුතු නියාමයන් කරනු ඇත.

**උපාය මාර්ගය 5.1.1**

නියාමන ක්‍රියාමාර්ග සහ වැලි වැටි ආරක්‍ෂණ සහ ස්ථාපිත කිරීම මගින් බාධක වෙරළ, වැලි තුඩු සහ වැලි වැටි මත ඇතිවන සංවර්ධනයේ අහිතකර බලපෑම් අවම කළ යුතුය.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. වෙරළබඩ පහත් බිම් අභිමුඛව ඇති බාධක වෙරළ, තුඩු සහ වැලි වැටි සංවේදී කලාප ලෙස ප්‍රකාශයට පමුණුවා එලෙස ප්‍රකාශයට පත්කළ ප්‍රදේශයන්ට හානිකර සියලු ක්‍රියාකාරකම් පාලනය කළ යුතුය.
2. බාධක වෙරළ, වෙරළ, වැලි වැටි සහ තුඩුවලට ආසන්න ප්‍රදේශවල ස්ථානගත කිරීම යෝජිත නව සංවර්ධන කටයුතු සඳහා ස්ථානගත කිරීමේ නිර්ණායකයන් සකස් කොට ක්‍රියාත්මක කළ යුතුය.
3. බාධක වෙරළ, වැලි වැටි සහ තුඩු ආශ්‍රිත පිහිටුවීමට යෝජිත සංවර්ධන කටයුතුවලට සහ වෙරළ කලාපයෙන් පිටත පිහිටුවීමට යෝජිත සංවර්ධන කාර්යයන් සඳහා පරිසර ඇගයීම් වාර්තා ක්‍රියාවලිය අනිවාර්ය කළ යුතුය.
4. බාධක වෙරළ, වැලි වැටි සහ තුඩු තුළ හෝ ආසන්නයේ සිදුකරනු ලබන නව සංවර්ධන කටයුතුවලට අදාළ සියළු රෙගුලාසිවලට අනුකූල වන බව සහතික කිරීම පිණිස අදාළ ආයතන සමග සම්බන්ධීකරණය වැඩි දියුණු කළ යුතුය.
5. සංවර්ධන කටයුතු සඳහා බාධක වෙරළ, වැලි වැටි සහ තුඩු ආශ්‍රිත රජයේ ඉඩම් ලබාදීම වැලැක්වීම සඳහා අදාළ ආයතන සමග සහයෝගයෙන් කටයුතු කළ යුතුය.
6. මෙම ලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වෙරළ ආරක්ෂිත යොමුරීති කෙරෙහි අවධානය යොමු කරමින් ඉඩම් මිනුම් කටයුතු පදනම් කොට වැලි වැටි ඉම (DPL) ස්ථාපිත කිරීම.
7. වැලි වැටි ඉම තුළ නව සංවර්ධන කටයුතු සහ දැනට පවත්නා ව්‍යුහයන් පුළුල් කිරීම තහනම් කළ යුතුය.
8. වැලි වැටි ඉම පවත්වා ගැනීමේ වැදගත්කම ප්‍රධාන පාර්ශවකරුවන් වෙත සන්නිවේදනය කිරීම පිණිස ඵලදායි වැඩසටහන් සකස් කළ යුතුය.
9. 1992 අංක 23 දරන පතල් සහ ඛනිජ ද්‍රව්‍ය පනතට අනුකූලව භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශයේ විමසා බාධක වෙරළ වලින්, වැලි වැටි සහ තුඩු වලින් වාණිජමය වශයෙන් වටිනා ඛනිජ හෝ ඛනිජ වැලි ගවේෂණය කළමනාකරණය කිරීම, නියාමනය කිරීම සහ නීතිය කඩකරන්නන්ට එරෙහිව නීති මගින් කටයුතු කළ යුතුය.

**ප්‍රතිපත්තිය 5.2**

සුනාමි සහ සුළි සුළං වැනි හදිසි වෙරළබඩ ආපදාවන්ගෙන් වන හානිය අවම කිරීම සඳහා වැලිවැටි ආරක්‍ෂා කරනු ඇත.

**ප්‍රතිපත්තිය 5.3**

වැලි වැටි බාධක, වෙරළ සහ තුඩු හායනයට ලක් වන වෙරළබඩ දූෂණය අවම කරනු ඇත./වලක්වනු ඇත.

**ක්‍රමෝපාය 5.3.1**

වැලි වැටි, බාධක වෙරළ සහ තුඩුවල දැනට පවත්වාගෙන යන ඝන අපද්‍රව්‍ය කැනීම් ද්‍රව්‍ය මුදා හැරීම පාලනයට පළාත් පාලන ආයතන සහ පාර්ශවකරුවන් ඒකරාශී කළ යුතුය.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. වැලි වැටි, බාධක වෙරළ සහ තුඩුවල දැනට පවත්වාගෙන යන ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ස්ථාන වෙනුවට විකල්ප ස්ථාන භාවිතා කිරීමට පලාත් ආයතනවලට සහය දක්වා දිරිමත් කළ යුතුය.

2. පළාත් පාලන ආයතන සහ සෑම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් වෙරළ පවිත්‍ර කිරීමේ වැඩ සටහන් දියත් කළ යුතුය.

3. වෙරළ ප්‍රදේශවල පදිංචිකරුවන් අතර කළමනාකරණ කණ්ඩායම් පිහිටුවා බාධක වෙරළ වැලි වැටි සහ තුඩු පවත්වාගෙන යාම සඳහාත් එම ප්‍රදේශ දූෂණයෙන් තොරව තබා ගැනීම සඳහා සකස් කර, එම මාර්ගෝපදේශයන් අනුව කටයුතු කරන බවට වග බලා ගත යුතුය.

**ප්‍රතිපත්තිය 5.4**

බාධක වෙරළ, වැලි තුඩු සහ වැලි වැටිවල ජෛව විවිධත්වය හායනයට පාත්‍ර වන කටයුතු අවම කරනු ඇත.

**ක්‍රමෝපාය 5.4.1**

අන්තර් ආයතනික සහභාගීත්වය තුළින් ජෛව විවිධත්වය අවම කරනු ලබන මිනිස් ක්‍රියාකාරකම් අවම කළ යුතුය.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. බාධක වෙරළ වැලි තුඩු සහ වැලි වැටිවල වන සත්ව සහ වෘක්ෂලතා ඉවත් කිරීම සහ විනාශ කිරීම තහනම් කිරීම.

2. හානියට පත් ප්‍රදේශවල සුදුසු දේශීය ශාක වර්ග සිටුවීමට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ සහයෝගයෙන් වැඩසටහන් ප්‍රවර්ධනය කර දියත් කිරීමට කටයුතු කළ යුතුය.

3. මුහුදු කැස්බෑවුන් බිජුලන වැදගත් ස්ථාන හඳුනාගෙන එම ස්ථාන සංරක්ෂණයට අවශ්‍ය සහයෝගාත්මක පියවර ගත යුතුය.

4. ආක්‍රමණශීලී ශාක හා බැඳුනු ගැටලු අවම කිරීමට අවශ්‍ය වන සහයෝගාත්මක පියවර ගත යුතුය.

**අරමුණ 6**

පාරිසරික කර්තව්‍ය සහ සමාජ ආර්ථික වටිනාකම පවත්වා ගැනීම පිණිස ලවණ වගුරුබිම් සංරක්ෂණය කරනු ලැබේ.

**ප්‍රතිපත්තිය 6.1**

ලවණ වගුරු හායනයට ලක්වන සංවර්ධන කටයුතු වැළැක්වීම හෝ අවම කිරීම.

**ක්‍රමෝපාය 6.1.1**

අදාළ ආයතන අතර සම්බන්ධතා සවිමත් කිරීම තුළින් නව සංවර්ධන කටයුතු, අදාළ මාර්ගෝපදේශ/රෙගුලාසිවලට අනුකූලව සිදුකෙරෙන බව සහතික කරමි.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. ලවන වගුරු බිම්වල පාරිසරික හා සමාජ ආර්ථික වටිනාකම අනුව අතිශයින් වැදගත් වන ඒවා හඳුනාගෙන ආශ්‍රිත සංවර්ධන කටයුතු සැලසුම් කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සකස් කළ යුතුය.

2. අදාළ වෙනත් ආයතන සහ ප්‍රජාවගේ එකතුවෙන් ලවන වගුරු බිම්වල දරාගැනීමේ සහ සංවර්ධන හැකියාවන් නිර්නය කොට අනාගතයේදී සිදුකළ හැකි සංවර්ධන කටයුතුවලට ඉවහල් වන සේ කලාපීකරන සැලසුම් සකස් කළ යුතුය.

3. පවත්නා නීති රීති අවසර පත්‍රවලට අනුකූලවනසේ ලවන වගුරු ආශ්‍රිත නව ක්‍රියාකාරකම් සහ ව්‍යාප්ත කිරීම් (උදා. ලුණු ලේවා, ඉස්සන් පොකුණු) නියාමනය කිරීම.

4. ලවන වගුරු තුළ සහ ඒ අවට සිදුවන සංවර්ධන කාර්යයන් නියාමනය කිරීමට අදාළ ආයතන සඳහා යාන්ත්‍රනයක් සකස් කළ යුතුය.

**ප්‍රතිපත්තිය 6.2**

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙරළ කලාපයේ සහ ඉන් පිටත ඇති ලවන වගුරු සංරක්ෂණය සඳහා අනෙකුත් ආයතන සමඟ කටයුතු කරනු ඇත.

**ක්‍රමෝපාය 6.2.1**

අදාළ පාර්ශවකරුවන් සඳහා සැලසුම් සහගත සන්නිවේදන ක්‍රමෝපායන් මගින් ලවන වගුරු තිරසාර ලෙස සංවර්ධනය කළ යුතුය.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. ලවන වගුරුවල වැදගත්කම පිළිබඳව ප්‍රධාන පාර්ශවකරුවන් දැනුවත්කොට ඒවා සංරක්ෂණය කිරීමට ඔවුන්ගේ කැපවීම ඉහල නැංවීමට විශේෂ වැඩසටහන් සකස්කොට ක්‍රියාත්මක කළ යුතුය.

2. දූෂණය පාලනය කිරීම සහ පිරිසිදු නිශ්පාදන තාක්ෂණයන් සපයන්නන් පිළිබඳ තොරතුරු වෙරළ කලාපය කෙරෙහි අහිතකර බලපෑම් ඇති කරන කර්මාන්ත වෙත සපයා දීම පහසුකරලීම.

**References** :


1. Coast Conservation and Coastal Resources Management Department (2004), Revised Coastal Zone Management Plan 2004
2. Coast Conservation and Coastal Resources Management Department (2014); Updating and preparation of a synthesis report on Coastal Coral Reefs, Sea Grass Beds, Salt Marshes, Lagoons and Estuaries and Barrier Beaches within the coastal region of Sri Lanka.
3. Government of Sri Lanka, Coast Conservation and Coastal Resources Management Act No. 57 of 1981.
4. Ministry of Environment and Nature Resources, 2009, National Action Plan for Haritah Lanka Programmer
5. Miththapala, S. (2008) Mangraves, Coastal Ecosystem Series Volume 2 P1-28 + iii, Colombo Sri Lanka; Ecosystem and Livelihood Group Asia, IUCN.
6. Miththapala, S. (2008) Seagrases and Sand dunes, Coastal Ecosystem Series Volume 3, Colombo Sri Lanka; Ecosystem and Livelihood Group Asia, IUCN.
7. Miththapala, S. (2013), Lagoon and Estuaries, Coastal Ecosystem Series (Vol 4). vi + 73 pp. IUCN Sri Lanka Country Office, Colombo.
8. Silva, E.I.L. Katupotha, J.; Amarasinghe, O.; Manthrithilake,H.; Ariyaratne,R.; 2013. Lagoon of Sri Lanka: from the origins to the present. Colombo, Sri Lanka; International Water Management Institute (IWMI)
9. Samarakoon, Jayampthy; Saman Samarawickrama (2012) An appraisal of challenges in the sustainable management of the Micro tidal Barrier built estuaries and lagoon in Sri Lanka, IUCN, Sri Lanka Country Office, Colombo.
10. Web sites used :
    http://www.fao.org/docrep/010/ai000e/AIOOOEO7.htm

# 4 පරිච්ඡේදය

## 4. වෙරළබඩ ජල දූෂණය පාලනය කිරීම

### 4.1 හැඳින්වීම

#### 4.1.1 ගැටලුවේ වැදගත්කම

> වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මෑතක දී කරන ලද පසු විපරම් අධ්‍යයනයන්ට අනුව ආර්ථික වශයෙන් වැදගත් පාරිසරික වශයෙන් සංවේදී වෙරළබඩ ප්‍රදේශයන්හි වෙරළබඩ ජලයේ ගුණාත්මකභාවය පිරිහෙමින් පවතින බව පෙන්වා දෙයි.
>
> වෙරළබඩ ප්‍රදේශය තුළ සංචාරක කර්මාන්තය සහ අනෙකුත් වැදගත් ආර්ථික කටයුතු ආකර්ෂණය වීම දෙස බලනවිට, වෙරළබඩ දූෂණය ඉතා සමීපව සුපරීක්ෂණය කිරීමත් ඵලදායී ලෙස කළමනාකරණය කිරීමත් අවශ්‍ය වේ.

ඉහළ යමින් පවත්නා ජනගහන පීඩනයත්, නාගරිකකරණය සහ වෙරළ කලාපයේ සිදුවන ආර්ථික සංවර්ධන කටයුතුවල ප්‍රතිඵලයක් ලෙස වෙරළබඩ ජල දූෂණ ගැටලුව පසුගිය දශක කිහිපය තුළ වැඩි වී ඇත. 2012 වසරේ දී වෙරළබඩ දිස්ත්‍රික්කයන්හි ජනගහනය 11,392,903 ලෙසට ඇස්තමේන්තු කරන ලදි. කොළඹ නාගරිකය තුළ ඉහළතම නාගරික වර්ධනය වාර්තා කරමින් 1981 දී මිලියන 3.9 ප්‍රමාණය 2012 දී මිලියන 5.8 දක්වා වැඩි වී ඇත. සාගර ජලය සහ වෙරළබඩ මතුපිට ජලය සමන්විත වන්නේ ගංගා, ඇළ දොළ, මෝය සහ කලපු සහ භූගත ජලය වන අතර පාලනයකින් තොර කර්මාන්තවලින් වෙරළ කලාපය තුළ සහ පිටත පිහිටි ජනාවාස සහ සංවර්ධන කටයුතුවලින් සැලකිය යුතු මට්ටමක දූෂණ ප්‍රමාණයක් මේවාට එකතු වේ. රට තුළ පවත්නා සියලු කර්මාන්තවලින් (කුඩා, මධ්‍යම, විශාල පරිමාණයේ) 61.6%ක ප්‍රමාණයක් වෙරළබඩ ප්‍රදේශවල ස්ථානගත වී ඇති අතර තරමක් පිරිපහදු සහිතව හෝ රහිතව බැහැර කරනු ලබයි. සාමාන්‍යයෙන් ධීවර, සංචාරක සහ අනෙකුත් කර්මාන්ත සහ ධීවර ප්‍රජාවගේ ජීවනෝපායන්ගේ තිරසාරභාවය විශාල වශයෙන් රඳා පවතින්නේ මෙම ප්‍රදේශවල පවත්නා විවිධ පරිසර පද්ධති සහ සම්පත්වල ඵලදායීතාව මතය. විශේෂයෙන් වෙරළාසන්න ජලතීරයන්ගේ ජලය විනෝද, සංචාරක සහ ධීවර කටයුතුවලට පුළුල් ලෙස භාවිතා කරනු ලබන අතර ඒ සඳහා ජලයේ විවිධ මට්ටම්වල ගුණාත්මකභාවය අවශ්‍ය වෙයි.

වෙරළබඩ සහ සමුද්‍රීය පද්ධතීන්ට සිදුවන දූෂණය මගින් එල්ලවන බලපෑම සහ එහි ප්‍රතිඵල වශයෙන් ඉස්මතුවන ජීව විද්‍යාත්මක, සහ සමාජ - ආර්ථික සංකීර්ණත්වයන් බෙහෙවින් විවිධය. පවත්නා තොරතුරු අනුව ශ්‍රී ලංකාවේ වෙරළබඩ ජල දූෂණයේ පිරිවැය වැඩිවන උපනතීන් පෙන්නුම් කරයි. උදහරණ වශයෙන් වෙරළබඩ ජල දූෂණ හේතුකොට කොළඹ නාගරික ප්‍රදේශයන්හි ප්‍රජා සෞඛ්‍ය ආරක්ෂා කිරීමට වැයවූ මුදල 1992 දී රුපියල් දස ලක්ෂ 2 ක් වූ අතර එය 1997 දී රුපියල් දස ලක්ෂ 4 දක්වාත් 2002 රුපියල් දස ලක්ෂ 14 දක්වාත් පිළිවෙළින් වැඩි වී ඇති බවට ඇස්තමේන්තුකොට ඇත.

තවද ජෛවවිවිධත්වය අඩුවීම, විනෝදාත්මක, දර්ශනීය, සංස්කෘතික, පුරාවිද්‍යාත්මක වටිනාකම පහත වැටීම, ඉඩම් මිල පහත යෑම, ධීවර සංචාරක සහ අනෙකුත් සංවර්ධන කටයුතුවලින් ලැබෙන ආදායම අඩුවීම ආදී පිරිවැය ද මෙයට දායක වී ඇත. දූෂණ මට්ටම ඉහළයාම සහ වෙරළබඩ ඉඩම්වල වටිනාකම අඩුවීමෙන් ධීවර ඵලදායීතාව පහත වැටීමත් අතර සෘජු සම්බන්ධතාවයක් පවතී. උදහරණ වශයෙන් පරිසර දූෂණය හේතුකොට ලුනාව කලපුවේ මත්ස්‍ය නිෂ්පාදනවලින් අහිමිවූ වාර්ෂික ආදායම දළ වශයෙන් රුපියල් මිලියන 1963 ලෙසටත් එම ප්‍රදේශයේ ඉඩම්වල වටිනාකම වාර්ෂික පහත වැටීම රුපියල් මිලියන 712 ලෙසටත් ඇස්තමේන්තු කොට ඇත. (වෙ.ක.සැත. 2014) මෙයට අමතරව ලුනාව කලපුව පුනරුත්ථාපනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය 2004-2007 කාලය තුළ රුපියල් මිලියන 95 ක් සෘජු පිරිවැයක් දරා ඇත. මේ අනුව වෙරළබඩ ජල දූෂණය කළමනාකරණය කිරීමේ අපේක්ෂිත ප්‍රතිලාභ ඉතා ඉහළ මට්ටමක පවතින අතර වෙරළ ප්‍රදේශයේ ජල දූෂණය අවම කිරීම අතිශයින් වැදගත් වේ.

**භූගත ජලය දූෂණය වීම**

> කෘෂිකාර්මික කටයුතු මගින් මතුපිට ජලය ගලා ඒම හේතුකොට සිදුවන වෙරළබඩ ජල දූෂණය පිළිබඳව නිරවද්‍ය ඇස්තමේන්තුවක් මෙතෙක් කර නොමැති නමුත් ඇතැම් අධ්‍යයනයන් මගින් මෙම ක්ෂේත්‍ර දෙකේ සබඳතාව පෙන්වයි. නොගැඹුරු භූගත ජල මට්ටමක් සහ අධික පාරගම්‍ය පාංශු සහිත කල්පිටිය අර්ධද්වීපයේ විශාල වශයෙන් වගා කරන ප්‍රදේශයන්හි පවත්නා ළිං ජලය අධික නයිට්‍රේට් සාන්ද්‍රණයකින් යුක්ත වේ. (ලෝක සෞඛ්‍ය සංවිධානයේ මාර්ගෝපදේශවල දක්වා ඇති මට්ටම වන මි.ග්‍රෑ 10/ලීටර් 1

ඉක්මවායයි) තවද මි.ග්‍රෑ. 50 - 200/ලීටරයට දක්වා පරාසයකින් යුත් ක්ලෝරයිඩ් සාන්ද්‍රණයක්ද එම ජලයේ අඩංගු වේ. අනෙක් අතට මෙම ප්‍රදේශයෙන් පිටත පිහිටි ගෘහස්ථ ළිංවල නයිට්‍රේට් මට්ටම මි.ග්‍රෑම් 2/ලීටර් 1ට වන අතර ක්ලෝරයිඩ් මට්ටම ලීටරයට/මි.ග්‍රෑ. 100 වඩා අඩුවිය. කෘෂිකාර්මික කටයුතු ආශ්‍රිතව මතුපිට ජලය ගලායාම සහ වළ වැසිකිළි තිබීම හේතුවෙන් යාපනය අර්ධද්වීපයේ භූගත ජලය දූෂණය වී ව්‍යාප්ත වී ඇත. යාපනය අර්ධද්වීපයේ භූගත ජලයේ ඉහළ නයිට්‍රේට් ප්‍රමාණයක් වාර්තා වී ඇති අතර මෙහි ප්‍රතිඵලයක් වශයෙන් දූෂණය වූ ජලය භාවිතා කරන්නන් අතර නිල් මිලිදු හෙවත් ඩිමේතැමොගේලාබිනේමියා නැමති රෝගය ව්‍යාප්තව ඇත.
(වෙ.ක.සැ. 2014)

**දූෂණ එක්රැස්වන ස්ථානයක් ලෙස වෙරළබඩ ජලය**

ගොඩබිම පාදක වූ කටයුතු මගින් උත්පාදනය වන ඝන අපද්‍රව්‍ය, ගෘහස්ත සහ කර්මාන්ත අප ජලය සහ පල්දෝරු මගින් එක්වන මළ ද්‍රව්‍ය සහ රොන් මඩ වැනි විශාල දූෂණ ප්‍රමාණයක් වෙරළාසන්න ජලයට එකතුවේ. මේවා ඍජුවම සාගරය වෙත ගලා ඒම හෝ ගංගා, ඇළ දෙල, මෝය සහ කලපු මගින් සාගරය වෙත ළඟාවීම සිදු වේ. මෙය සැලකිය යුතු කරුණක් වන්නේ හඳුනාගන්නා ලද භාවිත කටයුතු සඳහා වන වෙරළාසන්න ජලයේ විශේෂ ගුණාත්මක මට්ටම් අවශ්‍ය බැවිනි.

උදම් ක්‍රියාකාරීත්වයෙන් හෝ ජලයේ ගලා බැසීම නිසා සිදුවන තනුක බව සහ නිකුත්වීම හේතුකොට දූෂණ මට්ටම යම් තරමකට වෙනස් වුවද මෝය සහ කලපුවල වෙරළබඩ ජලය විශාල වශයෙන් දූෂණයට යටත් වේ. මෙම කලපු සහ මෝයවල අඩංගු ආර්ථික වශයෙන් වැදගත් සහ විවිධ ශාක සහ සත්ත්වයින් මෙන්ම මේවා සමඟ සම්බන්ධිත පරිසර පද්ධතීන්ගේ පැවැත්මට ජලය දූෂණය වීම විශාල බලපෑම් කරයි.

ශ්‍රී ලංකාවේ ගංගා 103 ක් මධ්‍යම කඳුකරයේ සිට ගලා බසී. මෙම ගංගා විවිධ දූෂිත බලපෑම්වලට යටත් වේ. ඇතැම් ඒවා කාබනික සහ අකාබනික දූෂණ, මල ද්‍රව්‍ය, ද්‍රව් තෙල් සහ දෘෂ්‍ය දූෂණ අන්තර්ගත විශාල ප්‍රමාණයක දූෂණ ගෙනයනු ලබයි. ගංගාවල දූෂණ ප්‍රමාණයන් කාලීන මෙන්ම අවකාශය අනුව වෙනස් විය හැක. මෙසේ වනුයේ ඒවාට විවිධ ස්ථානවලින් ඇතුළුවන දූෂණ ද්‍රව්‍ය ප්‍රමාණය විශාල වශයෙන් වෙනස් වන බැවිනි.

භූගත ජලය බොහෝ විට ලබා ගන්නේ පොළවට උරා ගන්නා වර්ෂා ජලය සහ ඇළ දෙල ජලාශ වැනි මතුපිට තලයන්ගේ ප්‍රති ආරෝපන මගිනි. මෙරට ඇස්තමේන්තුගත භූගත ජල සම්පත කියුබික් මීටර මිලියන 7250 පමණ වේ. ශ්‍රී ලංකාවේ පවත්නා පොහොසත්ම භූගත ජල මූලය වන්නේ පුත්තලම සිට මන්නාරම දිස්ත්‍රික්කය හරහා යාපනය අර්ධද්වීපය දක්වා දිවෙන හුණුගල් පරය ආශ්‍රිත ජල ධරයයි. පසුගිය වර්ෂයන් තුළ ගෘහස්ත, කෘෂිකාර්මික සහ කාර්මික අවශ්‍යතාවන් සඳහා කනින ලද ළිං සහ ගැඹුරු නල ළිං මගින් විශාල වශයෙන් උකහාගෙන ඇත.

බොහෝ වෙරළබඩ ප්‍රදේශයන්හි භූගත ජලය කෙරෙහි දැඩි තර්ජන එල්ලවනුයේ නයිට්‍රේට් සහ බැක්ටීරියා ආසාදන මගින් බව නිරීක්ෂණය කොට ඇත. වෙරළබඩ ප්‍රදේශයන්හි භූගත ජලයට බලපාන ප්‍රධාන දූෂක ගැටලුවක් වන්නේ පොහොර කාන්දු වීම මගින් වන නයිට්‍රේට් දූෂණය, අසූචි ද්‍රව්‍ය භූ අභ්‍යන්තරයට කාන්දුවීම, කාර්මික කලාපයන්හි බැර ලෝහ ආශ්‍රිතව සිදුවන දූෂණ යනාදිය වේ. භූගත ජලය පිරිසිදු කිරීමට වැය වන පිරිවැය අධික වීම නිසා භූගත ජලය දූෂණය වීම වැළැක්වීම ඉතා වැදගත් වේ. මේ පිළිබඳව අවධානය යොමුවිය යුතු තවත් කරුණක් නම් තිරසාර මට්ටමට වඩා අධික ලෙස වෙරළබඩ ප්‍රදේශයන්හි භූගත ජලය උකහාගැනීමයි. මේ හේතුකොට ළිංවලට කිවුල් ජලය කාන්දු වීම විශේෂයෙන් කෘෂිකාර්මික කටයුතු සඳහා ළිං ජලය බෙහෙවින් යොදා ගන්නා උතුරු සහ වයඹ වෙරළබඩ ප්‍රදේශයන්හි දැකිය හැක.

### 4.1.2 වෙරළබඩ ජල දූෂණයේ ස්වභාවය

#### 4.1.2.1 වෙරළබඩ ජල දූෂණයට හේතුවන මූලික සාධක

වෙරළබඩ ප්‍රදේශවල ජල දූෂණයට හේතු කාරකවන ප්‍රධාන සාධකය වනුයේ අධික ජන ඝනත්වය විශේෂයෙන් කර්මාන්ත, කෘෂිකර්මය, සංචාරක හා බෑදුන කටයුතු වැඩි වශයෙන් පවත්නා ප්‍රදේශයන්හිය. මේ අනුව කොළඹ, ගම්පහ, කළුතර, ගාල්ල, මාතර සහ යාපනය පිළිවෙලින් වැඩිම ජන ඝනත්වයක් වාර්තා කරයි. වැදගත් සමාජ ආර්ථික සංවර්ධන කටයුතු අඛණ්ඩව වෙරළතීරය දිගේ සිදුවන බැවින් මනා කළමනාකරණයක් නොකළහොත් වෙරළබඩ දූෂණය හා සම්බන්ධිත ගැටලු අනාගතයේදී තවදුරටත් උග්‍ර විය හැකි යයි අපේක්ෂා කළ හැක. මේ පිළිබඳව සලකා බැලීමේදී ජාතික භෞතික සැලැස්ම යටතේ වසර 2030 දක්වා අනුව නාගරික කලාප යෝජනා කොට ඇති උතුර, උතුරු මැද, මධ්‍යම, දකුණ සහ බස්නාහිර (වෙරළ කලාප) පහක් පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළ යුතු ය. මෙයට අමතරව මන්නාරම, යාපනය, කුච්චවේලි සහ කල්පිටිය වෙරළ බාණ්ඩයෙන් නව

සංචාරක මධ්‍යස්ථාන ලෙස සංවර්ධනය වනු ඇත. එබැවින් වෙරළබඩ දූෂණයක් සිදු වීමේ වඩා ඉහළ ප්‍රවනතාවයක් අනාගතයේදී අපේක්ෂා කළ යුතු ය.

#### 4.1.2.2 දූෂක වර්ගය සහ ඒවායේ ප්‍රභව

වෙරළබඩ ජල දූෂණයේ මට්ටම මෙතෙක් පූර්ණව අධ්‍යයනය කර නැතත්, මෙතෙක් වෙරළබඩ දූෂණය ප්‍රධාන වශයෙන් සිදු වන්නේ කර්මාන්ත, සංචාරක මධ්‍යස්ථාන, ජලජීවි වගා කටයුතු මගින් අර්ධ වශයෙන් හෝ පිරිපහදු නොකරන ලද අප ජලය සහ විෂ සහිත ද්‍රව්‍ය මුදා හැරීම, ඝන අප ද්‍රව්‍ය වෙරළබඩ ප්‍රදේශවලට මුදා හැරීම, මල ද්‍රව්‍ය ළඟා වීම, ධීවර යාත්‍රා, නැව් සහ සේවා ස්ථාන මගින් මුද හරිනු ලබන ද්‍රව තෙල් මුසුවීම, සහ තෙල් පිටාර ගැලීමෙනි. මෙම ජලයට කෘෂිකාර්මික ඉඩම් වලින් ගලා එන කෘෂි රසායන ද්‍රව්‍ය පොහොර අතිරික්ත සහ අනවසර ජනාවාස වලින් සහ වෙනත් ගෘහස්ථ ප්‍රභවයන්ගෙන් පිටවන අපද්‍රව්‍ය ද එකතු වේ. වෙරළබඩ ජලයට එකතුවන දූෂණ අසූචි ද්‍රව්‍ය පාවෙන හෝ අවලම්භිත දෘශ්‍ය දූෂණ පෝෂක ද්‍රව්‍ය අධිකව ඇති නයිට්‍රජන් සහ පොස්පරස්, විෂ ද්‍රව්‍ය, විෂ නොවන කාබනික කොටස්, බැර ලෝහ, ද්‍රව තෙල්, තාපජ ජලය (Thermal discharges) යනාදි වශයෙන් විවිධ වෙයි. (වගුව 4.1) ඒවා වැඩි වශයෙන් කර්මාන්තශාලා, නාගරික පල්දෝරු හෝ එම පවිත්‍රාගාර සහ පොල් ලෙලි පල් කරන ස්ථානයන් වැනි සුවිශේෂ ස්ථාන වලින් ද (අ) ගංගා, ඇලමාර්ග සහ කලපු වැනි වෙරළබඩ ජලමාර්ග ඔස්සේ ප්‍රවාහනය කරනු ලැබීමෙන් ද (ආ) සෘජු කාන්දුවීම් හෝ උරා ගැනීම් මගින් උත්පාදනය වේ. තවද මූලාශ්‍ර නොවන පාලනය කිරීම දුෂ්කරවන කෘෂිකාර්මික ඉඩම් පතල් හෝ ජනාකීර්ණ ප්‍රදේශ යනාදියෙන් ද උත්පාදනය විය හැක.

**වගුව 4.1: දූෂක වර්ග ප්‍රභවය සහ අහිතකර බලපෑම්**

| *දූෂක වර්ගය* | *ප්‍රධාන ප්‍රභව* | *අහිතකර බලපෑම්* |
|---|---|---|
| මල (අසූචි) දූෂණය | • නාගරික පළුදෙරු<br>• කර්මාන්ත<br>• සංචාරක අංශය<br>• ජලජීවි වගා කටයුතු<br>• අනවසර ජනාවාස | • ජල ආශ්‍රිත රෝග<br>• සමුද්‍රීය ශාක සහ සත්වයින්ගේ වැඩීම කෙරෙහි බලපෑම<br>• දුර්ගන්ධය සහ දර්ශනීය වටිනාකම හීන වීම.<br>• නිර්වායු පරිසර තත්ත්වයන් ඇතිවීමට තුඩුදීම |
| දෘෂ්‍ය දූෂණය | • කර්මාන්ත<br>• සංචාරක අංශය<br>• කෘෂිකර්ම සහ ජලජීවි වගාව<br>• අනවසර ජනාවාස<br>• නාගරික සහ ගෘහස්ථ ඝන අප ද්‍රව්‍ය | • දර්ශනීය වටිනාකම හීනවීම<br>• සත්ව වාසභූමි සහ සත්ව ප්‍රජනන ස්ථානයක් කෙරෙහි අහිතකර බලපෑම්<br>• ආලෝකය විනිවිද යාම අවම වීමෙන් මුහුදු තෘණ වැනි ශාක කෙරෙහි ඇති වන අහිතකර බලපෑම්. |
| පොස්පරස් සහ නයිට්‍රජන් වැනි පෝෂක ද්‍රව්‍ය වලින් සාරවත් වීම | • නාගරික පළුදෙරු<br>• කර්මාන්ත<br>• සංචාරක අංශය<br>• කෘෂිකර්ම සහ ජලජීවි වගාව<br>• අනවසර ජනාවාස<br>• නාගරික සහ ගෘහස්ථ ඝන අප ද්‍රව්‍ය | • ඇල්ගී වැඩීම උත්තේජනය වීම<br>• ජෛව විවිධත්වය වෙනස් වීම හෝ අඩුවීම<br>• ජලයේ ගුණාත්මක බව වෙනස් වීම |
| කාබනික (විෂ සහිත සහ රහිත) බැර ලෝහ ආශ්‍රිත දූෂණය | • කර්මාන්ත<br>• සංචාරක අංශය<br>• කෘෂිකර්ම සහ ජලජීවි වගාව<br>• අනවසර ජනාවාස<br>• නාගරික සහ ගෘහස්ථ ඝන අප ද්‍රව්‍ය | • මුහුදු ජීවීන්ට සෞඛ්‍ය ආපදා ඇති කරන හෝ පිළිකා කාරක පදාර්ථයන්ගේ ජෛව ඒකරාශී වීම<br>• ජෛව විවිධත්වය අඩු වීම<br>• වෙරළබඩ හෝ මුහුදු පරිසරයේ මෙම ද්‍රව්‍ය දිගු කලක් නොනැසී පැවතීම |
| තෙල් ආශ්‍රිත දූෂණය | • කර්මාන්ත<br>• බෝට්ටු, නැව් තෙල් පිටාර ගැලීම සහ සේවා ස්ථාන | • දර්ශනීය වටිනාකම හිනවීම<br>• මුහුදු පැලෑටි සහ ජීවීන් විනාශ වීම |

| දූෂක වර්ගය | ප්‍රධාන ප්‍රභව | අහිතකර බලපෑම් |
|---|---|---|
| තාප ආශ්‍රිත දූෂණය | • බල ශක්ති අංශය<br>• කර්මාන්තය | • තෙල් දර හා තාර කැටිති ඇති වීමෙන් පත්ල වාසි සත්ත්වයන් කෙරෙහි වන බලපෑම.<br>• සත්වයින්ගේ සංක්‍රමණික රටා වෙනස් වීම.<br>• මුහුදු ජීවින් සහ පැලෑටිවල වර්ධනයට බලපෑම<br>• පාරිසරික පද්ධතිවල වෙනස්වීම්වලට හේතු පාදක වීම.<br>• ඇල්ගී වර්ධනයට උත්තේජනය වීම. |

(වෙ.ක.ක. සැලැස්ම 2004)

### 4.2 ගැටලු සහ තර්ජන

#### 4.2.1 නාගරික මල අපවහන පහසුකම් ප්‍රමාණවත් නොවීම

පිරිසුදු නොකරන ලද නාගරික මළ අපවහන ජල මාර්ග සහ ගොඩබිම වෙත සෘජුවම මුද හැරීම හේතුකොට ඇතැම් වෙරළබඩ ජල ප්‍රදේශවල මළ (අසූචි) නිසා වන දූෂණය ප්‍රධාන ගැටලුවක් වී ඇත. ශ්‍රී ලංකාවේ මල අපවාහන පද්ධතියක ස්ථාපිත කර ඇති නගර කිහිපය අතරින් එකක් වන්නේ කොළඹ නගරයයි. එය මළ අපවහනය පද්ධතියේ එක් කොටසක් කොළඹ වරායට උතුරින් මෝදර දී දිගු නල මාර්ගයක් ඔස්සේ මුහුදට සම්බන්ධකොට ඇති අතර ඉතිරි කොටස තවත් දිග නල මාර්ගයක් ඔස්සේ වැල්ලවත්තේදී මුහුදට මුදහරියි. දැනට පවත්නා මළ අපවාහන පද්ධතියේ ධාරිතාව සමස්ථ කොළඹ නගරයම ආවරණය කිරීම සඳහා ප්‍රමාණවත් නොවේ. එම පද්ධතියම අවුරුදු 100 ක් පමණ පැරණිවන අතර නිරන්තර අළුත්වැඩියා අවශ්‍ය කෙරේ. මේ සම්බන්ධයෙන් ගැටලුවක් වී ඇත්තේ නීති විරෝධී මළ අපවහනය යා කිරීම් අනවසරයෙන් වැසි ජලය බස්නා කානු මළ අපවාහන පද්ධතියට සම්බන්ධ කිරීමයි.

වර්තමාන ඇස්තමේන්තු අනුව වෙරළබඩ ප්‍රදේශවල දිනකට අප ජලය උත්පාදනය ඝ.මී. 1,822,864 ක් වන අතර, මෙයින් ගෘහස්තව උත්පාදනය වන අප ජලයෙන් වැදගත් ප්‍රමාණයක් ඇල මාර්ග, කාණු සහ නල මාර්ග ඔස්සේ වෙරළ කලාපයට මුද හරියි.

2001 වසරේදී පරිසර අමාත්‍යාංශය පවත්වන ලද සමීක්ෂණයට අනුව මහ කොළඹ ප්‍රදේශයේ දිනකට උත්පාදනය වන ඝ. මී. 370,000 වූ අප ජලයෙන් මුහුදු නල මාර්ගය ඔස්සේ බැහැර කරනු ලබන්නේ ඝ.මී. 90,000 පමණි. ඉතිරි ඝ.මී. 280,000 අප ජලය ලෙස පරිසරයට එකතු වේ. මුහුදු නල මාර්ග ඔස්සේ මුද හරින අප ජලයේ, වැඩි කාබනික ප්‍රමාණයක්, වැඩි පෝෂක ප්‍රමාණයක්, වැනි කොලිෆෝම් ප්‍රමාණයක් පවතී.

**මහ කොළඹ ප්‍රදේශය තුළ මල අපවහන බැහැර කිරීමේ පහසුකම්**

> කොළඹ මහ නගර සභාවට අයත් වැල්ලවත්ත සහ මෝදර පිහිටි පිටාර මුව අධි ඝනත්වයෙන් යුත් පොලි එතිලින් (HDPE) නල මාර්ග යොදා ගනිමින් අප ජලය මුහුදට මුද හරී. වඩාත් විශාල ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා දිගු මුහුදු නල මාර්ග (Grift removal) ක්‍රමවේදය යොදා ගන්නා අතර වැඩි දුරටත් පිරිපහදු කිරීමේ ක්‍රියාවලිය යොදා නොගනී. වැල්ලවත්ත මුහුද තීරයෙන් පසුගිය වර්ෂ කිහිපයේදී ජලයට හා සම්බන්ධ සමේ රෝග පිළිබඳ වාර්තා වී ඇති අතර මෙය ඇතැම්විට මුහුදු නල මාර්ග මගින් මුදහැරීම්වල ප්‍රතිඵලයක් විය හැකිය. (වෙරළබඩ දූෂණය පිළිබඳ තොරතුරු එකතුව 2014).

#### 4.2.2 අවවරප්‍රසාදිත ජනාවාසවල අපද්‍රව්‍ය මුදහැරීමේ පහසුකම් නොමැතිවීම

> අධික ජනගහනයෙන් යුත් වෙරළබඩ පහත්බිම් බොහොමයක ඉතා ආසන්න (නොගැඹුරු) භූගත ජල මට්ටමක් ඇති අතර ගංවතුරින් ආපදාවට ලක්වීමේ ඉහළ අවදානමක් පවතී. මෙම ප්‍රදේශවල ප්‍රමාණවත් පල්දොරු පහසුකම් නොමැතිවීමත් අවිධිමත් සංවර්ධන කටයුතුත් ගංවතුරට භාජනය විය හැකි වෙරළබඩ පහත්බිම්වලට තවදුරටත් ක්‍රමවත් මල අපවාහන බැහැර කිරීමේ පහසුකම් නොමැතිවීම නිසා බලපෑම් තවදුරටත් තීව්‍ර වී ඇත.

කොළඹ නගරයේ මල අපවාහන බැහැර කිරීම ගැටලුව සංයුක්ත වී ඇත්තේ නාගරික දුගී ජනයා සඳහා ප්‍රමාණවත් නාගරික යටිතල පහසුකම් නොමැති වීමයි. පසුගිය ශත වර්ෂය අවසානයේ පැල්පත් ජනාවාස 1500 පමණ තිබූ අතර, ඒවා කුටුම්බයන් 66000 සමන්විත වූ අතර එම ප්‍රමාණය නාගරික ජනගහනයෙන් සියයට 51 පමණ වේ. සනීපාරක්ෂාව, ආරක්ෂිත පානීය ජලය, අප ද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් අනුව මෙම ජනාවාස සේවාවන්

ප්‍රමාණවත් අයුරින් සැපයීම නොකරන ස්ථාන වශයෙන් හඳුනාගෙන ඇත. මෙම මූලාශ්‍රයන්ගෙන් ජනිතවල දූෂණය මගින් ඇල මාර්ග සහ දිය පහරවල්වල ද්‍රාවිත ඔක්සිජන් ප්‍රමාණය අඩුවීමත් එහි ප්‍රතිඵල ලෙස (anoxic) ඇනොක්සීය පරිසර සහ ජලජ උපාංගයන්ට සහ මිනිස් සෞඛ්‍යයට අහිතකර දුර්ගන්ධයක්ද වහනය වේ.

4.2.3 **කාර්මික අපද්‍රව්‍ය**

> ආයෝජන සංවර්ධන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන අපනයන සැලසුම් කලාප 09ක් ද කර්මාන්ත උද්‍යාන තුනක්ද එක් අපනයන උද්‍යානයක්ද ඇත. මෙයින් අපනයන සැකසුම් කලාප 2ක් (කටුනායක, කොග්ගල) සහ එක් කර්මාන්ත උද්‍යානයක් (මිරිජ්ජ විල) වෙරළ ප්‍රදේශයන්හි ස්ථානගත වී ඇත. මෙයට අමතරව කර්මාන්ත අමාත්‍යංශය මගින් වෙනත් කර්මාන්ත උද්‍යාන 17 ක් කළමනාකරණය කරනු ලබන අතර ඉන් උද්‍යාන තුනක් බටඅත, රත්මලාන සහ උඩුකාව වෙරළබඩ ප්‍රදේශයේ පිහිටුවා ඇත. අනෙකුත් කර්මාන්ත 4ක් පානදුර, වැලිගම, ඒකල, හලාවත, ශාන්ත මාටින් වත්තද වෙරළබඩ ප්‍රදේශයේ පිහිටා ඇත.

කිසිදු පිරිසිදු කිරීමට ලක් නොවූ ඉතා සුළුවෙන් පිරිපහදු කරන ලද කාර්මික අපසන්දන නිරන්තරව ආසන්න වෙරළට ගලා ඒමෙන්, කාන්දු වීමෙන් හෝ වැස්සීමෙන් කලපු සහ මෝය තුළට ඇතුලු වේ. වෙරළබඩ ප්‍රදේශයන්හි ස්ථානගත වී ඇති බොහෝ කර්මාන්ත "මධ්‍යම" හෝ "පහළ" දූෂණ මට්ටමකින් යුත් කාණ්ඩයට අයත් වේ. 1994 දී ශ්‍රී ලංකාවේ වෙරළ කලාපය තුළ "මධ්‍යම" හෝ "ඉහළ'' දූෂණ විභවයකින් යුත් කර්මාන්ත 336 ක් විය. ජල දූෂණයට වඩාත් දයක වන කර්මාන්ත වනුයේ රෙදිපිළි, කඩදසි, සම් පදම් කිරීම, ලෝහ සැකසුම් සහ ඉංජිනේරු, තීන්ත, රසායන ද්‍රව්‍ය, සිමෙන්ති, ආහාර සහ බීම වර්ග සහ ස්කාගාරයන්ය. පොල් ලෙලි පල් කිරීම හා සම්බන්ධ කුඩා කර්මාන්තයන් මගින් ස්ථානීය වශයෙන් ජල දූෂණයක් ඇති කරන්නේ ඉහළ මට්ටම් ජෛව රසායන ඔක්සිජන් ඉල්ලීම් හා රසායනික ඔක්සිජන් ඉල්ලීම අගයන් ඇති කරන නිසාය.

අපද්‍රව්‍ය පිරිපහදු කිරීම සඳහා අවශ්‍ය මූලික යටිතල පහසුකම් වලින් මේ වනතෙක් බොහෝ කර්මාන්තශාලා සන්නද්ධ වී නොමැති අතර පිරිපහදු කිරීමේ පහසුකම් සඳහා වන පිරිවැය ඉහළ යාම නිසා එම පහසුකම් ඇති කර්මාන්තශාලාවලට පවා ඒවා භාවිතා කිරීමේ දුෂ්කරතාවට මුහුණදීමට සිදු වී ඇත. අපජලය මුද හැරීමට ප්‍රථම ඒවා පිරිපහදු කිරීමේ මධ්‍යම පහසුකම් ඇත්තේ බියගම සහ කටුනායක සැකසුම් කලාපවල පමණි. පිරිපහදු නොකරන ලද කර්මාන්ත අප ජලය මුද හැරීම හේතුවෙන් බොහෝ ජලයේ ගුණාත්මක බව පිළිබඳ ගැටලු පසුගිය වසර කිහිපය තුළ පැනනැගී ඇත. කර්මාන්ත අප ජලය දිගුකල් පවත්නා කාබනික දූෂණය (POP) සහ කාලය සමග නොනැසී පවත්නා බැර ලෝහ වලින් සංයුක්ත වේ. පිරිපහදු කිරීමේ ක්‍රියාවලිය සඳහා අධික පිරිවැයක් දැරීමට වන හෙයින් බොහෝ කර්මාන්තශාලා දිගුකල් පවත්නා කාබනික දූෂණ (POP) සහ බැර ලෝහ ඉවත් කිරීමට උත්සුක නොවේ. මේ පිළිබඳව බැලීමේදී සම් පදම් කිරීමේ කර්මාන්තශාලා එක් ප්‍රධාන දූෂණ මූලයක් ලෙස සැලකිය හැකිය.

වගුව 4.2 මගින් වෙරළ ප්‍රදේශවල ස්ථානගත කර්මාන්තශාලා ප්‍රමාණය සහ ඒවාට අදාළ අපජලය ප්‍රමාණයන් දක්වා ඇත. මේවාට ආයෝජන සංවර්ධන මණ්ඩලය යටතේ ස්ථාපිත කරන ලද ඒවාද ඇතුළත් ය.

වගුව 4.3 මගින් වෙරළබඩ ජලයට මුද හරින ගෘහස්ථ සහ කර්මාන්තශාලා අප ජලයේ ධරණීය මට්ටම පෙන්වා ඇත.

**වගුව 4.2: වෙරළබඩ ප්‍රදේශයන්හි පිහිටි මධ්‍යම සහ ඉහළ මට්ටමේ දූෂක සහිත කර්මාන්ත**

| කර්මාන්තයේ ස්වභාවය | වෙරළබඩ ඒකක ප්‍රමාණය | ප්‍රමාණය මුළු ඒකක | ඇස්තමේන්තු කරන ලද දූෂණ ප්‍රමාණය කි.ග්‍රෑ./ දිනකට | | |
|---|---|---|---|---|---|
| | | | BOD | COD | Total Toxic metal |
| 1. රෙදිපිළි | 41 | 7100 | 4970 | 11360 | |
| 2. ආහාර සහ බීම වර්ග | 47 | 4111 | 6166 | 12333 | |
| 3. සැකසූ පොල් | 53 | 1200 | 4200 | 7200 | |
| 4. රබර් | 229 | 4840 | 9670 | 29040 | |
| 5. සම් පදම් කිරීම | 15 | 750 | 2000 | 5200 | |
| 6. නිමි ලෝහ සැකසුම් | 76 | 6692 | -- | -- | 669 |
| 7. සායම් සහ රසායන ද්‍රව්‍ය | 33 | 928 | -- | -- | 92.8 |

(*මූලාශ්‍රය* : සමුද්‍ර දූෂණ වැළැක්වීමේ අධිකාරිය 2013)

වගුව 4.3 : ශ්‍රී ලංකාවේ සහ සමුද්‍රීය ජලය වෙත කාර්මික සහ ගෘහස්ථ අපසන්දන මුදහැරීමේ ධරණීය මට්ටම

| නිර්ණායක | ධාරණ සීමාව |
|---|---|
| මුළු අවලම්බිත ඝන ද්‍රව්‍ය ප්‍රමාණය (උපරිම) | |
| (අ) පිළියම් කරන ලද ජලය සඳහා මි./ග්‍රෑ/ලි | 150 |
| (ආ) සිසිල් කිරීම සඳහා භාවිතා කිරීමෙන් පසු බැහැර කරන ජලය සඳහා සම්පූර්ණයෙන්ම සහ 10%ක වැඩිපුර | සිසිල් කිරීමට භාවිතා කළ ජලයේ වූ අවලම්බිත ඝන ද්‍රව්‍ය ප්‍රමාණය |
| අංශ ප්‍රමාණය | |
| (අ) පාවෙන ඝන ද්‍රවය | මි. මි. 3 |
| (ආ) තැන්පත්වෙන ඝන ද්‍රව්‍ය උපරිම මයික්‍රො මීටර් | මි. මි. 850 |
| සාධක උෂ්ණත්වයේදී පී.එච්. පරාසය | 6.0-8.5 |
| ජීව රසායනික අම්ලකර ඉල්ලුම (ජීඑම්ඉ) | 100 |
| සෙ. 20 දී දින 05 ක් තුළ උපරිම මි.ග්‍රෑ/ලි | පිටකරන ස්ථානයේදී උපරිම සෙ.$45^0$ |
| තෙල් සහ ග්‍රීස් උපරිම මි.ග්‍රෑ/ලි | 20 |
| අවශේෂ ක්ලෝරීන් උපරිම මි.ග්‍රෑ/ලි | 1.0 |
| ඇමෝනියා නයිට්‍රජන් උපරිම මි.ග්‍රෑ/ලි | 50.0 |
| රසායනික අම්ලකර ඉල්ලුම උපරිම මි.ග්‍රෑ/ලි | 250 |
| ෆිනෝලික සංයෝග (ෆිනෝල් OH ලෙස) උපරිම මි.ග්‍රෑ/ලි | 5.0 |
| සයිනයිට් (CH ලෙස) උපරිම මි.ග්‍රෑ/ලි | 0.2 |
| සල්ෆයිඩ් (S) උපරිම මි.ග්‍රෑ/ලි | 5.0 |
| ෆ්ලුවෝරයිඩ් (F) උපරිම මි.ග්‍රෑ/ලි | 15 |
| ආසනික් (As) ලෙස උපරිම මි.ග්‍රෑ/ලි | 0.2 |
| කැඩ්මියම් (Cg) ලෙස මුළු ප්‍රමාණය උපරිම මි.ග්‍රෑ/ලි | 2.0 |
| ක්‍රෝමියම් (Cr) ලෙස මුළු ප්‍රමාණය උපරිම මි.ග්‍රෑ/ලි | 1.0 |
| තඹ (Cu) ලෙස මුළු ප්‍රමාණය උපරිම මි.ග්‍රෑ/ලි | 3.0 |
| ඊයම් (Pn) ලෙස මුළු ප්‍රමාණය උපරිම මි.ග්‍රෑ/ලි | 1.0 |
| රසදිය (Hg) ලෙස මුළු ප්‍රමාණය උපරිම මි.ග්‍රෑ/ලි | 0.01 |
| නිකල් (Ni) ලෙස මුළු ප්‍රමාණය උපරිම මි.ග්‍රෑ/ලි | 0 |
| සෙල්නියම් (Se) ලෙස මුළු ප්‍රමාණය උපරිම මි.ග්‍රෑ/ලි | 0.05 |
| සින්ක් (Zn) ලෙස මුළු ප්‍රමාණය උපරිම මි.ග්‍රෑ/ලි | 5.0 |
| විකිරණශීලි ද්‍රව්‍ය | |
| (අ) ඇල්ෆා විමෝචක උපරිම මයික්‍රො කියුරි මි. | $10^{-8}$ |
| (ආ) බීටා විමෝචක උපරිම මයික්‍රො කියුරි මි. | $10^{-7}$ |
| කාබනික පොස්පරස් සංයෝග උපරිම මි.ග්‍රෑ/ලි | 1.0 |
| ක්ලෝරොනිකෘත හයිඩ්‍රොකාබන (Cl) ලෙස උපරිම මි.ග්‍රෑ/ලි. | 0.02 |

(*මූලාශ්‍රය* : 595/16 - 1992.02.02 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය)

අපසන්දනවල වර්ණය සහ දුර්ගන්ධය ඉවත් කිරීමට හැකිතාක් දුරට උත්සාහ කළ යුතු ය. ඉහත කී ධරණීය අගයන් පදනම් වී ඇත්තේ අවම වශයෙන් පරිමාන 8ක පිරිසිදු ජලයෙන් අපසන්දන තනුක කිරීම අනුව ය. 8 වරක් තනුක නොකෙරුනහොත් නියම වශයෙන් තනුක කළ ප්‍රමාණය 1/8 ගුණකිරීමෙන් ධාරණ සීමාව ලැබේ. මෙම ධාරණ සීමා පනවන ලද්දේ 1980 අංක 77 දරන ජාතික පරිසර පනත සහ 1988 අංක 56 දරන සංශෝධන යටතේ 1990.02.02 දිනැති අංක 595/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද නියෝගයක් මගිනි.

### 4.2.4 සංචාරක මධ්‍යස්ථානවලින් අප ද්‍රව්‍ය මුදා හැරීම

> ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින්ගෙන් 74.4% පැමිණෙනුයේ විවේකය සහ විනෝදය සඳහාය. මෙවැනි සංචාරක කටයුතු වැඩි වශයෙන් රඳා පවතින්නේ පරිසරයේ ගුණාත්මක භාවය මත වන අතර සංචාරකයෝ ඔවුන් සැරිසරන ප්‍රදේශවල පරිසර හායනය හෝ දූෂණය ගැන ඉතා සංවේදී බවක් දක්වයි. වෙරළ කලාපය තුළ සංචාරක කර්මාන්තයේ තිරසාර භාවය රැක ගැනීම හා එයට වන අහිතකර බලපෑම් වැලැක්වීමට දූෂණය පාලනය කළ යුතු වේ.
>
> කර්මාන්තශාලා 7ක් කුඩා පරිමාණ කර්මාන්තශාලා 14 ක් සජීවම ඒවායේ අපසන්දන ලූනාව කලපුවට මුදාහරියි. මෙහි ප්‍රතිඵලයක් ලෙස එක් යුගයකදී බහුලව ධීවර සම්පත් පැවති මෙම කලපුව සම්පූර්ණයෙන් විනාශ වී මදුරුවන් බෝවෙන ජලජ පැලෑටි සහ මඩ තට්ටුවකින් වැසුන නිසල ජලාශයක් බවට පත් විය.

වර්තමාන තෙරතුරු අනුව ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති හෝටල් ප්‍රමාණයෙන් වැඩි ප්‍රතිශතයක් වෙරළබඩ කලාපයේ ස්ථානගත වී ඇත. වසර 2013 දී ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාව මසකට ආසන්න වශයෙන් 100,000 පමණ වන අතර මාසයක් තුළ උත්පාදනය කරන අප ජල ප්‍රමාණය ඝ.මී. 19000 පමණ වෙයි. මෑතකදී සංචාරක හෝටල් 276ක් ඉලක්ක කොට පවත්වන ලද සමීක්ෂණයකට අනුව විශාල පරිමාණයේ හෝටල් සංඛ්‍යාවෙන් 92% පමණ විධිමත් අප ජලය පිරිපහදු කිරීමේ ඒකක ඇති අතර කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ ඒවායින් 17% පමණක් එවැනි ඒකක ඇත. කෙසේ වුවත් සංචාරක කර්මාන්තයේ වේගවත් වර්ධනයේ ආරම්භය සමඟ පාලනයකින් තොරව වූ සංචාරක කර්මාන්තයේ පුළුල්වීමේ අහිතකර ප්‍රතිඵල දැනෙනවිට පොකුරු වශයෙන් ආපනශාලා නවාතැන් සහ ප්‍රධාන සංචාරක මධ්‍යස්ථාන තිබෙන ස්ථානවලින් ඉස්මතු විය. පිරිපහදු නොකරන ලද මල අපවාහන ද, මුළුතැන් ගෙවල් වලින්ද, රෙදි සේදීමේන්ද, අපවිත්‍ර ජලය රොන්මඩ සහ ප්ලාස්ටික් ඇතුළු ඝන අපද්‍රව්‍ය ද වෙරළාසන්න ජලයට මුහුවෙයි. මේ මගින් නැගෙනහිර, දකුණු දිග සහ නිරිතදිග වෙරළ තීරයේ බොහෝ ප්‍රධාන සංචාරක මධ්‍යසථානයන්හි දූෂණය මේ වනවිට පැහැදිලිව දැකිය හැක. උණවටුව, හික්කඩුව සහ බේරුවල ප්‍රදේශයන්හි සංචාරක කර්මාන්තයේ ව්‍යාප්තිය හේතුකොටගෙන ජලයේ ගුණාත්මකභාවය හායනය වීම මෙන්ම වෙරළාසන්න ජලයේ සහ වෙරළ තීරයන්හි ද්‍රව්‍ය දූෂණයකට තුඩු දී ඇත. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තු මගින් දැනට දියත් කොට ඇති සුපරීක්ෂණ අධ්‍යයනයන්ට අනුව සංචාරක මධ්‍යස්ථාන ආශ්‍රිත වෙරළාසන්න ජලයේ ගුණාත්මකභාවය අප ජලය මුදා හැරීම හේතුකොට සැලකිය යුතු මට්ටමින් හායනය වන බව පෙනීගොස් ඇත. රොන්මඩ පිළිබඳ ගැටළුව විශේෂයෙන් විශාල සංචාරක හෝටල් හා සම්බන්ධිත ගැටලුවක් බව හඳුනාගෙන ඇත. මල ද්‍රව්‍ය ආශ්‍රිත ගැටලු නිසා සංචාරක ස්ථාන හා සම්බන්ධ අනවසර ජනාවාස සැලකිල්ලට ගතයුතු වන්නේ එමගින් ජල ආශ්‍රිත විනෝදාත්මක කටයුතුවලට විශාල තර්ජනයක් වන බැවිනි.

### 4.2.5 බලශක්ති නිෂ්පාදන අංශය මගින් සිදුවන දූෂණය

ශ්‍රී ලංකාවේ බලශක්ති අවශ්‍යතාවන් විවිධ වර්ගයේ ප්‍රභවයන් හයකින් සපුරාලයි. වර්තමානයේ තාප බලාගාර මගින් මුළු විදුලිබල අවශ්‍යතාවන්ගෙන් 50.3% දයකවන අතර එය අතීතයේදී ප්‍රධාන තැනක් ගත් ජල විදුලි බලශක්ති ප්‍රමාණය ඉක්මවා යයි. (මෙගාවොට් 3368.0 මුළු ස්ථාපිත ධාරිතාවෙන් 40.3%) තාප බලාගාර ප්‍රධාන වශයෙන් පිහිටා ඇත්තේ වෙරළබඩ ප්‍රදේශ ආශ්‍රිතවය. මෙම බලාගාර කෙරවලපිටිය, නොරොච්චෝළි සහ පුත්තලමේ ස්ථානගතකොට ඇති අතර කෙරවලපිටිය සහ පුත්තලම බලාගාරයන් බලශක්ති මූල්‍ය ලෙස ද්‍රව් තෙල් භාවිතා කරන අතර නොරොච්චෝලේ බලාගාරය ගල් අඟුරු භාවිතා කරනු ලබයි. ස්ථාපිත මුළු ධාරිතාවෙන් වැඩි ප්‍රතිශතයක් ජලවිදුලියට දයක වුවද වාර්ෂික විදුලි නිෂ්පාදනයට එහි දයකත්වය සීඝ්‍රව පහත බසිමින් පවතී. වර්තමානයේ විදුලි ඉල්ලුම් සහ ජලවිදුලි නිමැවුම් අතර පරාසය පුරවනු ලබන්නේ ගල් අඟුරු, තෙල් සහ ගෑස් මගින් බලශක්ති නිපදවීමෙනි. මෙම බලාගාර වෙරළබඩ ප්‍රදේශයන්හි පිහිටුවීමෙන් වෙරළබඩ ජලය තාප දූෂණයන්ට ලක්විය හැක. තාප බලාගාර මගින් වෙරළබඩ ජලයේ ගුණාත්මකභාවයට බලපාන තර්ජනය වන්නේ එමගින් නිකුත් කරන උණු ජලය සහ ලවන ඉවත් කරන ලද ජලයයි.

### 4.2.6 ධීවර අංශය මගින් වන දූෂණය

ධීවර අංශයෙන් වන දූෂණය වෙරළ කලාපයේ ස්ථානගත වී ඇති ධීවර නැංගුරම් තොටුපොල 72 සහ ධීවර වරාය 20ක් වෙරළබඩ ජල දූෂණයට දයක වනුයේ අවිධිමත් ලෙස දූවිතෙල් සහ යාත්‍රා පතුලේ පල් වූ ජලය වරායන්ට මුද හැරීමෙනි. මෙයට අමතරව මත්ස්‍ය සැපයීමේදී විශාල කාබනික අපද්‍රව්‍ය ප්‍රමාණයක් සහ මත්ස්‍ය ඝන අපද්‍රව්‍ය මුදහැරීමෙන් වෙරළබඩ ජලයේ COD මට්ටම ඉහළ යාමද සිදු වේ. දූවී තෙල් එක්රැස් කිරීමේ පහසුකම් ධීවර වරාය නීතිගත සංස්ථාව මගින් සැපයූවද දූවිතෙල් වරායන්ට මුදහැරීම අඛණ්ඩව සිදුවීමෙන් පාරිසරික තර්ජනයක් ඇතිකොට ඇත.

### 4.2.7 සනීපාරක්ෂාවට සුදුසු නොවන අයුරින් ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම

ගෘහස්ථ, ආයතන, වෙළඳපොල, වෛද්‍ය, වානිජ කාර්මික ආදී ප්‍රභව වලින්ද මහා මාර්ග සහ ගෙවතු වලින්ද බැහැර කරන අපද්‍රව්‍ය ආදියද, ද්‍රව නොවන කැලි කසල වලින්ද ඝන අපද්‍රව්‍ය සමන්විත වේ. ආහාර ශාක කොටස්, කඩදාසි, කාඩ්බෝඩ්, රබර් සම් සහ ඉවත දමන ඇඳුම් ආදිය ඇතුළත් කාබනික අපද්‍රව්‍ය වලින්ද, ලෝහ, ප්ලාස්ටික් හෝ විදුරු වලින් තැනූ ඇසුරුම්, ඇඟළුම් කම්මල් වලින් ඉවත්කරන රෙදි කැබලිද ඝන අපද්‍රව්‍ය ගණයට වැටේ.

ඝණ අපද්‍රව්‍ය වෙරළබඩ දූෂණයේ ප්‍රධාන මූලාශ්‍රයකි. පසුගිය දශක කිහිපය තුළ ඝන අපද්‍රව්‍ය හා සම්බන්ධිත සෞඛ්‍ය සහ පාරිසරික ගැටළු ශ්‍රී ලංකාව තුළ වර්ධනය වෙමින් පවතින අතර ඉදිරියේදී ද එය ගැටලුවක් ලෙස පවතිනු ඇත. දිනකට දිවයින පුරා ඇති පළාත් පාලන ආයතන මගින් එකරැස් කරනු ලබන ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය දිනකට ටොන් 2694 ක් යැයි ඇස්තමේන්තු කොට ඇති නමුත් මෙම ගැටලු අවශ්‍යයෙන්ම නාගරික පෙදෙස් හට වන අතර ඉන් ප්‍රධාන කොටසක් බස්නාහිර පළාතින් උත්පාදනය වේ. මධ්‍යම පරිසර අධිකාරිය මගින් කරන ලද සමීක්ෂණයට අනුව ප්‍රධාන බැහැර කිරීමේ ස්ථාන 46ක් හඳුනාගෙන ඇත. මෙම මුළු ප්‍රමාණයෙන් සියයට 80කට වැඩි ප්‍රමාණයක් පිහිටා ඇත්තේ උතුරු සහ නැගෙනහිර පලාත්වලය. මෙම බැහැර කිරීමේ ස්ථානවලින් සියයට 90ක්ම නියමිත පාරිසරික අනුමැතින් රහිතව පවත්වාගෙන යයි. බොහෝ ඝන අපද්‍රව්‍ය බැහැර කරන ස්ථාන විවෘත ප්‍රදේශ වන අතර සියයට 4ක් මුඩුබිම් භාවිතා කරනු ලබන අතර අනෙකුත් ස්ථාන වෙරළ කලාපයට සෘජුව හෝ වක්‍රව සම්බන්ධ වගුරු බිම් හෝ තෙත් බිම්වල ස්ථාන ගතවී ඇත. වෙරළබඩ අනවසර ජනාවාස සහ සංචාරක මධ්‍යස්ථානයන්ට ආසන්නව ඇති වෙරළ තීරයන්හි කැලිකසළ ගොඩගසා තිබීමේ සහ අවිධිමත් ලෙස ඝන අපද්‍රව්‍ය වෙරළ ප්‍රදේශයන්හි මුද හැරීම ගැටලුවක්ව පවතී. වෙරළ තීරයන්හි ඝන අපද්‍රව්‍ය ඒකරාශිවීම හේතුකොට ජලයේ ගුණාත්මක බව පිරිහීමක් පාවෙන ද්‍රව්‍ය දිස්වීමක් සිදුවේ.

බොහෝ පළාත්පාලන ආයතන මුහුණ දෙනු ලබන බැරෑරුම් ප්‍රශ්නයක් වනුයේ පාරිසරික වශයෙන් ආරක්ෂිත ප්‍රමාණවත් සුදුසු හිස් බිම් හිඟවීම හේතුකොට ආරක්ෂිත ලෙස ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමට පහසුකම් නොමැති වීමයි.

වගුව 4.4 මගින් වෙරළබඩ දිස්ත්‍රික්කයන්හි මහනගර සහා ප්‍රදේශයන්හි ඝන අපද්‍රව්‍ය දෛනිකව එක්රැස් කරන ප්‍රමාණය

**වගුව 4.4: වෙරළබඩ දිස්ත්‍රික්කයන්හි එක්රැස් කරනු ලබන ඝන අප ද්‍රව්‍ය ප්‍රමාණය**

| *දිස්ත්‍රික්කය* | *දිනකට එක්රැස් කරන දෑ බර - ටොන්* | *දිස්ත්‍රික් ප්‍රතිශතය* |
|---|---|---|
| පුත්තලම | 97 | 3.4 |
| ගම්පහ | 313 | 11.0 |
| කොළඹ | 1,257 | 44.3 |
| කළුතර | 93 | 3.2 |
| ගාල්ල | 103 | 3.6 |
| මාතර | 68 | 2.4 |
| හම්බන්තොට | 28 | 1.0 |

| *දිස්ත්‍රික්කය* | *දිනකට එක්රැස් කරන දෑ බර - ටොන්* | *දිස්ත්‍රික් ප්‍රතිශතය* |
|---|---|---|
| අම්පාර | 57 | 2.0 |
| මඩකලපුව | 119 | 4.2 |
| ත්‍රිකුණාමලය | 56 | 2.0 |
| මුලතිව් | 09 | 0.3 |
| කිලිනොච්චිය | 01 | 0.0 |
| යාපනය | 71 | 2.5 |

*මූලාශ්‍රය* : නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ දත්ත පද්ධතිය, මධ්‍යම පරිසර අධිකාරිය 2005.

**4.2.8 ජලජීවී වගා අංශයෙන් සහ කෘෂිකාර්මික කටයුතුවලින් සිදුවන දූෂණය**

**කෘෂිකර්මය**

වර්තමාන තොරතුරු අනුව පෙනීයන්නේ රසායනික කෘමිනාශක, පලිබෝධ නාශක සහ දිලීර නාශක කෘෂිකාර්මික කටයුතු සඳහා විශාල ප්‍රමාණයක් යොදාගන්නා අතර (ප්‍රස්ථිතික) ඇතැම් ඒවා දිගුකල් නොනැසී පවත්නා ඒවාය. ක්ෂීරණයේදී දූපත අවශෝෂණය කර ගන්නා බැවින් මෙම ද්‍රව්‍ය මගින් පස හායනයට ලක් කරන අතර භූගත ජලයද දූෂණයට ලක් කෙරේ. දූෂණය වූ භූගත ජලය කෘෂිකටයුතු සඳහා යොදා ගැනීමෙන් සහ කෘෂිකාර්මික ඉඩම්වල මතුපිට ජලවහනය හේතුකොට වෙරළබඩ මතුපිට ජලය දූෂණයට ලක්වෙයි. වර්තමාන ඇස්තමේන්තු අනුව යූරියා මෙට්‍රික් ටොන් 3986888.8 (Mt) පොටෑෂ් මෙ.ටො. 144776 (Mt) MOP (Muriate Potash) සහ ට්‍රිපල් සුපර් පොස්පේට් TSP මෙ.ටො. 1,09,708 ක් 2012 වසරේදී කෘෂිකාර්මික කටයුතු සඳහා රට තුළට ආනයනය කොට ඇත. රට තුළ පවත්නා ගංගා පද්ධතිය මගින් කෘෂිඅංශයෙන් ජනිත වන බොහෝ දූෂණ වෙරළබඩ ප්‍රදේශයන් වෙත පැමිණේ. මේ සම්බන්ධව බැලූවිට වඩාත් විශාල ප්‍රමාණයක පොහොර සහ වල්නාශක සහිත මතුපිට ජලවහනය තේ වතු ආශ්‍රිත ප්‍රදේශවල සිට වෙරළ ප්‍රදේශ වෙත ගෙන එනු ලබන විශාලතම ප්‍රවාහකයා කැලණි ගඟ බවට හඳුනාගෙන ඇත. මහවැලි H කලාපයෙන් ජනිත වන කෘෂි රසායන හේතුකොට මහවැලි ගඟේ මෝය දූෂණය වී ඇති බවද වාර්තා වී ඇත.

> හරිත විප්ලවයේ එක් අනර්ථකාරී බලපෑමක් වනුයේ විවිධ වසංගත හා රෝගයන්ට පහසුවෙන් ගොදුරු වියහැකි සහ ඉහළ, පෝෂණ අවශ්‍යතා සහිත ඉහළ ඵලදාවක් ලබාදෙන කෘෂිකර්මාන්තයේ දී කෘෂිරසායනික වැඩියෙන් භාවිතා කිරීමේ ප්‍රවණතාවයයි.
>
> මේ අනුව කෘත්‍රිම පොහොර ආනයනය සහ භාවිතය ශ්‍රී ලංකාව තුළ ඉහළ මට්ටමකින් වැඩි විය. 2012 දත්තයන්ට අනුව යූරියා මෙ.ටො. 396, MOP මෙ.ටො.144776 සහ STP මෙ.ටො. 109708 කෘෂිකටයුතු සඳහා ආනයනය කොට ඇත. මෙම දත්තයන් මගින් කෘෂිරසායනික පොහොර භාවිතයේ ප්‍රමාණය මෙන්ම වෙරළබඩ ජලය දූෂණයවීමේ තත්ත්වය විදහා පායි.

**ජලජීවී වගාව**

> ඕලන්ද ඇළ වෙත ගලා එන මුළු අවලම්බිත අපද්‍රව්‍ය ප්‍රමාණය අධික වන අතර (200-600 mg 1ලී.) මෙම දූෂණ මගින් ඇල මාර්ග අපසන්දන තැන්පත්මක් සිදුවීමත්, බොර ස්වභාවය ඉහළ යාමද සිදු වේ. මෙම ජලයේ අධික ඇමෝනියා සහ සල්ෆයිඩ් මට්ටම ඇති වීමට ඉස්සන් ගොවිපලවල්වලින් බැහැර කරන අපද්‍රව්‍ය දයක වී ඇත.

අවිධිමත් අන්දමින් සංවර්ධනය වූ ජලජීවී වගාවට අයත් ඉස්සන් පොකුණුවලින් මුදහරින අපද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් වයඹ පළාතේ වෙරළබඩ දූෂණයට දයක වී ඇත. මේ නිසා ඕලන්ද ඇළ සහ අවට වෙරළබඩ ප්‍රදේශ සැලකියයුතු ප්‍රමාණයකින් දූෂණය වී ඇත. ඕලන්ද ඇළට අපද්‍රව්‍ය මුදහැරීම නිසා ලෙඩ රෝග බෝවීම හා පැතිරීම සිදු වූ අතර මේ නිසා ඉස්සන් වගාව වයඹ පලාතේ කඩා වැටීමට ලක්විය. වෙරළබඩ ජලය වෙත අධික මට්ටමින් නයිට්‍රේට් සහ පොස්ෆේට් ඉස්සන් ගොවිපලවලින් මුදහැරීම නිසා මෙම පළාතේ ජල මාර්ගවල සුපෝෂණය සිදු වී ඇති අතර භූගත ජලය ද දූෂණය වී ඇත. ඕලන්ද ඇළෙහි දූෂණ මට්ටම මුලිනුපුටා දැමීමේ වැදගත්කම සැලකිල්ලට ගනිමින් රජය රුපියල් මිලියන 1300 පුනරුත්ථාපන කටයුතු සඳහා වැය කොට ඇත. වගුව 4.5 මගින් පොකුණුවල අවසන් අස්වැන්න නෙලන අවස්ථාවේ ජලයේ ගුණාත්මක තත්ත්වය පෙන්වා ඇත.

වගුව 4.5: ජලජීවී පොකුණුවල අවසන් අස්වැන්න නෙලන අවස්ථාවේ ගොවිපොල අපවහනයන්හි ජලයේ ගුණාත්මකභාවය

| පරාමිතිය | කුඩා ගොවිපල | මධ්‍යම ප්‍රමාණයේ ගොවිපල |
|---|---|---|
| ලවනතාවය | 07-45 | 18-43 |
| PH පරාසය | 8.1-9.6 | 7.9-9.5 |
| මුළු ඇමෝනියා (ppm) | 0.628->3.5 | 0.52->3.5 |
| නයිට්‍රේට් (ppm) | 2.6-5.2 | 2.5-4.8 |
| පොස්ෆේට් (ppm) | 2.9-3.3 | 2.5-3.6 |
| සල්ෆයිඩ් (ppm) | 5.6-7.2 | 4.4-6.8 |
| ද්‍රාව්‍ය ඔක්සිජන් (ppm) | 1.6-2.6 | 1.8-2.4 |
| මුළු අවලම්බිත ඝන ද්‍රව්‍ය ප්‍රමාණය (ppm) | 522-1380 | 469-1240 |

#### 4.2.9 තෙල් ඉහිරුම්, අනෙකුත් මුදු හැරීම්වලින් සිදුවන දූෂණය

දිවයින වටා ප්‍රධාන වානිජ වරායන් 7ක් ස්ථාපන වී ඇති අතර අහඹු ලෙස නිකුත්වන තෙල් මගින් වෙරළබඩ ජලය දූෂණයට ලක්වෙයි. දූවිතෙල් එක්රැස් කිරීමට දැනට පවත්තා පහසුකම් අඩුවීම ද, නැව් වලින් පිටකරන ජලය මගින් ද වරායවල ජලය දූෂණය වේ. එවැනි පහසුකම් මෙන්ම දූෂණ තුරන් කිරීමේ සැලසුම් දූෂණයෙන් තොර වරායන් සඳහා වැදගත් අවශ්‍යතාවක් වේ.

ශ්‍රී ලංකාව වටා වානිජ වරායන් 7ක් පවතින අතර තෙල් දූෂණය හඳුනාගන්නා ලද අහඹු දූෂණයකි. විශාල තෙල් ටැංකි සහිත නැව්වලින් බැහැර කරන දූවිතෙල් නැව්වල තුලන සඳහා යොදා ගන්නා ජලය හා තෙල් ටැංකි පවිත්‍ර කිරීමට භාවිතා කරන ජලය පිටකිරීම, වරායන්හි නැව් සහ බෝට්ටු පිළිසකර කිරීම සහ නඩත්තු කිරීම මගින් සුළු ප්‍රමාණයක් තෙල් පිටකිරීම් හේතුකොට තෙල් දහරාවන් හටගනී.

කොළඹ සහ ගාල්ල වරායන්හි ජලයේ ගුණාත්මකභාවය පිළිබඳ කරන ලද අධ්‍යයනයන් කිහිපයකට අනුව පරිසර සංරක්ෂණය සඳහා යෝජිත ප්‍රමිතීන්ට අදාළ වටිනාකම්වලට වඩා BOD, COD, N සහ අසූචි මට්ටම ඉහළ බව පෙනී ගොස් ඇත. (Information Compendium 2014)

සුළු තෙල් පිටාර ගැලීම් මගින් විශාල බලපෑමක් සිදු නොවුවත් එමගින් වෙරළබඩ දර්ශනීය බවට සහ විනෝදාත්මක කටයුතුවලට අවහිරවන දෘෂ්‍ය දූෂණයක් ඇතිවිය හැක. ශ්‍රී ලංකාව තුළ මධ්‍යම ප්‍රමාණයේ තෙල් පිටාර ගැලීම් සිද්ධීන් 4ක් වාර්තා වී ඇති අතර මේ මගින් තාර බෝල වශයෙන් වෙරළ වෙත ළඟා වී ඇත. මෙම තත්ත්වයන් වෙරළබඩ පරිසර පද්ධතීන්ට සහ ජීවීන්ට අවදානමක් ගෙන දෙන බැවින් තෙල් පිටාර ගැලීම් මගින් වන බලපෑම් අවම කිරීමේ සැලසුම් සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. සේවා ස්ථානවලින් පිට කරනු ලබන තෙල්ද අවසානයේ ළඟා වනුයේ වෙරළබඩ ප්‍රදේශ වෙතය. මේ මගින් තෙල් රඳවා ගැනීමේ ක්‍රමෝපායන් සේවා ස්ථානයන්ට අවශ්‍ය බව පෙන්වා දෙයි. මෙවැනි උපකරණ බොහෝවිට දැනට හිඟ අතර තිබෙන උපකරණ ක්‍රියා විරහිත තත්ත්වයේ පවතී. බඩු පැටවීම සහ ගොඩබෑම සඳහා වන නැව්වලින් දූවි තෙල් ඉවත් කිරීම සඳහා විශේෂ වැඩ පිළිවෙලක් කොළඹ වරායේ යොදා ඇත.

නැව්වලින් සෘජුව බව්සර් රථ වෙත තෙල් පොම්ප කිරීමේදී පිටවෙන දූවි තෙල් එකතු කිරීමට සමාගම් 36ක් සමුද්‍ර පරිසර දූෂණ වැලැක්වීමේ අධිකාරිය (MEPA) ලියාපදිංචි වී ඇත. වගුව 4.6 මගින් පසුගිය වසර 05 තුළ කොළඹ වරායෙන් අදාළ සමාගම් මගින් එක්රැස් කරන ලද හෝ ඉවත් කරන ලද අපත තෙල් ප්‍රමාණය දක්වා ඇත.

**වගුව 4.6: එකතු කරන්නන් විසින් කොළඹ වරායෙන් එකතු කොට ඉවත් කළ දූවි තෙල්**

| වර්ෂය | ප්‍රමාණය |
|---|---|
| 2008 | 5,092 |
| 2010 | 17,000 |
| 2011 | 18,988 |
| 2012 | 19,422 |
| 2013 | 22,632 |

*මූලාශ්‍රය* : සමුද්‍ර පරිසර දූෂණ වැලැක්වීමේ අධිකාරිය - 2013

**4.2.10 බලශක්ති, සංචාරක, සමුද්‍රීය මධ්‍යස්ථාන සංවර්ධනය තුළින් විය හැකි දූෂණ**

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව ප්‍රධාන ආර්ථික කේන්ද්‍ර තුනක් වන බලශක්ති, නාවික සහ සංචාරක කේන්ද්‍රයන් ස්ථානගත වී ඇත්තේ වෙරළබඩ ප්‍රදේශයන් මූලික කොට ගෙනය. වර්තමාන පුරෝකථනයන් අනුව දැනට පවත්නා සංචාරක වාර්ෂික පැමිණීම 654,000 සිට මිලියන 2.5 දක්වා 2016 වන විට වැඩිවන අතර දැනට පවතින කාමර ප්‍රමාණය 22745 සිට 45000 දක්වා 2016 දී වැඩිවනු ඇත. මේ මගින් සංචාරක කේන්ද්‍රය සංවර්ධනයට අපේක්ෂා කෙරේ. නාවික කේන්ද්‍රය සංවර්ධනයේදී මූලික වශයෙන් අවධානය යොමු කොට ඇත්තේ වානිජ වරායන් මහා පරිමාණයෙන් සංවර්ධනය කිරීමයි. මෙහිදී කොළඹ, ගාල්ල, හම්බන්තොට සහ ත්‍රිකුණාමලය සංවර්ධනය කරනු ඇත. මෙම සංවර්ධන කටයුතු මගින් විය හැකි දූෂණය නොතකා සිටිය නොහැක. මේ නිසා විධිමත් දූෂණ අවම කිරීමේ පිළියම් සැලසුම් මගින් විය හැකි දූෂණය නොතකා සිටිය නොහැක. මේ නිසා විධිමත් දූෂණ අවම කිරීමේ පිළියම් සැලසුම් මූලික අවස්ථාවේදීම අනුගමනය කළ යුතු අතර එම පිළියම් පිළිබඳව පුළුල් ලෙස අවධානය යොමු කලයුතුය.

**4.2.11 තෝරා ගන්නා ලද වෙරළ බාණ්ඩ කිහිපයක වෙරළබඩ ජලයේ වර්තමාන ගුණාත්මක තත්ත්වය**

වෙරළඩබ ජලයේ ගුණාත්මක පරාමිතීන් පිළිබඳව අඛණ්ඩ සහ භූගෝලීය වශයෙන් විශේෂිත තොරතුරු නොතිබුණද 2014 දී වෙරළ සංරක්ෂණ සහ වෙරළ කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් බලය පවරන ලදුව ලංකා හයිඩ්‍රොලික් ආයතනය විසින් මූලාශ්‍රයන්ගෙන් රැස් කළ දත්ත භාවිතා කරමින් නොරොච්චෝලෙයි සිට නිලාවැලි දක්වා නියැදි ස්ථාන 25 ක ජලයේ ගුණාත්මකභාවයේ තත්ත්වය නිශ්චය කිරීම සඳහා ප්‍රයත්නයක් දරන ලදී.

**වගුව 4.7 : නියැදි ස්ථාන පිළිබඳ විස්තර**

| *පිහිටීම* | *විස්තරය* |
|---|---|
| නොරොච්චෝල | තාප බලාගාරය ආසන්නයේ |
| හලාවත වෙරළ | ප්‍රසිද්ධ නාන ස්ථානය |
| අඹකඳවිල | ඉස්සන් අභිජනන ස්ථාන සඳහා ජලය ලාබ ගැනීම |
| මාරවිල | නාන ස්ථාන, සංචාරක, ඉස්සන් අභිජනන |
| මීගමුව වෙරළ | නාන ස්ථාන, සංචාරක |
| කැළණි ගඟ මෝය | ගඟ මුහුදට වැටෙන ස්ථානය |
| මෝදර | පල්දෙරු නළය බැහැර කරන ස්ථානය |
| කොළඹ | වානිජ වරාය |
| වැල්ලවත්ත | පල්දොරු නළය බැහැර කරන ස්ථානය |
| ගල්කිස්ස | සංචාරක කටයුතු, නාන ස්ථානය |
| වාද්දුව | නාන ස්ථානය, සංචාරක කටයුතු |

| *පිහිටීම* | *විස්තරය* |
|---|---|
| කළුතර - මොරගල්ල | නාන ස්ථානය, සංචාරක කටයුතු |
| බේරුවල | නාන ස්ථානය, සංචාරක කටයුතු |
| බෙන්තොට | නාන ස්ථානය, සංචාරක කටයුතු |
| හික්කඩුව | නාන ස්ථානය, සංචාරක කටයුතු |
| ගාල්ල | වානිජ වරාය |
| උණවටුන | නාන ස්ථානය, සංචාරක කටයුතු |
| කොග්ගල | සංචාරක, කර්මාන්ත |
| වැලිගම | සංචාරක, ධීවර කටයුතු |
| පොල්හේන | සංචාරක, නාන ස්ථාන |
| බට-අත | කර්මාන්ත |
| තංගල්ල | නාන ස්ථානය, සංචාරක කටයුතු |
| මිරිජ්ජවිල | සංචාරක, කර්මාන්ත |
| ආරුගම් බොක්ක | නාන ස්ථානය, සංචාරක කටයුතු |
| නිලාවේලි | නාන ස්ථානය, සංචාරක කටයුතු |

අධ්‍යයනයේ දත්ත විශ්ලේෂණ ක්‍රියාවලියේදී පර්යේෂණ කණ්ඩායම විසින් PH, DO, BOD, COD, TN, TC සහ FC මෙන්ම තෙල් යන පරාමිතීන් විශ්ලේෂණය සඳහා අවධානය යොමු කරන ලදී. ඒ අනුව 7.8 සහ 8.4 PH මට්ටමක් පෙන්නුම් කරමින් නියැදි ස්ථානයන්හි PH අගය ස්වභාවික වෙරළබඩ ජලයේ ගුණාත්මක තත්ත්වයේ පැවතුණි. කොළඹ හැර අනෙකුත් නියැදි ස්ථානයන්හි DO අගය ප්‍රමිතියට වඩා පහළ මට්ටමක හායනයක් පෙන්නුම් නොකරයි. BOD මට්ටම හා සැලකීමේදී විශ්ලේෂණය මගින් පෙනී යන්නේ මෝදර, වැල්ලවත්ත සහ ගාල්ල යන නියැදී ස්ථාන පාරිභෝජනය සඳහා නොවන ප්‍රමිතීන්ට අනුකූල අතර අනෙකුත් සියලු නියැදි ස්ථාන දියනෑම සඳහාත් පරිභෝජනය සඳහා නොවන භාවිත සඳහාත් වූ ප්‍රමිතීන් දෙකටම අනුකූල නොවේ. මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රමිතීන් අනුව දියනෑම සඳහා නිර්දේශිත COD මට්ටම මි.ග්‍රෑ 1ට 20ට වඩා අඩුවිය යුතුය. කෙසේ වුවත් මෝදර සහ කැලණි මුවදොර මධ්‍යම පරිසර අධිකාරියේ නෑම සඳහා වූ ප්‍රමිතීන් සමග ගැළපෙන අතර COD මට්ටම අනෙකුත් සියලු නියැදි ස්ථානයන්හි නොගැළපේ. මධ්‍යම පරිසර අධිකාරිය මගින් ප්‍රමිතියක් සඳහන් නොකළද, පිළිගත් මට්ටම වූයේ ලීටරයට මි.ග්‍රෑ. 2 සිට 6 දක්වා පමණි. විශ්ලේෂණයන් අනුව කැලණි ගඟ මෝය, මෝදර, කොළඹ සහ වැල්ලවත්ත යන නියැදි ස්ථාන සම්බන්ධයෙන් TN අගය පිළි ගත හැකි පරාසයක නොවීය. මෙයට හේතුව විය හැකි පිරිපහදු නොකළ මළ අපවහනය මුදාහැරීම සහ පොහොර සමග මිශ්‍ර වීම විය හැක. මධ්‍යම පරිසර අධිකාරියේ දියනෑම සඳහා වූ ප්‍රමිතීන් අනුව TC අගය100 MPN/100m/- අතර පරිභෝජනය නොවන භාවිත සඳහා වූ අගය 2000 MPN/100m/- විය යුතුය. සියලුම නියැදි ස්ථානයන්හි TC ඒකරාසි අගය පාරිභෝජනය සඳහා නොවන භාවිතා සඳහා වූ ප්‍රමිතීන් සඳහා අගය තුළ තිබෙන බව විශ්ලේෂණයෙන් පෙනී ගොස් ඇත. කෙසේවුවත් ගල්කිස්ස, කළුතර, උණවටුන, බෙන්තොට සහ පොල්හේන වැනි ප්‍රසිද්ධ නාන ස්ථාන ජලය සමග සෘජු සබඳතා කාර්යයන් සඳහා ආරක්ෂා නොවන බව පෙනී යයි. ෆීකල් කොලිෆෝම් (FC) සම්බන්ධයෙන් විමසා බැලූවිට දියනෑම සඳහා තිබිය යුතු ප්‍රමිතිය වනුයේ මිලි ලීටර් 100කට MPN 50 අඩු තත්ත්වයක් සහ පාරිභෝජනය නොවන භාවිත සඳහා මි.ලී. 100ට MPN 600 වඩා අඩුවිය යුතුය. විශ්ලේෂණය පෙන්වා දෙන ආකාරයට බේරුවල, මිරිජ්ජවිල සහ ගාල්ල යන නියැදි ස්ථාන හැර අනෙකුත් සියලුම ස්ථානයන්හි FC සංකේන්ද්‍ර වූ ප්‍රමාණය නෑම සඳහා වූ දෘශ්‍ය ප්‍රමිතියට වඩා ඉහළ අගයක් ගනී. තවද නොරොච්චෝල, හලාවත, මෝදර, වාද්දුව, බෙන්තොට, කොග්ගල, උණවටුන සහ වැලිගම යන නියැදි ස්ථානයන්හි FC අගය පාරිභෝජනය සඳහා නොවන භාවිතා සඳහා වූ ප්‍රමිතීන් සැහීමකට පත්කරනු ලබයි. සියලු නියැදි ස්ථානයන්හි තෙල් සහ ග්‍රීස් ප්‍රමාණයන් මෝසම් කාලයේ දී වැඩි සංකේන්ද්‍රණයක් පෙන්වයි. කෙසේවුවත් එම ප්‍රමාණය ලීටරයට මි.ග්‍රෑ. 200 අඩු විය යුතුය.

### 4.3 සැලසුම්, ප්‍රතිපත්ති සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපායන්

වෙරළබඩ දූෂණය වෙරළ කලාපය තුළ ඉතා වැදගත් පාරිසරික ගැටලුවක් වුවද, එම ගැටලු 1990 වෙරළ කලාප කළමනාකරණ සැලැස්ම මගින් ඒ පිළිබඳව අවධානය යොමුකොට නොතිබුණි. කෙසේවුවත් එහි වැදගත්කම හා ප්‍රමුඛතාව සැලකිල්ලට ගෙන 1997 සහ 2004 වෙරළ කලාප සංශෝධිත කළමනාකරණ සැලසුම්වලට ඇතුළත් කරන ලදී. වෙරළ

කලාප කළමනාකරණ සැලසුම් වලින් හඳුන්වා දෙන ලද ප්‍රතිපත්ති, ක්‍රමෝපායන් සහ ක්‍රියාකාරකම්වලට අමතරව වෙරළබඩ දූෂණය හා සම්බන්ධ බොහෝ ප්‍රතිපත්ති, නීති සහ වැඩසටහන් තිබුණි. උදාහරණ වශයෙන් ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘතීන් වෙරළ කලාපය තුළ ආරම්භ කිරීමේදී (මසුන් ඇල්ලීම හැර) පාරිසරික ඇගයීම් තක්සේරු වාර්තා පටිපාටියට යටත් විය. මෙම ව්‍යාපෘති 1988 අංක 56 දරන ජාතික පාරිසරික පනත යටතේ ලැයිස්තු ගත කරන ලද නම් කරන ලද ව්‍යාපෘති වලට ඇතුළත් වූ අතර වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතනය ලෙස මේ යටතේ ක්‍රියා කරයි.

වෙරළබඩ ජලය හා සම්බන්ධ කර්මාන්ත දූෂණය යටතේ පනවා ඇති වැදගත් නියාමන මෙවලම් වූයේ පාරිසරික බලපෑම තක්සේරු වාර්තා සහ පරිසර ආරක්ෂණ බලපත්‍ර ක්‍රියාවලියයි. ඉහතින් සඳහන් කරන ලද පරිසර ආකර්ෂණ බලපත්‍ර 2000 නොවැම්බර් 22 දිනැති අංක 1157/22 අති විශේෂ ගැසට් නිවේදනය අනුව නම් කරන ලද කාර්යයන් සඳහා අත්‍යාවශ්‍යය නියෝගයකි. පරිසර ආරක්ෂණ බලපත්‍රය මධ්‍යම පරිසර අධිකාරය, ආයෝජන මණ්ඩල සහ පළාත් පාලන ආයතන වලින් ලබාගත හැකි අතර එහි වසර 3ක කාලයකට වලංගු වේ. එසේ නමුත් දූෂණ පාලනය බලාත්මක කිරීමේ අඩුපාඩු සහ කර්මාන්තශාලා බොහෝ සංඛ්‍යාවක දූෂණ අවම කිරීමේ තාක්ෂණ දුර්වලතා හේතුකොට වෙරළබඩ ජලය කාර්මික ප්‍රභව මගින් දූෂණයට ලක්වෙයි.

මධ්‍යම පරිසර අධිකාරය, මහ නගර සභා, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල, සමුද්‍ර පරිසර දූෂණ වැලැක්වීමේ අධිකාරිය වැනි අනෙක් ආයතන මගින් දූෂණ වැළැක්වීමේ කටයුතුවලට අමතරව වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවද විවිධ වැළැක්වීමේ සහ නිවැරදි කිරීමේ කටයුතු මගින් වෙරළ කලාපයේ දූෂණය අවම කිරීමට හෝ පාලනය කිරීමේ කටයුතුවල යෙදී සිටියි. මේවා බොහොමයකට සෙසු ආයතන සහ නියෝජිත ආයතනයන්ගේ සහභාගිත්වය සහ ඵලදායි සම්බන්ධීකරණය ලබා ගැනීම සඳහා යාන්ත්‍රණයක් අවශ්‍ය වේ. උදාහරණ වශයෙන් ජාතික මට්ටමින් නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශයන්ට ගුණාත්මක වශයෙන් සුදුසු ජලය සහ සනීපාරක්ෂක සේවා ලබාදීම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වගකීම වේ. එසේ වුවත් කොළඹ පිහිටි පහසුකම් රහිත ජනාවාසයන් සඳහා ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් සැපයීමට වෙනත් ආයතන ගණනාවක් කටයුතු කරනු ලබයි.

වෙරළබඩ ජලයේ දූෂණය අවම කිරීම සඳහා ජලයේ ගුණාත්මක බව සුපරීක්ෂණය කිරීම පූර්ව අවශ්‍යතාවයක් වුවත් මේ දක්වා වෙරළ කලාපයේ අභ්‍යන්තරයේ කලපු, මෝය සහ වෙරළාසන්න ජලයේ ගුණාත්මකභාවය පිළිබඳ නිරන්තර සුපරීක්ෂණය සඳහා නෛතික වගකීමක් සහිත කේවල ආයතනයක් නොමැත. සමුද්‍ර පරිසර දූෂණ වැළැක්වීමේ අධිකාරිය (MEPA) මුහුදු ජල දූෂණය පාලනය කිරීම පිළිබඳව ක්‍රියා කිරීමේ බලය ඇතත් එය අදාළ වන්නේ අක් වෙරළ මූලාශ්‍රයන් සම්බන්ධයෙන් පමණි. කෙසේවුවත් ලංකා ආයෝජන මණ්ඩලය, මධ්‍යම පරිසර අධිකාරිය, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවට වෙරළ කලාපයේ ජලයේ ගුණාත්මකභාවය සුපරීක්ෂණය සඳහාත් සංවර්ධන ක්‍රියාකාරකම්වලින් බැහැර කරන අපද්‍රව්‍ය පාලනය කිරීමෙත් බලයක් ඇත. මෙයට අමතරව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ජාතික ජලජ සම්පත් සංවර්ධන නියෝජිත ආයතනය (NARA) සහ ලංකා ඉඩම් සංවර්ධනය හා ගොඩකිරීමේ සංස්ථාව හා කාර්මික තාක්ෂණික ආයතනය වැනි ඇතැම් රේඛීය ආයතන, විශ්වවිද්‍යාල සහ අනෙකුත් පර්යේෂණ ආයතන කලින් කල ජලයේ ගුණාත්මක භාවය පිළිබඳ සුපරීක්ෂණ සහ පර්යේෂණවල නිරතවෙයි.

විවිධ භාවිතයන් සඳහා වෙරළබඩ ජලය යොදා ගැනීමේ දී අවශ්‍යවන ජලය සඳහා වූ සාධක ප්‍රමිතීන් ශ්‍රී ලංකාව විසින් මේ වනතෙක් සංවර්ධනය කොට නැත. මධ්‍යම පරිසර අධිකාරිය විසින් අදාළ ප්‍රමිතීන් පිළිබඳ යෝජනා ඉදිරිපත් කොට ඇති නමුත් විශේෂයෙන් ඍතුමය බලපෑම් හේතුකොට ජලයේ ගුණාත්මක බව වෙනස්වන හෙයින් අවසන් තීරණ ගැනීමට පෙරාතුව මේවා ප්‍රමාණවත් පරිදි සැලකිල්ලට භාජනය කල යුතුය. වෙරළබඩ ජලයේ දූෂණය අවම කිරීම සඳහාවන ප්‍රධාන පියවරක් වනුයේ දූෂණය අවම කිරීම සඳහා පහසුකම් සහිත කාර්මික ජනපද පිහිටුවීමට රජය ගෙන ඇති තීරණයයි. ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමෝපාය සහ එය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සුදුසු රෙගුලාසි මත පිළියෙල කොට ඇත. අන්තරායකාරී අපද්‍රව්‍ය එක්රැස් කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම සහ බැහැර කිරීම පාලනය කිරීම සඳහා අවශ්‍ය රෙගුලාසි 1996 දී ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පමුණුවන ලද අතර පරිසර අමාත්‍යාංශය මගින් අන්තරායකාරී අපද්‍රව්‍ය කළමනාකරණ යන්ත්‍රයක් ස්ථාපිත කිරීම සඳහා කටයුතු කරමින් සිටී. එසේ වුවත් කෘෂි රසායනික ද්‍රව්‍ය ඇතුළු ස්ථානීය නොවන මූලාශ්‍රයන් පිළිබඳව කටයුතු කිරීම සඳහා සුපිරිසිදු ප්‍රතිපත්ති සහ ඵලදායි ලෙස ක්‍රියා කිරීමේ යාන්ත්‍රණයක් නොමැති වීම නිසා මේ පිළිබඳව කටයුතු කිරීම අපහසු වී ඇත.

#### 4.3.1 වෙරළබඩ ජල දූෂණය කළමනාකරණය සඳහා අනාගත මග පෙන්වීම

ආර්ථික සංවර්ධනය සඳහා වෙරළබඩ ප්‍රදේශ වෙත යොමු කරන ලද අවධානය තිරසාර භාවය සහතික කිරීම සඳහා වෙරළබඩ ජලයේ ගුණාත්මක භාවය කළමනාකරණය සඳහා දූෂණය අවම කිරීමට ප්‍රමාණවත් ක්‍රමෝපායන් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම කළ යුතුය. මෙයට අමතරව අනුකූලතාවන් කෙරෙහි අවධානය යොමුකොට පිලියම් යෙදීමත්, දැනුම්වත් කිරීමේ ඉලක්කගත වැඩසටහන් ඵලදායි සහ පුළුල්ව යොදා ගැනීමෙන් ජල භාවිත කලාපිකරණයත් සිදු කිරීමත් අවශ්‍ය වේ.

වෙරළබඩ ජල දූෂණය වෙරළ සම්පත් කළමනාකරණය කිරීමේදී සැලකිල්ලට භාජනය විය යුතු ප්‍රධාන ගැටලුවලින් එකක් වුවත් මෙම ගැටලුව හුදෙක් වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් තනිව විසඳිය හැක්කක් නොවේ. වෙරළබඩ දූෂණය පාලනය කිරීම හා ඒ සම්බන්ධයෙන් කටයුතු කරන විශාල ආයතන සහ නියෝජ්‍ය ආයතන පිළිබඳව සැලකීමේදී සහභාගිත්ව කළමනාකරණය පදනම්කොට ගත් ඒකාබද්ධ වෙරළ කලාප කළමනාකරණයක අවශ්‍යතාව පැහැදිලි වේ. මේ සඳහා එක් එක් බල ප්‍රදේශය තුළ ඇති වෙරළබඩ ජලතලයන්හි සුපරීක්ෂණ කටයුතු හා සම්බන්ධ කටයුතු කිරීමට පළාත් ආයතන සහ ප්‍රදේශයේ ආයතන ශක්තිමත් කිරීම අවශ්‍ය වේ. කලින් හඳුනාගත් ස්ථානයන්හි භූගෝලීය හා කාලීනව ජලයේ ගුණාත්මක බව සුපරීක්ෂණය සඳහා එක් එක් පළාත් සභා සහ ප්‍රාදේශීය සභාවන්ට මූල්‍ය ප්‍රතිපාදන තිබිය යුතුය. ප්‍රමුඛතා අනුව ජල සම්පත් වර්ගීකරණය පෙළගැස්වීමට අවශ්‍ය වන ජලයේ ගුණාත්මක බව පිළිබඳව නිර්ණායකයන් සකස්කල යුතු අතර ගුණාත්මක බවින් අඩු වෙරළබඩ ජල තලයන්ගේ තත්ත්වය නංවාලීම සඳහා ඉංජිනේරුමය ක්‍රියාමාර්ග යොදා ගැනීමද අවශ්‍ය වේ.

ප්‍රධාන දූෂණ මූලාශ්‍රයන් පාලනය කිරීමට හැකිවන ලෙස නීති සහ රෙගුලාසි ශක්තිමත් කළ යුතු අතර එමගින් වෙරළබඩ ජලය වෙත ගලා එන දූෂණ ප්‍රමාණයන් අවම කරගත හැක. දැඩි ලෙස නීතිය ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණයක්ද ප්‍රධාන වෙරළබඩ ජල දූෂණ සිද්ධීන්ගේ ප්‍රමාණය සහ සිදුවන සිද්ධි ගණන අවම කිරීම අරමුණුකොටගත් ක්‍රියාමාර්ගයක්ද දියත් කල යුතුය.

### 4.3.2 වෙරළබඩ ජල ප්‍රදේශ සඳහා වූ කලාපිකරණය සහ විශේෂිත නිර්ණායක අවශ්‍යතා

අවම කිරීම පිණිස සහ වෙරළබඩ කලාපයේ ආර්ථික ක්‍රියාකාරකම්වල තිරසාරභාවය සහතික කිරීම පිණිස මනා සමාජ ආර්ථික සහ පාරිසරික තොරතුරු මත පදනම් වූ ජල පරිහරන කලාපිකරණයක් හඳුන්වා දිය යුතුය.

භූමිය සහ ජල පරිහරණය සැලසුම් කිරීම පාලන උපකරණයක් ලෙස බහුලව යොදා ගනී. මේ මගින් සමාජ ආර්ථික අරමුණු සහ පාරිසරික ගැටලු පිළිබඳව අවධානය යොමු කරමින් ප්‍රදේශයන් සංවර්ධනය කිරීමේදී වඩාත් වාසිදායක ලෙසට අදාළ සංවර්ධනය මෙහෙයවීම මෙහිදී සිදු කෙරේ. ජල (භාවිතය) පරිහරන කලාපිකරණය මගින් විවිධ සංවර්ධන කටයුතු තිරසාර මට්ටමකින් පවත්වාගෙන යන අතර ප්‍රතිලාභ උපරිම කරමින් පරිසරයට වන අහිතකර බලපෑම් සීමා කරනු ලබයි. මෙයට අමතරව වෙරළබඩ පරිසර පද්ධති සංරක්ෂණය කරන අතර භාවිත ගැටලු අවම කරමින් එකිනෙකට නොගැළපෙන භාවිතයන් වෙන් කිරීම කලාපිකරණය මගින් සිදුකළ හැක.

**සාර්ථක ජල පරිහරන කලාපිකරණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යතා**

1. ප්‍රමාණවත් නොවන ප්‍රතිපාදන සහ නෛතික විධිනියෝගයක් තිබීම
2. ඉලක්ක පරිසරය පිළිබඳ නිරවද්‍යවූත් පූර්ණ සමාජ ආර්ථික සහ පාරිසරික තොරතුරු
3. නීති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය සහභාගිත්වය
4. බලතල බෙදා ගැනීම සහ හවුල්කාරත්වය
5. තිරසාර මූල්‍ය සැපයුම සහතික කිරීම
6. කලාපිකරණ සැලසුම් ක්‍රියාවලියේදී පාර්ශ්වකරුවන් හවුල් කර ගැනීම
7. සැලසුම් ක්‍රියාවලිය ආරම්භයේදී සමුද්‍රීය සහ වෙරළ කලාපයේ බහුවිධ භාවිතය පිළිබඳ අවධානය යොමු කිරීම
8. නීති ක්‍රියාත්මක කිරීමේ ආයතන කලාප පිළිබඳව ප්‍රමාණවත් ලෙස දැනුම්වත් කිරීම

වගුව 4.8 පෙන්වා ඇති ආකාරයට වෙරළබඩ ජලයේ සංවේදී ප්‍රදේශ දූෂණයෙන් වැළැක්වීමට විවිධ කලාපවලට වර්ග කිරීම අවශ්‍ය වේ.

වෙරළබඩ ප්‍රදේශයන්හි වර්තමාන සංවර්ධන පීඩනයන් සහ සීඝ්‍ර ජනගහන වර්ධනය දෙස බැලීමේදී වෙරළබඩ ජල පරිහරන කලාපිකරණයන් පිළිබඳ අවධානය අනාගතයේදී යොමු කිරීම ඉතා වැදගත් වේ. මේ නිසා මෙම සැලැස්ම මගින් වෙරළබඩ ජල පරිහරන කලාපිකරණයක් සිදු කිරීම සඳහා වූ පූර්ව අවශ්‍යතාවන් ඉටු කිරීම සඳහා උත්සහ කළ යුතුය. වෙරළබඩ ජල පරිහරන කලාපිකරණයක් යොදාගන්නා තෙක් "සංරක්ෂණ ප්‍රදේශ" සහ "බලපෑම් ප්‍රදේශ" පිළිබඳව 2011 අංක 49 දරන සංශෝධන මගින් හඳුන්වා දෙන ලද නෛතික විධිවිධානයන් ඇතැම් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා යම් මට්ටමකින් යොදාගත හැක.

වගුව 4.8: වෙරළබඩ ජල පරිහරන කලාපිකරණය සඳහා යෝජිත වාර්ගිකරණය

| විස්තරය | භාවිතය |
|---|---|
| පරිසර සංරක්ෂණය | පරිසර පද්ධති සංරක්ෂණ දර්ශනීය සහ අධ්‍යාපනික විනෝදාස්වාදය |
| ධීවර/ඉස්සන්, කකුළුවන් | ධීවර මොලස්කාවුන්<br>ජලජීවී වගාව<br>ලුණු නිෂ්පාදනය<br>ජල ආශ්‍රිත විනෝද කටයුතු<br>විසිතුරු මත්ස්‍ය නිෂ්පාදන |
| ධීවර/මත්ස්‍යයින් | මත්ස්‍යයින්<br>ජලජීවී වගා මසුන්<br>මොලස්කාවුන් නොවන අපෘෂ්ඨවංශික මත්ස්‍ය<br>මොලස්කාවුන් නොවන අපෘෂ්ඨවංශිකයින් |
| පරිභෝජනයට නොගන්නා භාවිත | ජලය හා නොගැටෙන විනෝද කටයුතු<br>ජලතරණය<br>වරාය<br>නාවික කටයුතු<br>අපද්‍රව්‍ය මුදාහැරීම<br>වැලි කැනීම |

## 4.4 වෙරළබඩ ජල දූෂණය පාලනය කිරීම සඳහා වූ කළමනාකරණ අරමුණු, ප්‍රතිපත්ති ක්‍රමෝපායන් සහ ක්‍රියාකාරකම්

**අරමුණ 1**

සංවර්ධන කටයුතු මඟින් වෙරළබඩ ප්‍රදේශ වෙත බැහැර කෙරෙන පිරිපහදු නොකළ හෝ අර්ධ වශයෙන් පිරිපහදු කරන ලද අපද්‍රව්‍ය පිළිබඳව පනවා ඇති රෙගුලාසි සහ මාර්ගෝපදේශ වලට අනුකූලව නම් කරන ලද භාවිතයන් සඳහා වූ පිළිගත හැකි මට්ටමින් ජලයේ ගුණාත්මක බව පවත්වා ගැනීම.

**ප්‍රතිපත්තිය 1.1**

අපද්‍රව්‍ය බැහැර කිරීමේදී මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රමිතින්ට අනුකූලව සිදුකිරීමට සියලු සංවර්ධන කාර්යයන් කළමනාකරණය කරනු ඇත.

**ක්‍රමෝපාය 1.1.1**

වෙරළබඩ ජලයේ ගුණාත්මක බව නිරන්තරව සුපරීක්ෂණය කිරීම තුළින් වෙරළ කලාපයේ සියලු සංවර්ධන කටයුතු මධ්‍යම පරිසර අධිකාරිය මඟින් අපද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධයෙන් පනවා ඇති ප්‍රමිතින්ට අනුකූලතාව දක්වන බව සහතික කිරීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් දැනට කරනු ලබන මුහුදු ජලයේ ගුණාත්මක බව පිරික්සීමේ සුපරීක්ෂණ වැඩසටහන පුළුල් කිරීම, ශක්තිමත් කිරීම සහ තවදුරටත් පවත්වා ගැනීම මගින් මුහුදු ජලයේ ගුණාත්මක තත්ත්ව පරීක්ෂා කිරීමටත් දරුණු දූෂණ තත්ත්වයන් හඳුනා ගැනීමටත් දූෂණයට ඉවහල් වන සංවර්ධන කාර්යයන් හඳුනා ගැනීමටත් කටයුතු කිරීම.

2. සමීක්ෂණයන්ගේ ප්‍රතිඵල අවශ්‍ය කටයුතු සඳහා අදාළ ආයතන වෙත යොමු කිරීම.

3. මධ්‍යම පරිසර අධිකාරියේ සහය ඇතිව වෙරළ කලාපය තුළ ඉහළ සහ පහළ මට්ටමේ දූෂණයට ඉවහල් වන සංවර්ධන කටයුතු හඳුනාගෙන දත්ත පදනමක් සකස් කිරීම.

4. වෙරළ කලාපයත් එහි ජල සම්පතත් දූෂණයට පාත්‍ර කිරීමට ඉඩ ඇති සංවර්ධන කටයුතු මධ්‍යම පරිසර අධිකාරිය මඟින් සකස් කොට ඇති අපද්‍රව්‍ය බැහැර කිරීමේ ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කරන බව සනාථ කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම.

5. දැනට අපද්‍රව්‍ය බැහැර කිරීමේ ප්‍රමිතීන් නොමැති ජලජීවී වගා වැනි කටයුතු සඳහා අදාළ ආයතන වල සහභාගිත්වයෙන් ප්‍රමිතින් සකස් කිරීම.

**ප්‍රතිපත්තිය 1.2**

අවට ජලයේ ගුණාත්මකභාවය හායනය නොවන බවට සහතික කිරීම සඳහා අධික දූෂණයක් සහිත කර්මාන්ත විශේෂ සුපරික්ෂාකරණයට ලක් කිරීම.

**ක්‍රමෝපාය 1.2.1**

අධික දූෂක කර්මාන්ත හඳුනාගෙන ඒවාට වෙරළබඩ අවට ජලයේ ගුණාත්මක භාවය හායනයට ලක්කරන අපද්‍රව්‍ය පිටකිරීම පාලනයට අදාළ තාක්ෂණයන් පිළිබඳ තොරතුරු නිරන්තර පරීක්ෂාවට ලක් කිරීමට අදාළ බලධාරීන්ට සහය වීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. වෙරළබඩ ජලය නිරන්තර සුපරීක්ෂණයට ලක් කිරීම මඟින් අධික දූෂක කර්මාන්ත පිළිබඳ අදාළ තොරතුරු ලබාදීමට අදාළ පරීක්ෂකවරුන් සහ බලධාරීන් සමඟ සම්බන්ධීකරණය කළ යුතුය.

2. දූෂණය අවකරණය සඳහා තාක්ෂණය සපයන්නන් පිළිබඳව සහ වෙරළබඩ කලාපයට බලපාන කර්මාන්ත අතර වඩා පිරිසිදු නිෂ්පාදන තාක්ෂණ පිළිබඳ තොරතුරු වෙත ප්‍රවේශය පහසු කිරීම.

3. දූෂණයෙන් තොර වෙරළබඩ පරිසරයක් පවත්වා ගැනීමේ වැදගත්කම පිළිබඳව වෙරළාසන්නයේ පිහිටි අධික දූෂක සහිත කර්මාන්තකරුවන් දැනුම්වත් කිරීම සඳහා වැඩසටහන් පැවැත්වීම.

4. දූෂණයෙන් තොර වෙරළබඩ පරිසරයක් පවත්වා ගැනීමේ වැදගත්කම පිළිබඳව වෙරළබඩ කලාපයේ පිහිටා ඇති ඉහළ දූෂණයක් ඇති කරන කර්මාන්ත අතර දැනුම්වත්බව ඇති කිරීම පිණිස ඔවුනට සහභාගිවීමේ වැඩසටහනක් පැවැත්වීම.

**ප්‍රතිපත්තිය 1.3**

පරිවේශී ජලයේ ගුණාත්මකභාවය හා සම්බන්ධිත විශේෂ කොන්දේසි වලට දැඩිව අනුකූල වෙමින් නම් කළ පාරිසරික සංවේදී ස්ථාන/සංරක්ෂණ ප්‍රදේශ වෙත අපවාහ/අපජලය විමෝචන බැහැර කිරීමට හේතුකාරක වන සංවර්ධන ක්‍රියාකාරකම් කළමනාකරණය කරනු ඇත.

**ක්‍රමෝපාය 1.3.1**

නම් කරන ලද විවිධ භාවිතයන් සඳහා මධ්‍යම පරිසර අධිකාරිය වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මඟින් පනවන ලද අවට වෙරළබඩ ජලයේ ගුණාත්මක භාවයට අදාළ ප්‍රමිතීන් සහ පරාමිතීන් වල සඳහන් උපරිම අවසර දියහැකි සීමාවන් නොඉක්මවන ලෙසට සංවර්ධන කටයුතු සඳහා අවසර දීම සඳහා කාලීනව වෙරළබඩ ජලය සුපරීක්ෂණය කරනු ඇත.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. ආර්ථික පාරිසරික වශයෙන් වැදගත් වෙරළබඩ ස්ථාන තෝරා ගෙන අවකාශිත සහ කාලීන ජල ගුණාත්මක සුපරීක්ෂණයක් මඟින් එක් එක් ස්ථානවල අවට පවත්වාගෙන යා යුතු ජල සාධක ප්‍රමිතීන් ස්ථාපිත කිරීම.

2. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ විධිවිධාන වලට අනුකූලව ප්‍රකාශයට පැමිණවිය හැකි "සංරක්ෂණ ප්‍රදේශ'' සහ "බලපෑමට ලක් වූ ප්‍රදේශ" වල කළ හැකි කාර්යයන් අනෙකුත් පාර්ශවකරුවන් සහ ආයතන සහභාගිත්වයෙන් හඳුනා ගැනීම සහ අනෙකුත් භාවිතයෙන් සහ සංවර්ධන කටයුතු පාලනය සඳහා රෙගුලාසි සකස් කිරීම.

3. අවට ජලයේ පරිසර ගුණාත්මකබව සහ නම්කරන ලද කාර්යයන් අනුව නව සංවර්ධන කටයුතු සඳහා අවසර දියහැකි ස්ථාන හඳුනා ගැනීම.

4. ජලයේ පරිසර ගුණාත්මක භාවයත් අදාළ භාවිතයනුත් අතර ගැලපීමක් ඇති නොවන, අතිශයින් වැදගත් ස්ථාන සංරක්ෂණ ප්‍රදේශයන්හි දූෂණ ප්‍රභවයන් හඳුනා ගැනීම අධ්‍යනයන් පැවත්වීම සහ ඒවා තවදුරටත් සංවර්ධනය කිරීමට හැකියාව ලබා දෙන දූෂණ අවම කිරීමේ උචිත ක්‍රියාමාර්ග යෝජනා කිරීම.

**අරමුණු 2**

දූෂක ප්‍රභවයන් කළමනාකරණයෙන් වෙරළබඩ ජලයේ ගුණාත්මක බව ඉහල නැංවීම.

**ප්‍රතිපත්තිය 2.1**

කුමන ආකාරයක හෝ අපද්‍රව්‍ය හෝ ආගන්තුක ද්‍රව්‍ය ඍජුව වෙරළ කලාපයට බැහැර කිරීම හෝ ඉන්පිටතට බැහැර කරන නමුත් ඉන් බලපෑම වෙරළ කලාපය වෙත සිදුවීම කළමනාකරණය මඟින් ජල දූෂණය දැඩි ලෙස සිදු නොවීමට වග බලාගනී.

**ක්‍රමෝපාය 2.1.1**

වෙරළබඩ ජලය කෙරෙහි ඇතිවන අහිතකර බලපෑම් අවම කිරීම සඳහා ඝන ද්‍රව්‍ය කළමනාකරණ සැලසුම් සකස් කිරීමට අදාළ බලධාරින් දිරිමත් කරනු ඇත.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. පළාත් පාලන ආයතන විසින් වෙරළ කලාපයේ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම පාලනය කිරීම පිණිස උචිත මට්ටම්වලදී (ප්‍රාදේශීය/කලාපීය/ජාතික) සැලසුම් සකස් කිරීමට වැඩසටහනක් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම.

2. ඝන අපද්‍රව්‍ය සැලසුම් කඩිනමින් අවශ්‍යවන ඝන අපද්‍රව්‍ය ජනිතකරන නාගරික මධ්‍යස්ථාන, කර්මාන්ත, වෙරළබඩ, සංචාරක මධ්‍යස්ථාන, ධීවර වරාය සහ අනෙකුත් ස්ථාන හඳුනා ගැනීම.

3. වෙරළ කලාපයෙන් පිටත ඝන අපද්‍රව්‍ය බැහැර කරන ස්ථාන ප්‍රතිස්ථාපනය සඳහා පාරිසරික වශයෙන් අඩු අනතුරුදායක විකල්ප ස්ථාන තෝරා ගැනීමට පළාත් පාලන ආයතන වෙත සහය වීම.

4. ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන් වෙරළ කලාපයේ පිහිටි තෝරාගත් ස්ථානවල පාරිසරික හායනය සුපරීක්ෂණය කිරීම.

5. කොම්පෝස්ට් සහ ජීව වායු නිපදවීම යනාදිය මඟින් පරිසර හිතකාමී අපද්‍රව්‍ය අවම කිරීමේ කටයුතු වලට අවතීර්ණ වීමට පලාත් පාලන ආයතන දිරිගැන්වීම සහ සහාය වීම.

6. ප්‍රකාශයට පත්වීමට නියමිත "විශේෂ කළමනාකරණ ප්‍රදේශය" "සංරක්ෂණ ප්‍රදේශ" සහ "බලපෑමට යටත් ප්‍රදේශ" සඳහා අපද්‍රව්‍ය බැහැර කිරීම වැළැක්වීමට රෙගුලාසි සකස් කිරීම.

**ප්‍රතිපත්තිය 2.2**

පළාත් පාලන ආයතන සහ අනිකුත් ආයතන සමග සහයෝගයෙන් මළ/අසූචි මඟින් වෙරළබඩ ජල දූෂණය වීම අවම කරනු ලැබේ.

**ක්‍රමෝපාය 2.2.1**

මළ/අසූචි ආශ්‍රිතව ඇතිවන ජල දූෂණයට ඒ සඳහා නියමිත අවම මට්ටම ඉක්මවන ස්ථාන හඳුනාගෙන එම ගැටලුව පළාත් පාලන ආයතන සමඟ සහයෝගයෙන් විසඳීමට ක්‍රියාමාර්ග ගැනීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. තෝරා ගැනීමේ නිර්ණායක පදනම් කරගෙන වෙරළ කලාපය තුළ මළ/අසූචි ආශ්‍රිතව ඇතිවන දූෂණය පාලනය කළයුතු වැදගත් ස්ථාන තීරණය කිරීම.

2. වැඩි වශයෙන් දිය නෑම, ජල ක්‍රීඩා වැනි දේ සඳහා ජල භාවිතය කෙරෙන ස්ථානවල පවත්නා මළ/අසූචි ආශ්‍රිත ජල දූෂණ මට්ටම නිමානය කිරීම සඳහා එම ස්ථාන සුපරීක්ෂණය.

3. මළ/අසූචි ආශ්‍රිත දූෂණයේ අහිතකර විපාක පිළිබඳව පළාත් පාලන ආයතන දැනුම්වත් කොට එය අවම කිරීමට ඔවුනට සහාය වීම.

4. ජලයේ ගුණාත්මක බව පිළිබඳ කරනු ලබන අධ්‍යයනයන්ගේ ප්‍රතිඵල සොයා ගැනීම් ලංකා සංචාරක මණ්ඩලය, හෝටල් හිමියන් සහ අදාළ සිවිල් සංවිධාන වෙත සුදුසු පරිදි ලබා දීම.

**ප්‍රතිපත්තිය 2.3**

වෙරළබඩ සම්පත් හායනය වීම අවම කිරීම සඳහා වෙරළ තීරයන්හි තෙල් පිටාර ගැලීම කළමනාකරණය කරනු ඇත.

**ක්‍රමෝපාය 2.3.1**

වෙරළබඩ ජලයට තෙල් මුසුවන ප්‍රධාන මූලාශ්‍ර හඳුනාගෙන ඒ සඳහා පිළියම් වශයෙන් ගතයුතු ක්‍රියාමාර්ග අදාළ ආයතනවල සහයෝගයෙන් සකස් කිරීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. වෙරළ කලාපයට තෙල් මුදා හරිනු ලබන මූලාශ්‍රයන් හඳුනා ගැනීමට සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරිය සමඟ සම්බන්ධිකරණය කිරීමට කටයුතු කළ යුතුය.

2. විශේෂ වෙරළ කළමනාකරණ ප්‍රදේශයන් සහ ධීවර වරාය ආශ්‍රිතව විශේෂයෙන් වෙරළබඩ ජලයට තෙල් මුදා හැරීම අවම කිරීම සඳහා අදාළ ආයතන සමඟ වැඩ සටහනක් සකස් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.

3. හරිත වරාය සංකල්පය ක්‍රියාත්මක කිරීමට සහ ප්‍රවර්ධනයට ධීවර වරාය නීතිගත සංස්ථාවට සහය වීමට කටයුතු කළ යුතුය.

4. තෙල් ආශ්‍රිත පරිසර දූෂණය අවම කිරීම සඳහා සමුද්‍ර පරිසර දූෂණ අධිකාරිය, ධීවර වරාය නීතිගත සංස්ථාව, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සමග එක්ව දැනුම්වත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

**ප්‍රතිපත්තිය 2.4**

අවට ජලයේ ගුණාත්මක භාවයට අහිතකර බලපෑම් ඇති නොවන පරිදි වෙරළ කලාපය තුළ වෙරළබඩ ජලය ලවණීකරණ ක්‍රියාවලිය කළමනාකරණය කරනු ඇත.

**ක්‍රමෝපාය 2.4.1**

නයිට්‍රේට් ආශ්‍රිත දූෂණයට බලපාන මූලාශ්‍ර සහ භූගත ජලය ලවණීකරණයට පාදක වන ප්‍රධාන හේතුකාරක හඳුනාගෙන සහයෝගිත්ව ප්‍රතිකාරාත්මක පිළිවෙත් ක්‍රියාත්මක කිරීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. අරමුණ නිර්ණායක පදනම් කොට අධික නයිට්‍රේට් දූෂණය සහ භූ ජලය ලවණීකරණය වන ස්ථාන තීරණය කිරීම.

2. එම දූෂණය අවම කිරීම සඳහා අදාළ ආයතන වල සහභාගිත්වයෙන් හඳුනාගන්නා ලද ස්ථාන පිළිබඳව සුපරීක්ෂණය කිරීම.

3. මළ/අසූචි දූෂණයට අදාල ගැටලු සහ ස්ථාන පිළිබඳව පළාත් පාලන අධිකාරීන් දැනුම්වත් කොට එය අවම කිරීමට සහාය වීම.

**අරමුණ 3**

ක්‍රමානුකූලව කරනු ලබන සුපරීක්ෂණ හා පර්යේෂණ මඟින් වෙරළබඩ හා සමුද්‍ර ජලයට එක්වන දූෂක ප්‍රමාණය ගණනය කොට අවම කරනු ලැබේ.

**ප්‍රතිපත්තිය 3.1**

මතුපිට ජල මාර්ග ඔස්සේ වෙරළබඩ ජලය වෙත ගලා එන දූෂක ප්‍රමාණය ගණනය කොට අවම කරනු ලැබේ.

**ක්‍රමෝපාය 3.1.1**

මතුපිට ජල මාර්ග ඔස්සේ වෙරළබඩ ජලය වෙත ගලා එන දූෂක ප්‍රමාණය හඳුනා ගැනීම සහ අදාල ආයතන සමග සහයෝගිතාවයෙන් ජලයේ ගුණාත්මතාවයෙන් ඉහල නංවාලීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. වෙරළබඩ ජලය වෙත දූෂණ ද්‍රව්‍ය ගෙන එන මතුපිට ප්‍රධාන ජල මාර්ග හඳුනාගෙන වියළි සහ වැසි කාලගුණ සමයන් තුළ ගලා එන ප්‍රමාණයන් තක්සේරු කිරීම.

2. අවශ්‍ය තොරතුරු සැපයීම මඟින් අධික දූෂණ ද්‍රව්‍ය ගලා ඒම අවම කිරීමට ක්‍රියාමාර්ග ගැනීමට පළාත් පාලන ආයතන සහ මධ්‍යම පරිසර අධිකාරියට සහය වීම.

3. එවැනි ජලාශවල ජලයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට අවශ්‍ය වන පර්යේෂණ කටයුතු කිරීම සඳහා අදාළ ආයතන සහභාගිත්වයෙන් කටයුතු කිරීම.

**ප්‍රතිපත්තිය 3.2**

වෙරළබඩ භූගත ජල දූෂණය අඩුකිරීම සඳහා සහයෝගිත්ව ක්‍රියාකාරකම් සිදුකරනු ලැබේ.

**ක්‍රමෝපාය 3.2.1**

වෙරළබඩ භූගත ජල දූෂණය වීමේ ක්‍රම සහ අදාළ මට්ටම් හඳුනාගෙන ජල දූෂණය වීමේ විභවය තක්සේරුකොට භූගත ජලයේ ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම සඳහා අදාළ ආයතන වල සහභාගිත්වයෙන් උචිත ක්‍රියාමාර්ග ගැනීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. ආර්ථික වශයෙන් අතිශය වැදගත් ස්ථාන තෝරාගෙන සුදුසු යයි නම් කළ ජල භාවිතයන් ආශ්‍රිතව ජලයේ ගුණාත්මක බව සුපරීක්ෂණය කිරීම.

2. භූගත ජලය දූෂණය සිදුවීම අඩුකිරීමට අදාළ ආයතන වලට සහය වීම.

**අරමුණු 4**

ක්‍රමෝපාය සන්නිවේදනය භාවිතා කරමින් අධ්‍යයනය තොරතුරු බෙදා හැරීම මඟින් වෙරළබඩ දූෂණය අවම කරනු ලැබේ.

**ප්‍රතිපත්තිය 4.1**

දූෂක ප්‍රභවයන් එහි බලපෑම අවම කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳව පාර්ශ්වකරුවන් දැන්වත් කිරීම සඳහා අදාල රජයේ ආයතන/ රජයේ නොවන සංවිධාන සමග එක්ව සහභාගීව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

**ක්‍රමෝපාය 4.1.1**

ජලයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට අදාළ පුහුණුවීම් සහ කුසලතා වර්ධනය කිරීම සඳහා දක්ෂතා ඇති ආයතන සමඟ සහභාගිත්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. ඇමතිය යුතු ඉලක්ක කණ්ඩායම් සහ විශේෂිත ගැටලු සහ අවශ්‍යතා හඳුනාගැනීම පිණිස අවශ්‍යතා ඇගයුමක් සිදු කළ යුතුය.

2. ඵලදායි පුහුණු කිරීමේ සහ දැනුම්වත් කිරීමේ වැඩසටහන් පිළිබඳව උනන්දුවන කණ්ඩායම සහ සන්නිවේදන සජීවිකාරකයින් හඳුනාගෙන සහයෝගිතා වැඩ සටහන් සකස් කිරීම.

3. ජල දූෂණය අවම කිරීම සඳහා වෘත්තිය මට්ටමින් පුහුණු කිරීමට අදාළ පුද්ගලයින් කණ්ඩායම් අතුරින් තෝරාගෙන ජල දූෂක මූලාශ්‍රයන් දූෂක මට්ටම අවම කිරීමේ ක්‍රම ගැන දැනුම්වත් කිරීම.

**ප්‍රතිපත්තිය 4.2**

විමෝචන හා දූෂණ සෘජුව හෝ වක්‍රව සම්බන්ධවන ඉලක්ක කණ්ඩායම් හඳුනාගනු ලබන අතර වෙරළබඩ දූෂණයේ අහිතකර බලපෑම් සහ දූෂණය අවම කිරීමේ යාන්ත්‍රණ පිළිබඳව දැනුම්වත් කරනු ඇත.

**ක්‍රමෝපාය 4.2.1**

පාසල් සිසුන්, පරිසරයට හානිකරන පිරිස්, ප්‍රතිපත්ති සම්පාදකයින් පළාත් පාලන ආයතන ඉලක්ක කරගත් දැනුම්වත් කිරීමේ වැඩසටහන් හවුල්කාර සංවිධාන සහ සන්නිවේදන සජීවිකරුවන් හවුල්කාර සංවිධාන සහ සන්නිවේදක සජීවිකරුවන්ගේ සහයෝගයෙන් ක්‍රියාත්මක කිරීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. දැනුම්වත් කිරීම/සන්නිවේදන ක්‍රියාකාරකම් අවශ්‍ය කරනු ලබන ඉලක්ක කණ්ඩායම් හා විශේෂිත ගැටලු නිර්ණය කිරීම සඳහා සන්නිවේදන පාර්ශ්වකරුවන්/අදාළ සංවිධාන සමග එක්ව අවශ්‍යතා ඇගයුමක් සිදු කළ යුතුය.

2. සන්නිවේදන අවශ්‍යතාවයන්ට අනුකූලව උචිත ලෙස සැකසූ දැනුම්වත් කිරීමේ වැඩසටහන් සකස්කොට තෝරාගත් ඉලක්ක කණ්ඩායම් සඳහා ක්‍රියාත්මක කළ යුතුය.

3. වෙරළ කලාපයේ දූෂණ සිදුවීම් අවම කිරීම පිණිස පාසල් ළමුන් සඳහා වැඩමුළු සහ වැඩසටහන් සංවිධානය කළ යුතුය.

4. වෙරළ දූෂණ පාලන ප්‍රයත්නය සඳහා මහජන සහභාගිත්වය ලබා ගැනීම පිණිස සංඥා පුවරු සවිකිරීමට හා අත් පත්‍රිකා බෙදා හැරීමට කටයුතු කළ යුතුය.

## References


1. Arjuna's *Atlas of Sri Lanka,* ed. T. Somasekaram, M. P. Perera, and H. Godellawatta, Dehiwala: Arjuna Consulting Co. Ltd., 1997.
2. Bandarathilake, K. G. D. 1999. Hazardous waste management in Sri Lanka. *Paper presented at sub regional training seminar for the Implementation of the basel convention on the control of transboundary movements of hazardous waste and their disposal.* Mar. 15-19, 1999. Colombo
3. Central Bank of Sri Lanka, 2001. *Annual report of 2000. Colombo,* Central Bank of Sri Lanka, Sri Lanka.
4. Central Bank of Sri Lanka, 2002. *Annual Report of 2001. Colombo,* Central Bank of Sri Lanka, Sri Lanka.
5. Central Environmental Authority, 2005, *Data base of municipal solid waste management*
6. Coast Conservation Department, 2014, *Information Compendium on Coastal Pollution,* (Unpublished Report)
7. Coast Conservation Department, *Revised Coastal Zone management plan 2004.*
8. Corea ASCE, 2009. *Trends in Water Quality changes in Main Water Sources for shrimp culture and the needs for Standards for shrimp farms Effluents*
9. Corea, A. S. L. F., J. M. P. K. Jayasinghe, S. U. K. Ekaratne and S. D. Johnston, 1995. *Environmental impact of prawn farming on Dutch canal: the main water source for the prawn culture industry in Sri Lanka*, AMBIO (24) : 423-427
10. Department of Census and Statistics, 2001. *Census of Population and Housing 2001: preliminary release.* Colombo : Department of Census and Statistics.

11. Department of Government Printing, 2008 Gazette Extra Ordinary 1534/18 dated 01.02.2008
12. Department of Government Printing, 1992, Gazette Extraordinary 595/16 of 02.02.92
13. Jayaweera, M. 1999. *Environmental improvement study, Port of Colombo,* Unpubl. Sri Lanka Ports Authority.
14. Manchanayake, E. P. and C. M. Madduma Bandara, 1999. *Water Resources of Sri Lanka Colombo*: National Science Foundation.
15. Marine Pollution Prevention Authority, 2002. *Database on accidental spills in Sri Lankan waters.*
16. Moenr. 2002. *State of the Environment in Sri Lanka: a Report for SAARC*, compiled and ed. J D S Dela. Colombo: Ministry of Environment and Natural Resources.
17. MOFE (1999). *Database of Municipal Waste in Sri Lanka. Colombo,* Ministry of Forestry and Environmet.
18. MOFE, 2000. *The National Strategy for Solid Waste Management. Colombo*: Ministry of Forestry and Environment, Sri Lanka.
19. MOFE, 2001. *State of the Environment. Sri Lanka. Colombo*: Ministry of Forestry and Environment.
20. Mubarak, A. M. 2000. Water Pollution. In : *Natural Resources of Sri Lanka 2000*. Colombo: National Science Foundation.
21. UDA, 1994 b. Colombo *Environmental Improvement Project, Colombo*: Urban Development Authority, 1994.
22. UDA, 1994 a. *Environmental Management Strategy for Colombo Urban Area* – (III): Colombo, Urban Development Authority.
23. University of Moratuwa, 2001. *Feasibility study report for establishment of a central wastewater treatment plan for Ratmalana/Moratuwa industrial / residential areas*, Unpublished. University of Moratuwa.

# 5 පරිච්ඡේදය

## 5. විශේෂ කළමනාකරණ ප්‍රදේශ

### 5.1 හැඳින්වීම

> ''නිශ්චිත භූවිද්‍යාත්මක ප්‍රදේශයක් ඇතුළත සම්පත් කළමනාකරණය සැලසුම් කිරීම සඳහා සහයෝගීතා එළඹුමක් අවශ්‍ය යයි තමාට පෙනී යන්නේ නම්, අමාත්‍යවරයා විසින් වෙරළ කලාපය ඇතුළත වූ හෝ වෙරළ කලාපයට යාබද වූ හෝ වෙරළ කලාපය සහ යාබද ඉඩම් ප්‍රදේශය යන දෙකෙන්ම සමන්විත වූ ප්‍රදේශයන් හෝ ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක්, මගින් ''විශේෂ කළමනාකරණ ප්‍රදේශයක්'' වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකිය''.
>
> **2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනත**

#### 5.1.1 සංකල්පය

විශේෂ කළමනාකරණ ප්‍රදේශ පිළිබඳ සංකල්පය (පෙරදී විශේෂ ප්‍රදේශ කළමනාකරණය යනුවෙන් හඳුන්වන ලද) ඒකාබද්ධ වෙරළබඩ සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රයට අදාළ ඉතා වැදගත් කළමනාකරණ ක්‍රමවේදයක් ලෙස හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකාවේ වෙරළ ප්‍රදේශයන්හි සීඝ්‍ර ජනගහන වර්ධනයත්, ආර්ථික සංවර්ධනය සඳහා වැඩිවෙමින් පවත්නා පීඩනයත්, දුගීභාවයත් පවතින තත්ත්වය තුළ මෙම සැලසුම් ක්‍රියාවලිය විශේෂිත වේ. මෙයට අමතරව පාර්ශ්වකරුවන්ගේ සහ වෙරළබඩ සම්පත් භාවිතකරුවන්ගේ සමාජ ආර්ථික අවශ්‍යතාවයන්ට ගැලපෙන ඒකාබද්ධ සහභාගිත්ව කළමනාකරණ ප්‍රවේශයන් සඳහා නව ප්‍රතිපත්තියක අවශ්‍යතාව මෙම සංකල්පය වර්ධනයට හේතු විය. තවද අනෙකුත් ජාතික වෙරළ කලාප කළමනාකරණ ප්‍රතිපත්තීන්ගේ ප්‍රමාණවත් නොවූ ප්‍රතිඵල හේතුකොට විවිධ පාර්ශ්වයන් විසින් වෙරළබඩ සම්පත් හා සම්බන්ධ පාර්ශ්වකරුවන් සක්‍රීය දයකත්වයක අවශ්‍යතාව ඉස්මතු කරන ලදී. මේ නිසා වෙරළබඩ සම්පත් කළමනාකරණය සඳහා වූ ''පහළ සිට ඉහළට විහිදෙන'' (bottom-up) ප්‍රවේශයක් ලෙසත් වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් එහි ආරම්භයේ සිට අනුගමනය කළ ''ඉහළ සිට පහළට විහිදෙන'' (Top-down) කළමනාකරණ ප්‍රවේශයන්ට අතිරේකයක් ලෙස විශේෂ කළමනාකරණ ප්‍රදේශ සංකල්පය යොදා ගැණින. විශේෂ කළමනාකරණ ප්‍රදේශ සංකල්පය සහභාගිත්වය කළමනාකරණ (Co-management) මූලධර්මය පදනම් කොට පැන නැගිණ. එය හඳුනාගත් භූගෝලීය ප්‍රදේශයක පවත්නා සම්පත් සංයෝගාත්මක, අනුවර්තන හා නම්‍යශීලී ප්‍රවේශයක් මත කළමනාකරණය සඳහා උපකාරි වන්නකි. මෙම සංකල්පය අතිරේක වෙරළ කලාප කළමනාකරණ ප්‍රතිපත්තියක් ලෙස විධිමත් අයුරින් 1997 ජාතික වෙරළ කලාප කළමනාකරණ සැලැස්ම මගින් හඳුන්වා දෙන ලදී. මෙම සංකල්පය විධිමත් අයුරින් යොදා ගැනීමට

පෙර 1992 දී එක්සත් ජනපද ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ ආයතනයේ (USAID) මූල්‍යාධාර යටතේ රැකව හා හික්කඩුව යන නියාමක ස්ථාන 2කදී සැලසුම් කොට ක්‍රියාත්මක කරන ලදී. එම නියාමක ව්‍යාපෘතිවල ප්‍රතිඵල මගින් විශේෂ කළමනාකරණ ප්‍රදේශ සංකල්පය වෙරළ කලාප කළමනාකරණය සඳහා සහභාගිත්ව පදනම මත ඵලදායී ලෙස යොදා ගැනීමේ හැකියාව සහ අවස්ථාවන් විදහා දැක්විණ. විශේෂ කළමනාකරණ ප්‍රදේශ පිළිබඳ නියාමක ව්‍යාපෘතිවලින් ලත් අත්දැකීම් උපයෝගිකොට ''*වෙරළ 2000 ශ්‍රී ලංකා වෙරළ ප්‍රදේශ සඳහා සම්පත් කළමනාකරණ ක්‍රමෝපාය ප්‍රතිපත්ති ප්‍රකාශයේ*'' මගින් විශේෂ කළමනාකරණ ප්‍රදේශ පාරිසරික සහ ආර්ථික විශේෂ වැදගත්කමක් ඇති ස්ථාන සඳහා සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම නිර්දේශ කරන ලදී. 1997 ජාතික වෙරළ කලාප කළමනාකරණ සැලැස්ම මගින් විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් ක්‍රියාවලිය පරීක්ෂා කොට විධිමත් ලෙස පිළිගත්තද විධිමත් අයුරින් විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් සකස් කොට ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නෛතික විධිවිධාන 2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනතින් හඳුන්වා දෙන තෙක් නොතිබුණි. මේ අනුව ක්‍රියාවලියේ මූලික අවස්ථාවේ දී සැලසුම් සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම සඳහා, ආයතනික වැඩ පිළිවෙලක් යොදන ලදී. මෙම සැලසුම් සකස් කිරීමේ දී ප්‍රජාව, ප්‍රාදේශීය සභා, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වැනි ප්‍රාදේශීය උපකාරක ආයතන ද, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වැනි මධ්‍යම රජයේ ආයතන සහ බාහිර ප්‍රතිලාභීන් ද ඇතුළත් පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වයෙන් සිදු කරන ලදී.

### 5.1.2 පරිනාමය සහ ක්‍රියාත්මක කිරීමේ අත්දැකීම්

1990 දී පිළියෙල කරන ලද වෙරළ කලාප කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීමෙන් ලද අත්දැකීම් අනුව වෙරළබඩ සම්පත් කළමනාකරණය සඳහා ප්‍රාදේශීය පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වයේ අවශ්‍යතාව පිළිබඳව වඩාත් පුළුල්ව අවධාරණය කරන ලදී. මෙම අවශ්‍යතාව පැන නැගී ඇත්තේ වෙරළබඩ සම්පත් සහ එම සම්පත් භාවිත කරන්නන් අතර පවතින දැඩි සබඳතාවය හේතුකොටය. වෙරළබඩ සම්පත් භාවිතය සඳහා පවත්නා නිදහස් පිවිසුම (Open Access) නිසා මෙම අවශ්‍යතාවය තවදුරටත් ඉස්මතු විය. මේ නිසා විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේ දී සම්පත් භාවිතකරුවන්ගේ සහභාගිත්වය වැදගත් විය. වෙරළබඩ සම්පත් කළමනාකරණය සඳහා නියෝග සහ පාලන පිළියම් සඳහා වන වැඩි අවධානයට අතිරේකවත් පාර්ශ්වකරුවන්ගේ සමාජ හා ආර්ථික අවශ්‍යතාවන් සැලකිල්ලට ගනිමින් මෙය සිදු කරන ලදී.

1992 රැකව කලපුව සහ හික්කඩුව අභය භූමිය සඳහා වූ නියාමක ව්‍යාපෘති දෙක ආරම්භ කිරීමත් සමග ශ්‍රී ලංකාවේ විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය ඉදිරියට ගෙන යන ලදී. මෙම මුල් පියවර, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කරන ලද්දේ එක්සත් ජනපද ජාත්‍යන්තර සංවර්ධන ආයතනය (USAID) මගින් සපයන ලද මූල්‍යාධාර මත ක්‍රියාත්මක වූ වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය මගිනි. ප්‍රාදේශීය තත්ත්වය අනුව විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලියේ ශක්‍යතාව ස්ථාන දෙක තුළදී පරීක්ෂා කරන ලදී. මෙම පියවරින් ලද ඵලදායී ප්‍රතිඵල සහ නව අත්දැකීම් අනුව 1997 ජාතික වෙරළ කලාප කළමනාකරණ සැලැස්ම මගින් විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය අනුමත කරන ලද අතර ස්ථාන 23ක් සඳහා එය ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කරන ලදී. මෙයට අමතරව ''*වෙරළ 2000 සම්පත් කළමනාකරණය සඳහා වූ ක්‍රමෝපාය*'' මගින් ද විශේෂ කළමනාකරණ ප්‍රදේශ ප්‍රවේශය යොදා ගැනීම නිර්දේශ කරන ලදී. විශේෂ කළමනාකරණ ප්‍රදේශ සඳහා වූ ස්ථාන තෝරාගැනීම සඳහා පහත සඳහන් නිර්නායක මත පදනම් විය.

(අ) සමාජ ආර්ථික සහ පාරිසරික ගැටලුවල උග්‍රතාව

(ආ) වෙරළබඩ පරිසර පද්ධතිවල සාපේක්ෂ සාරවත්භාවය සහ බහුලත්වය

(ඇ) ප්‍රදේශයේ ප්‍රමාණය, ස්ථානය, නෛතික සහ ආයතනික සාධක මත පදනම් වූ කළමනාකරණ ශක්‍යතාව

(ඈ) ආර්ථික සංවර්ධනය සඳහා එම ප්‍රදේශය පවත්නා හෝ විභව වටිනාකම

ස්ථාන තෝරා ගැනීමේ නිර්ණායකයන්ට අමතරව, අනුගමනය කළයුතු සැලසුම් පියවරද 1997 වෙරළ කලාප කළමනාකරණ සැලැස්ම මගින් ඉදිරිපත් කරන ලදී. 2005 වසරේදී වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව සහ ''ලෝක සංරක්ෂණ සංගමය'' (IUCN) සමඟ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ ගෝලීය පරිසර පහසුකම් යටතේ රැකව, උස්සන්ගොඩ, කලමැටිය පරිසර විශේෂ කළමනාකරණ සැලැස්මක් වෙරළබඩ ග්‍රාම නිලධාරි කොට්ඨාශ 20 ආවරණය කරමින් ක්‍රියාත්මක කරන ලදී. මෙම සැලැස්මේ අරමුණ වූයේ රැකව - උස්සන්ගොඩ - කලමැටිය වෙරළබඩ පරිසර පද්ධතියේ ස්වභාවික සම්පත් පෝෂණය සහතික කරමින් එම ප්‍රදේශය තුළ ජීවත් වන ප්‍රජාවගේ සමාජීය තත්ත්වය නගා සිටුවීමයි. ඉන් අනතුරුව, ආසියානු

සංවර්ධන බැංකුව සහ නෙදර්ලන්ත රජයේ මූල්‍යාධාර සපයන ලද වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපාතිය යටතේ (2000-2007) විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලියේ දෙවන වටය ආරම්භ කරමින් සම්පූර්ණ විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය කල්පිටිය බාර්පරය, මීගමු කලපුව සහ මුතුරාජවෙල තෙත්බිම, ලුනාව කලපුව, මාදු ගඟ, හබරාදූව - උනවටුන, හික්කඩුව මාවැල්ල සහ කලමැටිය යන ස්ථානයන්හි ක්‍රියාත්මක කරන ලදී. විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීමට අමතරව වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් දිස්ත්‍රික් මට්ටමේ ව්‍යාපෘති සඳහා ද මෙය හඳුන්වා දෙන ලදී. මේ අනුව විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් කිරීමේ කටයුතු නොරාඩ් මූල්‍යාධාර යටතේ ක්‍රියාත්මක කල *"හම්බන්තොට ඒකාබද්ධ වෙරළ කලාප කළමනාකරණ ව්‍යාපෘතියට"* එක් කරන ලදී. මේ මගින් විශේෂ කළමනාකරණ ප්‍රදේශ (SMA) ක්‍රියාවලිය හම්බන්තොට වෙරළ ආශ්‍රිත වැලි කඳු, මාවැල්ල කලපුව සහ කුඩාවැල්ල හුම්මානය වෙරළ ප්‍රදේශ ඉලක්ක කරන ලදී.

### 5.2 උගත් පාඩම් සහ දුර්වලතා

ශ්‍රී ලංකාවේ වෙරළ සම්පත් කළමනාකරණය හා සම්බන්ධ විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම රාජ්‍ය අංශයේ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානත්වයෙන් සිදු විය. විදේශ අරමුදලින් ක්‍රියාත්මක වූ සුවිශේෂී ව්‍යාපෘති හතරක් යටතේ 1992 සිට වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් 12ක් සැලසුම් කොට ක්‍රියාත්මක කරන ලදී. ශ්‍රී ලංකාවේ විශේෂ කළමනාකරණ ප්‍රදේශ වැඩසටහන් පිළිබඳව කෙම් ලොව්රි (1997), ලැන්ඩ්ස්ටොම් (2006) ඩී. සිල්වා සන්ජීව (2012) විසින් කරන ලද අගැයීම් සහ විමර්ශනයන් ද වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සතු අත්දැකීම් සහ උගත් පාඩම් මගින් හඳුනාගන්නා ලද අඩුපාඩු නෛතික හා ආයතනික, බලපෑම් සඵලතාවය, තිරසාරභාවය සහ අභියෝග යන ක්ෂේත්‍ර යටතේ පෙන්වා දිය හැකිය.

#### 5.2.1 නෛතික හා ආයතනික

විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය හා සම්බන්ධව නෛතික හා ආයතනික අංශ ගත්කළ, අතීතයේ දී පහත දැක්වෙන පාඩම් සහ දුර්වලතා අත්දැක ඇති අතර ඒවා පහත සඳහන් පරිදි සාරාංශගත කළ හැක.

- විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් කිරීම සහ තිරසාරභාවය සහතික කිරීම සඳහා අවශ්‍ය නෛතික රාමුවක් නොමැතිව සහභාගිත්ව හෝ පරිපාලනමය වැඩ පිළිවෙල යටතේ පමණක් ඵලදායී නොවේ.

- වෙරළ සංරක්ෂණ පනත මගින් හෝ වෙනත් නීතියක් මගින්, විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා ස්ථාපිත කරන ලද ප්‍රජා සම්බන්ධීකරන කමිටු නෛතික වශයෙන් හඳුනාගෙන/පිළිගෙන නොමැත. නෛතික හා පරිපාලන වශයෙන් ප්‍රජා සම්බන්ධීකරණ කමිටු පිළිනොගැනීම විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ බල අධිකාරිය දුර්වල කරනු ලබයි.

- විශේෂ කළමනාකරණ ප්‍රදේශ වැඩසටහන් යටතේ ස්ථාපිත කරන ලද ප්‍රජා සම්බන්ධීකරණ කමිටුවල ක්‍රියාකාරිත්වය මූල්‍යාධාර සැපයූ ව්‍යාපෘතිවල අවසානයත් සමගම මූල්‍යමය සම්පත් සහ තාක්ෂණික සම්පත්වල පැවති හිඟකම මත අක්‍රීය වී ඇත.

- මුල් අවස්ථාවලදී සැලසුම් කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේ දී ප්‍රාදේශීය ලේකම්වරුන් ඉටුකරන ලද වැදගත් භූමිකා, එකී භූමිකා පශ්චාත් ව්‍යාපෘති ක්‍රියාදාමයේ දී නෛතිකව සහ ආයතනිකව හඳුනාගැනීමක් නොමැතිවීම නිසා වියැකී ගොස් ඇත. මෙයට අමතරව ව්‍යාපෘතිය අවසානයේදී ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන් විසින් ඉටුකළ යුතු අපේක්ෂිත කාර්යයන් සහ ඔවුන්ගේ ධාරිතාව, සම්පත් සහ හැඩ ගැසීම සමග ගැලපීමක් නොතිබිණ.

- විශේෂ කළමනාකරණ ප්‍රදේශ වැඩසටහන් ඉදිරියට ගෙනයාම සහතික කිරීම සඳහා නව රාජ්‍ය නොවන සංවිධාන ස්ථාපිත කිරීම සහ පවත්නා සංවිධාන ශක්තිමත් කිරීම මගින් සකස් කරන ලද ස්ථාපිත කරන ලද උපකාරක ආයතන වැඩපිළිවෙල බොහෝ අවස්ථාවලදී අසාර්ථක වී ඇත.

- ව්‍යාපෘති අදියර අවසන් වීමෙන් පසුව, පසු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රජා සම්බන්ධීකරණ සමිටුවට බාහිර ආධාර මත සම්පූර්ණයෙන් යැපීමට සිදුවිය. මෙය බොහෝදුරට විශාල ප්‍රමාණයේ ක්‍රියාකාරකම් පිළිබඳව වලංගුවේ. සම්පූර්ණයෙන් මූල්‍යාධාර මත යැපීම් තත්ත්වයේ සිට නිතැතින් සම්පූර්ණයෙන් ස්වාධීන තත්ත්වයකට මාරුවීමේ දී ආයතන ධාරිතාවයන් වැඩිකර ගැනීම සඳහාත් ක්‍රියාවලින් ඒකරාශි කර ගැන්ම සඳහාත් කාලපරාසයක් ලබා දී නොමැත.

- ප්‍රජාව සඳහා නෛතික අධිකාරිය, පිළිගැනීම මෙන්ම පුද්ගලික ප්‍රතිලාභ නොමැතිවීම හෝ ප්‍රමාණවත් නොවීම විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය සඳහා ප්‍රජා සහභාගිත්වය කෙරෙහි බලපාන ලදී.

- ප්‍රාදේශීය ආයතන ව්‍යුහයේ සහ ක්‍රියාකාරිත්වයේ විනිවිදභාවය නොමැතිව තීරණ ගැනීමේ ක්‍රියාවලිය, ප්‍රතිලාභ ව්‍යාප්ත කිරීමේදී/බෙදා ගැනීමේදී අහිතකර ලෙස බලපා ඇත.

- ප්‍රජාවගේ සහ නානාවිධ කණ්ඩායම් අතර සහභාගිත්ව සහ ඒකාග්‍රතා මත පදනම් වූ සම්පත් පාලන ආයතනයන්ගේ බලපෑම නිසිලෙස ඇගයීමට අපොහොසත් වී ඇත.

- විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් ක්‍රියාවලිය බහුවිධ පාර්ශ්ව කණ්ඩායම් සමග ගනුදෙනු කිරීම/සාකච්ඡා කිරීම, දැනුමේ ඇති වෙනස්කම් සැලසුම් සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේ දී සහභාගිත්වය සහ ඒකාග්‍රතා ගොඩනැගීම කෙරෙහි විශාල වශයෙන් බලපා හැක.

- විශේෂ කළමනාකරණ ප්‍රදේශ (SMA) ක්‍රියාවලියේ දී ප්‍රාදේශීය මට්ටමේ සහභාගිත්ව ක්‍රියාවලියක් සඳහා මගපෙන්වීමක් ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශන මගින් සැපයුවද තීරණ ගැනීමේ ක්‍රියාවලිය මධ්‍යම රජයේ ආයතන සතුව පැවතීම හා ප්‍රමාණවත් පසු විපරම් සහ සක්‍රීය ප්‍රජා සජීවීකරණය නොමැතිවීම තුළ ශක්තිමත් ප්‍රාදේශීය මට්ටමේ ආයතන ඉස්මතු නොවිය.

### 5.2.2 බලපෑම් සහ සඵලතාව

- දිගුකාලීන තිරසාරභාවය සහ සඵලතාව සහතික කිරීම සඳහා විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය ජාතික මට්ටමේ සමස්ත වෙරළ සම්පත් කළමනාකරණ සහ සැලසුම් ක්‍රියාවලියේ කොටසක් විය යුතුය.

- විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලියේ සමස්ත තත්ත්වය විමර්ශනය කිරීමේදී වැඩි ස්ථාන සංඛ්‍යාවක ප්‍රමාණවත් සඵලතාවයක් පෙන්නුම් කර ඇත. (ශ්‍රී ලංකාවේ විශේෂ කළමනාකරණ ප්‍රදේශ ඇගයීම 2014).

- විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස අනෙකුත් ආයතන මගින් ගන්නා ලද සංරක්ෂණ පිළියම්වල තත්ත්වය වැඩි දියුණු වී ඇත. (ශ්‍රී ලංකාවේ විශේෂ කළමනාකරණ ප්‍රදේශ ඇගයීම 2014)

- වෙරළ සම්පත් කළමනාකරණයේ වැදගත්කම පිළිබඳව සමස්ත දැනුවත්භාවය පාර්ශ්වකරුවන් අතර ප්‍රමාණවත් මට්ටමක ඉහළ ගොස් ඇත.

- පාර්ශ්වකරුවන් සහ පරිසර උද්‍යෝගී ප්‍රජාව අතර සම්පත්වල හිමිකාරිත්වය පිළිබඳ හැඟීම විශේෂ කළමනාකරණ ක්‍රියාවලිය තුළින් ඇති විය.

- තිරසාරත්වය පිළිබඳ ඉස්මතු වූ ගැටලු හේතුකොට ප්‍රජාවගේ ජීවන තත්ත්වය උදෙසා ආරම්භකරන ලද ජීවනෝපාය සංවර්ධන ප්‍රයත්නයන්ගේ බලපෑම ඉතා අඩු මට්ටමක විය.

- තිරසාරත්වය සහතික කරන අතර පාර්ශ්වකරුවන් අතර පොදුවේ හෝ පුද්ගලික වශයෙන් ඉලක්ක කොට ක්‍රියාත්මක කළ ක්‍රියාකාරකම් මගින් විශාල බලපෑමක් ජනිත කොට ඇත.

- විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් සහ අත්කර ගන්නා ලද සත්‍ය ප්‍රතිඵල අනුව ක්‍රියාත්මක කරනලද සමීක්ෂණයට භාජනය වූ ස්ථාන අතුරින් 50% වැඩි ප්‍රමාණයක් අපේක්ෂිත අරමුණු අත්කරගෙන ඇත. (රැකව 59%, මාවැල්ල-කුඩාවැල්ල 54%, මීගමුව 55%, බාර්පරය 60%, ලුනාව 66%, පුත්තලම කලපුව 56%, මඩකලපුව 54%) (විශේෂ කළමනාකරණ ප්‍රදේශ ඇගයීම 2014.)

### 5.2.3 තිරසාරත්වය සහ අභියෝග

2014 දී තෝරාගන්නා ලද විශේෂ කළමනාකරණ ප්‍රදේශය පිළිබඳව කරන ලද ඇගයීම් අධ්‍යයනයට අනුව පහත සඳහන් නිර්ණායක යොදා ගනිමින් තිරසාරත්වය මිනුම් කරන ලදී.

1. ව්‍යාපෘති කාලයෙන් පසු ප්‍රජා සම්බන්ධීකරණ කමිටුවල ක්‍රියාකාරිත්වය

2. ව්‍යාපෘතිය මගින් ස්ථාපිත කරන ලද ආයතනික යාන්ත්‍රණයේ අඛණ්ඩ පැවැත්ම

3. විශේෂ කළමනාකරණ ප්‍රදේශ සඳහා වූ අනෙකුත් ප්‍රභවයන්ගෙන් ලැබෙන මූල්‍යාධාර ඉදිරි පැවැත්ම
4. විශේෂ ප්‍රදේශ කළමනාකරණ ක්‍රියාවලිය තුළින් හඳුන්වාදෙන ලද ව්‍යාපෘති වැඩසටහන් වල ඉදිරි පැවැත්ම
5. ව්‍යාපෘතියෙන් පසුව වෙරළ සංරක්ෂණය සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ සබඳතා

**අධ්‍යයනයේ ප්‍රතිඵල**

- ❖ ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ආයතනය කුමක් වුවද, ව්‍යාපෘතිය යටතේ ස්ථාපිත කරන ලද ප්‍රජා සම්බන්ධීකරණ කමිටු ව්‍යාපෘතියෙන් පසුව අක්‍රිය වී ඇත.
- ❖ අවස්ථා කිහිපයකදී හැර විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය සඳහා මූල්‍ය උපකාරයන් ව්‍යාපෘතියෙන් පසු අවදියේ නතර වී ඇත.
- ❖ අවස්ථා කිහිපයකදී හැර ව්‍යාපෘති සහ වැඩසටහන් ව්‍යාපෘතියන් පසු කාලයේ අඛණ්ඩව පවත්වාගෙන යාමට නොහැකි වී ඇත.

මෙයට අමතරව පහත සඳහන් දුර්වලතා ද විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලියේ තිරසාරභාවය දුර්වල වීමට අතීතයේ දී බලපාන ලදී.

- ❖ සංරක්ෂණ පිළියම් යෙදීමේදී භාවිතා කරන තාක්ෂණික පිළියම්වල නොගැලපීම නිසා අහිතකර බලපෑම් ඇතිවීම.
- ❖ අනෙකුත් අංශයන් පිළිබඳව අදාළ ප්‍රතිපත්ති විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය කෙරෙහි අහිතකර ලෙස බලපෑම මගින් සාර්ථකත්වයට තර්ජන එල්ලවීම.
- ❖ විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය සමග එක්වී ඇති රාජ්‍ය නොවන සංවිධාන සහ ප්‍රජාමූල සංවිධානයන්ගේ සීමාවන් ප්‍රධාන අරමුණු ළඟාකර ගැනීම වැළැක්වීම.
- ❖ පාරිසරික තක්සේරු ප්‍රමාණවත් ලෙස භාවිතා නොකිරීම හේතුකොට විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය සඳහා නව ආර්ථික ප්‍රතිපත්ති ගැලපීමට විශාල අභියෝගයක් වීම.
- ❖ දැනට පවත්නා නෛතික විධිවිධානවලට අනුකූලව ආයතනික යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීම විශේෂ කළමනාකරණ ක්‍රියාවලියේ තිරසාරභාවය සහතික කිරීම සඳහා විශාල අභියෝගයක් වනු ඇත.

**5.3 විශේෂ කළමනාකරණ ප්‍රදේශ (SMA) සඳහා වූ නව නෛතික විධිවිධාන**

විශේෂ කළමනාකරණ ප්‍රදේශ ලෙස වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව යොදාගත්ත ද 2011 වන තෙක් විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය සඳහා සැලසුම් සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විධිමත් නෛතික විධිවිධාන නොවීය. වෙරළ සංරක්ෂණ පනතේ හෝ වෙනත් පනත් යටතේ නෛතික විධිවිධාන නොමැතිවීම විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලියේ දිගුකාලීන පැවැත්මට අහිතකර ලෙස බලපාන ලදී. ප්‍රමාණවත් නෛතික විධිවිධාන නොමැති වීමෙන් බාධාවන් ඉස්මතු වුවද, ආයතනික සහ පරිපාලනමය වැඩ පිළිවෙලක් වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් සැලසුම් සම්පාදනයට සහ ක්‍රියාත්මක කිරීමට යොදාගන්නා ලදී. මෙය අතීතයේ දී ප්‍රාදේශීය ලේකම්වරු සහ අනෙකුත් අදාළ ආයතන එක්ව සහභාගිත්ව කළමනාකරණ ප්‍රවේශය මත සිදු කරන ලදී.

2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනත මගින් අවශ්‍ය නෛතික විධිවිධාන හඳුන්වා දෙන ලදී. ශ්‍රී ලංකාවේ විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම තිරසාර සහ ඵලදායි කළමනාකරණ සැලසුම් උපකරණයක් ලෙස දිගටම පවත්වාගෙන යාමට නව අවස්ථාවන් එමගින් උදා කරන ලදී. නව විධිවිධාන යටතේ (22ඉ(1) වගන්තිය) විශේෂ කළමනාකරණ ප්‍රදේශ *ගැසට්* නිවේදනයක් මගින් වෙරළ කලාපයට අයත් භූමිය හෝ ඊට ආසන්න ප්‍රදේශ ඇතුළත් වන ලෙස ප්‍රකාශයට පැමිණවිය හැක. අර්ථකථනය කරන ලද විශේෂ කළමනාකරණ ප්‍රදේශයන්හි සම්පත් කළමනාකරණය සහ සැලසුම් කිරීමට සහභාගිත්ව ප්‍රවේශයක් යොදා ගැනීම ද නව නෛතික විධිවිධාන මගින් හඳුනාගෙන ඇත. නව නෛතික විධිවිධානයන්ට අනුව විශේෂ කළමනාකරණ ප්‍රදේශ ප්‍රකාශයට පැමිණවිය හැක්කේ එම ස්ථාන සංශෝධිත පනත යටතේ විධිවිධාන අනුව පිළියෙල කරන ලද වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්මට ඇතුළත් කර ඇත්නම් පමණි.

විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් කිරීම සහ කළමනාකරණය සඳහා ඵලදායී ආයතනික ව්‍යුහයක් සම්පාදනය කිරීම සඳහා නව රෙගුලාසි 2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනතේ තුන ඇ (කොටසේ) 111 ඇ 2 වන වගන්තිය යටතේ සපයා ඇති නෛතික විධිවිධානවලට අනුකූලව පිළියෙල කළ යුතුය. විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලියේ අරමුණු ළඟාකර ගැනීම සඳහා රෙගුලාසි සම්පාදනය කොට අනුමැතිය සඳහා පහසු ආකාරයට ඉදිරිපත් කළ යුතුය. මෙම රෙගුලාසි අනුමත නොකළ හොත් මෙම රෙගුලාසි යටතේ කරනු ලබන යම් ක්‍රියාවක් කිසිදු අගතියකින් තොරව අවලංගුවේ. නව රෙගුලාසි සම්පාදනය කළ යුත්තේ විශේෂ කළමනාකරණ ප්‍රදේශ පරිපාලනය කළ යුතු ආකාරය පිළිබඳවය.

මේ අනුව මධ්‍යම රජයේ ආයතන, බාහිර ප්‍රතිලාභීන්, රාජ්‍ය නොවන සංවිධාන, අදාළ ප්‍රජාව ඇතුළු පාර්ශ්වකරුවන්ගේ දායකත්වයෙන් පවත්නා නෛතික විධිවිධාන විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාත්මක කිරීම සඳහා භාවිතා කළ යුතුය.

### 5.4 විශේෂ කළමනාකරණ ප්‍රවේශය ශක්තිමත් කළ යුත්තේ සහ ප්‍රවර්ධනය කළ යුත්තේ ඇයි ?

ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ වෙරළ සම්පත් කළමනාකරණය සඳහා වඩාත් ඵලදායී ප්‍රවේශයක් ලෙස සහභාගිත්ව කළමනාකරණ මූලධර්ම මත පදනම් වූ විශේෂ කළමනාකරණ ප්‍රදේශ සංකල්පය සලකනු ලබයි. අනෙකුත් ප්‍රවේශයන් හා සැසඳීමේදී මේ මගින් වෙරළබඩ පරිසර පද්ධති සහ වෙරළබඩ සහ සමුද්‍රීය අතර භාවිතයන් සමග ඇති සංකීර්ණ සබඳතාව නිසි පරිදි පිළිගනු ලබයි. ස්වභාවධර්මයේ භෞතික ක්‍රියාවලින් සහ විවිධ වර්ගයේ වෙරළබඩ ක්‍රියාකාරකම් අතර සම්බන්ධක සහ සුසංයෝජනය විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය මගින් ප්‍රවර්ධනය කෙරේ. මානව පද්ධති මෙන්ම වෙරළබඩ සම්පත් පද්ධති යන දෙකම පිළිබඳව නම්‍ය වූ කළමනාකරණය මගින් නිසි අවධානය යොමු කරයි. ඒකාබද්ධ වෙරළ සම්පත් කළමනාකරණය සඳහා වූ අතිරේක උපකරණයක් ලෙස විශේෂ කළමනාකරණ ප්‍රදේශ (SMA) යොද ගැනීමේ ප්‍රධාන බලපෑම් සාධක පහතින් සඳහන් පරිදි සාරාංශගත කෙරේ.

- වෙරළබඩ සම්පත් හායනය, අධි උපයෝජනය සහ භාවිතාකරන්නෝ ගැටලු අවමකිරීම පිණිස දේශීය සහ සාම්ප්‍රදායික කළමනාකරණ පරිතයන් නෛතික සහ වඩා පුළුල් පාලන රාමුව තුළ විධිමත් කිරීමේ අවශ්‍යතාවය පිළිගැනීම.

- පොදු හෝ රජයේ අයිතිය යටතේ පවත්නා වෙරළබඩ සම්පත්වල ගති ලක්ෂණ සහ ඒවා වෙත ඇති විවෘත පිවිසුමේ වත්මන් තත්ත්වය වෙරළබඩ සම්පත් කළමනාකරණය සඳහා දැඩි අභියෝගයන් ඉදිරිපත් කරයි.

- මානව ක්‍රියාකාරකම් මෙන්ම ස්වභාවික සංසිද්ධි හේතුකොට වෙරළබඩ පරිසර පද්ධති සීඝ්‍රව හායනයට ලක්වෙන අතර ඒ සඳහා භාවිතාකරුවන් කේන්ද්‍ර කොටගත් කළමනාකරණ ප්‍රවේශයන් ඉතා වැදගත් වේ.

- සමුද්‍ර සහ වෙරළබඩ සම්පත් ප්‍රමාණය ඉක්මවා භාවිතා කිරීම සහ දුගීබව ව්‍යාප්ත වීමට එරෙහිව විධිමත් සහ ඵලදායි ප්‍රවේශයක අවශ්‍යතාවය.

- ප්‍රාදේශීය මට්ටමේ කළමනාකරණ මැදිහත්වීම සඳහා පහසුකම් සැපයීම සහ ජාතික මට්ටමේ වෙරළබඩ සම්පත් කළමනාකරණ ප්‍රතිපත්ති සහ රෙගුලාසි සමග අනුකූලතාව හා සංගතබව පවත්වාගෙන යාම.

- සම්පත් කළමනාකරණ සහ තීරණ ගැනීමේදී නීත්‍යානුකූල භාවය සහ විනිවිද භාවය පිළිබඳ ප්‍රජාවගේ ඇති ඉල්ලුම.

- වෙරළබඩ ප්‍රදේශයන්හි නව සංවර්ධන කටයුතුවලට සමගාමීව ඉහළ යමින් පවත්නා ගැටලු අවම කිරීම.

- සිවිල් සමාජ තුළ හිමිකාරිත්වය පිළිබඳ හැඟීම් ගොඩනැගීම, බල ගැන්වීම සහ ප්‍රජා සංවිධාන සහ ප්‍රජාව වෙරළබඩ සම්පත් තිරසාර ලෙස කළමනාකරණය සඳහා බල ගැන්වීම.

- වෙරළබඩ සම්පත් භාවිතය සම්බන්ධ ස්ත්‍රී පුරුෂ බව පිළිබඳ ගැටලු (Gender Issues) කෙරෙහි අවධානය යොමු කිරීම.

- ස්ථානගත වෙරළබඩ පාරිසරික ගැටලු විසඳුම සඳහා තිරසාර ජීවනෝපාය සංවර්ධනය බද්ධ කිරීම.

- ස්වභාවික විපත් වලට එරෙහිව වෙරළබඩ ප්‍රජාවගේ දරාගැනීමේ හැකියාව බල ගැන්වීම හා අන්තරායන් අවම කිරීම.

- දේශපාලන සහ පරිපාලන ක්ෂේත්‍රයන්හි මෑතදී ඒත්තු ගන්වන ලද විමධ්‍යගත ප්‍රතිපත්ති පිළිබඳ ධනාත්මක දක්ම තුළින් කළමනාකරණ ප්‍රදේශ ප්‍රවේශය හරහා තිරසාර වෙරළ සම්පත් කළමනාකරණයට හිතකර පරිසරයක් නිර්මාණය කිරීම.

5.5 ව්‍යාපෘති ප්‍රවේශයෙන් වැඩසටහන් ප්‍රවේශය සඳහා විස්ථාපනයවීමේ අවශ්‍යතාව

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව සහ අනෙකුත් ආයතන මගින් දියත් කරන ලද දශක දෙකහමාරක් පමණ වූ විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සම්පූර්ණයෙන් ව්‍යාපෘති පදනමක් මත සිදු කෙරිණ. මෙහි ප්‍රතිපලයක් ලෙස විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලියේ සැලසුම් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵල සහ එහි දිගුකාලීන තිරසාරභාවය ගැටලුකාරී විය. මෙම තත්ත්වය විධිමත් නෛතික සහ ආයතනික රාමුවක් නොමැතිවීම හේතුකොට වැඩිදුරටත් සංකීර්ණ විය. ඒ අනුව මෙම ව්‍යාපෘති අවසන් වීමෙන් පසු පහසුකම් සපයනු ලබන ප්‍රධාන ආයතනයන්ගේ දිගුකාලීන කැපවීම ද නැවතින. ඒ ලෙසම, රාජ්‍ය නොවන සංවිධාන වැනි ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාවලියට සහභාගි වූ ආයතනයන්ට ද ක්‍රියාවලිය මූල්‍ය දුෂ්කරතා, ධාරිතාව නොමැතිවීම මෙන්ම නෛතික සහ පරිපාලන වශයෙන් පිළිනොගැනීම හේතුකොට ඉදිරියට ගෙන යාමට අපහසු විය. ක්‍රියාත්මක කිරීමේ අත්දැකීම් අනුව ව්‍යාපෘති අවසන් වීමෙන් පසුව පසු විපරම් ක්‍රියාවලින්, සංරක්ෂණ සහ ජීවනෝපායන් ඉහළ නැංවීම වැනි පශ්චාත් ව්‍යාපෘති කටයුතු එකවර නැවතී ඇති බව පෙනී ගොස් ඇත. මේ නිසා නව නීති පදනම් කොට යෝජිත රෙගුලාසි උපයෝගී කරගනිමින් විශේෂ කළමනාකරණ ප්‍රදේශ ප්‍රවේශයට අදළ සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම වඩාත් වැඩසටහන් මත පදනම් වූ ප්‍රවේශයක් වෙත සහභාගිත්ව කළමනාකරණ මූලධර්මයන් සහ මාර්ගෝපදේශ යොදගනිමින් විස්ථාපනය විය යුතුය. මෙහිදී නෛතික ප්‍රවේශයට අනුගත කරන ලද විශේෂ කළමනාකරණ ප්‍රදේශයේ සංරක්ෂණ කටයුතු සහ සංවර්ධන කටයුතු තුළනය කල යුතුය. ඉහත කරුණු සලකා බැලීමේදී ස්ථානයේ සිටින ප්‍රජාවගේ සක්‍රීය සහභාගිත්වය හඳුනාගනිමින් වැඩසටහන් ප්‍රවේශයක් යොද ගත යුතුය. විශේෂ කළමනාකරණ වැඩසටහන පවත්නා නෛතික විධිවිධාන වලට අනුකූලව පහත සඳහන් යොමු රීති සහ යෝජිත රෙගුලාසි අනුව සම්පාදනය වනු ඇත.

(අ) වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව තුළ අධ්‍යක්ෂ, වෙරළබඩ සම්පත් කළමනාකරණ යටතේ වෙනම විශේෂ කළමනාකරණ ප්‍රදේශ ඒකකයක් අංශයක් පිහිටුවනු ඇත.

(ආ) විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් සම්පාදනයට සහ ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය පහසුකම් රජයෙන් ලබාගැනීම තහවුරු කිරීමට වෙනම වැය ශීර්ෂයක් (Financial vote) ස්ථාපිත කරනු ඇත.

(ඇ) නම් කරන ලද ස්ථානයන්හි ප්‍රජාවට තීරණ ගැනීමේ අධිකාරිය ලබාදීමටත් ප්‍රජා සහභාගිත්වයේ නීත්‍යානුකූල භාවය තහවුරු කිරීමටත් නව රෙගුලාසි සකසනු ඇත.

(ඈ) විශේෂ කළමනාකරණ ප්‍රදේශ සඳහා නියෝජිතයන් තෝරා ගැනීමේ දී විශේෂ කළමනාකරණ කමිටු සහ බිම් මට්ටමේ ක්‍රියාදමය සඳහා නෛතික පිළිගැනීම ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය පිළිගනු ඇත.

(ඉ) විශේෂ කළමනාකරණ ප්‍රදේශ කමිටු සඳහා නව රෙගුලාසි යටතේ මෙහෙයුම් නීති හෝ ආචාර ධර්ම සංග්‍රහයක් කරනු ඇත.

(ඊ) විශේෂ කළමනාකරණය සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කිරීම සඳහා කලාපීය රටවල් සමග සහභාගීත්ව කළමනාකරණයේ අත්දැකීම් බෙද ගැනීම සඳහා වැඩ පිළිවෙලක් යොදනු ඇත.

(උ) නව නිර්ණායක අනුව විශේෂ කළමනාකරණ ප්‍රදේශ ලැයිස්තුවක් පිළියෙල කොට මෙම සැලැස්මට ඇතුළත් කරනු ඇත.

5.6 විශේෂ කළමනාකරණ ප්‍රදේශ (SMA) ක්‍රියාවලියේ සඵලත්වය වැඩි දියුණු කිරීම

විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාම, ක්‍රියාත්මක කිරීම, සැලසුම් කිරීම පිළිබඳව යම් දුර්වලතා අත්දුටුවද වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය හා බැඳුන ප්‍රධාන උත්සාහයන් මගින් වෙරළ සම්පත් කළමනාකරණ ක්‍රමවේදයක් ලෙස එහි ඵලදායිතාව සහ ගැලපීම හඳුනාගෙන ඇත. එලෙසම ලබාගත් අත්දැකීම් අනුව වඩාත් හොඳ ප්‍රතිඵල ලබා ගැනීම සඳහා කලයුතු වෙනස්කම්ද දෙපාර්තමේන්තුව මගින් හඳුනාගෙන ඇත. සංකීර්ණ පාරිසරික තත්ත්වයන් තුළ වෙරළබඩ සම්පත් සහ එහි පරිසරය කළමනාකරණය සඳහා වඩාත් යෝග්‍ය ප්‍රවේශයක් ලෙස හැඟී ගියද, ඉහතින් දක්වන ලද ආකාරයට විවිධ දුර්වලතා සහ බාධක මගින් කළමනාකරණ ක්‍රියාවලියෙන් ලබාගත හැකි උපරිම ප්‍රතිලාභ ලබාගැනීමට දුෂ්කර වී ඇත. ඊට අමතරව විශේෂ කළමනාකරණ ප්‍රදේශ ප්‍රවේශයේ තිරසාරභාවය සංකීර්ණ තත්ත්වයකට පත්වන ලදී. ව්‍යාපෘති සඳහා වන බාහිර මූල්‍යාධාර යටතේ මූලික වට දෙක තුළදී දියත් කරන ලද විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම ස්ථාන 12කදී සිදු කරන ලදී. අනෙකුත් විශේෂ කළමනාකරණ ප්‍රදේශ වැඩසටහන් හම්බන්තොට ඒකාබද්ධ වෙරළ කලාප කළමනාකරණ ව්‍යාපෘතිය (HICZMP) සහ (UNDP-GEF) ව්‍යාපෘතිය මගින් අනෙකුත් නම් කරන ලද ස්ථානයන්හි විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන ලද අතර වටිනා අත්දැකීම් මෙම

ප්‍රවේශය ශක්තිමත් කිරීම සඳහා ලබා දී ඇත. විශේෂ කළමනාකරණ සංකල්පය සහ ශ්‍රී ලංකාව තුළ එය සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳව විද්වතුන් විසින් කරන ලද ගැඹුරු විමර්ශනයක් සහ ඇගයීම් නව යොමු රීති (Guidelines) පටිපාටි සැකසීම සඳහා ප්‍රයෝජනවත් විය. ඊට අමතරව වඩාත් වැදගත් වනුයේ විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලියේ සඵලතාව ඉහළ නැංවීම සඳහා 2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනත මගින් හඳුන්වාදෙන ලද නෛතික විධිවිධානයන්ය.

ලෝක පරිසර සංරක්ෂණ සංගමය (IUCN) කොළඹ කාර්යාලය මගින් 2009 දී ශ්‍රී ලංකාවේ කඩොලාන පිළිබඳ අනාගතය (MFF) වැඩසටහනේ ජාතික මෙහෙයුම් කමිටුව සඳහා සම්පාදනය කරන ලද ජාතික ක්‍රමෝපාය සහ ක්‍රියාකාරී සැලැස්ම මගින් පරිසර පද්ධති මත පදනම් වූ ඒකාබද්ධ වෙරළ සම්පත් කළමනාකරණ ප්‍රතිපත්තියක් යොදා ගැනීම නිර්දේශ කොට ඇත. මෙවැනි වෙනසක් කල හැක්කේ ප්‍රතිපත්තිමය වශයෙන් මෙම නිර්දේශයන් ඉහළම මට්ටමින් පිළිගැනීමක් වෙරළ සංරක්ෂණ පනත ඒ ආකාරයට ගැලපෙන ලෙස වෙනස් කිරීමක් මගිනි. මේ පිළිබඳව අවධානය ඉදිරි වසර පහ තුළ මෙම සැලැස්ම යාවත්කාලීන කරනු ලබන අවස්ථාවේදී සැලකිල්ලට භාජනය කළ හැක.

විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් කිරීමේ සඵලතාව වැඩි දියුණු කිරීම මූලික අවශ්‍යතා පිළිබඳ අවබෝධයක් මත පදනම්ව ප්‍රධාන කරුණු කිහිපයක් ආමන්ත්‍රණය කිරීම අවශ්‍ය වේ.

පූර්ව සැලසුම් අදියර

1. රටතුළ සමස්ථ විශේෂ කළමනාකරණ ප්‍රදේශ වැඩසටහන සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම ව්‍යාපෘති ප්‍රවේශයේ සිට වැඩසටහන් ප්‍රවේශයට විස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය.

2. 2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ සංශෝධන පනතේ විධිවිධාන අනුව නව නිර්ණායකයන් පදනම් කොට විශේෂ කළමනාකරණ ප්‍රදේශ සඳහා සුදුසු ස්ථාන ලැයිස්තුවක් සකස් කොට මෙම සැලැස්මට ඇතුළත් කළ යුතුය.

3. නෛතික සීමාවන් නිර්ණය කිරීම සඳහාත් ප්‍රමුඛතාවන් හඳුනා ගැනීම සඳහාත් එක් එක් ස්ථානය අළලා ප්‍රාථමික තත්ත්ව විශ්ලේෂණ වාර්තාවක් පිළියෙල කළ යුතුය.

4. වඩාත් පුළුල් පාර්ශ්වකරුවන්ගේ උපදේශකත්වය සහිතව නව නීතිවලට අනුකූලව අවශ්‍ය රෙගුලාසි කෙටුම්පත් කොට ගැසට් කිරීම සඳහා අනුමැතිය ලබාගත යුතුය.

5. විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යභාරය පවරා ගත යුතු අතර විශේෂ කළමනාකරණ ප්‍රදේශ සඳහා වෙනම අංශයක් දෙපාර්තමේන්තුව තුළ ස්ථාපිත කළ යුතුය.

6. වෙරළ කලාපයේ සමාජ ආර්ථික පාරිසරික ප්‍රවනතාවයන් සැලකිල්ලට ගනිමින් නව නෛතික විධිවිධාන සහ රෙගුලාසි මත විශේෂ කළමනාකරණ ප්‍රදේශ පිළිබඳ ගුරු උපදේශ ඇතුළත් පොතක් සැකසීම.

සැලසුම් අදියර

1. විශේෂ කළමනාකරණ ප්‍රදේශ ප්‍රවේශය පිළිබඳව ස්ථිතික තත්ත්වයක් නොපවතී, එක් එක් සුවිශේෂී වූ (unique) ඒකාබද්ධ ක්‍රමවේදයන් යොදා ගැනීමේ අවශ්‍යතාවන් සැලකිය යුතු අතර සැලසුම් කිරීම ස්ථානීය ගැටලු පදනම් කොට සිදුවිය යුතුය.

2. අවස්ථා විශ්ලේෂණ සිදු කිරීමේදී සමාජ හා ආයතනික පැතිකඩ සඳහා සමාන අවස්ථාවක් පිළිබඳ අවධාරණය කළ යුතුය.

3. ව්‍යාපෘති ප්‍රදේශයේ ප්‍රමාණය කුඩාවන තරමට සාර්ථකත්වයේ හැකියාව ඉහළ මට්ටමක පවතී. මේ නිසා විශේෂ කළමනාකරණ ප්‍රදේශ නෛතික සීමාවන් මූලික තත්ත්ව වාර්තාව සහ අදාළ පාර්ශ්වකරුවන්ගේ උපදේශකත්වය මත ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පැමිණ වීමට පෙර කළ යුතුය. කෙසේ වුවත් විශේෂ කළමනාකරණ ප්‍රදේශ සහ එයට අන්තර්ගතවී ඇති පරිසර පද්ධති අතර සබඳතාව පැහැදිලිව හඳුනාගත යුතුය.

4. විශේෂ කළමනාකරණ ප්‍රදේශ සඳහා වූ නව රෙගුලාසි අනුව විශේෂ කළමනාකරණ ප්‍රදේශ කමිටු ස්ථාපිත කළ යුතුය. කමිටු සඳහා නියෝජිතයන් තේරීමේදී ස්වාධීන තේරීම් ක්‍රියාවලියක් අනුගමනය කිරීම මගින් ප්‍රාදේශීය සහභාගිත්වය තහවුරු කළ යුතුය.

5. රෙගුලාසිවලට අනුකූලව විශේෂ කළමනාකරණ ප්‍රදේශ කමිටු සඳහා මෙහෙයුම් නීතිමාලාවක් සකස් කිරීම (operational rules). ගැටලු හඳුනාගැනීම, තීරණ ගැනීම, අරමුදල් කළමනාකරණය, පළාත් සභාවලින් ආධාර ලබා ගැනීම සහ මධ්‍යම ආණ්ඩුවේ සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවල ආධාර ලබා ගැනීම ආදිය පිළිබඳව මෙම මෙහෙයුම් නීති අනුගමනය කළ යුතුය.

6. විශේෂ කළමනාකරණ කමිටු රැස්වීම් තීරණ, තීරණ ගැනීමේ ක්‍රියාවලිය තොරතුරු සටහන් සියල්ල ප්‍රාදේශීය භාෂාවන්ගෙන් පිළියෙල කළ යුතුය. (දෙමළ හෝ සිංහල).

7. සැලසුම් කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී ගන්නා තීරණ පැහැදිලි මෙන්ම නිසි අයුරින් වාර්තා කළ යුතුය. බැඳුන තීරණ (Binding decision) අදාළ සියලු පාර්ශවයන් වෙත පැහැදිළිව දැන්විය යුතු අතර සියලු දෙනා විසින් එක පිළිපැදීමෙන් විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලියට බාධාවන අවිශ්වාසය ඉවත් කළ හැක.

**ක්‍රියාත්මක කිරීමේ අදියර**

1. විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ සහ පසුවිපරම් කිරීමේ භූමිකාව සිදු කරන රාජ්‍ය නොවන සංවිධාන සහ අනෙකුත් ආයතන ඔවුන්ගේ කාර්යභාරය ඉටු කිරීමට අදළ ක්‍රියාකාරකම් ඉටු කිරීමටත් ඔවුනගේ වාර්ෂික වැඩසටහන්වලට ඇතුළත් කිරීමටත් අනුග්‍රහය දැක්විය යුතුය.

2. ප්‍රාදේශීය සංවිධාන ව්‍යුහය සහ මෙහෙයුම් නීති, ශක්තිමත් කිරීමට උත්සාහ කළ යුතු අතර එමගින් විනිවිදභාවය, නායකත්වය, සාමාජිකත්වය සහ තීරණ ගැනීමේ ක්‍රියාවලිය වැඩි දියුණු කල හැක.

3. විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ සෘජු සාර්ථකත්වය රඳාපවතින්නේ සියලු අදියරේදී සියලු නියෝජිත පාර්ශ්වකරුවන්ගේ සක්‍රිය සහභාගිත්වය මතය.

4. සැලසුම් අදියරේදී ප්‍රාදේශීය මට්ටමේ ආයතනික සංවර්ධනය ආරම්භ කිරීමේදී ස්ථාපිත ආයතන සහ ප්‍රාදේශීය/මධ්‍යම රාජ්‍ය ආයතන සමග තිරස් සහ සිරස් සබඳතාවන් ශක්තිමත් කළ යුතුය.

5. සම්පත් සහ ජීවනෝපායන් ආශ්‍රිතව ප්‍රාදේශීය සංවිධාන ගොඩනැංවීම වෙනුවට ප්‍රජා මූලයන් (Element) ප්‍රවර්ධනය කළ යුතුය.

6. ස්වභාවික සම්පත් කළමනාකරණය සඳහා ප්‍රාදේශීය ප්‍රජාව සක්‍රිය කිරීමට විශේෂ කළමනාකරණ ක්‍රියාවලිය ආරම්භයේදී ඔවුනට දැනෙන ප්‍රතිලාභ අත්කර ගැනීමට අවස්ථාව තිබිය යුතුය.

7. සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා සංවිධාන ධාරිතාවලින් ශක්තිමත් කිරීමට අවශ්‍ය මූල්‍යමය සහ තාක්ෂණික ආධාර ලබාදීමෙන් සැලසුම් ක්‍රියාවලිය ආරම්භක අදියරේදී ප්‍රජාවට උපකාරී විය යුතුය. ඔවුන්ගේ ප්‍රදේශයේ සමාජ - ආර්ථික සංවර්ධනය සඳහා දිගුකාලීන මූල්‍යාධාරද අවශ්‍ය විය හැක.

8. බාහිර යැපීම් අවම කරමින් ස්වශක්තීන් ප්‍රවර්ධනය කිරීම සඳහා යාන්ත්‍රණයක් විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලියට ඇතුළත් කළ යුතුය.

9. දිස්ත්‍රික්, පළාත් සභා සංවර්ධන සැලසුම්වලට හෝ ප්‍රාදේශීය සැලසුම්වලට හැකි සෑම අවස්ථාවේදීම විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය ජාතික සහ ප්‍රාදේශීය සංවර්ධන සැලසුම්වලට අනුකූලව සිදුකළ යුතුය.

10. සහභාගිත්ව සුපරීක්ෂණය සහ පසුවිපරම් පද්ධතියක් (feedback) ඇතුළත් කිරීමේ යාන්ත්‍රණයක් සියලු විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම්වල තිබිය යුතුය. මෙම පසුවිපරම් සඳහා දර්ශකයන් ව්‍යාපෘති සැලසුම් අදියරේදී හඳුනාගත යුතුය. මේ මගින් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කළ හැකි අතර ප්‍රතිඵල දැනෙන අයුරින් සකස් කරගත හැක.

## 5.7 විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය

**විශේෂ කළමනාකරණ ප්‍රදේශ ස්ථාන හඳුනා ගැනීම සහ ඒ පිළිබඳව ඒකඟතාව : 1997 සහ 2004 සංශෝධිත වෙරළ කලාප කළමනාකරණ සැලසුම් මගින් ලත් අත්දැකීම්**

ඒකාබද්ධ වෙරළ සම්පත් කළමනාකරණ පිළිබඳ අතිරේක ක්‍රමවේදයක් ලෙස විශේෂ කළමනාකරණ ප්‍රදේශ

ක්‍රියාවලිය පිළිගැනීමෙන් සහ විධිමත් කිරීමෙන් පසු 1997 සැලැස්ම මගින් විශේෂිත සංකීර්ණ ගැටලු විසඳීමට ඇති විශේෂ කළමනාකරණ ප්‍රදේශ ලෙස ස්ථාන 23ක් හඳුනා ගන්නා ලදී. එක් එක් ස්ථාන නිර්ණායකයන් 4ක් යොදා ගනිමින් ශ්‍රේණිගත කරන ලදී. වැඩිම මුළු ලකුණු ලබා ගන්නා ස්ථාන ප්‍රමුඛතම ස්ථාන ලෙස පෙලගස්වා ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ කරන ලදී. විශේෂ කළමනාකරණ ප්‍රදේශ ස්ථාන ශ්‍රේණිගත කිරීම සඳහා වැදගත් නිර්ණායකයන් තුනක් අතිරේකව යොදා ගන්නා ලදී.

**විශේෂ කළමනාකරණ ප්‍රදේශ ශ්‍රේණිගත කිරීම සඳහා යොදා ගන්නා නිර්ණායකයන්**

1. ස්ථානයේ පවත්නා සමාජ - ආර්ථික සහ පාරිසරික ගැටලුවල උග්‍රබව
2. වෙරළබඩ පරිසර පද්ධතිවල සාපේක්ෂ අවශ්‍යතාව සහ බහුලතාව
3. ප්‍රමාණය, පිහිටීම, නෛතික සහ ආයතනික සාධක පාදකව කළමනාකරණය සඳහා වූ ශක්‍යතාව
4. ප්‍රදේශයේ පවත්නා හෝ තිබිය හැකි ආර්ථික සංවර්ධන වටිනාකම
5. දේශගුණික විපර්යාස බලපෑම සඳහා නිරාවරණය වූ මට්ටම
6. කාලයක් මුළුල්ලේ හෝ ක්ෂණික වෙරළබඩ ව්‍යසනයන්ගේ අන්තරාය
7. ස්ථානයේ ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වැදගත්කම.

1997 දී සම්පාදනය කරන ලද විශේෂ කළමනාකරණ ප්‍රදේශ ලැයිස්තුව සම්පූර්ණ නොවූ අතර දිවයිනේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශයන්ගේ ස්ථාන නිසියාකාරයෙන් ප්‍රමාණවත් ලෙස නියෝජනය වී නොමැත. මේ තත්ත්වය සිදු වූයේ පැවති ගැටුම්කාරී තත්ත්වය හේතුකොට මහජන උපදේශනය සඳහාත් ස්ථාන හඳුනාගැනීම සඳහාත් පිවිසීම වැලැක්වූ බැවිනි. මෙම ප්‍රදේශයන්ගේ සුදුසු යැයි හැඟෙන ස්ථාන පිළිබඳව තොරතුරු අල්ප වීමද මේ තත්ත්වය තව දුරටත් සංයුක්තවීමට හේතුවිය.

**වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ විධිවිධාන අනුව විශේෂ කළමනාකරණ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කිරීම**

1997 සහ 2004 සංශෝධිත වෙරළ කලාප කළමනාකරණ සැලසුම් මගින් හඳුනා ගන්නා ලද විශේෂ කළමනාකරණ ප්‍රදේශ ඇතුලු දෙවන මට්ටමේ විශේෂ කළමනාකරණ ප්‍රදේශ සඳහා සැලසුම් ක්‍රියාත්මක කිරීමට නෛතික පිළිගැනීමක් නොවූ අතර එම ස්ථානද සැලකිල්ලට ගෙන විශේෂ කළමනාකරණ ප්‍රදේශ ලෙස නම් කළ යුතුය. මේ නිසා විවිධ ව්‍යාපෘති යටතේ දැනටමත් ආරම්භකොට ඇති විශේෂ කළමනාකරණ ප්‍රදේශ සහ සුදුසු දෙවන මට්ටමේ ස්ථානද මෙම සැලැස්මට ඇතුලුකොට විශේෂ කළමනාකරණ ප්‍රදේශ යනුවෙන් වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ III කොටසේ 22ඉ වගන්තියේ නෛතික විධිවිධාන අනුව නෛතික වශයෙන් පිළිගන්නා ලදී.

**ව්‍යාපෘති පාදක ප්‍රවේශය මගින් දැනටමත් ක්‍රියාත්මක කරන ලද විශේෂ කළමනාකරණ ප්‍රදේශ නැවත නම් කිරීම සහ පුනර්ජීවනය**

පහත වගුව 5.1 සහ 5.2 වගුවලින් පෙන්වාදී ඇති පරිදි, සැලසුම් කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාදාමය ආරම්භ කරනු ලැබ ඇති විශේෂ කළමනාකරණ ප්‍රදේශ එකොළහම, විශේෂ කළමනාකරණ ප්‍රදේශ ලෙස නැවත ලයිස්තු ගත කර 2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනතේ විධිවිධානයන්ට අනුකූලව රජයේ ගැසට් නිවේදනයක් මගින් විශේෂ කළමනාකරණ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කිරීමට ක්‍රියා මාර්ග ගනු ඇත.

**නෛතික සීමාවන් (Legal Boundaries) ස්ථාපිත කිරීම**

විශේෂ කළමනාකරණ ප්‍රදේශයන්හි නෛතික සීමාවන් පහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන නැවත සීමාවන් නිර්ණය කරනු ඇත.

- වෙරළබඩ පරිසර පද්ධති සංරක්ෂණය පිළිබඳ තත්ත්වය
- පැවති ගැටලු අනුව ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලවල ප්‍රමාණය
- ස්ථානයේ සමාජ ආර්ථික පැතිකඩ
- ආර්ථික අවශ්‍යතා අනුව සංරක්ෂණය තුළනය කිරීම
- දේශගුණික විපර්යාසයන්ට නිරාවරණය වීම හා අන්තරායට ලක්වීම.

**විශේෂ කළමනාකරණ ප්‍රදේශ සම්බන්ධීකරණ කමිටු ස්ථාපිත කිරීම**

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ විධිවිධාන යටතේ සම්පාදනය කරනු ලබන රෙගුලාසි අනුව විශේෂ කළමනාකරණ ප්‍රදේශ සම්බන්ධීකරණ කමිටු ස්ථාපිත කිරීමෙන් පෙරදී ස්ථාපිත සම්බන්ධීකරණ කමිටු ක්‍රියාකාරී නොවනු ඇත. මධ්‍යම රජයේ සහ පළාත් ආයතන, ප්‍රාදේශීය සංවිධාන සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගෙන් විශේෂ කළමනාකරණ ප්‍රදේශ කමිටු සංයුක්ත වනු ඇත. නව රෙගුලාසිවල දක්වන පරිදි ප්‍රාදේශීය මට්ටමේ ආයතන නියෝජිතයන් තේරීම සිදු කරනු ඇත. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් හෝ නම් කරන ලද ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් සහ ප්‍රාදේශීය ලේකම් විශේෂ කළමනාකරණ ප්‍රදේශ කමිටු (SMAC) වන සම සභාපතිත්වය දරනු ඇත. නව රෙගුලාසි අනුව පිළියෙල කරනු ලබන මෙහෙයුම් නීති (operational rules) වලට අනුකූලව කමිටු ක්‍රියාත්මක වෙනු ඇත.

**පවත්නා විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් යාවත්කාලීන කිරීම**

නැවත නම් කරන ලද විශේෂ කළමනාකරණ ප්‍රදේශයන් සඳහා පිළියෙල කොට ඇති සැලසුම් සංරක්ෂණ අවශ්‍යතාවන් සහ සංවර්ධන අවශ්‍යතාවයන්ට අනුව විශේෂ කළමනාකරණ ප්‍රදේශ කමිටු මගින් විමර්ශනය කොට යාවත්කාලීන කරනු ඇත.

**තිරසාර මූල්‍ය යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම**

විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලියේ දිගුකාලීන තිරසාරත්වය ආරක්ෂා කිරීම සඳහා පාර්ශ්වකරුවන්ගේ උපදේශකත්වය මත තිරසාර මූල්‍ය යාන්ත්‍රණයක් විශේෂ කළමනාකරණ ප්‍රදේශ කමිටු මගින් ස්ථාපිත කරනු ඇත. මේ සම්බන්ධව මධ්‍යම රජයේ ආයතන, පළාත් සභා ආයතන සහ ප්‍රාදේශීය මට්ටමේ ආයතනවල දයකත්වයද අපේක්ෂා කෙරේ.

**බලපෑම් විශ්ලේෂණය සහ සුපරීක්ෂණය**

විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලියේ බලපෑම සහ ප්‍රතිඵල ඇගයීම සඳහා විශේෂ කළමනාකරණ ප්‍රදේශ කමිටු මගින් සුපරීක්ෂණ යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතුය. මෙම ක්‍රියාවලියේදී ක්‍රියාවලිය, නිමැවුම් සහ ප්‍රතිඵල ගැන අවධානය යොමු කළ යුතුය.

**වගුව 5.1: ව්‍යාපෘති පදනම මත විශේෂ ප්‍රදේශ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය ආරම්භ කරන ලද ස්ථාන**

| *දිස්ත්‍රික්කය* | *ව්‍යාපෘතිය* | *ස්ථානය* |
|---|---|---|
| කොළඹ | වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය II | ලුනාව කලපුව |
| ගාල්ල | වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය II | මාදු ගඟ මෝය |
| | වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය I/II | හික්කඩුව සමුද්‍ර උද්‍යානය |
| | වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය I | උණවටුන, හබරාදූව |
| හම්බන්තොට | හම්බන්තොට වෙරළ කලාප කළමනාකරණ ව්‍යාපෘතිය | හම්බන්තොට වැලි කඳු |
| | හම්බන්තොට වෙරළ කලාප කළමනාකරණ ව්‍යාපෘතිය/වෙ.සං. සහ වෙ.සම්. | මාවැල්ල කලපුව |
| | වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය II | කලමැටිය කලපුව |
| | වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය I | රැකව කලපුව |
| | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන/ ගෝලීය පරිසර පහසුකම් UMNDP = GEF | රැකව, උස්සන්ගොඩ, කලමැටිය |
| ගම්පහ | වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය II | මීගමු මෝය/මුතු රාජවෙල තෙත් බිම |

| *දිස්ත්‍රික්කය* | *ව්‍යාපෘතිය* | *ස්ථානය* |
|---|---|---|
| පුත්තලම | වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය II Bmz, IUCN, FAO - UNDP | බාර්පරය, පුත්තලම කලපුව |
| මඩකලපුව | පශ්චාත් සුනාමි නැගෙනහිර පළාත් වෙරළ කලාප ප්‍රතිෂ්ඨාපනය සහ තිරසාර කළමනාකරණ ව්‍යාපෘතිය | මඩකලපුව කලපුව |
| අම්පාර | පශ්චාත් සුනාමි නැගෙනහිර පළාත් වෙරළ කලාප ප්‍රතිෂ්ඨාපනය සහ තිරසාර කළමනාකරණ ව්‍යාපෘතිය | පානම වැලි කඳු |
| ත්‍රිකුණාමලය | පශ්චාත් සුනාමි නැගෙනහිර පළාත් වෙරළ කලාප ප්‍රතිෂ්ඨාපනය සහ තිරසාර කළමනාකරණ ව්‍යාපෘතිය | පරෙවි දූපත |

**වගුව 5.2: වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ විධිවිධාන අනුව විශේෂ කළමනාකරණ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පැමිණ වීමට යෝජිත ස්ථාන ලැයිස්තුව.**

| දිස්ත්‍රික්කය | ස්ථානය |
|---|---|
| කොළඹ | - ලුනාව<br>- බොල්ගොඩ වැව<br>- දෙහිවල - ගල්කිස්ස වෙරළ තීරය |
| කළුතර | - කළු ගඟ මෝදර ප්‍රදේශය |
| ගාල්ල | - මාදු ගඟ මෝය<br>- හික්කඩුව සමුද්‍ර උද්‍යානය<br>- උණවටුන බොක්ක සහ කොග්ගල මෝය<br>- බෙන්තොට, බේරුවල වෙරළ තීරය<br>- දෙඩන්දූව වැව (lake) |
| මාතර | - පොල්හේන වෙරළ තීරය<br>- වැලිගම බොක්ක |
| හම්බන්තොට | - රැකව කලපුව<br>- රැකව - උස්සන්ගොඩ - කලමැටිය - පොකුරු පෙදෙස<br>- කලමැටිය - ලුනාව කලපු සංකීර්ණය<br>- මාවැල්ල කලපුව සහ කුඩාවැල්ල හුම්මානය |
| අම්පාර | - පානම වැලි කඳු ප්‍රදේශය - ආරුගම් බොක්ක<br>- පෙරිය කලපුව - කොරයි කලපුව<br>- කෝමාරි කලපුව |
| මඩකලපුව | - මඩකලපුව කායන්කර්නි මෝය/කලපුව<br>- උප්පාර - පනිච්චන්කරුනි මෝය<br>- කල්කුඩා - පාසිකුඩා - කන්නාඩි බොක්ක<br>- වාලච්චේන මෝය<br>- සල්ලිතිව් දූපත හා ආශ්‍රිත වෙරළබඩ ප්‍රදේශ |
| ත්‍රිකුණාමලය | - ත්‍රිකුණාමල බොක්ක<br>- නිලාවේලි වෙරළ<br>- පරවි දූපත<br>- පෙරියකරච්චි සහ සින්නකරච්චි මෝය<br>- කුච්චවේලි - පොඩුව කට්ටු |

| දිස්ත්‍රික්කය | ස්ථානය |
|---|---|
| මුලතිව් | - නන්දිකඩාල් කලපුව<br>- නයිආර් මෝය |
| යාපනය | - මනල්කාඩු වැලි කඳු<br>- යාපනය මෝය (නගර ප්‍රදේශය)<br>- තොන්ඩමනාරු කලපුව<br>- කන්කසන්තුරෙයි සහ කිරිමල වෙරළ තීරය<br>- මන්ඩතිව්, ඩෙල්ෆ්ට්, නයිනතිව් දූපත්<br>- කරෙයිනගර් වෙරළ තීරය (කැෂුරිනා වෙරළ ඇතුළත්ව)<br>- නාවෙලි වෙරළ ප්‍රදේශය |
| මන්නාරම | - මන්නාරම් බොක්ක<br>- තලෙයිමන්නාරම් වෙරළ තීරය<br>- සිලාවතුර - අරිප්පු - අරච්චිආරු වෙරළ තීරය<br>- කොන්ඩච්චි බොක්ක<br>- වෙඩිතල්තිව් කොරල්පරය ආශ්‍රිත පරිසර පද්ධති |
| පුත්තලම | - පුත්තලම කලපුව<br>- හලාවත මෝය<br>- මුන්දලම කලපුව සහ පුත්තලම ඇළ මාර්ගය |

**5.8 විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය සඳහා යොමුරීති**

පෙර ආරම්භ කරන ලද හෝ දැනට ක්‍රියාත්මකවන විශේෂ කළමනාකරණ ප්‍රදේශ පිළිබඳ පෙර කොටසේදී ඉදිරිපත් කරන ලද මාර්ගෝපදේශවලට අමතරව පහත සඳහන් සාමාන්‍ය යොමුරීති අළුත් ස්ථානයන්හි විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය සඳහා ඉදිරිපත් කරනු ලබයි. 2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනත මගින් හඳුන්වා දෙන ලද විධිවිධාන පදනම් කොට මෙම මාර්ගෝපදේශ කෙටුම්පත් කොට ඇත. කෙසේවුවත් ඒ ඒ ස්ථානයේ අවශ්‍යතාවන්ට අනුකූලව මෙම යොමුරීති යොදාගත යුතුය.

1. **ස්ථානයක් තෝරා ගැනීම සහ ප්‍රකාශයට පැමිණවීම**

   නව නෛතික විධිවිධාන යටතේ, මෙම වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්මේ ලැයිස්තුගත කරන ලද (වගුව 5.1 සහ 5.2) ස්ථාන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් සහභාගිත්ව සම්පත් කළමනාකරණ ක්‍රියාවලියක් යොදා ගැනීම සඳහා ගැසට් මගින් ප්‍රකාශයට පැමිණවීමට තෝරා ගත හැක.

2. **නෛතික සීමාවන් (Legal boundaries) ස්ථාපිත කිරීම**

   නෛතික විධිවිධාන සහ එම විධිවිධාන යටතේ සකසන ලද රෙගුලාසිවලට අනුව වෙරළ කලාපය තුළ සහ ආසන්න ප්‍රදේශයේ පිහිටි භූමිය යන දෙකම අවශ්‍යතාව අනුව සැලකිල්ලට ගෙන තීරණය කළ හැක.

3. විශේෂ කළමනාකරණ ප්‍රදේශ කමිටු ස්ථාපිත කිරීම.
4. හඳුනාගන්නා ලද ගැටලු ප්‍රමුඛතාගත කිරීම සහ පරිසර පැතිකඩ තත්ත්ව වාර්තාව පිළියෙල කිරීම.
5. පාර්ශවකරුවන් විශ්ලේෂණය.
6. විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් සකස් කිරීම.
7. විශේෂ කළමනාකරණ සැලසුම් පිළිගැනීම (Adoption).
8. සැලසුම් ක්‍රියාවලියට සමගාමීව තෝරාගන්නා ලද ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම.

9. තිරසාර මුල්‍ය යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.

10. සැලසුම් ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම.

**5.9 විශේෂ කළමනාකරණ ප්‍රදේශ - කළමනාකරණ අරමුණු, ප්‍රතිපත්ති, ක්‍රමෝපායයන්, ක්‍රියාකාරකම්**

**අරමුණ 1**

වඩාත් සුදුසු කළමනාකරණ අංගයන් භාවිතා කරමින් නම් කරන ලද ප්‍රදේශයන්හි ජීවනෝපායන් වැඩිදියුණු කිරීමටත් පරිසර පද්ධතිවල ස්වභාවික අගයන් නොකඩවා වැඩි කිරීම සඳහා විශේෂ කළමනාකරණ ප්‍රදේශ භාවිතා කරනු ඇත.

**ප්‍රතිපත්ති 1.1**

හඳුනාගත් පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයන් තුළින් දිස්ත්‍රික්ක, කොට්ඨාස සහ ප්‍රාදේශීය මට්ටමින් ගොඩබිම සහ වෙරළබඩ ජල ප්‍රදේශ ඇතුළත්ව විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කෙරේ.

**ක්‍රමෝපාය 1.1.1**

රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, ප්‍රාදේශීය ප්‍රජාවගේ ඵලදායී සහයෝගය සහ සහභාගිත්වයෙන් වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ විධිවිධාන සහ ඒ යටතේ පිළියෙල කරනු ලබන රෙගුලාසිවලට අනුකූලව සවිස්තරාත්මක විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් පිළියෙල කරනු ඇත.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. විශේෂ කළමනාකරණ ප්‍රදේශ ලෙස කළමනාකරණය කළ යුතු ස්ථාන තෝරා ගැනීම.

2. නීත්‍යානුකූල සීමාවන් ස්ථාපිත කොට එම ස්ථාන විශේෂ කළමනාකරණ ප්‍රදේශ ලෙස ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කළ යුතුය.

3. ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් මට්ටමින් විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය සැලසුම් කිරීම සඳහා මෙම වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම මගින් සපයා ඇති මාර්ගෝපදේශයන් අනුව ආයතනික යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතුය .

4. තිරසාර මූල්‍යමය යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතුය.

5. විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් ක්‍රියාවලියේ ප්‍රගතිය හා බැලපෑම් ඇගයීම සඳහා සහභාගිත්ව සුපරීක්ෂණ සැලසුම් පිළියෙල කළ යුතුය.

**ක්‍රමෝපාය 1.1.2**

විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් කිරීම ක්‍රියාත්මක කිරීම සහ ක්‍රියාත්මක කිරීමෙන් පසු ක්‍රියාවලිය සඳහා ප්‍රාදේශීය සහයෝගය සහ සහභාගිත්වය වැඩිදියුණු කිරීමට යාන්ත්‍රණයක් සම්පාදනය කිරීම.

**ක්‍රියාකාරකම්**

1. ක්‍රියාවලියේදී පාර්ශවකරුවන්ගේ සහයෝගය සහ සහභාගීත්වයට උපකාරීවන හෝ එයට අවහිරවන සාධක හඳුනාගැනීම සඳහා අදාළ ස්ථානයන්හි පාර්ශවකරුවන් පිළිබඳ විශ්ලේෂණ අධ්‍යයනයක් කිරීම.

2. විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලියේ දී සියලු පාර්ශවකරුවන්ගේ සක්‍රීය සහයෝගය සහ සහභාගිත්වය තහවුරු කිරීම සඳහා සන්නිවේදන සැලැස්මක් පිළියෙල කිරීම.

3. පාර්ශව කණ්ඩායම්, විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය සැලසුම් කිරීම සඳහා 2014 වෙරළ කලාපය සහ වෙරළබඩ සම්පත් කළමනාකරණ සැලැස්ම මගින් සපයා ඇති මාර්ගෝපදේශයන් අනුව ආයතනික යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.

4. ප්‍රජාවන්ට නියත ප්‍රතිලාභ ලැබීම තුළින් ඔවුන්ගේ සහභාගිත්වය සහ සහයෝගය උනන්දු කරලීමට දිරිගැන්වීමේ වැඩසටහන් සකස් කිරීම.

**ප්‍රතිපත්තිය 1.2**

පසුගිය කාලය තුළ ව්‍යාපෘති පදනම මත ක්‍රියාත්මක කරන ලද විශේෂ කළමනාකරණ ප්‍රදේශ නැවත ප්‍රකාශයට පමුණුවා ප්‍රතිෂ්ඨාපනය කිරීම.

**ක්‍රමෝපාය 1.2.1**

ක්‍රියාත්මක කිරීමේදී ලද අත්දැකීම් අනුව පවත්නා දුබලතාවන් මගහැරවීම සඳහා ව්‍යාපෘති පදනම මත සැලසුම් කොට ක්‍රියාත්මක කරන ලද විශේෂ කළමනාකරණ ප්‍රදේශ නැවත ප්‍රකාශයට පැමිණවීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත යටතේ පිළියෙල කරනු ලබන රෙගුලාසි අනුව විශේෂ කළමනාකරණ ප්‍රදේශ කමිටු ස්ථාපිත කිරීම.

2. මෙම සැලැස්මේ විශේෂ කළමනාකරණ ප්‍රදේශ යටතේ දක්වා ඇති 5.2 කොටසේ මාර්ගෝපදේශයන් අනුගමනය කිරීම.

3. විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී මුහුණපාන ප්‍රධාන බාධක හඳුනා ගැනීම, ලැබූ අත්දැකීම් විශ්ලේෂණය කිරීම,දැනට ක්‍රියාත්මක කෙරෙන සැලසුම් වල අඩුපාඩු නිවැරදි කිරීම සඳහා පිළියම් සොයා ගැනීම මගින් මෙම ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාම පහසු කිරීම.

4. කළමනාකරණ ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම කරනු පිණිස විශේෂ කළමනාකරණ ප්‍රදේශ හා සම්බන්ධිත ව්‍යාපෘති තුළ සුපරීක්ෂණය කිරීම ඇගයීම පසුවිපරම් යාන්ත්‍රණයක් ආයතනගත කිරීම.

**ප්‍රතිපත්තිය 1.3**

සියලු විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම නීති රීතිවලට අනුකූලව සිදුකරනු ඇත.

**ක්‍රමෝපාය 1.3.1**

ජාතික මට්ටමේ නීතිරීති සහ රෙගුලාසිවලට අනුකූලව විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. ජාතික මට්ටමේ නීතිරීතිවලට අනුකූලව විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය සිදු කිරීම සඳහා අනුගමනය කළ යුතු පටිපාටිය සහ ක්‍රමවේදය වන විස්තර කරනු ලබන මාර්ගෝපදේශ ලේඛනයක් පිළියෙල කිරීම.

2. ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් මට්ටමේ පාර්ශවකරුවන් සඳහා විශේෂ ප්‍රදේශ කළමනාකරණ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

**ප්‍රතිපත්ති 1.4**

විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් කිරීම ශක්තිමත් කිරීම සඳහා පළාත් පාලන ආයතන සහ අනෙකුත් අදාළ රාජ්‍ය ආයතනයන්ගේ ධාරිතාව වර්ධනය කරනු ඇත.

**ක්‍රමෝපාය 1.4**

ඵලදායී නීති සම්පාදනය, දැනුවත් කිරීමේ වැඩසටහන් සහ පුහුණු කිරීම තුළින් අදාළ රාජ්‍ය ආයතන සහ පළාත් පාලන ආයතනවල විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ධාරිතාව වැඩි කිරීම.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. විශේෂ කළමනාකරණ ප්‍රදේශ පිළිබඳ පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම.

2. විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් කිරීම සඳහා වූ නෛතික රාමුව තවදුරටත් ශක්තිමත් කිරීම.

3. විශේෂ කළමනාකරණ ප්‍රදේශ කමිටු ඔස්සේ සහභාගිත්ව කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම.

4. විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් කිරීම පිළිබඳව ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන්ගේ හැකියාවන් වර්ධනය.

**ප්‍රතිපත්තිය 1.5**

ජාතික සහ ප්‍රදේශීය සංවර්ධන වැඩසටහන් සමග විශේෂ කළමනාකරණ ප්‍රදේශ වැඩසටහන් අනුකූල වනු ඇත.

**ක්‍රමෝපාය 1.5.1**

යෝග්‍ය අවස්ථාවන්හිදී ප්‍රාදේශීය ඒකාබද්ධ සංවර්ධන වැඩසටහන් තුළට විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් සහ කළමනාකරණ ක්‍රියාවලියට ඇතුළත් කරනු ඇත.

**යෝජිත ක්‍රියාමාර්ග**

1. ජාතික ඒකාබද්ධ ව්‍යාපෘති/ප්‍රාදේශීය ව්‍යාපෘතිවලට විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් අන්තර්ග්‍රහනය කිරීම සඳහා යාන්ත්‍රණයක් සැකසීමට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සමග සම්බන්ධීකරණය කිරීම.

2. විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය පෞද්ගලික අංශයේ දයකත්වය සහ සහභාගිත්වය පහසු කිරීමට යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.

**ප්‍රතිපත්තිය 1.6**

පරිසර පද්ධතිවල හඳුනා නොගත් ආර්ථික සේවාවන් ඇතුළත් වන පරිදි විශේෂ කළමනාකරණ ප්‍රදේශ සැලසුම් ක්‍රියාවලියේදී සහ ක්‍රියාත්මක කිරීමේදී ඵලදායී ඇගයීම් ප්‍රයත්නයක් යොදා ගැනීම.

**ක්‍රමෝපාය 1.6.1**

ආර්ථික සංවර්ධන අවශ්‍යතාවය සමග සංරක්ෂණ අරමුණු තුලනය කරමින්, පරිසර සංරක්ෂණය සංවර්ධනය සහ ජීවනෝපායන් පිළිබඳ තීරණ ගැනීමේදී පරිසර පද්ධතිවල සේවාවන්ගේ නියම වටිනාකම පිළිබඳව වැඩි අවධානයක් යොමු කරනු ඇත.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. හැකි සෑම අවස්ථාවකදීම ඵලදයි තීරණ ගැනීම පිණිස පරිසර පද්ධතින්ගේ සේවාවන් පිළිබඳ පාරිසරික ඇගයීමක් කරනු ඇත.

2. වෙරළබඩ පරිසර පද්ධති හා සම්බන්ධ සැඟවුණ හෝ හඳුනා නොගත් සේවාවන්ගේ වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

3. පාරිසරික ඇගයීම් (තක්සේරු) දියත් කිරීම සඳහා සහභාගි ආයතනයන්ගේ ධාරිතාවන් වැඩිදියුණු කිරීම.

**ප්‍රතිපත්තිය** 1.7

වෙරළබඩ සම්පත් තිරසාර ලෙස භාවිතා කිරීම සහතික කිරීම සඳහා විශේෂ කළමනාකරණ ප්‍රදේශයන්හි ප්‍රජාවගේ ජීවනෝපායන් වැඩිදියුණු කිරීම සහ ශක්තිමත් කිරීම.

**ක්‍රමෝපාය** 1.7.1

වෙරළබඩ සම්පත් සහ ජීවනෝපායන් පිළිබඳ ගැටලු පෘථුල ලෙස අධ්‍යයනය කොට ප්‍රජාවගේ ජීවනෝපායන් තිරසාර ලෙස වැඩිදියුණු කිරීම විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලියට ඇතුළත් කරනු ඇත.

**යෝජිත ක්‍රියාකාරකම්**

1. විශේෂ කළමනාකරණ ප්‍රදේශයන්හි ප්‍රජාවගේ ජීවනෝපායන් සහ වෙරළබඩ සම්පත් භාවිතය පිළිබඳ ගැටලු අධ්‍යයනය කිරීම.

2. හඳුනාගන්නා ලද ගැටලු අවම කිරීම සඳහා පසුගිය අත්දැකීම් පදනම් කොට ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

3. විශේෂ කළමනාකරණ ප්‍රදේශයන්හි ජීවනෝපායන් සංවර්ධනය කිරීමේ සහ ඉහළ මට්ටමකට නැංවීමේදී පෞද්ගලික අංශයේ සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම.

4. ක්‍රියාත්මක කරනු ලබන ජීවනෝපාය වැඩසටහන්වල ප්‍රතිඵල ඇගයීම් සඳහා සුදුසු සුපරීක්ෂණ යාන්ත්‍රණයක් යොදා ගැනීම.

REFERENCES ;


1. Coast Conservation and Coastal Resource Management Department (2014), Evaluation of Special Management Area (SMA) in Sri Lanka (unpublished)

2. Coast Conservation and Coastal Resource Management Department, (2004), Revised Coastal Zone Management Plan.

3. Government of Sri Lanka, (2012) Coast Conservation and Coastal Resource Management Act No. 57 of 1981.

4. Government of Sri Lanka, (2011) Coast Conservation (Amendment) Act No. 49 of 2011.

5. Clemett, Alexandra ; Senaratne, Sonali ; and Bnada, R; (2004) Can Coastal Zone Management in Sri Lanka Sustain Local livelihoods and Eco-systems? Policy Process Analysis Paper 2, Improving Policy Livelihood Relationship in South Aisa, Stockholm Environmental Institute (SEI), York. UK.

6. De Cosse, P. J., and Jayawickrama, S. S. 1996. Co-management of resources in Sri Lanka: Status, Issues and Opportunities, USAID/Sri Lanka Natural Resources and Environmental Policy Project, Colombo.

7. De Silva, Sanjiv ; Senaratne, Sellamuttu, Sonali ;, Kodituwakku, Dekshika Charmini ; Atapattu Sitara S; (2011) Governance Performance in Integrated Coastal Management in Sri Lanka, Country Report, Colombo IUCN Sri Lanka.

8. CCD. 1997. *Revised Coastal Zone Management Plan, Sri Lanka, 1997*, Colombo: Coast Conservation Department. Ministry of Fisheries and Aquatic Resources Development

9. Jayatilake, A.,, Pallewatta., ' N.,; and Wickramanayake. J. 1998. The practice of community based conservation in Sri Lanka. In Community and Conservation: Natural Resource Management in South and Central Asia. Ed. A. Kothari, N. Pathak, R. B. Anuradha, and B. Taneja, New Delhi: Sage Publication.

10. Landstorm Ingegerd (2006), Towards Collaborative Coastal Management in Sri Lanka? A study of Special Area Management in Sri Lanka's Coastal Region.

11. Lowry, K.,; Pallewatte, N.,; and Dainis. A. P. 1997. Special Area Management Projects at Hikkaduwa and Rekawa.. A Preliminary Assessment. CRMP, Colombo.

12. Lowry, K.,; Pallewatte, N.,; and Dainis, A. P., 1999. Policy-relevant assessment of community-level coastal management projects in Sri Lanka. Ocean and Coastal Management 42 (8): 717 - 745.

13. Wickramaratne, H. J. M. and A. T. White. 1992. Concept paper on Special Area Management for Sri Lankan Coasts. Working Paper No. 10, 1992. CRMP Colombo.

14. Senaratna, S. 2003. Factors influencing the sustainability of livelihoods in rural coastal communities in Sri Lanka. PhD Upgrade Report. Imperial College London.

15. HSAMCC/CCD/NARA/Department of Wildlife Conservation/DWLC/CRMP/, 1996.Special Area Management Plan for Hikkaduwa Marine Sanctuary and Environs, Sri Lanka.Hikkaduwa Special Area Management and Marine Sanctuary Coordinating Committee, Coast Conservation Department, National Aquatic Resources Agency, Department of Wildlife Conservation and Coastal Resources Management Project.

16. RSAMCC/CCD/NARA/CRMP. 1996. Special Area Management Plan for Rekawa Lagoon, Sri Lanka. Rekawa Special Area Management Coordinating Committee/Coast Conservation Department/National Aquatic Resources Agency/and Coastal Resources Management Project.

# 6 පරිච්ඡේදය

## 6. නියාමන යාන්ත්‍රණය

### 6.1 හැඳින්වීම

වෙරළ කලාපයේ පවත්නා සම්පත් සහ ක්‍රියාකාරකම් කළමනාකරණය සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතින් නෛතික රාමුව වඩාත් ඵලදායී සහ ක්‍රමවත් කළමනාකරණ ක්‍රමවේදයක් ලෙස යොදා ගන්නා ලදී. ප්‍රධාන වෙරළබඩ ගැටලු පිළිබඳව කටයුතු කිරීම සඳහාත් කළමනාකරණ පිලියම් වල තිරසාර භාවය සහතික කිරීම සඳහාත් විශේෂ කළමනාකරණ ප්‍රදේශ ක්‍රියාවලිය, ආයතන සම්බන්ධීකරණය, අනුකූලතා සුපරීක්ෂණය, පර්යේෂණ සහ අධ්‍යයනයන්, මහජනතාව දැනුවත් කිරීම වැනි අතිරේක කළමනාකරණ උපාය මාර්ග ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වෙරළබඩ සම්පත් කළමනාකරණ ක්‍රමෝපායේ රෙගුලාසි සහ නීතිරීතිවලට අතිරේකව මේවා මෑත ඉතිහාසයේ භාවිත කරන ලද්දකි.

වෙරළ කලාපය හා සම්බන්ධිත නියාමන යාන්ත්‍රණය පහත සඳහන් අංගයන්ගෙන් සමන්විත වේ.

* බලපත්‍ර පිළිබඳ ක්‍රියා පටිපාටිය

* වෙරළ කලාපයේ අවසරපත්‍ර නිතුක් නොකරන තහනම් කාර්යයන්

* වෙරළාරක්ෂිතයන් ප්‍රකාශයට පත්කිරීම, පසසිටුව වෙනස් කිරීම හෝ ඒවායින් නිදහස් කිරීම

* සංවර්ධන කාර්යයන් පිළිබඳ පසුවිපරම් පරීක්ෂණ ක්‍රියාත්මක කිරීම

* සංවර්ධන කාර්යයන් පාලනය කිරීම

* අනවසර සංවර්ධන කාර්යයන් පාලනය කිරීම

* විශේෂිත සංවර්ධන කාර්යයන් සඳහා ප්‍රමිතින් හා යොමුරීති ක්‍රියාත්මක කිරීම

* පරිසර බලපෑම් තක්සේරු හෝ මූලික පරිසර පරීක්ෂණ වාර්තා නියම කිරීම

* "බලපෑමට යටත් වන ප්‍රදේශ" ප්‍රකාශයට පත්කිරීම හා පාලනය කිරීම

* "සංරක්ෂණ ප්‍රදේශ" ප්‍රකාශයට පත්කිරීම හා පාලනය කිරීම

* විශේෂ කළමනාකරණ ප්‍රදේශ ප්‍රකාශයට පත්කිරීම හා කළමනාකරණය කිරීම

### 6.1.1 වෙරළ කලාපය පිළිබඳ අර්ථ නිරූපණය

"වෙරළ කලාපය" යන්නෙන්, මධ්‍ය වඩදිය ඉම සිට ගොඩබිම දෙසට මීටර් තුන්සීයක සීමාවක් සහ මධ්‍ය බාදිය ඉම සිට මුහුද දෙසට කිලෝමීටර් දෙකක සීමාවක් ඇතුළත පිහිටි ප්‍රදේශය අදහස් වන අතර, ස්ථිර වශයෙන් හෝ කලින් කල මුහුදට සම්බන්ධ වූ ගංගා, දිය පාරවල්, කලපු හෝ වෙනත් යම් ජලකඳක් සම්බන්ධයෙන් වන විට, ගොඩබිම දෙසට වූ මායිම ඒවායේ ස්වභාවික ඇතුළුවීමේ ලක්ෂ අතර අඳින ලද ඍජු පාද රේඛාවකට ලම්භකව මනින ලද කිලෝමීටර් දෙකක සීමාවකට ව්‍යාප්ත වියයුතු අතර, එසේ මුහුදට සම්බන්ධ වූ ගංගාදිය පාරවල් සහ කලපු හෝ වෙනත් යම් ජලකඳක් සහ මායිම දිගේ ශුන්‍ය මධ්‍ය මුහුද මට්ටමේ සිට ගොඩබිම දෙසට මීටර් සියයකින් දීර්ඝ කල වැඩිදුර සීමාවක් ඇතුළත වූ ප්‍රදේශය ද ඇතුළත් වේ.




රූපය 6.1 : 2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ සංශෝධන පනතින් සංශෝධනය වූ 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනතට අනුව දක්වන ලද "වෙරළ කලාපය"

### 6.2 අවසර පත්‍ර පිළිබඳ ක්‍රමවේදය

වෙරළ කලාපය තුළ සංවර්ධන කටයුතු කළමනාකරණය සඳහා වෙරළ සංරක්ෂණය සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව භාවිතා කරන ප්‍රධානතම ක්‍රමවේදය අවසර පත්‍ර පිළිබඳ ක්‍රියා පටිපාටියයි. අවසර පත්‍ර පිළිබඳ ක්‍රියාපටිපාටියේ ප්‍රධාන අරමුණ වනුයේ වෙරළ කලාපය තුළ සංවර්ධන කටයුතු මගින් සිදුවන අහිතකර බලපෑම් වැළැක්වීම හෝ අවම කිරීමයි. මෙම පටිපාටිය මගින් වෙරළ කලාපයට අහිතකර හෝ සුදුසු නොවන සංවර්ධන කාර්යයන් පාලනය කර වෙරළ කලාපයේ ගුණාත්මක භාවය, ස්ථායිතාව සහ ඵලදායිතාව පවත්වාගෙන යාම සිදුවේ. මේ නිසා වෙරළ කලාපය තුළ පෞද්ගලික හෝ රාජ්‍ය අංශයෙන් සිදු කරන යම් සංවර්ධන කාර්යයක් සඳහා (බලපත්‍ර අවශ්‍ය නොමැති හඳුනාගත් කාර්යයන්ට හැර) වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන

අවසර පත්‍රයක් ලබා ගැනීම අනිවාර්ය වේ. අවසර පත්‍රයක් නොමැතිව වෙරළ කලාපය තුළ සිදුකළ හැකි කාර්යයන් 1983 සැප්තැම්බර් 02 දිනැති *ගැසට්* අංක 260/22 මගින් ප්‍රකාශයට පමුණුවන ලද 1983 අංක 1 දරන වෙරළ සංරක්ෂණ රෙගුලාසි මගින් නියම කොට ඇත.

**6.2.1 වෙරළ කලාපය තුළ අවසර ලබා ගත යුතු සංවර්ධන කාර්යයන්**

"වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන අවසර පත්‍රයක් ලබා ගත යුතු සංවර්ධන කාර්යයන් පහත දැක්වේ.

* සහාධිපත්‍යය දේපළ, නිවාස, තට්ටු නිවාස සංකීර්ණ හා අනිකුත් වාසස්ථාන සහ මායිම් තාප්ප සහ ආශ්‍රිත ව්‍යුහ
* කාර්මාන්ත හා අනිකුත් වාණිජමය ඉදිකිරීම්
* සංචාරක, විනෝදාත්මක පිහිනුම් තටාක සහ ජලාශ්‍රිත ඉදිකිරීම්
* වරාය හා ධීවර වරාය සම්බන්ධ ඉදි කිරීම් හා ජලතරණ මාර්ග
* මහාමාර්ග, පාලම්, දුම්රිය මාර්ග සහ උමං මාර්ග
* පොදු හෝ ආගමික ඉදිකිරීම්
* පුද්ගලයකු හෝ කණ්ඩායම් ඉදිකරනු ලබන වෙරළ ඉම ආරක්ෂණ ඉදිකිරීම්
* අපවිත්‍ර ජලය බැහැර කිරීමේ, පල්දෝරු පිළියම් පහසුකම් සහ සාගර පිටවාන්
* ජල ජීවී වගා පහසුකම්
* ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම (ජලතල දෙපස)
* කැණීම්, පිරවීම්, බැවුම් කිරීම් හා වැලි අවුරු විවර කිරීම
* වෙරළ උද්‍යාන සංවර්ධනය සහ භූමි අලංකරණය
* කැණීම් සහ ඛණිජ ද්‍රව්‍ය හැරීම
* බලශක්ති උත්පාදනය
* වැලි, සිප්පිකටු, මුහුදු පැලැටි ඉවත් කිරීම
* ගොඩකිරීම් දූපත් නිර්මාණය, අමතර ආරක්ෂක ව්‍යුහයන් සැකසීම
* වාහක මාර්ග ඉදිකිරීම
* පුද්ගලයින් හෝ කණ්ඩායම් විසින් ගංවතුර පාලනය හෝ ආපදා බැලපෑම් පාලනය සඳහා ඉදිකිරීම්/කැණීම් විවර කිරීම්
* වෙරළ කලාපයේ ජලතලයක සිදු කරන පිරවීම්, ඉවුරු ඛාදන වැලැක්වීම සඳහා සිදු කරන ඉදිකිරීම
* වෙරළ කලාපයේ භෞතික ස්වරූපය වෙනස් කිරීමට ඉඩ ඇති වෙනත් ඕනෑම ක්‍රියාකාරකමක්

**6.2.2 වෙරළ කලාපය තුළ අවසර පත්‍රයක් රහිතව සිදුකළ හැකි සංවර්ධන කාර්යයන්**

* මසුන් ඇල්ලීම
* වෙරළ, වැලි වැටි පද්ධති අස්ථාවර වීමට හේතු නොවන බෝග වගාව
* වෙරළ මත හැර අනෙකුත් ස්ථානවල ගස් හෝ අනෙකුත් ශාඛ රෝපනය

* වෙරළ බාදන කළමනාකරණ ක්‍රමෝපායට සහ 2 වන පරිච්ඡේදයේ දක්වා ඇති වෙරළ බාදන වැලැක්වීමේ හදිසි ක්‍රියාපටිපාටින්ට අනුකූලව වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් වෙරළ ආරක්ෂණ නිර්මාණ ඉදිකිරීම සහ නඩත්තු කිරීම.

**6.2.3 අවසර පත්‍ර වර්ගීකරණය**

වර්ග තුනක අවසර පත් නිකුත් කිරීම 1990, 1997 සහ 2004 වෙරළ කලාප කළමනාකරණ සැලසුම් මගින් හඳුන්වා දෙන ලදී. මේ අනුව ප්‍රධාන අවසර පත්‍ර, සුළු අවසර පත්‍ර සහ හදිසි අවසර පත්‍ර ලෙස වර්ග කරන ලදී. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණය පිළිබඳ 2018 යොමු රීති අනුව සියලුම අවසර පත්‍ර වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලබන අතර එය " A " වර්ගය, "B" වර්ගය ලෙස වර්ග කොට ඇත.

| **A වර්ගය** | **B වර්ගය** |
|---|---|
| පරිසර බලපෑම් තක්සේරු වාර්තා (EIA) සහ මූලික පාරිසරික පරීක්ෂණය (IEE) වාර්තා අවශ්‍ය කරනු ලබන සංවර්ධන කාර්යයන් සඳහා වූ අවසර පත්‍ර | පාරිසරික බලපෑම් තක්සේරු වාර්තා (EIA) සහ මූලික පාරිසරික පරීක්ෂණය (IEE) වාර්තා අදාළ නොවන සංවර්ධන කාර්යයන් සඳහා නිකුත් කරන අවසර පත්‍ර සහ හදිසි අවස්ථාවක දී නිකුත් කරන අවසර පත්‍ර |

**හදිසි අවස්ථාවකදී නිකුත් කරන අවසර පත් පහත පරිදි ය :**

* ගංවතුර පාලනය හෝ වෙනත් ස්වභාවික ආපදා අවම කිරීමේ පිළියම් සඳහා
* ගංවතුර පාලයනය වැලිපර ඉවත් කිරීම සඳහා
* කරදිය ගලා ඒම වැලැක්වීම සඳහා තාවකාලික ඉදිකිරීම
* මහජන ජීවිත/දේපළවලට හානියක් හෝ තර්ජනයක් විය හැකි අවස්ථාවකදී සිදුකළ යුතු කාර්යයන්
* ජාතික ආරක්ෂාව සම්බන්ධ ඉදිකිරීම්/සංවර්ධන කාර්යයන් සඳහා

මෙම හදිසි අවස්ථාවකදී නිකුත් කරන අවසරපත්වල වලංගු කාලය වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ලබයි.

**6.2.4 "A" වර්ගයේ සහ "B" වර්ගයේ අවසර පත්‍ර ඇගයීම සඳහා අධ්‍යක්ෂ ජනරාල් විසින් භාවිතා කරනු ලබන නිර්ණායකයන්**

යෝජිත ක්‍රියාකාරකම් පහත නිර්ණායකවලට අනුකූල විය යුතුය.

* පරිච්ඡේද 2 - 5 දක්වා ඇති කළමනාකරණ ප්‍රතිපත්ති සහ වෙනත් අතිරේක මාර්ගෝපදේශ හා අනුකූලවීම,
* මෙම සැලැස්ම මගින් දක්වා ඇති තහනම් සංවර්ධන කාර්යයන් නොවීම,
* නියම කරන ලද වෙරළ පසසිටුු ප්‍රමිතීන්ට අනුකූල වීම,
* මධ්‍යම පරිසර අධිකාරිය මගින් නියම කරන ලද වායු/ජල ගුණාත්මකභාවය, ශබ්ද, දෙදරීම් පිළිබඳ ප්‍රමිතීන්ට අනුකූල වීම,
* මුහුදු වෙරළ දිගේ සහ මුහුදු වෙරළට පිවිසීමට ඇති පොදු පිවිසුම් අවහිර නොකිරීම, සිරස් සහ තිරස් පොදු පිවිසුම් සහතික කිරීම,

* පවත්නා ධීවර කටයුතුවලට බාධා නොපමුනුවන බව හෝ අවහිර නොවන බව සහතික කිරීම,

* අදාළ රාජ්‍ය ආයතනයන්ගේ කලාපිකරණ යෝජනා ක්‍රම සහ/හෝ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව පිළිගත් මාර්ගෝපදේශ හා අනුකූල වීම,

* වෙරළ කලාපය තුළ (වගුව 6.3) සඳහන් ආරක්ෂිත ප්‍රදේශයන් තුළ ස්ථානගත නොකළ යුතුය,

* නම් කරන ලද පුරාවිද්‍යාත්මක, ඓතිහාසික හෝ සංස්කෘතික ස්ථානයක පරිධියේ සිට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් නියම කරන ලද අරයක් තුළ ස්ථානගත නොකළ යුතුය,

* වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත යටතේ ප්‍රකාශිත "සංරක්ෂිත ප්‍රදේශයක" හෝ බලපෑමට යටත්වන ප්‍රදේශයක" ස්ථානගත නොවිය යුතුය,

* අනවසරයෙන් පුරවන ලද ස්ථානයක නොවිය යුතුය,

* වෙරළ කලාපයේ ස්ථායිතාවයට හානි නොවන ස්වභාවික වෘක්ෂලතා ඉවත් නොකළ යුතුය,

* සේවාවන් දැනටමත් අඩුවෙන් සැපයෙන් ප්‍රදේශයන්හි වානිජ ව්‍යුහ, කර්මාන්ත සහ වාසස්ථාන සම්බන්ධයෙන් ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් ඇති කළ යුතුය,

* වැලි කඳුවල ස්වභාවික ක්‍රියාවලියට හානිදයක සංවර්ධන කාර්යයන් සිදු නොකළ යුතුය,

* මාර්ග, ඇළ මාර්ග, ගංගා, දොළ මාර්ග ආදියෙහි රක්ෂිතයන් අනුකූල විය යුතුය.

**6.2.5 වැලි ඉවත් කිරීම සඳහා වූ අවසර පත් නිකුත් කිරීමේ මාර්ගෝපදේශ**

වාණිජ නොවන භාවිතය සඳහා වැලි ඉවත් කිරීම පිණිස අවසර පත්‍ර නිකුත් කිරීමේදී පහත සඳහන් මාර්ගෝපදේශ අදළ වේ. වෙරළ කලාපයේ ගතික තත්ත්වය සැලකිල්ලට ගෙන ස්ථානීය මාර්ගෝපදේශයන් කලින් කලට අවශ්‍යතාවන් අනුව නිකුත් කළ හැකිය.

* වැලි ඉවත් කිරීම සඳහා අවසර දෙනු ලබන්නේ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් වෙරළ කලාපය තුළ හඳුනාගත් වෙරළ ඛාදනයට බලපෑමක් නොවන ප්‍රදේශයන්/ස්ථාන වලින් පමණකි. මෙම ස්ථාන දෙපාර්තමේන්තුව මගින් තීරණය කරනු ලබන පරිදි කලින් කලට වෙනස් කළ හැක.

* මුහුදට යාවූ කලපු මෝය හා ගංගා ආදියේ මුවදෙර සිට මීටර් 500ක රට අභ්‍යන්තරයට වන ජල ප්‍රදේශය තුළ හා ඉවුරු වලින් වැලි ඉවත් කිරීමට අවසර දෙනු නොලැබේ. එම ප්‍රදේශය තුළ වැලි ඉවත් කිරීමට අවසර දෙනු ලබන්නේ ගංවතුර පාලනයට හෝ නාවික මාර්ග සකස් කිරීම සඳහා පමණි.

* වැලි ඉවත් කිරීමේදී වෙරළබඩ තුරුලතාවලට අහිතකර බලපෑම් සිදු නොවිය යුතුය.

* වෙරළ කලාපයෙන් යන්ත්‍රානුසාරයෙන් වැලි ඉවත් කිරීම සඳහා අවසර දෙනු නොලැබේ.

* ඛාදක වෙරළ, විවර්ධනය නොවන වෙරළ, වැලි තුඩු හා වැලි වැටි වලින් වැලි ඉවත් කිරීමට අවසර දෙනු නොලැබේ.

* අලුතින් විවර්ධනය වූ හෝ කෘත්‍රිම වැලි පෝෂණය කළ ප්‍රදේශවල ඇති වෙරළින් වැලි ඉවත් කිරීමට අවසර නොදිය යුතුය.

* ජල පොම්පාගාර සඳහා ජලය ලබාගන්නා ස්ථාන අසල හෝ ඉවුරු ඛාදනයට ලක්වූ ගංගා සහ දෙල මාර්ගවලින් වැලි ඉවත් කිරීමට අවසර නොදිය යුතුය.

* වෙරළ කලාපය තුළ ජලතලයන්හි ආසන්න දෙපස භූමිය (Riparian land) තුළින් වැලි ඉවත් කිරීමට අවසර නොදිය යුතුය.

**6.2.6 වෙරළ කලාපය තුළ අවසර පත්‍ර නිකුත් නොකරන තහනම් කාර්යයන්**

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත යටතේ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් වෙරළ කලාපය තුළ අවසර පත්‍ර නිකුත් නොකරන තහනම් කරන ලද කාර්යයන් පහත දක්වේ.

* හිරිගල් ඉවත් කිරීම (සටහන :- පර්යේෂණ කාර්යයන් සඳහා හිරිගල් ඉවත් කිරීම අවශ්‍යවන විට ඉවත් කරන හිරිගල් වර්ගය, ප්‍රමාණය, ස්ථානය සහ ඉවත් කරන කාල සීමාව සඳහන් කරමින් හිරිගල්පර ඉවත් කිරීමේ අවසර පත්‍රයක් අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කළ හැක).

* වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් නම් කරන ලද ප්‍රදේශවලින් හැර වෙනත් ස්ථානවලින් වැලි ඉවත් කිරීම.

* විශේෂිත, දර්ශනීය හෝ සංස්කෘතික අගයක් නම් කළ ප්‍රදේශයක ගුණාත්මක භාවය සැලකිය යුතු පරිදි හානියට හේතු කරවන කවර හෝ සංවර්ධන කාර්යයන්.

* නම්කරන ලද ආරක්ෂක ප්‍රදේශයන් තුළ සිදු කරනු ලබන සංවර්ධන කාර්යයන් (මෙයට ස්වභාවික දැඩි රක්ෂිත, ජාතික උද්‍යාන, ස්වභාව රක්ෂිත, වන පිවිසුම්, සමුද්‍රීය රක්ෂිත, සීමාන්තරික කලාප, රැම්සා තෙත්බිම්, අභය භූමි, රක්ෂිත වනාන්තර සහ ජාතික උරුම වන භූමි අයත් වේ).

* අනවසරයෙන් ජලතලයන් පුරවන ලද ස්ථාන, "බලපෑමට යටත් ප්‍රදේශ" හා "සංරක්ෂණ ප්‍රදේශ" ලෙස නම්කල ස්ථානවල සිදුකරන සංවර්ධන කාර්යයන්.

* වෙරළ කළමනාකරණ සැලසුම් මගින් හෝ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් නම්කරන ලද පුරාවිද්‍යාත්මක, ඓතිහාසික, සංස්කෘතික ස්ථානයේ මායිමේ සිට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් නියම කරන ලද අරයක් තුළ සංවර්ධන කාර්යයන් සිදු කිරීම.

**6.2.7 "බලපෑමට යටත් ප්‍රදේශය" සහ "සංරක්ෂිත ප්‍රදේශයන්හි" තහනම් කාර්යයන්**

* 2011 අංක 49 දරන පනත මගින් සංශෝධිත 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත අනුව, බලපෑමට යටත් ප්‍රදේශයක් ලෙස ගැසට් නිවේදනය මගින් ප්‍රකාශිත ප්‍රදේශයක් තුළ කිසිදු සංවර්ධන කාර්යයක් හෝ ජලජ හෝ මුහුදු ජීවීන්ට හානිවන අපද්‍රව්‍ය මුදා හැරීම, බාධා කිරීම, පිරවීම, ඉදිකිරීම්ද තහනම් වේ.

* 2011 අංක 49 දරන පනත මගින් සංශෝධිත 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත අනුව සංරක්ෂිත ප්‍රදේශයක් ලෙස ගැසට් මගින් ප්‍රකාශිත ප්‍රදේශයක් තුළ විද්‍යාත්මක හෝ පර්යේෂණ කාර්යයන් සඳහා අවසර දෙනු ලබන කාර්යයන් හැර කිසිදු සංවර්ධන කාර්යයක් හෝ ජලජ සම්පත් එක්රැස් කිරීමක් සිදු නොකළ යුතුය.

**6.2.8 ආරක්ෂිත ප්‍රදේශයන් සඳහා වූ වෙරළ රක්ෂිතයන්**

* වගුව 6.3හි සඳහන් ආරක්ෂිත ප්‍රදේශ සහ අනෙකුත් රැම්සා තෙත්බිම්, රක්ෂිතයන්, අභය භූමි වෙන් කරන ලද වන ප්‍රදේශ, සංරක්ෂිත වනාන්තර, ජාතික උරුම ප්‍රදේශ දැඩි ස්වාභාවික රක්ෂිත, ජාතික වන උද්‍යාන, ස්වභාවික රක්ෂිත, සමුද්‍රීය රක්ෂිත අභය භූමි, වන පිවිසුම් වෙරළ කලාපයේ යම් ප්‍රදේශයක ඇතුළත් වේ නම් එම සම්පූර්ණ කලාපයම ඉදිකිරීම් නොකළ යුතු ප්‍රදේශයක් ලෙස සැලකේ.

මීටර් 200ක මුල් වෙරළාරක්ෂිතයන් සියලුම වෙරළබඩ පුරාවිද්‍යාත්මක ස්ථාන සඳහා යොදා ගත යුතු ය.

## 6.3 පස සිටු ප්‍රදේශ (set - back areas)

**6.3.1 නව නෛතික විධිවිධාන යටතේ රක්ෂිතයන් සහ වෙරළ පසසිටු සංශෝධනය කිරීම**

2011 අංක 49 දරන සංශෝධන පනත මගින් 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනතට කරන ලද සංශෝධනයන් අනුව, ජල තලයන්හි දෙපස භූමියේ මීටර් 100ක් (Riparian land) අයත් වන ලෙස "වෙරළ කලාපය" නැවත

අර්ථකථනය කරන ලදී. මේ අනුව දෙපස භූමියේ සිදු කරනු ලබන සංවර්ධන කටයුතුවලින් සිදුවන බලපෑම් අවම කිරීම සඳහා එවැනි සංවර්ධන කටයුතු පාලනය කිරීමේ බලය ද නව සංශෝධන මගින් වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත. ප්‍රදේශ දෙක අතර ඉතා සමීප සබඳතාවක් තිබුනද එම ප්‍රදේශවල ජීව භෞතික ගති ලක්ෂණ සහ අන්තරායට ලක්විය හැකි තත්ත්වය අනුව වෙනස් වෙයි. මේ නිසා සංවර්ධන කටයුතු සඳහා රක්ෂිතයන් හෝ පස සිටු තීරණය කිරීමේදී වෙනස් වූ නිර්ණායකයන් යොදා ගත යුතුය.

#### 6.3.2 පසසිටුවක් මගින් අපේක්ෂිත අරමුණු

* ඛාදනයෙන් සහ කුණාටු තර්ජනයෙන් ජීවිත/දේපළ ආරක්ෂා කිරීම.

* වෙරළ ආරක්ෂණ ව්‍යුහ සඳහා වූ පොදු ආයෝජන අවම කිරීම.

* වෙරළබඩ පරිසරයේ දර්ශනීය අගය වැඩි කිරීම සහ ආරක්ෂා කිරීම, අන්තරායට ලක්විය හැකි වෙරළබඩ පරිසරයන් සහ අද්විතීය ස්වභාවික ප්‍රදේශ ආරක්ෂා කිරීම.

* වෙරළ කලාපය තුළ පිහිටි පුරා විද්‍යාත්මක, ඓතිහාසික ආගමික සහ සංස්කෘතික ස්ථාන වටා ස්වාරක්ෂක කලාප සැපයීම.

* වෙරළ ඔස්සේ සහ වෙරළ වෙතට වූ මහජන පිවිසුම සහතික කිරීම.

* ජාතිකවූත්, ප්‍රාදේශීයවූත් නීති සහ සැලසුම් අතර එකඟතාවයක් පවත්වා ගැනීම.

* ජාතික සංවර්ධන අභිමතාර්ථ සහ පාරිසරික අරමුණු අතර එකඟතාව සහතික කිරීම.

### 6.4 වෙරළ පසසිටුව අර්ථ දැක්වීම

#### 6.4.1 මධ්‍ය වඩදිය ඉමේ සිට ගොඩබිම දෙසට වූ සංවර්ධන කාර්යයන් සඳහා වූ වෙරළබඩ පසසිටුව

මධ්‍යම වඩදිය ඉමේ සිට ගොඩබිම දෙසට පිහිටි ප්‍රදේශය තුළ සංවර්ධන කටයුතු කිරීමේදී ප්‍රමාණවත් පසසිටුවක් වෙන්කළ යුතුය. මුළු පසසිටු ප්‍රදේශ කොටස් දෙකකින් සමන්විත වේ. එනම් අදළ වෙරළ කාණ්ඩයේ මුහුද දෙසට පවත්නා යොමු ඉම සහ ගොඩබිම දෙසට ඇති යොමු ඉම අතර පිහිටි "වෙන්කළ ප්‍රදේශ" සහ "සීමාකළ ප්‍රදේශ" යන කොටස් සහිතවය.

**වෙරළ පසසිටුව යනු :** යම් සංවර්ධන කාර්යයන් තහනම් කරන ලද හෝ සැලකිය යුතු සීමාවක් පනවන ලද්ද වූ වෙරළ කලාපය තුළ පිහිටි පටු බිම් තීරයක් හෝ බිම් පටියකි. මුළු වෙරළ පසසිටුව කොටස් දෙකකින් සමන්විත වේ. එනම් විශේෂිත වෙරළ කාණ්ඩයක් තුළ ගොඩබිමට පිහිටි ඉම සහ මුහුද දෙසට පිහිටි යොමු ඉම අතර පවතින "වෙන්කළ ප්‍රදේශය" සහ "සීමාකල ප්‍රදේශය" ද වේ.

**මුහුද දෙසට පවත්නා යොමු ඉම**

වෙරළ පසසිටුව සඳහා මුහුද දෙසට පවත්නා යොමු ඉම වෙරළ ස්ථිර තුරුලතා තීරයේ සිට සලකුණු කිරීමේ අයිතිය වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව සතුව ඇත. එහිදී පොල් (Cocos nucifera), මහාරාවනා රැවුල (Spinifex littoreus), වැටකෙයියා (Pandanus ssp.) හෝ මුදිල්ලා (Barringtonia speciosa) වැනි ස්ථිර ශාක ලෙස සැලකේ. තව ද, ස්ථිර තුරුලතා තීරය පැහැදිලි නොවන ස්ථානයක වෙරළ රක්ෂිතයන් තීරණය කිරීමේදී යෝග්‍ය සමෝච්ඡ රේඛාවක් හෝ ගොඩබිම දෙසට පිහිටි වැලි වැටිවල ගොඩබිම පාමුල හෝ තුඩුවක දඹයක මුහුද දෙසට ඇති ඉම හෝ දූනට පවත්නා වෙරළ මත ඉදිකර ඇති වෙරළ ආරක්ෂණ ව්‍යුහයක් මුහුද දෙසට ඇති යොමු ඉම ලෙස තීරණය කිරීමේ අයිතිය වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව සතුව ඇත.

ගොඩබිම දෙසට ඇති යොමු ඉම යනුවෙන් හැඳින්වෙන්නේ පස සිටු කලාපය ගොඩබිම දෙසට ඇති සීමාවයි.




6.2 රූපය : වෙරළ කලාපය තුළ පසසිටු ප්‍රදේශවල සාපේක්ෂ පිහිටීම

දිවයිනේ සමස්ත වෙරළ පසසිටු තීරය කොටස් 105කට බෙදා ඇත. (වගුව 6.1) එක් එක් කොටස් සඳහා 1 සිට 105 දක්වා අංක යොදා ඇත. එක් එක් වෙරළ කාණ්ඩය තවදුරටත් වෙන්කළ ප්‍රදේශ සහ සීමාකළ ප්‍රදේශය ලෙස උපකොටස් දෙකකට බෙදේ (6.2 රූපය) වෙන්කළ ප්‍රදේශය පිහිටන්නේ වෙරළට ආසන්නව බැවින් එය තහනම් කලාපයකට අනුරූප වන අතර අවසර දෙනු ලබන්නේ අවම ලෙස අත්‍යාවශ්‍ය පරිහරණය සඳහා පමණි. මෘදු කලාපය ලෙස සැලකිය හැකි සීමාකල ප්‍රදේශය පරිහරණය කළ හැක්කේ මෙම පරිච්ඡේදයේ දක්වා ඇති අඩු බලපෑම් සහිත කාර්යයන් සඳහා පමණි. යම් ස්ථානයක වෙරළ ඛාදන අන්තරායකට ලක්විය හැකිනම් ඒ ස්ථානයේ වෙන්කල ප්‍රදේශයේ සහ සීමාකළ ප්‍රදේශය වෙනස් වේ.

6.4.2 වෙරළ පස සිටුවේ වෙන්කළ ප්‍රදේශ සහ සීමාකළ ප්‍රදේශ

"වෙන් කළ ප්‍රදේශය" වෙරළට ඉතා ආසන්න ප්‍රදේශය වන අතර එය "ඉදිකිරීම් රහිත" ප්‍රදේශය ලෙස සලකන අතර ඉතා අත්‍යාවශ්‍ය භාවිත/ක්‍රියාකාරකම් පමණක් සඳහා අවසර දෙනු ලබයි.

"සීමාකල ප්‍රදේශය" අඩු බලපෑම් සහිත සංවර්ධන කාර්යයන් සඳහා භාවිතා කළ හැක. ඒ ඒ වෙරළ කාණ්ඩයේ අවදානම් සහිත බව අනුව වෙන්කළ සහ සීමාකල ප්‍රදේශය වෙනස් වේ.

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් වෙරළ පසසිටුව වෙන් කිරීමේදී භාවිතා කරන ලද නිර්ණායකයන් :

* වෙරළ ඛාදන සීඝ්‍රතාවන්

* පරිහරණ ගැටලු මට්ටම

* පුරාවිද්‍යාත්මක සහ සංස්කෘතික වැදගත්කම

* වෙරළ කලාපය තුළ ජලතල දෙපස ඉවුරු ඛාදන තත්ත්වයන්

* යෝජිත භූමියට අදාළ නෛතික තත්ත්වයන්

* වෙරළ ආරක්ෂණ පිළියම් ක්‍රියාත්මක කොට ඇති ප්‍රමාණය

* ආරක්ෂිත ප්‍රදේශයන්

* සුළි සුළං, උදම් රළ, සුනාමි වැනි ස්වාභාවික සංසිද්ධිවලට නිරාවරණය වීම

* භූරූපන විද්‍යාත්මක අනු ලක්ෂණ

* වෙරළබඩ පරිසර පද්ධති අන්තරායට ලක්වීමේ හැකියාව

* උදම් වෙනස, උපරිම රළ මට්ටම, මුහුදු මට්ටම ඉහළ යාම

* සංවර්ධන මට්ටම

* විනෝදාත්මක සහ ස්වභාවික අගයන් දර්ශනීය බව වැනි අනෙක් ස්වභාවික ලක්ෂණ

* ජාතික ආරක්ෂාව පිළිබඳ තත්වයන්

**6.4.3 වෙරළ පසසිටු සැකසීමේදී භාවිතා කරන ලද නිර්නායකයන්**

මධ්‍ය වඩදිය ඉමේ සිට ගොඩබිම දෙසට වන ප්‍රදේශයේ සංවර්ධන කටයුතු කිරීමේදී තැබිය යුතු වෙරළ පසසිටු සැකසීම සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව භාවිතාකරන ලද නිර්නායකයන් ඃ

* වෙරළ ඛාදන සීඝ්‍රතාවය

* භාවිත ගැටලු මට්ටම

* පුරාවිද්‍යාත්මක සහ සංස්කෘතික ස්ථානයන්හි වැදගත්කම

* වෙරළ කලාපය තුළ පිහිටි ජල තලයන්හි ඉවුරුවල ඛාදන තත්ත්වය

* ස්ථානයට අදාළ නීතිමය තත්ත්වය

* නෛතික (Statutory) සීමාවන්

* ආරක්ෂිත ප්‍රදේශ

* සුනාමි, සුලි සුළං, වඩදිය ගැලීම් වැනි ස්වභාවික ආපදාවන්ට නිරාවරණය වූ ප්‍රමාණය

* භූ විද්‍යාත්මක ගති ලක්ෂණ

* වෙරළබඩ පරිසර පද්ධති අස්ථායීතාව

* සංවර්ධනයේ මට්ටම

* දර්ශණීය බව, විනෝදාත්මක සහ පාරිසරික සේවාවන්ගේ වටිනාකම වැනි අනෙකුත් ස්වභාවික ගති ලක්ෂණයන්ගේ වැදගත්කම

* ජාතික ආරක්ෂාව පිළිබඳ අවශ්‍යතා.

6.4.4 වෙරළ පසසිටුවේ වෙන් කරන ලද ප්‍රදේශය තුළ අවසර ඇති කාර්යයන්

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පහත සඳහන් කාර්යයන් කිරීම සඳහා අවසර පත්‍රයක් නිකුත් කළ හැකි අතර එම කාර්යය මගින් අදාළ වෙරළ කාණ්ඩයට හෝ ඊට යාබද වෙරළ කාණ්ඩයට කුමන හෝ අහිතකර බලපෑමක් නොවන බටවත් වෙරළ තීරය දිගේ වූ තිරස් පිවිසුමට හෝ සිරස් පිවිසුමට බාධා නොවන බවටත් තහවුරු කළ යුතු ය.

- වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වෙරළ ඛාදන කළමනාකරණ ක්‍රමෝපායන්ට අනුකූල වෙරළාරක්ෂක නිර්මාණයන්
- ජැටි, පියර් (තොට) කේබල් මාර්ග, දියත් මග (Slipway)
- පොළව යටින් දිවෙන මුහුදු ජලය ලබාගන්නා ස්ථාන, නළ ළිං හා ආශ්‍රිත ඉදි කිරීම්
- නාවික ඇළ මාර්ග සඳහා පවතින බාධා ඉවත් කිරීම.
- වානිජ වටිනාකමක් ඇති ඛනිජ ඉවත් කිරීම.
- පොලව යටින් දිවෙන සන්නිවේදන මාර්ග, අපද්‍රව්‍ය බැහැර කිරීමේ නල මාර්ග, බල ශක්ති උත්පාදන, ගෑස් තෙල් බෙදා හැරීමේ මාර්ග සහ අනෙකුත් වෙරළාශ්‍රිත පොදු පහසුකම්.
- වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව අනුමත කරන ලද වෙරළ ස්ථායීකරණ සහ දර්ශනීය වටිනාකම් ඉහළ දැමීමේ සංරක්ෂණ කටයුතු.
- මාස 6ට නොවැඩි කාලයක් වලංගුවන ලෙස මාදැල් කටයුතු සඳහා තාවකාලික ඉදිකිරීම් සඳහා (මෙම ස්ථාන 1985 පෙබරවාරි 21 දිනැති අංක 337/48 ගැසට් නිවේදනය මගින් ප්‍රකාශිත මා දැල් පාඩු ස්ථාන) පහත නිර්ණායකයන් මත ඉදිකිරීමට.
    - වහල - ඉලුක්, කැන්වස්, රෙදි හෝ තාර තහඩු, පොල් අතු
    - බිත්ති - පොල් අතු, ලෑලි, උණ බම්බු කැන්වස්, ප්ලාස්ටික්
    - ගෙබිම - වැලි, මඩ, මැටි, දැව
    - වෙනත් තාවකාලික පරිසර හිතකාමී ඉදිකිරීම්
    - අත්තිවාරම - ස්ථිර අත්තිවාරමක් නොවිය යුතු ය.
    - ව්‍යුහයේ පළල - මුහුදු වෙරළේ පළලින් 30% වඩා අඩුවිය යුතු ය.
    - ව්‍යුහයේ දිග - මී. 10 (අඩි 33) වඩා අඩුවිය යුතු ය.
- ජාතික ආරක්ෂාව සඳහා අත්‍යාවශ්‍ය ඉදිකිරීම්
- ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් සැලසුම් කරන ලද මාදැල් පාඩු සඳහා වූ පහසුකම්
- අතිරේක රක්ෂිතයන් සැපයීම සඳහා වූ පිරවීම්
- වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශවලට අනුකූලව සිදුකරනු ලබන වෙරළ තීර ජල ප්‍රදේශ සංවර්ධනයන් (water front dvelopment)
- සුනාමි කුටි, සංඥා කුළුණු, සහ ජීවිතාරක්ෂක නිරීක්ෂණ කුළුණු

### 6.4.5 සීමා කළ ප්‍රදේශය තුළ අවසර ඇති කාර්යයන්

සීමා කළ ප්‍රදේශය කිසිදු සංවර්ධන කාර්යයකින් තොරව පවත්වා ගැනීම සුදුසු කළමනාකරණ ක්‍රියාවලියක් වන නමුත් වෙරළ කලාපයේ ඉඩම් පරිහරණය, අධික ජනගහන සනත්වය සහ ඉඩම් කැබලිවල ප්‍රමාණය සැලකිල්ලට ගත්විට මෙය සාමාජීය වශයෙන් සෑම විටම පිළිගත නොහැකිය. මේ නිසා වඩාත් ලිහිල් කළමනාකරණ ක්‍රමෝපායයන් අවශ්‍ය වේ. කර්මාන්ත හා අදාළවූ ඉදිකිරීම් සඳහා අවසර නොදෙන අතර සීමා කළ ප්‍රදේශය සංචාරක සහ නේවාසික කටයුතුවලට අදළ ගොඩනැගිලිවලට සීමා වේ. කෙසේ වුවත් එවැනි ඉදිකිරීම්වලින් වෙරළ පිවිසුමට බාධා නොවිය යුතුය.

### 6.4.6 වෙරළ පසසිටුවෙන් නිදහස් කිරීම (Set Back Exemption)

වෙරළ පසසිටුවෙන් නිදහස් කිරීම යන්නෙන් අදහස් කරනුයේ මෙම සැලැස්ම මගින් නියමකර ඇති වෙරළ රක්ෂිතයන් (පසසිටුවන්) පිළිබඳ මාර්ගෝපදේශයන්ගෙන් සැලකියයුතු ලෙස බැහැර වීමකි. නිදහස් කිරීමක් අනුමත කරනුයේ මහජනතාවට අවශ්‍ය කරන පෞද්ගලික නොවන පොදු සංවර්ධන කාර්යයන් සඳහා පමණි. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ට නිදහස් කිරීම අනුමත කළ හැක්කේ මේ සඳහා වූ සාධාරණ කරුණු තිබේයයි වෙරළ සංරක්ෂණ සහ වෙරළ කළමනාකරණ උපදේශක සභාව තීරණය නිර්දේශ කළහොත් පමණි. තවද මෙම සංවර්ධන කාර්යය සඳහා වෙනත් විකල්පයක් නොමැති අවස්ථාවකදී විය යුතුය.

වෙරළ රක්ෂිතයන් තුළ සීමා කරන ලද සංවර්ධන කටයුතු සඳහා නිදහස් කිරීම සඳහා පහත නිර්ණායක සලකා බැලේ.

1. යෝජිත සංවර්ධන කාර්යය පොදු අවශ්‍යතාවයන් සඳහා විය යුතු අතර සමස්ත ප්‍රජාවම විසින් ප්‍රතිලාභ ලැබිය යුතු අතර පෞද්ගලික අවශ්‍යතාවන් මත නොවිය යුතුය. එම සංවර්ධන කාර්යයන් පහත ක්ෂේත්‍රයන්ගෙන් විය යුතුය.

    - ප්‍රවාහන පහසුකම්, බලශක්ති, සන්නිවේදන, පොදු යටිතල පහසුකම් හා සම්බන්ධිත අනෙකුත් සංවර්ධන කාර්යයන්
    - වෙරළ පිවිසුම විවෘත කොට දෙනු ලබන, පොදු ආර්ථික ප්‍රතිලාභ ජනිත කරනු ලබන හෝ ජලය මත පදනම් වූ සංවර්ධන කාර්යයන්
    - ජාතික ආරක්ෂාව සඳහා අදළ සංවර්ධන කාර්යයන්
    - පරිසර තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා වූ සංවර්ධන කාර්යයන්
    - ජීවිත හා දේපල ආරක්ෂා කරනු ලබන ක්‍රියාකාරකම

2. අහිතකර පාරිසරික බලපෑම් සහ/හෝ පරිහරණ ගැටුම් අවම කිරීම සඳහා හේතු සහගත සියලු පියවරයන් ගත යුතුයි.

3. අත්‍යවශ්‍ය මහජන කටයුතු උදෙසා හේතු සහගත අන් විකල්පයක් නොමැති අවස්ථාවක විය යුතුයි.

### 6.4.7. වෙරළ පසසිටුව වෙනස් කිරීම් (Set back variance)

වෙරළ පසසිටුව වෙනස් කිරීමක් යනුවෙන් අදහස් කරනුයේ මෙම සැලැස්මේ සඳහන් වෙරළ පසසිටුව අඩු කිරීමයි. නිදහස් කිරීමක් මෙන් නොව රජයේ සහ පොදු අවශ්‍යතා සඳහා පමණක් නොව පෞද්ගලික අවශ්‍යතා සඳහා ද වෙරළ පසසිටුව වෙනස් කිරීමක් සඳහා ඉල්ලුම් කළ හැක. වෙරළ පසසිටුව වෙනස් කිරීම සඳහා ඉල්ලීමක් වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල්වරයාට අනුමත කළ හැක්කේ එම ඉල්ලීම සඳහා සාධාරණ හේතු ඇතැයි වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ උපදේශක සභාව නිර්දේශ කරන්නේ නම් පමණි.

වෙරළ පසසිටුව වෙනස් කිරීම සලකා බැලීම සඳහා පහත නිර්ණායකයන් භාවිත කෙරේ.

- යෝජිත සංවර්ධන කාර්යය සීමා කළ ප්‍රදේශයට පමණක් සීමා විය යුතුය.
- යෝජිත වෙනස් කිරීම මගින් කිසිදු භාවිත ගැටලුවක් හෝ අහිතකර පාරිසරික බලපෑමකට හේතු නොවිය යුතුය. මෙහිදී පරිසර බලපෑම් ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ උපදේශක සභාව පහත සඳහන් කරුණු පිළිබඳ සැලකිලිමත් විය යුතුයි.
    - අදළ වෙරළ පසසිටු වෙනස් කිරීම ඉල්ලා ඇති සංවර්ධන කාර්යය සිදු කිරීමට යෝජිත ප්‍රදේශයේ වෙරළ ඛාදන සීඝ්‍රතාවය.
    - අදළ සංවර්ධන කාර්යය හේතු කොට ගෙන වෙරළ ඛාදනය ඉහළ යාමේ සීඝ්‍රතාවය
    - අදළ වෙනස් කිරීම නිසා යෝජිත සංවර්ධන කාර්යය මගින් ආශ්‍රිත පරිසර පද්ධතිවලට වියහැකි අහිතකර බලපෑමේ ප්‍රමාණය.

- පාෂාණ, ශාක හෝ වැලි වැටි අඩු වැඩි වීම වැනි භූරූප විද්‍යාත්මක අනුලක්ෂණ කෙරෙහි අහිතකර ලෙස බලපෑමේ ප්‍රමාණය.

- අදාළ ස්ථානයේ භූමියේ ස්ථායීතාවය සහ භූමිසංයුතිය අනුව යෝජිත භූමිය පිහිටීමේ උස ප්‍රමාණය සැලකිල්ලට ගත හැක.

- යෝජිත ක්‍රියාකාරකම් සහ පවත්නා වෙරළාරක්ෂණ ව්‍යුහය අතර ඇති පරස්පර බලපෑම්.

- මෙම අයදුම්පත හේතුකොට ගෙන ගන්නා තීරණයෙන් විය හැකි පූර්වාදර්ශයන්.

➢ ප්‍රශ්නයට ලක් වී ඇති ස්ථානයේ තත්ත්වය හේතුකොට ගෙන පසසිටුව ප්‍රමිතිය මගින් අයදුම්කරු අධික දුෂ්කරතාවයට පත්වීම.

➢ පවත්නා දුෂ්කරතා අවම කර ගැනීම සඳහා වෙනස් කිරීම මගින් ඉල්ලුම් කරනු ලබන්නේ දුෂ්කරතාවෙන් මිදීම සඳහා වූ අවම අවශ්‍යතාවය වීම.

➢ ඉහත කී අධික දුෂ්කරතාවය යනු ඉල්ලුම්කරුගේ කිසිදු පූර්ව ක්‍රියාවක ප්‍රතිපලයක් නොවිය යුතුය.

➢ ඉල්ලුම්කරන ලද වෙනස් කිරීමේ ප්‍රමාණය සීමා කළ කලාපයෙන් 50% නොඉක්මවිය යුතුය. (ජලය මත පදනම් වූ සංවර්ධන කටයුතු හැර)

*6.4.8 මහජනයා විසින් පෙර වෙරළ භාවිතා කිරීම පාලනය කිරීම*

1. **පෙර වෙරළේ තහනම් සංවර්ධන කාර්යයන් :**

   ➢ පෞද්ගලිකමය කටයුතු සඳහා වන සියලුම ඉදිකිරීම්
   ➢ පෙර වෙරළ මත වැටවල් ඉදිකිරීම
   ➢ පැල සිටුවීම හා රුක් රෝපණය
   ➢ ඝණ අපද්‍රව්‍ය හා අපවිත්‍ර ජලය බැහැර කිරීම
   ➢ කන්ටේනර් පෙට්ටි සහ ධීවර කටයුතු සඳහා යොදාගත් එහෙත් දැනට භාවිතා නොකරන යාත්‍රා, උපකරණ යොදා ගනිමින් සිදුකරන ඉදිකිරීම්

2. **පොදු අවශ්‍යතා මත හා ජාතික සංවර්ධනයට අදාළ විශේෂ අවශ්‍යතා මත පමණක් වෙරළ මත අවසරය ලබාදිය හැකි සංවර්ධන කාර්යයන් :**

   ➢ මාදැල් වාඩි සහ මාදැල් වරායන්
   ➢ සාගර පිටවාන්, මුහුදු ජලය ලබාගන්නා ස්ථාන
   ➢ වරායන් සහ ධීවර වරායන්ට අදාළ ඉදිකිරීම්
   ➢ ජීවිතාරක්ෂක කුලුණු
   ➢ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද වෙනත් ව්‍යාපෘති

*6.4.9 පවත්නා ගොඩනැගිලි පුළුල් කිරීම හෝ නවීකරණය/අලුත්වැඩියාව සඳහා අවසර පත්‍ර නිකුත් කිරීම සඳහා වූ මාර්ගෝපදේශ*

වෙරළ කලාපය තුළ නාගරික සංවර්ධනය, දර්ශනීය - ඓතිහාසික සහ සංස්කෘතික වටිනාකම්, ඉඩම් හිඟය සහ පවතින අධික මිල ගණන් සැලකිල්ලට ගෙන බොහෝ විට පවත්නා ගොඩනැගිලි වෙනස් කිරීම සහ විශාල කිරීම සඳහා වූ ප්‍රවණතාවයක් ඇත. මෙවැනි කටයුතු සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව අවසර පත් නිකුත් කිරීමේදී අවිනිශ්චිතතා සහ ගැටලු ඉස්මතුවීම වැලැක්විය නොහැක. එවැනි අවස්ථා මගහැරවීම සඳහා වෙරළ කලාපය තුළ එවැනි සංවර්ධන කටයුතු කිරීමේදී පහත සඳහන් මාර්ගෝපදේශ භාවිතා කළ යුතුය.

➢ පවතින ගොඩනැගිල්ලේ බිම් මහලේ ගෙබිම (ground floor) වර්ග ප්‍රමාණය වැඩි කිරීමට හෝ පුළුල් කිරීම නොකළ යුතුය.

➢ අදාළ වෙරළ කණ්ඩයට අයත් නියම කරන ලද වෙරළ පසසිටුව තැබීමට ප්‍රමාණවත් ඉඩ ප්‍රදේශයක් නොමැති නම් බිම් මහලේ ගෙබිම පුළුල් කිරීමට ඉඩ නොදෙනු ඇත.

➢ පිහිනුම් තටාක, පල්දොරු ටැංකි, මුහුදු තාප්ප හෝ වෙනත් ව්‍යුහ ගොඩනැගිල්ලේ වෙරළ ඉදිරිපස ස්ථානගත නොකළ යුතුය.

- අදාළ ගොඩනැගිලි හා සම්බන්ධිතව පුරාවිද්‍යාත්මක, ආගමික හෝ ඓතිහාසික අගයක් තිබේ නම් එවැනි ගොඩනැගිලි වෙනස් කිරීම හෝ පුළුල් කිරීම සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය අවශ්‍ය වේ.

- පවත්නා ගොඩනැගිලි නවීකරණය කිරීම හෝ පුළුල් කිරීම පිළිබඳ සැලසුම් වෙරළබඩ ජලතීර සංවර්ධන සැලසුම්වලට හා වෙරළාරක්ෂණ සැලසුම්වලට අනුකූල විය යුතුය.

**6.4.10 සංචාරක සහ විනෝදාත්මක කටයුතු සඳහා වෙරළ කලාපයේ ජලාශ්‍රිත ඉදිකිරීම් සහ දූපත් සංවර්ධනය සඳහා වූ මාර්ගෝපදේශ**

සංචාරක සහ විනෝදාත්මක කටයුතු සඳහා වෙරළාශ්‍රිත ජල ප්‍රදේශයන්හි නේවාසික ඉදිකිරීම් (water bungalows) ස්ථාපිත කිරීම සහ දූපත් සංවර්ධනයේ දී ඉස්මතු විය හැකි පාරිසරික, සමාජ ආර්ථික ගැටලු විවිධ වන අතර පහත සඳහන් ක්ෂේත්‍රයන්හි නිරූපනය වේ.

- පාරිසරික සම්පත්වල සංවේදී ස්වභාවය හේතුකොට පීඩාවන්ට ඔරොත්තු දිය හැකි මට්ටම පහළ මට්ටමක පැවතීම.

- රඳවා ගැනීමේ ධාරිතාව සීමාවීම

- දිය කඩන, ජැටි සහ ගොඩ බෑමේ වේදිකා ඉදිකිරීම වැනි වෙරළබඩ ව්‍යුහයන් මගින් ඇතිවිය හැකි බලපෑම

  (දූපත් වටා වැලි ප්‍රවාහයට බාධා ඇතිවීම, කැනීම හේතුකොට තරංගවල ඇතිවිය හැකි වෙනස්කම්, කොරල්, මුහුදු තෘණ සහ අනෙකුත් ඉදිකිරීම් මගින් සමුද්‍රීය පරිසර පද්ධති විනාශ වීම).

- හානි අවම කර ගැනීම සඳහා අමතර ආරක්ෂණ ව්‍යුහයන් ඉදි කිරීම

- ඛාදනය සහ වැලි තැන්පත්වීමේ රටාවන් වෙනස්වීමට හේතුවන වෙරළබඩ පැලෑටි ඉවත් කිරීම

- ඝන අපද්‍රව්‍ය සහ ද්‍රව අපද්‍රව්‍ය එක් රැස්වීම

- ධීවර කටයුතු සහ සංචාරක කටයුතු අතර භාවිත ගැටලු ඉස්මතු වීම

- දූපත් හා සම්බන්ධ වෙරළබව ක්‍රියාවලිය පිළිබඳ ඓතිහාසික දත්ත සහ තොරතුරු නොමැති වීම.

වෙරළ කලාපය තුළ සංචාරක සහ විනෝදාත්මක කටයුතු සඳහා ජලාශ්‍රිත නේවාසික පහසුකම් (water bungalows) සහ දූපත් සංවර්ධනයේදී ඇතිවිය හැකි දැඩි අහිතකර බලපෑම් සැලකිල්ලට ගෙන පහත සඳහන් මාර්ගෝපදේශයන් අවසර පත්‍ර නිකුත් කිරීමේදී අදාළ වේ.

(1) ප්‍රධාන ගොඩබිමින් සහ තෝරාගත් කලපු සහ ජලතලයන්ගෙන් වෙන්වූ කුඩා දූපත් ආශ්‍රිතව පමණක් ජලාශ්‍රිත නේවාසික පහසුකම් (water bungalows) ස්ථාපිත කිරීම සඳහා අවසර පත්‍ර නිකුත් කිරීම සලකා බැලිය හැකිය.

(2) දැනට පවත්නා නෛතික විධිවිධානවලට අනුකූලව වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත සහ ජාතික පාරිසරික බලපෑම් ඇගයීම් තක්සේරු වාර්තාවන්හි සොයා ගැනීම් පදනම්කොට එවැනි සංවර්ධන කටයුතු සඳහා අවසර පත්‍ර නිකුත් කිරීම ඒ ඒ ව්‍යාපෘති අනුව සිදු කළ හැක.

(3) දූපත්/කලපු ආශ්‍රිත වෙරළබඩ පරිසරයේ තිරසාර කළමනාකරණය සහතික කිරීම සඳහා මූලික පාරිසරික පරීක්ෂණ සහ පාරිසරික බලපෑම් තක්සේරු වාර්තා පදනම්කොට පාරිසරික කළමනාකරණ සැලැස්මක් සකස්කොට ක්‍රියාත්මක කිරීම අදාළ සංවර්ධකයා විසින් කළ යුතුය.

(4) ජලාශ්‍රිත සංචාරක බංගලා හෝ විනෝදාත්මක යටිතල පහසුකම්, ජීවී හිරිගල්පර හෝ මුහුදු තෘණ ස්ථානයන්හි හෝ ආසන්නව ස්ථානගත නොකළ යුතුය.

(5) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පමුණුවා ඇති ජාතික උද්‍යාන මායිමේ සිට කිලෝමීටර් 1.6 පරිධියක් තුළ ජලාශ්‍රිත සංචාරක බංගලා ඉදි නොකළ යුතුය.

(6) අභය භූමි සමුද්‍රීය ආරක්ෂිත ප්‍රදේශයන් තුළ ජලාශ්‍රිත සංචාරක බංගලා හෝ අදාළ යටිතල පහසුකම් ස්ථානගත කිරීම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ එකඟතාව දෙනු ලබන්නේ නම් අවසර දෙනු ඇත.

(7) ගංගා මෝය, කලපු හෝ ඇළ මුවදෙර සිට මීටර් 500ක ජලතලය තුළ සහ දෙපස පිහිටි භූමියේ ජලාශ්‍රිත සංචාරක බංගලා ස්ථානගත නොකළ යුතුය.

(8) වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ පවත්නා ගංගා, ඇළ මාර්ග සහ අනෙකුත් ජල තලයන්හි ජලාශ්‍රිත සංචාරක බංගලා සහ අනෙකුත් අදාළ යටිතල පහසුකම් ස්ථානගත කිරීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය අවශ්‍ය වේ.

(9) "පාරිසරික ආරක්ෂණ ප්‍රදේශන්" ලෙස නම් කරන ලද ස්ථානයන්හි සියලු සංවර්ධන කටයුතු ස්ථානගත කිරීමේදී මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලබාගත යුතුය.

(10) ජලාශ්‍රිත සංචාරක බංගලාවන්ගෙන් අප ජලය හෝ අපද්‍රව්‍ය මුදාහැරීම සඳහා "පරිසර ආරක්ෂණ බලපත්‍රය" මධ්‍යම පරිසර අධිකාරියෙන් ලබාගත යුතුය.

(11) ජලාශ්‍රිත සංචාරක බංගලා සහ අදාළ යටිතල පහසුකම් ස්ථාපිත කිරීමේදී සාම්ප්‍රදායික ධීවර කටයුතු, මත්ස්‍ය භූමි සහ මත්ස්‍ය ගමන් මාර්ග අවහිර නොකළ යුතුය.

(12) කුඩා දූපත් ආශ්‍රිත සංවර්ධනයන් සඳහා අවසර දීමේදී ප්‍රමාණවත් සේවා ප්‍රදේශයක් දූපතට යාබද ප්‍රධාන භූමියේ පවත්වා ගැනීම අවශ්‍ය වේ.

(13) ජාතික ආරක්ෂාව පිළිබඳ විශේෂිත පිළියම් යොදන ලද හෝ ආරක්ෂාව පිළිබඳ සීමාවන්ට යටත් ප්‍රදේශයන්හි ජලාශ්‍රිත සංචාරක බංගලා ඉදිකිරීමට අවසර නොදෙනු ඇත.

(14) මුහුදු පත්ල, ගංගා සහ කලපු පත්ල භාවිතා කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් සහ අදාළ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අවසරය ලබාගත යුතුය.

(15) 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත යටතේ ප්‍රකාශයට පමුණුවන "සංරක්ෂිත ප්‍රදේශ" හෝ "බලපෑමට ලක්වන ප්‍රදේශ" යන්හි කිසිදු සංවර්ධන කටයුත්තකට අවසර නොදෙනු ඇත.

(16) පොදු පිවිසුම් තහවුරු කිරීම සඳහා දූපත් ආශ්‍රිත විශේෂ විධිවිධාන යෙදිය යුතුය.

(17) ආපදාවන්ගෙන් වන හානි අවම කර ගැනීම සඳහා සුදුසු ඉවත් කිරීමේ සැලසුම් (Evacuation Plan) හදිසි ආපදා අවස්ථාවන්හිදී භාවිත කිරීම සඳහා සංවර්ධකයා විසින් ඉදිරිපත් කළ යුතුය.

*6.4.11 පාවෙන අවන්හල්, ජලය මත ඉදිකිරීම් සහ විනෝදාත්මක කටයුතු සඳහා වූ පාවෙන උපාංග ඉදිකිරීම සඳහා වූ මාර්ගෝපදේශ*

වෙරළ කලාපයේ ජලය මත පාවෙන අවන්හල් සහ අනෙකුත් විනෝදාත්මක ව්‍යුහයන් හා සම්බන්ධිත කටයුතු මේ වනතෙක් ශ්‍රී ලංකාව තුළ එතරම් සංවර්ධනයක් නොපෙන්වයි. නමුත් සංචාරක කර්මාන්තය හා සම්බන්ධව ඉස්මතු වී ඇති සංවර්ධන උපනතීන් සහ විවිධාංගීකරණ අවශ්‍යතාවයන් අනුව අනාගතයේ දී එවැනි පහසුකම් සංවර්ධනය සඳහා යොමුවනු ඇත. මෙම පහසුකම් සහ ව්‍යුහයන් සංචාරක සහ විනෝදාත්මක කටයුතු සඳහා වැදගත් වුවද, එමගින් සාම්ප්‍රදායික සමාජ ආර්ථික කටයුතු, වෙරළබඩ පරිසරය, දර්ශනීය බව සහ නාවික ගමනාගමනය කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකිය. මේ නිසා වෙරළ කලාපය තුළ තිරසාර සංචාරක සහ විනෝදාත්මක කටයුතු පවත්වා ගැනීම සහතික කිරීම සඳහා පහත සඳහන් මාර්ගෝපදේශයන් පාවෙන අවන්හල්, (Boat House) බෝට්ටු නිවාස හෝ ජලය මත ඉදිකරනු ලබන විනෝදාත්මක වේදිකාවන්, අංගන සහ ජැටි ඉදිකිරීම සහ ස්ථාපිත කිරීමේ දී අදාළ වේ.

1. පාවෙන අවන්හල්, බෝට්ටු නිවස (Boat House) , පාවෙන විනෝදාත්මක වේදිකා(Recreational Float) සහ ජලය මත ඉදිකරනු ලබන අදාළ ව්‍යුහයන් වෙරළ කලාපය තුළ ස්ථාපිත කිරීමට අවසර දෙනු ලබන්නේ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් හඳුනාගෙන්නා ලද ස්ථානයන් හි පමණි.

2. අවසර ලබාදීමේ ක්‍රියාවලියේ දී අනවශ්‍ය පමාවීම අවම කිරීම සඳහා ප්‍රාථමික ව්‍යාපෘති යෝජනාව/සංකල්පය විස්තරාත්මක ව්‍යාපෘති යෝජනාව සකස් කිරීමට ප්‍රථම ඉදිරිපත් කළ යුතුය.

3. සංචාරක සහ විනෝදාත්මක කටයුතු සඳහා පාවෙන ව්‍යුහයක් සඳහා වූ සියලු ව්‍යාපෘති පාරිසරික ඇගයීම් වාර්තා/මූලික පාරිසරික ඇගයීම් වාර්තාවන්වලට යටත් වේ.

4. පාවෙන අවන්හල්, පාවෙන ව්‍යුහයන් සහ විනෝදාත්මක ව්‍යුහයන් මුහුදු පත්ල හෝ කලපු පත්ල භාවිතා කොට ස්ථිරව රඳවා තැබීමට අවසර දෙනු නොලැබේ.

5. කොරල් පර, මුහුදු තෘණ පිහිටි ප්‍රදේශ හෝ කැස්බෑවුන් බිජු දැමීමට භාවිතාකරන වෙරළ තීරයන් ආශ්‍රිතව පාවෙන ව්‍යුහයන් හෝ විනෝදාත්මක කටයුතු සඳහා භාවිත කරනු ලබන වේදිකාවන් ස්ථාපිත කිරීමට අවසර දෙනු නොලැබේ.

6. "සංරක්ෂණ ප්‍රදේශ" හෝ "බලපෑමට ලක්වූ ප්‍රදේශ" ලෙස නම්කරන ලද ස්ථානයන්හි හෝ වැලි ඇතුළු ඛනිජ ද්‍රව්‍ය ඉවත්කිරීම සලකා හඳුනාගත් ස්ථානයන්හි පාවෙන අවන්හල් සහ අදාළ ව්‍යුහයන් ස්ථාපිත කිරීමට හෝ පවත්වා ගෙනයාමට අවසර දෙනු නොලැබේ.

7. මාදැල් හෝ කට්ටුදැල් වැනි සාම්ප්‍රදායික ධීවර කටයුතු කරනු ලබන ස්ථානයන් සමීපව සංචාරක හෝ විනෝදාත්මක කටයුතු සඳහා ව්‍යුහයන් ස්ථාපිත කිරීම අවසර දෙනු නොලැබේ.

8. ඝන අපද්‍රව්‍ය හෝ ද්‍රව අපද්‍රව්‍ය වෙරළබඩ ජලයට හෝ ආසන්න ජල තලයන්ට මුදාහැරීමට අවසර දෙනු නොලැබේ.

9. ජලය මත පාවෙන ව්‍යුහයන් මඟින් වෙරළබඩ පිවිසුම් මාර්ග හෝ පොදු වෙරළ භාවිතයන්ට අවහිර නොවිය යුතුය.

10. පාවෙන ව්‍යුහයන් නිර්මාණය කිරීම සඳහා විෂ සහිත රසායනික ද්‍රව්‍ය යොද පදම්කළ දැව භාවිත නොකළ යුතුය.

11. රාත්‍රී කාලය සඳහා කෘතිම විදුලි ආලෝකය වේදිකාවන් සඳහා යොදගැනීම හැකිතාක් අවම ලෙස කළ යුතු අතර, අවට පරිසරය ආලෝකමත් වීම අවම වන ලෙස ආවරණයක් යොද ගත යුතුය.

12. අදළ ව්‍යුහයන් ජලය මත පාවීම සඳහා යොදගන්නා පෙන සහිත ද්‍රව්‍ය (Foam Materials) ජලයට මුසුවීම හෝ පුපුරා යාම වැළැක්වෙන ලෙස ආරක්ෂිත වැස්මකින් යුක්ත විය යුතුය.

13. පාවෙන ව්‍යුහයන් දේශීය (native) ශාඛාව විශේෂයන් පවතින ස්ථානයන්ට අවම වශයෙන් මීටර් 10 ක දුර ප්‍රමාණයකින් ක්‍රියාත්මක කළ යුතුය.

14. වෙරළබඩ ජලය භාවිත කරන්නන්ගේ ආරක්ෂාව සහ ආරක්ෂිත අනතුරු අවම කිරීම සඳහා ප්‍රමාණවත් ලෙස පරාවර්තික (Reflector) උපාංගයන් යොදගත යුතුය.

15. ආරක්ෂක ස්ථාන/මධ්‍යස්ථාන ආසන්නව පාවෙන ව්‍යුහයන් ස්ථාපිත කිරීම, ක්‍රියාත්මක කිරීම අවසර දෙනු නොලැබේ.

**6.4.12 කෘතිම දූපත් සහ ගොඩකරන ලද ප්‍රදේශ සඳහා පසසිටුව තීරණය කිරීම**

මෙවැනි සංවර්න කටයුතු සඳහා පරිසර ඇගයීම් වාර්තා/මූලික පාරිසරික ඇගයීම් වාර්තා අවශ්‍යතාවන් පිළිබඳ සැලකිල්ලට ගෙන එවැනි සංවර්ධන කටයුතු සඳහා අදළ පසසිටුව එක් එක් ව්‍යාපෘතිය අනුව තීරණය කරනු ඇත.

***6.5. වෙරළ කලාපයේ ජලතලයන්හි ඉවුරුවල දෙපස පිහිටි භූමිය තුළ සංවර්ධන කාර්යයන් සඳහා පස සිටුව***

වෙරළ කලාපයේ ජලතලයන්හි පිහිටි දෙපස ඉඩම් පිළිබඳව (ගංගා, දෙළ මාර්ග, කලපු ආදියේ) පසසිටුව යම් සංවර්ධන කාර්යයන් තහනම් කරනු ලබන හෝ සීමාකරන ප්‍රදේශයක් ලෙස අර්ථකතනය කල හැක. ඉවුරු ආශ්‍රිත දෙපස ඉඩම් සඳහා රක්ෂිතයක් පූර්ණ සැපයුම් මට්ටමක් (Full Supply Level), මධ්‍ය වඩදිය මට්ටම හෝ ඉවුරේ කෙළවර හෝ අවස්ථානුකූලව තීරණය කරනු ලබන යොමු ඉම සිට ගොඩබිම දෙසට ගත හැක.

***6.5.1 ජලතලයන්හි ඉවුරු දෙපස භූමියේ සංවර්ධන කටයුතු සඳහා පසසිටුව***

මුහුදට සම්බන්ධවන ගංගා, ඇළ, දෙළ සහ කලපුවල ඉවුරු දෙපස භූමියේ සංවර්ධන කටයුතු කිරීමේදී ප්‍රමාණවත් රක්ෂිතයක් තැබිය යුතුය. සාම්ප්‍රදයික ජල තලයන්හි ඉවුරු දෙපස සංවර්ධන කටයුතු සඳහා වූ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් රක්ෂිතයන් නියම කර ඇත. ජල තලයන්හි ජීව භෞතික ගති ලක්ෂණයන් පිළිබඳ සලකා එම ජලතලයන් රක්ෂිතයන් තීරණය කිරීම සඳහා පහත දක්වෙන ලෙස වර්ග කරන ලදී.

- මුහුදට සම්බන්ධ වූ කලපු සහ මෝය
- මුහුදට සම්බන්ධ වූ ප්‍රධාන ගංගා
- මුහුදට සම්බන්ධ වූ වෙනත් ජල මාර්ගයන්

**6.5.2 සංවර්ධන කටයුතු තහනම් කළ කලාපය "No Development Zone" සහ සංවර්ධන කටයුතු සීමා කළ කලාපය - "Restricted Development Zone"**

ගංගා මුවදෙර ආසන්නව පිහිටි ඉවුරු ප්‍රදේශ සහ මෝය ප්‍රදේශයන්හි ජල ප්‍රදේශවල ජීව-භෞතික ගති ලක්ෂණ සහ අන්තරායට ලක්වීමේ මට්ටම් දෙස බැලූවිට කලපු සහ අනෙකුත් ජල තලයන්හි "සංවර්ධන කටයුතු තහනම් කළ කලාපය" හෝ "සංවර්ධන කටයුතු සීමා කළ කලාපය" ලෙස නම් කෙරේ.

- කලපු සහ ප්‍රධාන ගංගාවන්ගේ මුවදෙර සිට මීටර් 500 රට අභ්‍යන්තරයට පිහිටි ජලතලය සංවර්ධන කටයුතු සීමාකල කලාපය "Restricted Development Zone" ලෙස නම් කෙරේ.

- වෙරළ කලාපය තුළ ප්‍රකාශයට පත්කර ඇති ආරක්ෂිත ප්‍රදේශ ("No Development Zone" (Protected Area) තුළ පිහිටි සියළු ගංගා, කලපු සහ වෙනත් ජලතලයන්හී ජල ප්‍රදේශ හා ඉවුරු සංවර්ධන කටයුතු තහනම් කලාපය "No Development Zone" ලෙස නම් කෙරේ.

- ප්‍රධාන ගංගාවල මුවදෝරේ සිට රට අභ්‍යන්තරයට මීටර් 500 ක් වූ ඉවුරු දෙපස සීමාකළ/සංවර්ධනය කටයුතු තහනම් කළ කලාපය ලෙස නම් කෙරේ.

*6.5.3 ගංගා ආශ්‍රිත ඉවුරු දෙපස භූමිය සඳහා පසසිටු*

වෙරළ කලාපයේ පිහිටි ගංගාවන්ගේ ඉවුරු දෙපස භූමියේ සංවර්ධන කටයුතු සිදු කිරීමේදී රජයේ ඉඩම් රෙගුලාසි (1948.10.15 (1) අංක 9912 සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව යොදා ගනු ලබන නිර්නායක වලට අනුකූලව පස සිටුව තීරණය කරනු ලැබේ. ගංගාව දෙසට වූ යොමු ඉම (River side reference point) ලෙස ගංගාවේ ඉවුර මායිම හෝ පූර්ණ සැපයුම් මට්ටම (Full supply level) ලෙස සැලකිය හැකිය. ගංගා වර්ගීකරණය පහත පරිදි වේ.

| ගංගා වර්ගය | පළල |
|---|---|
| ප්‍රධාන ගංගා | පළල මීටර් 15ට වැඩි |
| මධ්‍යම ප්‍රමාණයේ ගංගා | පළල මීටර් 5 - මීටර් 15 |
| කුඩා ගංගා හා අනෙකුත් ඇළ මාර්ග | පළල මීටර් 5ට අඩු |

ගංගා ඉවුරු සහ ඇල මාර්ග සඳහා රක්ෂිතයන්/පසසිටු තීරණය කිරීමේදී වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් යොදා ගනු ලබන රක්ෂිතයන් පවත්වා ගනු ලැබේ.

කෙසේ වුවද වාරිමාර්ග දෙපාර්තමේන්තුව හෝ වෙනත් යම් නීතියක් මගින් ගංගා සහ ඇළ මාර්ග සඳහා රක්ෂිතයන් නියම කර නොමැති අවස්ථාවක එම රක්ෂිතයන් තීරණය කිරීම වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ.

**6.5.4 කලපු ඉවුරු සඳහා රක්ෂිතයන් (පසසිටුව)**

වෙරළ කලාපය තුළ පිහිටි කලපු දෙපස පිහිටි භූමියේ සංවර්ධන කටයුතු කිරීමේ දී මීටර් 10 ක අවම පසසිටුවක් තැබිය යුතුය. කෙසේවුවද වෙරළ කලාපය තුළ කලපු ඉවුරු වල පාරිසරික හා ජෛව විවිධත්වය සැලකිල්ලට ගෙන අවශ්‍යතාවය පරිදි මීටර් 10 ට වැඩි රක්ෂිතයක් තීරණය කිරීමට වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල්වරයාට හැකිය.

***6.5.5 වෙරළ කලාපයේ ජලාශ ආශ්‍රිත ඉවුරු දෙපස භූමිය සඳහා රක්ෂිතයන්/පසසිටු තීරණය කිරීමේ දී යොමුඉම තීරණය කිරීම***

| | | |
|---|---|---|
| කලපු ඉවුර දෙපස පවත්නා යොමු ඉම | : | පූර්ණ සැපයුම් මට්ටම හෝ මධ්‍ය වඩදිය ඉම |
| ගංගා දෙසට පවත්නා යොමු ඉම | : | ගඟ ඉවුර ඉම හෝ ගංගාවේ පූර්ණ සැපයුම් මට්ටම (FSL) |
| ඇළ මාර්ග සහ අනෙකුත් ජල මාර්ග | : | ඇළ ඉවුර ඉම හෝ ඉවුර ආරක්ෂිත බැම් |

*6.5.6 ජලතලයන්හි ඉවුරු දෙපස භූමි ගොඩ කිරීම සඳහා වූ මාර්ගෝපදේශ*

- ජාතික ආරක්ෂාව සහ නගර සංවර්ධනය සඳහා අදාළ ගොඩකිරීම් පිළිබඳව සලකා බලනු ඇත.
- වෙරළ කලාපය තුළ ජලතලයන්හි ඉවුරු ස්ථායිකරණය හා සංරක්ෂණය කිරීමට හැර වෙනත් කටයුතු සඳහා පිරවීමට අවසර දෙනු නොලැබේ.
- වෙරළ කලාපීය ජලාශවල ඉවුරු දෙපස ඝණ අපද්‍රව්‍ය සහ අන්තරාකාරී අපද්‍රව්‍ය මුදා හැරීමට අවසර නොදෙනු ඇත.
- ජලතලයන්හි ඉවුරේ සිට මීටර් 20 ක් ගොඩබිම දෙසට වන ප්‍රදේශය පිරවීමට අවසර දෙනු නොලැබේ.

**6.6 පාරිසරික බලපෑම් තක්සේරුව සහ මූලික පාරිසරික පරීක්ෂණය**

2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනත මගින් සංශෝධිත 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනතේ 16 වන වගන්තිය යටතේ පැවති පාරිසරික ඇගයීම් වාර්තා අවශ්‍යතා පිළිබඳ නෛතික විධිවිධානයන් සංශෝධනය කරන ලදී.

ඉහත සඳහන් නෛතික විධිවිධානවලට අනුකූලව වෙරළ කලාපය තුළ සංවර්ධන කාර්යයක නිරතවීම සඳහා අයදුම්පතක් ලද විට, එම සංවර්ධන කාර්යය සඳහා පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවක් (EIA) හෝ මූලික පාරිසරික පරීක්ෂණයක (IEE) අවශ්‍යතාව වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත. පාරිසරික බලපෑම් තක්සේරුවක හෝ මූලික පාරිසරික පරීක්ෂණයක අවශ්‍යතාවය පිළිබඳව නිශ්චය කිරීමේ දී වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්‍ෂ ජනරාල්ගේ අභිමතය පරිදි තීරණය කිරීමට බලය ඇතත් ඔහු විසින් අවශ්‍ය අවස්ථාවන්හිදී ජාතික පාරිසරික පනත යටත් වූ නියමිත ව්‍යාපෘති නාමාවලිය කෙරෙහි අවශ්‍යතාව අනුව සැළකිල්ලට භාජනය කරනු ඇත.

*6.6.1 පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව*

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත අනුව පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවක් යනු පහත සඳහන් ලෙස අර්ථකතනය කොට ඇත.

"යෝජිත සංවර්ධන කාර්යයකින් ඇති විය හැකි පරිසරය හා සම්බන්ධ ප්‍රතිඵල පිළිබඳ ලිඛිත විශ්ලේශණයක් අදහස් වන අතර, යෝජිත කාර්ය පිළිබඳ විස්තරයක්ද යෝජිත සංවර්ධන කාර්යයෙන් පරිසර විෂයයෙහි ඇතිවන වැළැක්විය හැකි සහ වැළැක්විය නොහැකි අනිෂ්ඨ ප්‍රතිඵල පිළිබඳ විස්තරයක්, වෙරළ කලාපයේ පරිසරයට අඩු හානි කරවූ ඒ කාර්යයට ඇති විකල්ප පිළිබඳ විස්තරයක් සමග ඒ විකල්ප ප්‍රතික්ෂේප කිරීමට හේතුද සහ යෝජිත සංවර්ධන කාර්යය සඳහා අවශ්‍ය වෙනස්කළ නොහැකි හෝ ආපසු ලබා ගත නොහැකි සම්පත් භාවිතය පිළිබඳ විස්තරයක්ද ඊට ඇතුළත් වේ."

වෙරළබඩ පරිසරය කෙරෙහි සැලකිය යුතු බලපෑම් හටගන්නේ යැයි අධ්‍යක්‍ෂ ජනරාල්වරයා විසින් තීරණය කෙරෙන ව්‍යාපෘති සඳහා හෝ ඉදිරිපත් කරනු ලබන මූලික පාරිසරික පරීක්ෂණ වාර්තාවක ප්‍රමාණත්වය මත තීරණය කරනු ලබන ව්‍යාපෘති සඳහා පරිසර බලපෑම් තක්සේරු වාර්තාවක් අවශ්‍ය වේ. අනෙකුත් අදළ රාජ්‍ය ආයතන වල සහභාගීත්වයෙන් සිදුකරනු ලබන ඇගයීම් ක්‍රියාවලියක් වන බැවින් අදළ නියෝජිත ආයතන වලින් උපදෙස් ලබාගැනීමෙන් පසු පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව පිළියෙල කිරීම සඳහා වූ නිර්ණේය විෂය (Terms of Reference) වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කොට ව්‍යාපෘති යෝජකයා වෙත ලබා දෙනු ඇත. පාරිසරික බලපෑම් තක්සේරු වාර්තා පිළියෙල කිරීම සඳහා ඉහතින් දක්වා ඇති සාමාන්‍ය මාර්ගෝපදේශ සහ ලබාදෙන ලද නිර්ණේය විෂයට අනුකූලව පාරිසරික බලපෑම් තක්සේරුව පිළියෙල කිරීම අයදුම්කරුගේ වගකීමකි. පාරිසරික බලපෑම් තක්සේරුව සැලසුම් කිරීමේදී සහ පිළියෙල කිරීමේදී වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙතින් උපදෙස් ලබා ගන්නා ලෙස සංවර්ධකයන් හට උපදෙස් දෙනු ලැබේ. වඩාත්ම අදළ වූ ගැටළු පිළිබඳ අවධානය යොමු කිරීම සඳහා සංක්ෂිප්තවූත් පිරිවැයට අනුව ඵලදායීවූත් පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවක් පිළියෙල කිරීම සඳහා සංවර්ධකයින් වෙත සහාය වීමට මේ මගින් වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවට අවකාශය ලැබෙනු ඇත.

සංවර්ධකයාගේ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව ලැබුන විට අධ්‍යක්‍ෂ ජනරාල් විසින් එහි පිටපතක් වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ උපදේශක සභාවේ අදහස් ලබා ගැනීම සඳහා එම සභාවට ඉදිරිපත් කරනු ලැබේ. තවද අධ්‍යක්‍ෂ ජනරාල් විසින් ගැසට් පත්‍රයේ ද, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පුවත්පත් වලට ද නිවේදනයක් පලකල යුතු අතර මහජනතාවට පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව පරීක්‍ෂා කළ හැකි ස්ථාන සහ කාලවේලාවන් දක්වා මහජනතාවට දින 30 ක් තුළ අදහස් දැක්වීමට ආරාධනයක් එමගින් කළ යුතුය. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ උපදේශක සභාව වෙත පාරිසරික බලපෑම් තක්සේරුව යොමු කර දින 60 ක් තුළ තම අදහස් අධ්‍යක්‍ෂ ජනරල් වෙත ඉදිරිපත් කරනු ලබයි. ගැසට් නිවේදනය නිකුත් කළ දින සිට වැඩ කරන දින 30 ක් ඇතුළත මහජන අදහස් අධ්‍යක්‍ෂ ජනරාල්වරයා වෙත දන්වා සිටීමට අවශ්‍ය වේ. අධ්‍යක්‍ෂ ජනරාල් විසින් ලද සියළු අදහස් සැලකිල්ලට ගත යුතු අතර අදහස් ලැබී දින 60 ක් තුළ අවසර පත්‍රයක් නිකුත් කල හැකිද යන්න පිළිබඳව සහ ඒ සඳහා වූ කොන්දේසි කවරේද යන්න පිළිබඳවත් තීරණය කෙරේ.

*6.6.2 මූලික පාරිසරික පරීක්ෂණය*

බලපත්‍රයක් නිකුත් කිරීමේදී, සංවර්ධන ක්‍රියාකාරකම් වෙරළ කලාපයේ පාරිසරික ගුණාත්මකබව හා වෙරළබඩ සම්පත්වල තිරසාරභාවය කෙරෙහි අයහපත් බලපෑමක් ඇති නොකරන බවට අධ්‍යක්ෂවරයා වගබලා ගැනීම අවශ්‍ය වේ. මෙය සහතික කිරීම පිණිස වෙරළ සංරක්ෂණ සහ සම්පත් කළමනාකරණ පනතේ 16 (1) වගන්තියේ නෛතික විධිවිධාන ප්‍රකාරව මූලික පාරිසරික වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසට අධ්‍යක්ෂවයා සංවර්ධකයාගෙන් ඉල්ලා සිටීමට ඉඩ ඇත.

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ පනත අනුව මූලික පාරිසරික පරීක්ෂණ වාර්තාවක් යන්න පහත දැක්වෙන ලෙස අර්ථකතනය කොට ඇත. "මූලික පරිසර පරීක්ෂණ වාර්තාව" යන්නෙන් පරිසරය පිළිබඳ සංවර්ධන කටයුත්තකදී සිදුවිය හැකි ගැටුම් වැදගත් වේද යන්නද, එසේ වේ නම් පාරිසරික බලපෑම් පිළිබඳ තක්සේරු වාර්තාවක් පිළියෙල කිරීම අවශ්‍ය වන්නේද යන්න දැන ගැනීමේ අදහසින් පිළියෙල කළ ලිඛිත වාර්තාවක් අදහස් වේ. ඒ වාර්තාවේ සංවර්ධන කටයුත්තට අදල සියළු විස්තර සහ විස්තරාර්ථ, දත්ත සිතියම්, දළ සටහන් සහ වෙනත් තොරතුරු ඇතුළත් විය යුතුය".

මූලික පාරිසරික පරීක්ෂණ වාර්තාවක් අවශ්‍ය නොවන නම් කරන ලද ව්‍යාපෘති හැර වෙරළබඩ පරිසරය සහ සම්පත් කෙරෙහි සැළකිය යුතු බලපෑම් හට ගන්නේ යැයි සැලකෙන්නානවූද, "පාරිසරික බලපෑම් තක්සේරුව ක්‍රියාවට නැංවීම සඳහා මාර්ගෝපදේශ" මගින් විස්තර කරන්නාවූද නියමිත ව්‍යාපෘති, සංවර්ධන කටයුතු සඳහා මූලික පාරිසරික පරීක්ෂණ වාර්තාවක් අවශ්‍ය වේ. මූලික පාරිසරික පරීක්ෂණ වාර්තාව පිළියෙල කිරීම අයදුම්කරුගේ වගකීම වෙයි. මූලික පාරිසරික පරීක්ෂණ වාර්තාවක් පිළියල කිරීම සඳහා වූ සාමාන්‍ය මාර්ගෝපදේශයන් පහතින් දක්වා ඇත. අදල නියෝජිතායතන වලින් උපදෙස් ලබා ගැනීමෙන් පසු මූලික පාරිසරික පරීක්ෂණයක් පිළිබඳ පිරික්සුම් නාමාවලියක් සහ නිර්නේය විෂය (Terms of Reference) වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කිරීමට පසු ඒවා අයදුම්කරු වෙත ලබා දෙනු ඇත.

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත මූලික පාරිසරික පරීක්ෂණ වාර්තාවක් ලැබුන පසු එය විමර්ෂණයට ලක් කෙරෙන අතර අවසර පත්‍රයක් නිකුත් කළ හැකි බව/නොකළ හැකි බව හා ඊට අදළ කොන්දේසි සම්බන්ධයෙන් තීරණයකට එළඹීමට ප්‍රමාණවත් වන්නේ නම් එම වාර්තාව වෙරළ සංරක්ෂණ සහ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ උපදේශක සභාවේ අදහස් ලබා ගැනීම සඳහා යොමුකළ යුතුය. උපදේශක සභාව තම අදහස් අධ්‍යක්ෂ ජනරාල් වෙත දින 30 ක් තුළ ලබා දිය යුතු ය.

*6.6.3 මූලික පාරිසරික පරීක්ෂණ වාර්තා සහ පාරිසරික බලපෑම් තක්සේරුව වාර්තා පිළියෙල කිරීම සඳහා වන සාමාන්‍ය මාර්ගෝපදේශ*

*(අ) යෝජිත ක්‍රියාකාරකම් විස්තරය :*

(i) යෝජිත කාර්යයේ ස්වභාවය, අරමුණු, විෂයපථය පිළිබඳ විස්තර
(ii) ඉදිකිරීමේදී, මෙහෙයවීමේදී සහ නඩත්තුවේදී උපයෝගී කරගනු ලබන ක්‍රමවේද පිළිබඳ විස්තර
(iii) යෝජිත ව්‍යාපෘතියේ සමාජීය, ආර්ථික සහ පාරිසරික ප්‍රතිලාභ සහ පිරිවැය පිළිබඳ විස්තර
සහ
(iv) යෝජිත කාර්යය සඳහා වූ දිගුකාලීන සුපරීක්ෂණ වැඩසටහන පිළිබඳ විස්තර

*(ආ) වැඩබිම පිළිබඳ විස්තර*

❖ යෝජිත කාර්යය, සංවර්ධනය හෝ මෙහෙයුම හෝ පිහිටුවීමට අදහස් කෙරෙන ස්ථානය සහ එහි අවට පරිසරය පිළිබඳ විස්තර ඊට ඇතුළත් විය යුතු අතර, එයට ;

➢ 1:50000 පරිමාණයේ මෙට්‍රික් සිතියමක හෝ සැතපුමට අඟලේ සිතියමක සලකුණු කරන ලද යෝජිත කාර්යයන් ස්ථාන ගත කරනු ලබන ප්‍රදේශයේ පිහිටීම.

➢ පරිගණක ආශ්‍රයෙන් ගූගල් අර්ත් (Goole Earth) මෘදුකාංගය මඟින් ගනු ලබන සිතියමක් මගින් සම්පාදනය කරන ලද යෝජිත කාර්යය පිහිටි ස්ථානය පිළිබඳ විස්තර ඇතුළත් සිතියමක පිටපතක්

➢ යෝජිත කාර්යයන් ඇතුළත් වැඩබිම පිළිබඳ සුදුසු පරිමාණයක සිතියමක්

- තුන්වන පරිච්ඡේදයේ අර්ථ දක්වා ඇති පරිදි වෙරළබඩ පරිසර පද්ධති පිළිබඳව සහ ඒවායේ පාරිසරික තත්ත්වය පිළිබඳ විස්තර

- ආසන්නයේ පවත්නා ජලාශ, ජල මාර්ග සහ ඒවාට ඇති දුර ප්‍රමාණ පිළිබඳ විස්තර

- දැනට පවත්නා ඉඩම් පරිහරණ රටාවන් සහ වෙනත් මානව ක්‍රියාකාරකම්

- වෙරළ කලාපයේ පිහිටි අධි ප්‍රමුඛතා පුරාවිද්‍යාත්මක, ඓතිහාසික, සංස්කෘතික, ආගමික ස්ථාන හෝ දර්ශනීය, විනෝදාත්මක, ආරක්ෂිත ප්‍රදේශයන් හෝ බලපෑමට යටත් ප්‍රදේශ යන කිසිවක් වැඩබිම අවට පවතී ද යන්න පිළිබඳ අදාල විස්තර

- වෙනත් අදාළ තොරතුරු

*(ඈ) උද්ගතවිය හැකි බලපෑම් විස්තර*

විභවය බලපෑම් පිළිබඳ විස්තරයට වෙරළබඩ කලාපය සහ එහි සම්පත් මත ක්‍රියාකාරකමෙහි පූර්වේක්ෂා ඍජු සහ වක්‍ර, දිගු කාලීන සහ කෙටි කාලීන බලපෑම් ඇතුළත් විය යුතුය. වෙරළබඩ සම්පත් කෙරෙහි ඇතිවිය හැකි ඍජු සහ වක්‍ර, දිගුකාලීන සහ කෙටිකාලීන බලපෑම් ද බලපෑම් විස්තරයට ඇතුළත් විය යුතුය. මේ අනුව දිගුකාලීන සහ කෙටිකාලීන යන්නෙන් කිසිදු නිශ්චිත කාලපරිච්ඡේදයක් නොකියවෙන නමුත්, අවධානය යොමුකළ යුත්තේ යෝජිත සංවර්ධන කාර්යය නිසා පාරිසරිකව සිදුවන වැදගත් ගැටළු කෙරෙහිය. සම්පත් අපතේ යැවෙන හෝ පසුව වෙනස් කළ නොහැකිසේ හෝ සම්පත් යොදවන අවස්ථා හඳුනාගත යුතු අතර යථෝක්ත විස්තරයට පහත සඳහන් දෑ කෙරෙහි විය හැකි බලපෑම්ද ඇතුළත් විය යුතුය.

- තුන්වන පරිච්ඡේදයෙහි විස්තර කොට ඇති වෙරළබඩ පරිසර පද්ධතීන්
- වෙරළබඩ ජලයේ ප්‍රමාණය සහ ගුණය
- අතීත සහ වර්තමාන ඉඩම් පරිහරණ රටාවන්
- ශාක සහ සත්වයන්ගේ විවිධත්වය සහ බහුලත්වය
- වෙරළ ඛාදනය වීමේ සහ වැලි තැන්පත්වීමේ ක්‍රියාවලිය
- ජල සංසරණය, ජල දෙරයැම, චලතාව සහ අවසාදනය
- මිරිදිය ගලායාමේ රටාව සහ/හෝ කරදිය ගොඩගැලීම
- පුරාවිද්‍යාත්මක, ඓතිහාසික, සංස්කෘතික, ආගමික, දර්ශනීය සහ විනෝදාත්මක ස්ථාන සහ ආරක්ෂිත ප්‍රදේශ
- වෙරළත වෙතට සහ වෙරළ ඔස්සේ ද වෙරළබඩ ජල ප්‍රදේශය වෙතට වූ ද මහජනයාට පොදු පිවිසුම
- ජාතික ආරක්ෂාව පිළිබඳ මතුවිය හැකි තත්ත්වයන්

*(ඈ) බලපෑම් අවම කිරීමේ යෝජිත ක්‍රියාමාර්ග*

බලපෑම් අවම කිරීම සඳහා යෝජිත ක්‍රියාමාර්ග විස්තර කරන ප්‍රකාශයක් සහ එම යෝජිත ක්‍රියාමාර්ගයන්ගේ ඵලදායීබව පිළිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය. විකල්ප ක්‍රියාමාර්ග සලකා බලන්නේ නම් ඒ පිළිබඳව සඳහන් කළ යුතු අතර බලපෑම් අවම කිරීම සඳහා යෝජනාකරන ක්‍රියාමාර්ග තෝරා ගැනීම පිළිබඳවද හේතු දැක්විය යුතුය.

*(ඉ) අතිරේක අවශ්‍යතා*

පරිසර බලපෑම් තක්සේරුවට හෝ මූලික පාරිසරික පරීක්ෂණ සඳහා ඇතුළත් කළ යුතු අතිරේක විස්තර එක් එක් යෝජිත කාර්යය අනුව ඇතුළත් කරන ලෙස අධ්‍යක්ෂ ජනරාල්/උපදේශක කමිටුවට නියම කළ හැක. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අවසර පත්‍රයක් ලබා ගැනීමේ ක්‍රියාපටිපාටිය රූපය අංක 6.3 සාරාංශකොට ඇත. පාරිසරික ඇගයීම් තක්සේරුවක් අවශ්‍ය නොවන සංවර්ධන කටයුතු සඳහා සියළු තොරතුරු ලැබීමෙන් පසු සාමාන්‍යයෙන් සති තුනකට නොවැඩි කාලයක් තුළ එම අයදුම්පත පිළිබඳ තීරණයක් ගනු ඇත. මෙම සැලැස්ම පරිශීලනය කිරීම සහ ව්‍යාපෘති සැලසුම් කිරීමේ මූලික අදියරේදී වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ උපදේශනය ලබාගැනීම ව්‍යාපෘතියක් සැලසුම් කිරීමේ දී ප්‍රයෝජනවත් අතර එමගින් අවසරපත්‍ර ලබා ගැනීමේ ක්‍රියාවලිය ද පහසු කරනු ඇත.

*6.6.4. සංවර්ධන කාර්යයන් සඳහා සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීමේ සහ විමර්ෂණය කිරීමේ ක්‍රියාපටිපාටිය*




6.3 රූපය

**6.7 පසු විපරම් ක්‍රියාපටිපාටිය**

වෙරළ කලාපය සහ එහි සම්පත් කළමනාකරණය කිරීම සඳහා අනුකූලතා සුපරීක්ෂණය වැදගත් අවශ්‍යතාවක් වෙයි. මෙම අවශ්‍යතාවය අනුව අනුකූලතා සුපරීක්ෂණයන් ක්‍රමවත්ව සිදුකිරීම සඳහා වෙරළ කලාප සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම මගින් වඩාත් වැඩි දියුණු කරන ලද යොමුරීති හඳුන්වා දී ඇත. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් අනුකූලතා සුපරීක්ෂණයන් සිදු කිරීමේ මූලික අරමුණු පහත පරිදි වේ.

- වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්මේ ඇතුළත් කොට ඇති ප්‍රමිතීන් හා යොමුරීති, ලබාදෙන ලද අවසර පත්‍රයක් මගින් අනුගමනය කරනු ලබන බව තීරණය කිරීම.

- වෙරළ කලාප කළමනාකරණ අරමුණු ළඟාකර ගැනීම සඳහා හඳුන්වා දී ඇති යොමු රීති සහ ප්‍රමිතීන්ගේ ප්‍රමාණවත් බව තීරණය කිරීම.

- වෙරළ කලාප කළමනාකරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී අනෙකුත් ආයතනයන්ගේ සහයෝගිතාව, ප්‍රමාණවත් බව සහ බලපෑම නිර්ණය කිරීම.

බලපත්‍රවල සඳහන් කොන්දේසිවල අනුකූලතාව සහතික කිරීම සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව භාවිතා කරන පසුවිපරම් ක්‍රමවේදයන්,

